# මොරටුව සංවර්ධන සැලැස්ම
# 2019 - 2030

පළමු වෙළුම



නාගරික සංවර්ධන අධිකාරිය
ජුනි, 2019

# මොරටුව සංවර්ධන සැලැස්ම

2019–2030

**වෙළුම I**

මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය

නාගරික සංවර්ධන අධිකාරිය

# මොරටුව සංවර්ධන සැලැස්ම 2019 – 2030 - පළමු වෙළුම

© නාගරික සංවර්ධන අධිකාරිය - ශ්‍රී ලංකාව - 2019

සියළුම හිමිකම් ඇවිරිණි.

මෙම ප්‍රකාශනය නාගරික සංවර්ධන අධිකාරිය විසින් ප්‍රකාශයට පත් කෙරේ. මෙම ප්‍රකාශනය සම්පූර්ණයෙන්ම හෝ කොටසක් මෙම අධිකාරියේ පූර්ව අනුමැතියකින් තොරව ප්‍රතිප්‍රකාශනය කිරීම, විකිණීම, බෙදාහැරීම, ලිඛිත අවසරයකින් තොරව පිටපත් කිරීම හෝ නවීන තාක්ෂණික ක්‍රම හරහා නැවතගත කිරීම හෝ බෙදාහැරීම හෝ වෙළඳ අරමුණක් සඳහා යොදා ගැනීම සිදු නොකළ යුතුය.

**ප්‍රකාශනය**

නාගරික සංවර්ධන අධිකාරිය - ශ්‍රී ලංකාව
6 වන, 7 වන හා 9 වන මහල, "සෙත්සිරිපාය",
බත්තරමුල්ල, කොළඹ, ශ්‍රී ලංකාව

වෙබ්අඩවිය– www.uda.gov.lk
විද්‍යුත් තැපෑල– info@uda.gov.lk
දුරකථන අංක- + 94112 873 637

ප්‍රකාශනය 2019 - ජූනි

මොරටුව සංවර්ධන සැලැස්ම 2019-2030 ප්‍රධාන වශයෙන් කොටස් දෙකකින් සමන්විත වන අතර එය පළමු වෙළුම හා දෙවැනි වෙළුම වශයෙන් ප්‍රකාශනයට පත් කෙරේ. මෙහි පළමු වෙළුම අනු කොටස් දෙකකින් සමන්විත වන අතර එය පළමුවන කොටස හා දෙවන කොටස වශයෙන් සඳහන් කර ඇත. මෙහි එන පළමු වෙළුමේ පළමුවන කොටස මඟින් සංවර්ධන සැලසුම හැඳින්වීම, පසුබිම් අධ්‍යයනය, සංවර්ධන සැලැස්මක අවශ්‍යතාවය පිළිබඳ සඳහන් කරන අතර එහි දෙවන කොටස මගින් සංවර්ධන සැලැස්මේ දැක්ම, අරමුණු හා පරමාර්ථ, සංකල්පිත සැලැස්ම, සංවර්ධන උපායමාර්ග සැලසුම් යනාදිය අන්තර්ගත කර ඇත. සංවර්ධන සැලැස්මෙහි දෙවැනි වෙළුම වෙනම ප්‍රකාශනයක් ලෙස සකස් කර ඇති අතර එහි 2019 -2030 කාලපරිච්ඡේදය සඳහා බලපවත්වන සැලසුම් හා ගොඩනැගිලි සංවර්ධනය කිරීමේ රෙගුලාසි හා කලාපිකරණ රෙගුලාසි අන්තර්ගත කර ඇත.

මොරටුව සංවර්ධන සැලැස්ම 2019 - 2030 නාගරික සංවර්ධන අධිකාරියේ බස්නාහිර පළාත් අංශය විසින් සකස් කර ඇති අතර, ඒ සඳහා නාගරික සංවර්ධන අධිකාරියේ විවිධ අංශයන්ගේ හා සම්පත් දායකයන්ගේ උපදෙස් හා මඟපෙන්වීම පෙරදැරි කරගෙන සිදු කර ඇත.

**අධීක්ෂණ කටයුතු**

**ආචාර්ය ජගත් මුණසිංහ මහතා** *සභාපති - නා.සං.අධි.*, **ඉංජිනේරු එස්.එස්.පි.රත්නායක මහතා** *අධ්‍යක්ෂ ජනරාල් - නා.සං.අධි.*, **නගර නිර්මාණ ශිල්පී කේ.ඒ.ඩී. චන්ද්‍රදාස මහතා** *හිටපු අතිරේක අධ්‍යක්ෂ ජනරාල් - නා.සං.අධි.*, **නගර නිර්මාණ ශිල්පී ඩී.එම්.බී. රණතුංග මහතා** *අතිරේක අධ්‍යක්ෂ ජනරාල් - නා.සං.අධි.*, **නගර නිර්මාණ ශිල්පී එම්.පී. රණතුංග මහතා** *නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (සැලසුම් ) - නා.සං.අධි.*, **වයි.ඒ.පී.කේ. ගුණතිලක මහතා** *අධ්‍යක්ෂ (බස්නාහිර පළාත් අංශය) - නා.සං.අධි.*, **නගර නිර්මාණ ශිල්පී ජනක් රණවීර මහතා** *අධ්‍යක්ෂ (සංවර්ධන සැලසුම් අංශය සහ පර්යේෂණ හා සංවර්ධන ඒකකය) - නා.සං.අධි.*, **නගර නිර්මාණ ශිල්පී ලලිත් විජයරත්න මහතා** *හිටපු අධ්‍යක්ෂ (සංවර්ධන සැලසුම් අංශය) - නා.සං.අධි.*

**සැලසුම් කණ්ඩායම**

**නගර නිර්මාණ ශිල්පී දයානි ෆ්‍රැන්සිස් මෙනවිය** *නියෝජ්‍ය අධ්‍යක්ෂ සැලසුම් (බස්නාහිර පළාත් අංශය) - නා.සං.අධි.*, **බී. එල්.රංජිත්** *සහකාර අධ්‍යක්ෂ සැලසුම්, (බස්නාහිර පළාත් අංශය) - නා.සං.අධි.*, **පී.ඩී.සී. ජයමාලි ජයවර්ධන මිය** *සැලසුම් සහකාර නිලධාරී (බස්නාහිර පළාත් අංශය) - නා.සං. අධි.*, **ශානිකා සුමනපාල මිය** *සහකාර සැලසුම් නිලධාරී (පර්යේෂණ හා සංවර්ධන ඒකකය) - නා.සං. අධි.*, **මොනාලි රූපසිංහ මෙනවිය** *සහකාර සැලසුම් නිලධාරී (පර්යේෂණ හා සංවර්ධන ඒකකය) - නා.සං. අධි.*

**සහාය කණ්ඩායම්**

පරිසර හා භූදර්ශන අංශය - නා.සං.අධි.
භූගෝලීය හා තොරතුරු පද්ධති අංශය - නා.සං.අධි.
පර්යේෂණ හා සංවර්ධන ඒකකය - නා.සං.අධි.

# ප්‍රණාමය

මොරටුව මහ නගර සභා ප්‍රදේශය ආවරණය වන පරිදි 2019 – 2030 කාල වකවානුව සඳහා සකස් කෙරෙන මෙම සංවර්ධන සැලැස්ම නාගරික සංවර්ධන අධිකාරියේ බස්නාහිර පළාත් අංශය සහ පර්යේෂණ හා සංවර්ධන ඒකකය ප්‍රධාන කොට ප්‍රදේශයේ සංවර්ධන කටයුතු වල නියුතු සියලු පර්ශවකරුවන්ගේ සම්බන්ධීකරණයෙන් පිළියෙළ කර ඇත.


ප්‍රධාන වශයෙන් මෙම කාර්යය සාර්ථක කර ගැනීම සඳහා ගරු මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය පාඨලී චම්පික රණවක මැතිතුමාගේ නායකත්වයත් සහයෝගයත් ඉතා අගය කොට සලකන්නෙමු. එමෙන්ම මහා නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශයේ ගරු ලේකම් ප්‍රමුඛ කාර්ය මණ්ඩලය වටිනා කාර්යභාරයක් ඉටු කරමින් මෙම කාර්යය සඳහා උනන්දුවක් දක්වමින් සහයෝගය දක්වන ලදී. එමෙන්ම මොරටුව මහ නගර සභාවේ ගරු නගරාධිපතිතුමා ප්‍රමුඛ සමස්ත කාර්යය මණ්ඩලයටද මේ වෙනුවෙන් දැක් වූ සහයෝගයට අපගේ විශේෂ ස්තූතිය පළ කරන්නෙමු.

තවද රාජ්‍ය හා පුද්ගලික අංශය නියෝජනය කරමින් විවිධ පාර්ශවකරුවන් මේ සඳහා දායකත්වය ලබා දුන් අතර ඔවුන්ගේ අදහස් යෝජනා හා නිර්දේශ මෙම සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීමේදී මනා පිටුවහලක් විය. එමෙන්ම ප්‍රදේශයේ ජීවත් වන සාමාන්‍ය මහ ජනතාවද, ලබා දුන් විවිධ තොරතුරු, අදහස් හා යෝජනාද, මෙම සංවර්ධන සැලැස්ම සඳහා විශාල දායකත්වයක් සැපයූ අතර පර්ශවකරුවන්ගේ රැස්වීම්, වැඩමුළු හා වැඩසටහන් සඳහා සහභාගී වෙමින් දැක්වූ දායකත්වය ඉතා අගය කොට සළකමි.

මෙම සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීමේ ක්‍රියාදාමයේ ආරම්භයේ සිට අවසානය දක්වා සෙවනැල්ලක් මෙන් පසුපසින් සිටිමින්, මනා මාර්ගෝපදේශකත්වයක් හා නායකත්වයක් සපයමින්, නව තාක්ෂණික ක්‍රම උපයෝගී කොට ගෙන නව මුහුණුවරකින් මෙම සැලැස්ම ඉදිරිපත් කිරීම සඳහා ඇප කැප වූ නාගරික සංවර්ධන අධිකාරියේ ගරු සභාපති ආචාර්යය ජගත් මුණසිංහ මැතිතුමා හට අපගේ විශේෂ ස්තූතිය පළ කර සිටින්නෙමු. එමෙන්ම අධ්‍යක්ෂ ජනරාල් ඉංජිනේරු එස්. එස්. පී රත්නායක මැතිතුමා, අතිරේක අධ්‍යක්ෂ ජනරාල්, නියෝජ්‍ය අධ්‍යක්ෂ ජනරාල් (සැලසුම්), සියලුම අධ්‍යක්ෂවරුන්, නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන් ප්‍රමුඛ සමස්ත සැලසුම් කාර්යය මණ්ඩලය හා සෙසු කාර්යය මණ්ඩලය මෙම සැලැස්ම සාර්ථකව නිම කිරීම සඳහා දැක් වූ සහයෝගයට හද පිරි ස්තූතිය පළ කර සිටින්නෙමු.

එමෙන්ම මෙම කාර්යය සඳහා නිරන්තරයෙන් මාර්ගෝපදේශකත්වයක් සැපයූ බස්නාහිර පළාත් අංශය, සංවර්ධන සැලසුම් අංශය, පර්යේෂණ හා සංවර්ධන ඒකකය, භූගෝලීය හා තොරතුරු පද්ධති අංශය, බලාත්මක අංශය, පාරිසරික හා භූ දර්ශන අංශය, ව්‍යාපෘති කළමනාකරණ අංශය, නාගරික පුනර්ජීවන අංශයද ඇතුළු සහයෝගය දැක්වූ සියලුම අංශ වෙතද අපගේ ගෞරවපූර්වක ස්තූතිය හිමි විය යුතු ය. එසේම මෙම සංවර්ධන සැලැස්ම සාර්ථකව නිම කිරීමේ කාර්යය සඳහා නන් අයුරින් සහයෝගය දක්වන ලද සියලුම පාර්ශවකරුවන්ට හද පිරි ප්‍රණාමය පළ කර සිටින්නෙමු.

# ඇමතිතුමාගේ පණිවිඩය



1978 නො.41 නාගරික සංවර්ධන අධිකාරී නීති ප්‍රකාරව පිහිටුවන ලද නාගරික සංවර්ධන අධිකාරිය පිහිටුවා වසර හතළිහක් සම්පූර්ණ වන මේ මොහොත වන විට නාගරික සංවර්ධන අධිකාරිය විසින් ශ්‍රී ලංකාවේ සැලසුම්ගත නාගරික සංවර්ධනයක් උදෙසා ඇප කැප වී සිටී . නවද බස්නාහිර පළාතේ සියලුම නාගරික ප්‍රදේශ සඳහා පුළුල් නාගරික සැලසුම් සකස් කිරීම හරහා නාගරික සංවර්ධන අධිකාරිය විසින් නවත් කඩඉමක් සලකුණු කරමින් සිටී.

රටේ සමාජ, ආර්ථික, දේශපාලනික, සංස්කෘතික ව්‍යුහය තුළ විධිමත් නාගරීකරණයක් ස්ථාපිත කිරීම අභියෝගයකි. විවිධ රජයන් බලයට පත් වීමේදී ජාතික ප්‍රතිපත්තියකින් බැහැරව රටට නොගැලපෙන නාගරික සංවර්ධන සැලසුම් ක්‍රියාත්මක වීම තුළ විවිධ වූ නාගරික අර්බුද නිර්මාණය වී තිබේ. අපේ දේශීය අනන්‍යතාවය ආරක්ෂා කර ගනිමින් , රටට ගැලපෙන සුහුරු නාගරික පද්ධතියක් නිර්මාණය කර ගත යුතු ය. ජන ජීවිත අඩාල වන, හරිත පරිසරය විනාශ වන, ජනතා මුදල් අධි වියදම්කාරී ප්‍රතිලාභ නොලැබෙන, අවිධිමත් සංවර්ධන ව්‍යාපෘති සිදු කිරීම නවතාලිය යුතු ය. ඒ අනුව සැලසුම් සහගතව ව්‍යාපෘති හඳුනා ගනිමින් ප්‍රදේශයේ ආර්ථිකයට ප්‍රතිලාභ ලැබෙන අයුරින් හා මහජනතාවගේ යහපත මෙන්ම ප්‍රදේශයේ විධිමත් සංවර්ධනයක් උදෙසා කටයුතු කල යුතුය.

මගේ අවබෝධය වන්නේ, මෙම මොරටුව සංවර්ධන සැලැස්ම සකස් කිරීම සඳහා නවීන තාක්ෂණය සහ නවීන ක්‍රමවේදයන්, භාවිතා කරන අතරම වෘත්තිකයින්, විශේෂඥයින්, පාර්ශ්වකරුවන් සහ ප්‍රජාවන් සමග පුළුල් ලෙස අදහස් හුවමාරු කර ගන්නා ලද බවයි. මෙම කාර්යය සාර්ථකව නිම කිරීම සඳහා ඇප කැප වුනු නාගරික සංවර්ධන අධිකාරියේ සභාපතිතුමා , අධ්‍යක්ෂ ජනරාල්, සැලසුම් කණ්ඩායම සහ මෙම උත්සාහය සාර්ථක කර ගැනීමට සහය දුන් සියලුම කාර්ය මණ්ඩලයේ කැප වීම මම අගය කරමි. එමෙන්ම , මොරටුව සංවර්ධන සැලැස්ම සාර්ථක කර ගැනීම සඳහා එක්ව කටයුතුකල අදාළ පළාත් පාලන ආයතන, රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ආයතන සහ පොදු ජනතාවගේ සහයෝගය සහ දායකත්වය මම අගය කරමි.

පාඨලී චම්පික රණවක
මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය

# ගරු සභාපතිතුමාගේ පණිවිඩය



වර්තමානයේදී ශ්‍රී ලාංකේය නාගරික පාරිසරික තත්වයන් කළමනාකරණය කිරීමේ වගකීම සමග සැලසුම්කරණය ක්‍රියාත්මක කිරීමේ ප්‍රමුඛතම ආයතනය වන්නේ නාගරික සංවර්ධන අධිකාරියයි. නාගරික ප්‍රදේශයන්හි සියලු ජනතාවගේ පොදු යහපත සදහා සංවර්ධනය ප්‍රවර්ධනය සහ නියාමනය කිරීම උදෙසා ඒකබද්ධ සැලසුම්කරණය සහ ක්‍රියාවට නංවාලීමේ අරමුණින් 1978 වර්ෂයේදී අධිකාරිය ස්ථාපනය ලදී.

සංශෝධිත නාගරික සංවර්ධන අධිකාරී නීති 1982 නො 4 (Part II section 8A (10)) ප්‍රකාරව විෂය භාර අමාත්‍යවරයා විසින් නියමකරන අවස්ථාවක නාගරික සංවර්ධන ප්‍රදේශ සඳහා සංවර්ධන සැලසුම් සකස් කිරීම සහ බලාත්මක කරනු ලබන්නේ එම නීති විධිවිධානවලට අනුවයි . මොරටුව මහ නගර සභාව නාගරික සංවර්ධන ප්‍රදේශයක් ලෙස සලකා බලා නාගරික සංවර්ධන අධිකාරිය විසින් මොරටුව මහ නගර සභා ප්‍රදේශය සඳහා සංවර්ධන සැලැස්ම සකස් කිරීමට කටයුතු කරන ලදී.

මෙම සැලැස්ම ක්‍රියාවට නැංවීම සඳහා වූ අපගේ ගමන් මාර්ගය සේද මෙන් මෘදු නොවනු අතර , අභියෝගයන්ගෙන් පිරුණු, රළු හා අවිනිශ්චිතතාවන්ගෙන් පිරුනු එකක් විය. එහෙත් අද වන විට එම අවිනිශ්චිතතාවයන් හරහා මතුවන අභියෝගයන්ට මුහුණ දීම සඳහා අවශ්‍ය පද්ධති, මෙවලම් හා ක්‍රමෝපායන් නාගරික සංවර්ධන අධිකාරිය සතුව පවතී.

නාගරික සංවර්ධන අධිකාරියේ මෙම මහඟු කාර්යය ඉටුකිරීමට කැප වූ කණ්ඩායමට මගේ අවංක කෘතඥතාව පිරිනැමීම සඳහා මම මෙය අවස්ථාවක් කරගන්නා අතර විවිධාකාරයෙන් ආධාර ලබා දුන් සහ කැපවීමෙන් කටයුතුකල සියලු දෙනාම මෙම මොරටුව සංවර්ධන සැලැස්ම සාර්ථකව ක්‍රියාවට නංවාලීම සඳහාද සමානව අඛණ්ඩ සහයෝගය ලබා දෙනු ඇතැයි බලාපොරොත්තු වෙමි.

*ආචාර්ය ජගත් මුණසිංහ*
*සභාපති*
*නාගරික සංවර්ධන අධිකාරිය*

# ගරු නගරාධිපතිතුමාගේ පණිවිඩය



මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශයේ, නාගරික සංවර්ධන අධිකාරිය මගින් මොරටුව මහ නගර සභා බල ප්‍රදේශය සඳහා සංශෝධිත සංවර්ධන සැලැස්මක් සකස් කර මේ ආකාරයෙන් නීත්‍යානුකූලව ප්‍රකාශයට පත් කිරීම පිලිබඳව ප්‍රථමයෙන් මගේ හද පිරි ස්තූතිය පිරි නමමි.

ප්‍රදේශයේ පවතින ගැටළු හා අවශ්‍යතාවයන් හඳුනා ගනිමින් ප්‍රදේශයේ මහජනතාවගේ මෙන්ම රටේම ජනතාවගේ සුබ සිද්ධිය සඳහා මෙවැනි සංවර්ධන සැලැස්මක් සකස් කිරීම විධිමත් සංවර්ධනයක් සඳහා ඉතාමත් යෝග්‍ය වේ. අපගේ අදහස් මෙන්ම ප්‍රදේශයේ සේවයේ යෙදෙන රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන කාර්යයමණ්ඩලය, ප්‍රදේශවාසීන් හා සංවර්ධන ආයෝජකයින් යනාදී විවිධ අංශ නියෝජනය වන පරිදි පාර්ශවකරුවන් සම්බන්ධ කර ගනිමින් මෙම සංවර්ධන සැලැස්ම සකස් කිරීම අගය කල යුතුය.

ප්‍රදේශයේ සංවර්ධනය විධිමත් කරමින්, මහජනතාවගේ සුබ සිද්ධිය සඳහා මෙම සංවර්ධන සැලැස්ම විධිමත් ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ශක්තිය නොමදව ලැබේවායි ප්‍රාර්ථනා කරමි.

සමන්ලාල් ප්‍රනාන්දු
ගරු නගරාධිපති,
මොරටුව මහ නගර සභාව

# පූර්විකාව

1978 අංක 41 දරණ නාගරික සංවර්ධන අධිකාරී පනතේ 3(1) සහ (2) යන වගන්තියේ බලතල ප්‍රකාර යම් ප්‍රදේශයක් නාගරික සංවර්ධන බල ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කිරීමට නාගරික සංවර්ධනය පිළිබඳ විෂයභාර අමාත්‍යවරයා හට බලතල පැවරී ඇති අතර ඒ අනුව 1979 මාර්තු මස 07 දිනැති අංක 26/8 දරණ අති විශේෂ ගැසට් නිවේදනය මගින් නාගරික සංවර්ධනය පිළිබඳ විෂයභාර අමාත්‍යවරයා විසින් මොරටුව බල ප්‍රදේශය, නාගරික සංවර්ධන බල ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කොට ඇත.

මොරටුව මහ නගර සභා බල ප්‍රදේශය සඳහා  2019 – 2030 කාල පරිච්ඡේදය ආවරණය වන පරිදි කෙරෙන මෙම සංවර්ධන සැලැස්ම ප්‍රදේශයේ ජනතාවට භෞතික, ආර්ථික, පාරිසරික හා සමාජයීය වශයෙන් තිරසාර සංවර්ධනයක් ලඟා කර දීමේ  අරමුණින් පිළියෙළ කර ඇති අතර 2018 දක්වා කාලය තෙක් ප්‍රදේශය ආශ්‍රිතව වූ තොරතුරු මේ සඳහා  උපයෝගී කර ගන්නා ලදී.

මෙම සංවර්ධන සැලැස්ම පළමුවන හා දෙවන වෙළුම ලෙස ග්‍රන්ථ දෙකකින් යුක්ත වන අතර පළමුවන වෙළුම පළමු කොටස හා දෙවන කොටස ලෙස කොටස් දෙකකින් සමන්විත වේ. එහි පළමුවන කොටස පරිච්ඡේද තුනකින් පැහැදිලි කර ඇති අතර එහි පළමු වන පරිච්ඡේදය මගින් මොරටුව සංවර්ධන සැලැස්මේ විෂය පථය, සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම සඳහා දායකත්වය ලබා දෙන ලද පාර්ශ්වකරුවන් හා උපදේශන ආයතන හා සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීමේදී අනුගමනය කරන ලද සැලසුම් පියවර පිළිබඳ විස්තර කර ඇත.

දෙවන පරිච්ඡේදය මගින් මොරටුව ප්‍රදේශයේ ඓතිහාසික පසුබිම හා භෞතික, ආර්ථික, පාරිසරික හා සමාජයීය අංශ යටතේ සැලසුම් හා තත්ත්ව සන්දර්භය පිළිබඳව  දීර්ඝ ලෙස විග්‍රහ කර ඇති අතර මොරටුව ප්‍රදේශය සතු ජාතික හා කලාපීකරණ සබඳතා, පූර්ව සැලසුම් ප්‍රයත්න හා එහි වැදගත්කම පිළිබඳව  මෙන්ම මොරටුව සංවර්ධන සැලැස්ම සකස් කල යුතු සැලසුම් සීමාව නිර්ණය කිරීමද මෙහිදී සාකච්ඡා කොට ඇත.

ප්‍රාථමික හා ද්විතීයික දත්ත විශ්ලේෂණය තුළින්  හඳුනාගත් ගැටළු විශ්ලේෂණය කිරීම මගින් මොරටුව සැලසුම් ප්‍රදේශය සඳහා සංවර්ධන සැලැස්මක් පිළියෙළ කිරීමේ අවශ්‍යතාවය පිළිබඳව තෙවන පරිච්ඡේදයේදී  දීර්ඝ වශයෙන් සාකච්ඡා කරනු ලබයි.

සංවර්ධන සැලැස්මේ දෙවන කොටස සිව්වන පරිච්ඡේදයෙන් ආරම්භ වන අතර සංවර්ධන සැලැස්ම මගින් අපේක්ෂිත දැක්ම එම දැක්ම සාක්ෂාත් කර ගැනීම සඳහා වන අරමුණු හා ඊට අදාළ පරමාර්ථද මෙහිදී දීර්ඝ වශයෙන් සාකච්ඡාවට භාජනය වේ.

මොරටුව සැලසුම් බල ප්‍රදේශය තුළ හඳුනා ගන්නා ලද ශක්තීන්, දුර්වලතා, සංවර්ධන අවස්ථා හා තර්ජන පස් වන පරිච්ඡේදය මගින් සවිස්තරාත්මක ලෙස විශ්ලේෂණය කර ඇත.

මෙම සැලැස්මේ දීර්ඝ කාලීන අරමුණු ඔස්සේ දැක්ම ලඟා කර ගැනීමට හා අපේක්ෂිත අනාගත සංවර්ධනය ලගා කර ගැනීමට ඉඩ ප්‍රස්ථාව විවර කර ගන්නා ආකාරය පිළිබදව හය වන පරිච්ඡේදය යටතේ පැහැදිලි කරනු ලබයි. එහිදී 2019–2030 කාල පරිච්ඡේදය සඳහා  හඳුනා ගන්නා ලද සංවර්ධන උපක්‍රම හරහා යෝජිත භූමි පරිහරණ සැලැස්ම සම්බන්ධව සාකච්ඡා කරන අතර අපේක්ෂිත අරමුණු කරා යාම පිණිස සමාජයීය  හා භෞතික අපරව්‍යුහ පහසුකම් සංවර්ධන උපක්‍රම, ආර්ථික සංවර්ධන උපක්‍රම හා තිරසාර පරිසර සංවර්ධන උපක්‍රම හා එකී උපායමාර්ගික සැලසුම් ක්‍රියාත්මක කිරීම සඳහා යෝජිත සංවර්ධන ව්‍යාපෘති පිළිබදවද දීර්ඝ වශයන් විස්තර කරනු ලබයි.

දෙවන වෙළුමෙහි පළමු පරිච්ඡේදය මගින් සංවර්ධන සැලැස්ම තුළින්  හඳුනා ගන්න ලද කලාප හා ඒවායේ මායිම් එක් එක් කලාපයන්ට අනන්‍ය වූ රෙගුලාසි පිළිබඳව පැහැදිලි කරන අතර දෙවන පරිච්ඡේදයේ "සැලසුම් හා ගොඩනැඟිලි රෙගුලාසි" විස්තරාත්මකව දක්වා ඇති අතර, එමගින් ඉහත කලාපයන්හී ඉඩම් හා ගොඩනැඟිලි සංවර්ධනයන් සඳහා බල  පැවැත්වෙන රෙගුලාසි හදුන්වා දීමක් සිදු කොට ඇත.

# පටුන


| | |
|---|---|
| ප්‍රණාමය | III |
| ගරු අමාත්‍යතුමාගේ පණිවිඩය | IV |
| ගරු සභාපතිතුමාගේ පණිවිඩය | V |
| ගරු නගරාධිපතිතුමාගේ පණිවිඩය | VI |
| පූර්විකාව | VII |
| පටුන | VII |
| පළමුවන කොටස | |
| පරිච්ඡේදය 01 : සංවර්ධන සැලැස්මේ පසුබිම | 01 – 06 |
| 1.1. හැඳින්වීම | 02 |
| 1.2. සංවර්ධන සැලැස්මේ පාර්ශවකරුවන් | 02 |
| 1.3. සංවර්ධන සැලැස්මේ විෂය පථය | 04 |
| 1.4.සැලසුම් ක්‍රියාවලිය | 05 |
| පරිච්ඡේදය 02 : මූලික අධ්‍යයනය | 07 – 41 |
| 2.1. අධ්‍යයන ප්‍රදේශය | 08 |
| 2.2. සැලසුම් හා තත්ත්ව සන්දර්භය | 10 |
| 2.3. සැලසුම් ප්‍රදේශය නිර්ණය කිරීම | 40 |
| පරිච්ඡේදය 03 : සංවර්ධන සැලැස්මක අවශ්‍යතාවය | 43 – 50 |
| 3.1. හැඳින්වීම | 44 |
| 3.2. ගැටළු හඳුනා ගැනීම | 44 |
| දෙවන කොටස | |
| ගරු අමාත්‍යතුමාගේ අනුමැතිය | 52 |
| ගැසට් නිවේදනය | 53 |
| පරිච්ඡේදය 04 : සංවර්ධන සැලසුම් රාමුව | 55 –59 |
| 4.1. සංවර්ධන සැලැස්මේ දැක්ම | 56 |
| 4.2. දැක්මෙහි ප්‍රකාශනය | 57 |
| 4.3. සංවර්ධන සැලැස්මේ අරමුණු | 58 |
| 4.4. සංවර්ධන සැලැස්මේ පරමාර්ථ | 58 |
| පරිච්ඡේදය 05 : SWOT විශ්ලේෂණය | 61 –86 |
| 5.1. සාරාංශගත SWOT විශ්ලේෂණය | 62 |
| 5.2. විස්තරාත්මක SWOT විශ්ලේෂණය | 65 |
| පරිච්ඡේදය 06 : සංවර්ධන සැලැස්ම | 87 –176 |
| 6.1. සංකල්පිත සැලැස්ම | 88 |
| 6.2. යෝජිත භූමි පරිහරණ සැලැස්ම | 90 |

6.3. අපරව්‍යුහ පහසුකම් සංවර්ධනය කිරීමේ උපායමාර්ගික සැලැස්ම 93

6.3.1. සේවා කළමනාකරණ සැලැස්ම 93
6.3.2. මාර්ග ප්‍රවාහන සැලැස්ම 100
6.3.3. ජල සැපයුම් සැලැස්ම 115
6.3.4. විදුලි සැපයුම් සැලැස්ම 117
6.3.5. මළ හා අපජල කළමනාකරණ සැලැස්ම 119
6.3.6. ඝන අපද්‍රව්‍ය කළමනාකරණ සැලැස්ම. 122

6.4. ආර්ථික සංවර්ධන උපායමාර්ගික සැලැස්ම 124
6.5. තිරසාර පරිසර සංවර්ධන උපායමාර්ගික සැලැස්ම 129

6.5.1. පාරිසරික සංරක්ෂණ සැලැස්ම 131
6.5.2. භූ දර්ශන කළමනාකරණ සැලැස්ම 133
6.5.3. පොදු එළිමහන් හා විනෝද කටයුතු පිළිබඳ අවකාශීය සැලැස්ම 136
6.5.4. ආපදා කළමනාකරණ සැලැස්ම 139

6.6. ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ උපායමාර්ගික සැලැස්ම 140

කෙටි යෙදුම් 177
සිතියම් ලැයිස්තුව 178
රූප සටහන් ලැයිස්තුව 178
වගු ලැයිස්තුව 180
ඇමුණුම් 181
පරිශීලිත ග්‍රන්ථ



# පළමු කොටස

# 01
පරිච්ඡේදය



# සංවර්ධන සැලැස්මේ පසුබිම

01 පරිච්ඡේදය
සංවර්ධන
සැලැස්මේ පසුබිම

හැඳින්වීම

සංවර්ධන සැලැස්මේ
පාර්ශවකරුවන්

## 1.1. හැඳින්වීම

නාගරික සංවර්ධන ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කරනු ලබන ප්‍රදේශයන්හි ආර්ථික, භෞතික, සමාජයීය හා පාරිසරික යන අංශ කෙරෙහි අවධානය යොමු කරමින්, එම අංශ ප්‍රවර්ධනය කිරීම හා විධිමත් කිරීම සඳහා ඒකාබද්ධ වූ සැලැස්මක් සකස් කිරීම සංවර්ධන සැලැස්මක් සකස් කිරීම ලෙස හැඳින්විය හැක.

1978 අංක 41 දරණ නාගරික සංවර්ධන අධිකාරි පනතේ 3(1) සහ (2) වගන්තියේ බලතල ප්‍රකාර යම් ප්‍රදේශයක් නාගරික සංවර්ධන බල ප්‍රදේශයක් ලෙස නාගරික සංවර්ධනය පිළිබඳ විෂයභාර අමාත්‍යවරයා විසින් ප්‍රකාශයට පත් කරනු ලැබිය හැකි අතර එසේ ප්‍රකාශයට පත් කරනු ලැබූ ප්‍රදේශ සඳහා සංවර්ධන සැලසුම් සකස් කිරීමේ බලතල 1982 අංක 4 දරණ නාගරික සංවර්ධන අධිකාරි (සංශෝධිත) පනතේ 8 II අ යටතේ නාගරික සංවර්ධන අධිකාරිය වෙත පැවරී ඇත.

1930 වර්ෂයේදී නගර සභා බල ප්‍රදේශයක් ලෙස පැවති මොරටුව නගරය 1998 වර්ෂයේදී මහ නගර සභාවක් ලෙස ප්‍රකාශයට පත් කර ඇති අතර, 1979 මාර්තු මස 07 දිනැති අංක 26/8 දරණ අති විශේෂ ගැසට් නිවේදනය ප්‍රකාර නාගරික සංවර්ධනය පිළිබඳ විෂයභාර අමාත්‍යවරයා විසින් මොරටුව, නාගරික සංවර්ධන බල ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කොට ඇත. ඒ අනුව එකී බල ප්‍රදේශය සඳහා නාගරික සංවර්ධන අධිකාරිය මගින් ප්‍රථම වරට 2005 – 2020 සඳහා පිළියෙළ කරනු ලැබූ සංවර්ධන සැලැස්ම 2005 ජුනි 07 දිනැති අංක 1396/7 දරණ ගැසට් නිවේදනය මගින් ප්‍රකාශයට පත් කර ඇත.

2005–2020 සඳහා සකස් කරන ලද මොරටුව සංවර්ධන සැලැස්මෙහි වලංගු කාලය ඉකුත් වීමට ආසන්නව පැවතීමත්, ප්‍රදේශයේ නව භෞතික, ආර්ථික, පාරිසරික හා සමාජයීය අංශ සඳහා උපායශීලී මැදිහත් වීමක අවශ්‍යතාවය මතුවීම හේතුවෙන් මොරටුව නගරය සඳහා නව සංවර්ධන සැලැස්මක් සකස් කිරීමේ කටයුතු නාගරික සංවර්ධන අධිකාරිය මගින් ආරම්භ කරන ලදී.

## 1.2. සංවර්ධන සැලැස්මේ පාර්ශවකරුවන්

මොරටුව සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීමේදී ප්‍රධාන වශයෙන් ප්‍රදේශයේ සංවර්ධන කටයුතුවල නියුතු සියලු පාර්ශවකරුවන් සම්බන්ධ කර ගැනීමට අදහස් කරන ලද අතර කර්මාන්ත, පාරිසරික, ආර්ථික, පරිපාලන හා යටිතල පහසුකම් ආදී අංශ නියෝජිත ආයතනයන්ගේ අදහස් හා යෝජනා සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීමට උපයෝගී කර ගන්නා ලදී. එම පාර්ශවකරුවන් පහත පරිදි පෙල ගස්වනු ලැබේ.

### මූලික පාර්ශවකරු

1. *මොරටුව මහ නගර සභාව*

### උපදේශන ආයතන

1. *මොරටුව ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලය*
2. *ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව*
3. *ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව*
4. *ජාතික ව්‍යවසායකත්ව සංවර්ධන අධිකාරිය*
5. *මධ්‍යම පරිසර අධිකාරිය*
6. *වෙරළ සංරක්ෂණ දෙපාර්තමේන්තුව*
7. *ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව*

8. ජාතික නිවාස සංවර්ධන අධිකාරිය
9. ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාව
10. ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය
11. මාර්ග සංවර්ධන අධිකාරිය
12. ශ්‍රී ලංකා ටෙලිකොම්
13. මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය
14. මොරටුව පොලිස් ස්ථානය
15. ද සොයිසා දිස්ත්‍රික් රෝහල- ලුනාව
16. ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය
17. සිවිල් ගුවන් සේවා අධිකාරිය
18. ගොඩනැගිලි දෙපාර්තමේන්තුව
19. ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය
20. ඉඩම් පරිහරණ ප්‍රතිපත්ති සැලසුම් දෙපාර්තමේන්තුව
21. මොරටුව විශ්වවිද්‍යාලය
22. කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය
23. ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය
24. ලංකා විදුලි පුද්ගලික සමාගම
25. ලංකා විදුලිබල මණ්ඩලය

## අනෙකුත් පාර්ශවකරුවන්

1. වඩු කර්මාන්ත සංගමය- මොරටුව
2. ත්‍රීරෝද රථ සංගමය- මොරටුව
3. වෙළඳ සංගමය- මොරටුව
4. ධීවර සංගමය- මොරටුව

## ප්‍රධාන සැලසුම් කණ්ඩායම, නාගරික සංවර්ධන අධිකාරිය

1. වයි.ඒ.ජී.කේ. ගුණතිලක මහතා අධ්‍යක්ෂ (බස්නාහිර පළාත් අංශය)
2. ජනක් රණවීර මහතා- හිටපු අධ්‍යක්ෂ (බස්නාහිර පළාත් අංශය)
3. දයානි ෆ්‍රැන්සිස් මෙනෙවිය- නියෝජ්‍ය අධ්‍යක්ෂ (සැලසුම්) බස්නාහිර පළාත් අංශය
4. නමරා ජයගොඩ මහත්මිය- නියෝජ්‍ය අධ්‍යක්ෂ (සැලසුම්) බස්නාහිර පළාත් අංශය
5. බී.එල්. රංජිත් මහතා- සහකාර අධ්‍යක්ෂ (සැලසුම්) බස්නාහිර පළාත් අංශය
6. පී.ඩී.සී. ජයමාලි ජයවර්ධන මහත්මිය- (සැලසුම් සහකාර නිලධාරී)
   බස්නාහිර පළාත් අංශය
7. ශානිකා සුමනපාල මහත්මිය- සහකාර සැලසුම් නිලධාරී
8. (පර්යේෂණ හා සංවර්ධන ඒකකය)
9. මොනාලි රූපසිංහ මෙනෙවිය- සහකාර සැලසුම් නිලධාරී
   (පර්යේෂණ හා සංවර්ධන ඒකකය)

## අනෙකුත් සහයෝගිතා සැලසුම් කණ්ඩායම් – නාගරික සංවර්ධන අධිකාරිය

1. සංවර්ධන සැලසුම් අංශය
2. පර්යේෂණ හා සංවර්ධන ඒකකය
3. භූගෝලීය තොරතුරු පද්ධති අංශය
4. පරිසර හා භූදර්ශන අංශය

# 1.3. සංවර්ධන සැලැස්මේ විෂය පථය

කොළඹ දිස්ත්‍රික්කයට අයත් ප්‍රධාන මහ නගර සභාවක් වන මොරටුව නගරය හරහා දිවෙන කොළඹ-ගාල්ල ප්‍රධාන මාර්ගය හා මුහුදුබඩ දුම්රිය මාර්ගය හේතුවෙන් බස්නාහිර පළාත හා දකුණු පළාත අතර කලාපීය සබඳතාවක් ගොඩ නැඟී ඇත. එසේම ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව මගින් පිළියෙල කරන ලද ජාතික භෞතික ව්‍යුහාත්මක සැලැස්ම 2030 අනුව මොරටුව නගරය කොළඹ අධි නාගරීකරණ කලාපය තුළද යෝජිත අවකාශීය ව්‍යුහාත්මක සැලැස්ම 2050 අනුව මොරටුව නගරය ආර්ථික කොරිඩෝව තුළද පිහිටා ඇති අතර බස්නාහිර කලාපීය මහනගර සැලැස්මට අනුව මොරටුව අධි ඝනත්ව කලාපය තුළ  පිහිටා ඇත. කොළඹ මහා නාගරික කලාපීය ව්‍යුහාත්මක සැලැස්මට අනුව මොරටුව නගරය දෙවන පෙළ නගරයක් ලෙස සංවර්ධනය කිරීමට යෝජනා වී ඇති බැවින් හා ඉහත සදහන් සැලසුම් පිළිබඳව සලකා බලා මොරටුව නගරය දෙවන පෙළ නගරයක් ලෙස සංවර්ධනය කිරීමට අපේක්ෂා කරනු ලබයි.

කොළඹ නගරයට ඉතා ආසන්නව පිහිටි මොරටුව නාගරික පරිසරයකට හිමිකම් කියනු ලැබුවද දර්ශනීය මුහුදු තීරය, බොල්ගොඩ ගංඟාව හා ලුනාව කලපුවෙන් වට වූ ස්වාභාවික පිහිටීම අනුව මොරටුව නගරය ස්වභාව සෞන්දර්යයෙන් පරිපූර්ණ නගරයක් ලෙසට හැදින්විය හැකිය. කෙසේ වුවද නගරයේ සිදු වන අවිධිමත් ක්‍රියාකාරකම් හේතුවෙන් පැන නැඟී ඇති පාරිසරික හා සමාජයීය ගැටළු මඟහරවා ගනිමින් විධිමත් සංවර්ධනයක් කරා ලඟා වීමට උපාය මාර්ගික නාගරික සංවර්ධන සැලැස්මක අවශ්‍යතාවය පැන නැඟී ඇත.

කොළඹ වාණිජ නගරයේ සිදු වන නාගරීකරණයට සමගාමීව මොරටුව නාගරීකරණය වීමත් සමඟ ඇති විය හැකි ගැටළු අවම කර ගනිමින් විධිමත් සංවර්ධනයක් කරා යොමු කිරීමේ අරමුණ ඇතිව ප්‍රවාහන හා ගමනාගමන පහසුකම් වැඩිදියුණු කිරීම තුළින්  හරිත නේවාසික නගරයක් බිහි කිරීමට අදහස් කරනු ලබන අතර 2030 වසර වන විට මෙම තත්ත්වය ලඟා කර ගැනීම සඳහා තිරසාර පාරිසරික සංවර්ධන උපායමාර්ග, අපරව්‍යුහ පහසුකම් සංවර්ධන උපායමාර්ග, ආර්ථික සංවර්ධන උපායමාර්ග හා ජනාවාස සංවර්ධන උපායමාර්ග පදනම් කර ගනිමින් භෞතික, සමාජයීය, ආර්ථික හා පාරිසරික යන අංශයන්හි තිරසාර සංවර්ධනය උදෙසා සැලසුම් සම්පාදනය කරන ලදි.

2019–2030 සඳහා පිළියෙල කරනු ලබන මොරටුව සංවර්ධන සැලැස්මේ සඳහන් උපායමාර්ග සැලසුම් මගින් ඉහත කී අංශ සඳහා ඒකාබද්ධ නාගරික සංවර්ධන සැලැස්මක් ඉදිරිපත් කරන අතර, මෙම සැලැස්ම පිළියෙල කිරීම සඳහා පාදක වූ දැක්ම දිර්ඝකාලීන වුවද සංවර්ධන සැලැස්ම අවුරුදු 12 ක කාල පරිච්ඡේදයක් වෙනුවෙන් පිළියෙල කිරීම සීමාවක් ලෙස දැක්විය හැකිය. වර්තමාන භූමි පරිහරණ රටාව පිළිබඳව සැලකීමේදී මොරටුව ප්‍රදේශය වාණිජ හා කර්මාන්ත භාවිතය සඳහා වැඩි නැඹුරුතාවයක් පෙන්නුම් කරනු ලැබුවද කොළඹ හර ප්‍රදේශයේ සංවර්ධනය හා බැදුණු ජලාභිමුඛ සංවර්ධනයක් මොරටුව ප්‍රදේශය තුළ  ඇති කිරීම තුළින් සංචාරක කර්මාන්තය දියුණු කිරීම මෙම සැලැස්මේ සීමාවක් ලෙස දැක්විය හැකිය.

## 1.4. සැලසුම් ක්‍රියාවලිය

| | |
|---|---|
| පසුබිම් අධ්‍යයනය | ප්‍රාථමික හා ද්විතියික දත්ත රැස් කිරීම: ක්ෂේත්‍ර සමීක්ෂණය, විවිධ පාර්ශ්වකරුවන් සමඟ සිදු කරනු ලැබූ සම්මුඛ සාකච්ඡා, කාර්යාල දත්ත, අන්තර්ජාලය, ගූගල් සිතියම්, ලේඛන පරිශීලනය මගින් දත්ත රැස් කිරීම සිදු කරන ලදී. මෙහිදී මූලික අධ්‍යයනයන් හා දත්ත විශ්ලේෂණය සිදු කරනු ලැබූ අතර, එහිදී භූගෝලීය වශයෙන් මෙන්ම ඓතිහාසික වශයෙන්ද මොරටුව ප්‍රදේශයේ ඇති වැදගත්කම, කලාපීය සබඳතා හඳුනා ගැනීම, ආර්ථික, සමාජීය, පාරිසරික හා භෞතික අංශ ආවරණය වන පරිදි ප්‍රාථමික අධ්‍යයනයන් සිදු කර මෙම ප්‍රදේශය පිළිබඳ මනා අවබෝධයක් ලබා ගැනීම. (2017 ජූනි සිට නොවැම්බර් දක්වා) |
| විෂය පථය | දැනට ප්‍රදේශයේ පවතින තත්ත්වය විශ්ලේෂණය කිරීම හා සංවර්ධන ප්‍රවණතා හඳුනා ගැනීම. (2017 නොවැම්බර් සිට 2018 ජනවාරි දක්වා) |
| ගැටළු හා විභවතා හඳුනා ගැනීම | 2017-12-11 වන දින විවිධ අංශයන්හී නියුතු පාර්ශවකරුවන් සම්බන්ධ කර ගනිමින් නැව්රෝ බීච් හෝටලයේදී පැවති වැඩමුළුවේදී ලබා ගත් අදහස් හා යෝජනා සමඟ දත්ත විශ්ලේෂණය තුලින් ගැටළු හා විභවතා හඳුනා ගැනීම. (2017 දෙසැම්බර් සිට 2018 පෙබරවාරි දක්වා) |
| දැක්ම සහ අරමුණු | ගැටළු, විභවතා හා සංවර්ධන ප්‍රවණතා අනුව ආර්ථික, භෞතික, පාරිසරික හා සමාජීය යන අංශ ඒකාබද්ධව නාගරික සංවර්ධන කටයුතු සපුරා ගැනීම සඳහා දැක්ම, අරමුණු හා පරමාර්ථ ගොඩ නැගීම. (2018 මාර්තු සිට මැයි දක්වා) |
| විස්තරාත්මක විශ්ලේෂණය | SWOT විශ්ලේෂණය මගින් දැක්ම හා අරමුණු පදනම් කර ගත් සවිස්තරාත්මක ලෙස දත්ත විශ්ලේෂණය කිරීම. (2018 මැයි සිට අගෝස්තු දක්වා) |
| සැලසුම් සහ උපායමාර්ග | දැක්ම හා අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා මොරටුව මහ නගර සභා බල ප්‍රදේශය සඳහා වන සංකල්පිත සැලැස්ම තුලින් 2030 භූමි පරිභරණ රටාව සැලසුම් කිරීම හා රට අදාල වූ අපරවයුහ පහසුකම් සංවර්ධනය, ආර්ථික සංවර්ධනය හා තිරසාර පරිසර සංවර්ධනය උදෙසා වූ උපායමාර්ග සැලසුම් වලට අමතරව ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ උපායමාර්ග සැලසුම් පිළියෙල කිරීම. (2018 අගෝස්තු සිට නොවැම්බර් දක්වා) |
| සැලසුම් සහ රෙගුලාසි | සැලසුම් හා ගොඩනැගිලි රෙගුලාසි සකස් කිරීම: ඉඩම් සංවර්ධනය සම්බන්ධ නීති රීති, ඉඩම් පරිහරණය සම්බන්ධ නීති රීති, පාරිසරික සංවේදී ප්‍රදේශ සංවර්ධනය කිරීමට අවශ්‍ය නීති රීති මෙන්ම සංවර්ධන සැලැස්ම කරා ලඟා වීමේදී උද්ගත වේ යැයි හැඟෙන ගැටලුකාරී තත්ත්ව මඟ හරවා ගැනීම සඳහා රෙගුලාසි සකස් කිරීම. (2018 දෙසැම්බර් සිට මාර්තු දක්වා) |

**අදහස් ලබා ගැනීම**

සංවර්ධන සැලැස්ම සඳහා පාර්ශවකරුවන්ගේ අදහස්, යෝජනා, විරෝධතා හා සංශෝධන ලබා ගැනීමට කටයුතු කිරීම හා නාගරික සංවර්ධන අධිකාරියේ වෘත්තීයවේදීන් වෙත සංවර්ධන සැලැස්ම ඉදිරිපත් කිරීම.

**දළ සැලසුම් වාර්ථාව භාර දීම**

සංවර්ධන සැලැස්ම ප්‍රධාන සැලසුම් කමිටුව වෙත ඉදිරිපත් කිරීම හා සංවර්ධන සැලසුම් අංශය වෙත භාර දීම.

**අනුමැතිය හා ප්‍රකාශයට පත් කිරීම**

සංවර්ධන සැලැස්ම සඳහා නාගරික සංවර්ධන අධිකාරියේ කළමනාකරණ මණ්ඩලයේ හා ගරු ඇමතිතුමාගේ අනුමැතිය ලබා ගැනීම හා ගැසට් පත්‍රයේ පළ කොට නීතිගත කිරීම.

***රූප සටහන 1.1 :** සැලසුම් ක්‍රියාවලිය*

# 02

## පරිච්ඡේදය



# මූලික අධ්‍යයනය

වර්තමාන සැලසුම් ප්‍රදේශයේ තත්ත්ව සන්දර්භය අධ්‍යයනය තුළින් නුදුරු අනාගතයේ මෙන්ම ඉදිරි වසර 12 ක කාල පරිච්ඡේදය තුළදී ක්‍රියාත්මක කිරීමට හැකි සංවර්ධන යෝජනා ඉදිරිපත් කිරීම සඳහා දායක කර ගත යුතු සංවර්ධන ප්‍රවණතා හඳුනා ගනු ලැබීය. ඒ අනුව මෙම පරිච්ඡේදය අධ්‍යයන ප්‍රදේශය, සැලසුම් හා තත්ත්ව සන්දර්භය හා සැලසුම් ප්‍රදේශය නිර්ණය කිරීම ලෙස ප්‍රධාන කොටස් තුනකින් සමන්විත වේ.

අධ්‍යයන ප්‍රදේශය යටතේ මොරටුව නගරයේ ස්ථානීය පිහිටීම හා භෞතික මායිම් පිළිබඳව හඳුනා ගත් අතර සැලසුම් හා තත්ත්ව සන්දර්භය යටතේ මොරටුව නගරයේ ඓතිහාසික පසුබිම, භෞතික, සමාජයීය, ආර්ථික, පාරිසරික ලක්ෂණ, පූර්ව සැලසුම් ප්‍රයත්න හා වත්මන් භූමි පරිහරණ රටාව පිළිබඳව අධ්‍යයනය කරන ලදි. සැලසුම් ප්‍රදේශය නිර්ණය කිරීමේදී ඉහත කරුණු සියල්ල සලකා බලන ලද අතර මොරටුව සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම සඳහා ක්‍රියාකාරී සීමාව හා පරිපාලන සීමාව ආශ්‍රයෙන් සැලසුම් සීමාව නිර්ණය කරන ලදි.

## 2.1. අධ්‍යයන ප්‍රදේශය

බස්නාහිර පළාතේ කොළඹ දිස්ත්‍රික්කයේ කොළඹ– ගාල්ල ප්‍රධාන මාර්ගයේ කොළඹ සිට කිලෝ මීටර 19 ක් දකුණින් පිහිටා ඇති මොරටුව මහ නගර සභා බල ප්‍රදේශය තුන් පැත්තකින් ස්වාභාවික මායිම් වලින් වට වූ වර්ග කිලෝ මීටර 23.4 ක වපසරියකින් සමන්විත භූමි ප්‍රදේශයකි. බටහිරින් දර්ශනීය මුහුදු තීරයකින්ද, නැගෙනහිරින් හා දකුණින් බොල්ගොඩ ගංගාවෙන්ද ලෙස තුන් පසෙකින් ජලතීරයන්ට මායිම්ව පිහිටා ඇති නාගරික බල ප්‍රදේශයක් වන මොරටුව මහ නගර සභා බල ප්‍රදේශය කොළඹ දිස්ත්‍රික්කයට ඇතුළ ත් මහ නගර සභා පහෙන් එකක් ලෙස හැඳින්විය හැකි අතර, ග්‍රාම නිලධාරී වසම් 42 කින් සමන්විතය. රූප සටහන් අංක 2.1 මගින් මොරටුව මහ නගර සභා ප්‍රදේශයේ ස්ථානීය පිහිටීම නිරූපනය කරනු ලබයි.

එමෙන්ම උතුරින් රත්මලාන ප්‍රාදේශීය මහ ලේකම් කොට්ඨාශය, නැගෙනහිරින් බොල්ගොඩ ගඟ හා කැස්බෑව ප්‍රාදේශීය මහ ලේකම් කොට්ඨාශය, බටහිරින් කි.මී. 10.5 ක පමණ වන වෙරළ තීරය, දකුණෙන් බොල්ගොඩ ගඟ හා කළුතර දිස්ත්‍රික්කය මොරටුව මහ නගර සභා බල ප්‍රදේශයේ භෞතික හා පරිපාලන සීමාව වේ.




***රූප සටහන 2.1 :*** *මොරටුව මහ නගර සභා ප්‍රදේශයේ ස්ථානීය පිහිටීම*
***මූලාශ්‍රය :*** *නාගරික සංවර්ධන අධිකාරිය, 2018*


# 2.2. සැලසුම් සහ තත්ත්ව සන්දර්භය

මොරටුව නගරයේ සැලසුම් සන්දර්භය සහ තත්ත්ව විශ්ලේෂණය අධ්‍යයනය සඳහා මූලිකව නගරයේ ඓතිහාසික තත්ත්වය අධ්‍යයනය කරනු ලැබූ අතර භෞතික, ආර්ථික, සමාජයීය හා පාරිසරික යන අංශ යටතේ වර්තමාන සැලසුම් ප්‍රදේශය හඳුනා ගනු ලැබූ අතර, පූර්ව සැලසුම් ප්‍රයත්න මගින් මොරටුව නගරය ජාතික, කලාපීය හා ප්‍රාදේශීය වශයෙන් ස්ථාන ගත කිරීම ද මෙම පරිච්ඡේදය මගින් සිදු කරන ලදි.

## 2.2.1. ඓතිහාසික පසුබිම හා විකාශනය

### 2.2.1.1. ජනප්‍රවාද හා බැඳුණු නාම විකාශනය

අතීත ජනප්‍රවාද අනුව මොරටුවේ මොරගස් වනයක් තිබූ බවත්, මොරගස් වනය “මොර අට” වී පසුව “මුර අටුව” ලෙසට ද, පසුකාලීනව එය මොරටුව ලෙසද විකාශනය වූ බව දැක්වේ. තවදුරටත් සංස්කෘත භාෂාවේ කියවෙන ආකාරයට “මෝරු” යන්න හැඳින්වීමට “මොරාටා” යන්න භාවිතා කරන හෙයින් එය මොරටුව ලෙස විකාශනය වූ බවත් තවත් එක් ජනප්‍රවාදයකි.




*රූප සටහන 2.2 : පැරණි මොරටුව නගරය*
*මූලාශ්‍රය : ලංකාපුර වෙබ් අඩවිය*

තිසර සංදේශය, ගිරා සංදේශය හා කෝකිල සංදේශය ආදී සංදේශ කාව්‍යයන්හි මොරටුව පිළිබඳව විවිධ තතු සඳහන් වන අතර ක්‍රි.ව. 1348 දි පමණ පස්වැනි පැරකුම්බා රජු දැදිගමපුර රජ කරමින් සිටි සමයේ ලියන ලද යැයි සැලකෙන තිසර සංදේශයේ “නෙතු සිතු සනසවමින් නොසලව මොරටු එළියේ” යන්න සඳහන් වේ. ගිරා සංදේශයේ “ගවපල් කෙළින කෙළියන යව ඉටු මොරටු එළියෙහි” යන්න සඳහන් කර ඇත. කෝකිල සංදේශයේ සඳහන් වන පරිදි ලක්ෂපතිය යන ගමෙහි පොල් උයනක් තිබූ බවට සඳහන් වේ.

## 2.2.1.2 පරිපාලන මායිම්වල ක්‍රමික විකාශනය

*අ) යටත් විජිත පාලන සමයට පෙර*

ශ්‍රී ලංකාව යටත් විජිත පාලනයට නතු වීමට පෙර මොරටුව නගරය මොරටුඑළිය, මොරටුපිටිය, මොරටුඋයන, මොරටුමුල්ල, මොරටුවැල්ල, මොරටුදික්වැල්ල ලෙස පාලන ප්‍රදේශ හයකට බෙදා වෙන් කොට තිබුණි.

*ආ) යටත් විජිත පාලන සමය*

විවිධ කාල වකවානු වලදී ඇති වූ විදේශීය ආක්‍රමණ හේතු කොට ගෙන මොරටුව පරිපාලන මායිම් ක්‍රමයෙන් වෙනස්වීම් වලට භාජනය වූ අතර 1930 වර්ෂයේදී මොරටුව නගර සභා පාලන ප්‍රදේශය ස්ථාපිත වීම දක්වා වූ ක්‍රමික විකාශනය පහත පරිදි පෙළගස්වා ඇත.

ලන්දේසි පාලන සමය – ක්‍රි.ව.1735 දී, එනම් ලන්දේසි පාලන සමයේදී මොරටුවේ එනෙක් පැවති පාලන ප්‍රදේශය තවදුරටත් පුළුල් කරමින් කොරලවැල්ල ප්‍රදේශයද මොරටුවට අයත් ප්‍රදේශයක් ලෙස නම් කරන ලදි.

බ්‍රිතාන්‍ය පාලන සමය – ක්‍රි.ව. 1835 දී මොරටුව බ්‍රිතාන්‍ය පාලනයට නතු වූ අතර, ඔවුන් විසින් කටුකුරුන්ද හා එගොඩ උයන, මොරටුවට සම්බන්ධ කරන ලදි. 1908 වර්ෂයේ දී මොරටුව ප්‍රාදේශීය මණ්ඩලය ස්ථාපිත කෙරුණු අතර 1930 වර්ෂයේදී එය මොරටුව නගර සභාව බවට පත් කරන ලදි.

තවදුරටත් විදෙස් ජාතිකයින්ගේ බලපෑම හේතු කොට ගෙන සංස්කෘතික වශයෙන් හා සමාජයීය වශයෙන් විවිධ විපර්යාස ඇති වූ අතර එමගින් කතෝලික ආගම ව්‍යාප්තියටත්, කතෝලික පල්ලි හා පාසල් ආරම්භ වීමටත් හේතු සාධක විය.

*ඇ) යටත් විජිත පාලන සමයට පසු*

1979 මාර්තු 07 දිනැති අංක 26/8 දරන අති විශේෂ ගැසට් නිවේදනය ප්‍රකාරව මොරටුව නගර සභා බල ප්‍රදේශය නාගරික සංවර්ධනය පිලිබද විෂය භාර අමාත්‍යවරයා විසින් 1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරි පනතේ 3(1) සහ (2) යන වගන්ති යටතේ නාගරික සංවර්ධන බල ප්‍රදේශයක් ලෙස ප්‍රකාශයට පත් කර ඇත.

එනෙක් පැවති මොරටුව නගර සභාව 1998 වර්ෂයේදී මහ නගර සභාවක් ලෙස ස්ථාපිත කෙරුණු අතර වර්තමානය වන විට කොළඹ දිස්ත්‍රික්කයට ඇතුළ ත් මහ නගර සභා පහෙන් එකක් ලෙස මොරටුව දැක්විය හැක.


## 2.2.2. වර්තමාන මොරටුව

මොරටුව ප්‍රදේශයේ වර්තමාන සැලසුම් සන්දර්භය හඳුනා ගැනීම සඳහා භෞතික, ආර්ථික, සමාජයීය හා පාරිසරික යන අංශ පහත පරිදි විග්‍රහ කර ඇත.

### 2.2.2.1.භෞතික අංශය


භූමි පරිහරණ රටාව, ජාතික හා කලාපීය සම්බන්ධතා, ප්‍රවාහන සැකැස්ම සහ සේවා හා යටිතල පහසුකම් යනාදී කරුණු විශ්ලේෂණය තුලින් මොරටුව ප්‍රදේශයේ භෞතික ලක්ෂණ හඳුනා ගන්නා ලදි.

*අ) භූමි පරිහරණ රටාව*




***රූප සටහන 2.3 :** මොරටුව භූමි පරිහරණ ව්‍යාප්තිය - 2016*
***මූලාශ්‍රය :** නාගරික සංවර්ධන අධිකාරිය, 2018*

සිතියම් අංක 2.1. මගින් දක්වා ඇති පරිදි 2016 වර්ෂයේ භූමි පරිහරණ රටාවට අනුව මුළු භූමි ප්‍රමාණයෙන් 60% ක් නේවාසික කටයුතු සඳහා යොදා ගෙන ඇති අතර වාණිජ කටයුතු වලට සාපේක්ෂව 4% කට වැඩි භූමි ප්‍රමාණයක් කර්මාන්ත කටයුතු සඳහා වෙන්ව ඇති බව පැහැදිලි වේ. මොරටුව මහ නගර සභා ප්‍රදේශයේ 2016 භූමි පරිහරණ ව්‍යාප්තිය රූප සටහන් අංක 2.3. මගින් දක්වා ඇත.





***සිතියම 2.1 :*** *මොරටුව භූමි පරිහරණ රටාව - 2016* ***මූලාශ්‍රය :*** *නාගරික සංවර්ධන අධිකාරිය, 2018*

## ආ) ජාතික හා කලාපීය සබඳතා

මොරටුව මහ නගර සභා ප්‍රදේශය තුළ ජාතික හා කලාපීය වශයෙන් වැදගත් රාජ්‍ය ආයතන විශාල ප්‍රමාණයක් පිහිටා ඇති අතර, මොරටුව විශ්වවිද්‍යාලය ප්‍රමුඛ අනිකුත් ආයතන වන ජර්මන් කාර්මික විද්‍යාලය, ආතර් සී ක්ලාක් මධ්‍යස්ථානය, ජාතික ආධුනිකත්ව හා පුහුණු කිරීම් අධිකාරිය, අන්තර්ජාතික සොයිසා ක්‍රීඩාංගනය, ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය, හස්ත කර්මාන්ත උසස් පුහුණු ආයතනය, ජාතික මෝස්තර මධ්‍යස්ථානය ඉන් ප්‍රධාන වේ. තවද රත්මලාන අභ්‍යන්තර ගුවන් තොටුපල කි.මී.5.4 ක දුරින් පිහිටා ඇත.

කලාපීය සම්බන්ධතා සැලකීමේදී රූප සටහන් අංක 2.4. මගින් දක්වා ඇති පරිදි උතුරින් රත්මලාන, නැගෙනහිර දෙසින් පිළියන්දල, දකුණු දෙසින් පානදුර යන නාගරික කේන්ද්‍රයන් සමග මොරටුව නගරය සෘජු අන්තර් සබඳතා පවත්වනු ලබයි. තවදුරටත් කොළඹ හර ප්‍රදේශයේ සිට කොළඹ දිස්ත්‍රික්කයේ දකුණු කෙළවර දක්වා දිවෙන නව ගාලු පාර ඔස්සේ පිලිවෙලින් කොල්ලුපිටිය, වැල්ලවත්ත, බම්බලපිටිය, දෙහිවල, රත්මලාන හා මොරටුව යන නාගරික කේන්ද්‍රයන්ගේ පිහිටීම හේතු කොට ගෙන රේඛීය සංවර්ධනයක් සිදු වන බව හඳුනා ගත හැක.




***රූප සටහන 2.4 :*** *මොරටුව නගරය හා බැදුණු කලාපීය සබඳතා*
***මූලාශ්‍රය :*** *නාගරික සංවර්ධන අධිකාරිය, 2018*

## ඇ) ප්‍රවාහන සැලැස්ම

මොරටුව ප්‍රදේශයේ ප්‍රවාහන සැකැස්ම ගාලු පාර ප්‍රධාන කොට ගත් මහාමාර්ග පද්ධතියෙන් හා මුහුදු බඩ දුම්රිය මාර්ගයෙන් සමන්විත වන අතර මොරටුව බස් නැවතුම්පොළ හා දුම්රිය නැවතුම්පොල ඒකාබද්ධ වී පිහිටීම වැදගත් විභවතාවක් ලෙස හඳුනා ගත හැක.

### මහාමාර්ග පද්ධතිය

ප්‍රදේශයේ භූමි පරිහරණ සැකැස්ම සලකා බැලීමේදී, මහාමාර්ග පද්ධතිය සඳහා මුළු භූමි ප්‍රමාණයෙන් 12% ක් වෙන්ව ඇති අතර එම මහා මාර්ග පද්ධතියේ සමස්ත දිග කි.මී. 160ක් පමණ වේ. එහිදී ගාලු පාර “ඒ” ශ්‍රේණියේ මාර්ගයක් ලෙසද පිළියන්දල–කටුබැද්ද මාර්ගය “බී” ශ්‍රේණියටද, සෙසු සියලුම මාර්ග “සී” හා “ඩී” ශ්‍රේණි වලටද අයත් වේ. එහෙත් මෙම මාර්ග වලින් 80% ක් පමණ අඩි 10–15 අතර අවම පළලකින් යුක්ත වන අතර මහාමාර්ග වල නඩත්තු කටයුතු මහාමාර්ග සංවර්ධන අධිකාරිය, ප්‍රාදේශීය මාර්ග සංවර්ධන අධිකාරිය හා මොරටුව මහ නගර සභාව මගින් සිදු කරනු ලබයි.

කොම්ට්‍රාන්ස් වාර්තාවට අනුව ගාලු කොරිඩෝව හරහා දිනකට මගීන් 30000 ක් පමණ සංසරණය වන අතර මොරටුව නව ගාලු පාර හරහා දිනකට කොළඹ දෙසට වාහන 11,600 ක් පමණද ගාල්ල දෙසට වාහන 10,900 ක් පමණද ගමන් කරන අතර වීර පුරන්අප්පු රජ මාවත ඔස්සේ නව ගාලු පාර හරහා ගාල්ල දෙසට වාහන 580 ක් පමණද කොළඹ දෙසට වාහන 700 ක් පමණද සංසරණය වන බව සඳහන් වේ.

### දුම්රිය මාර්ග පද්ධතිය

බස්නාහිර පළාතේ ප්‍රධාන දුම්රිය මාර්ගය වන වෙරළබඩ දුම්රිය මාර්ගයේ කිලෝ මීටර 11 ක දුරක් මොරටුව සැලසුම් ප්‍රදේශයට අයත් වන අතර මොරටුව ප්‍රධාන දුම්රිය ස්ථානය කේන්ද්‍ර කොට ගත් ලුනාව, අඟුලාන, කොරලවැල්ල හා එගොඩ උයන යන අභ්‍යන්තර දුම්රිය ස්ථාන හතරක් මොරටුව මහ නගර සභා සීමාව තුළ පිහිටා ඇත. රත්මලාන දුම්රිය ස්ථානයේ සිට පානදුර දුම්රිය ස්ථානය දක්වා දුම්රිය ගමන් ගන්නා සාමාන්‍ය වේගය පැයට කිලෝ මීටර 18 ක් වන අතර ක්‍රොම්ට්‍රාන්ස් වාර්තාව අනුව බම්බලපිටියේ සිට මොරටුව දක්වා දෙදිශාවට දෛනිකව මගීන් 79,000 ක් පමණ සංසරණය වන බව සඳහන් වේ.

## ඈ) සේවා හා යටිතල පහසුකම්

### නිවාස

මොරටුව මහ නගර සභා බල ප්‍රදේශයේ නිවාස ව්‍යාප්තිය පිළිබඳව සලකා බැලීමේදී වෙරළබඩ කලාපය හා දුම්රිය රක්ෂිතය ආශ්‍රිතව ධීවර කර්මාන්තයෙහි නියැලෙන ජනතාවද, ගංගා රක්ෂිතය අවට අඩු ආදායම්ලාභී ජනතාවද, මොරටුමුල්ල, ඉදිබැද්ද, විල්ලෝරවත්ත ආශ්‍රිතව ලී කර්මාන්තය මත පදනම් වූ ප්‍රජාවක්ද, කටුබැද්ද ප්‍රදේශයේ විශ්වවිද්‍යාලය හා බැඳුණු සංවර්ධනයක්ද, සොයිසාපුර, කල්දෙමුල්ල, ලක්ෂපතිය, තෙලවල යන ප්‍රදේශවල මධ්‍ය පාන්තික හා ඉහළ පාන්තික ආදායම්ලාභීන්ද ජීවත් වන සමාජයීය පසුබිමක්ද බොරුපන, තෙලවල, මාලිගාව පාර යනාදි ප්‍රදේශ කර්මාන්ත සඳහා පදනම් වූ පසුබිමක්ද වශයෙන් පොකුරු සංවර්ධනයක් දැක ගත හැකිය.

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තුමේන්තුවේ ජන සංගණන වාර්තා අනුව මොරටුව මහ නගර සභා සීමාව තුළ 1981 වර්ෂයේ සිට 2012 වර්ෂය දක්වා නිවාස සංඛ්‍යාව වැඩි වීම පිළිබඳව පහත වගු අංක 2.1 මගින් විස්තර කර ඇත.

02 පරිච්ඡේදය
මූලික අධ්‍යයනය

සැලසුම් සහ තත්ත්ව සන්දර්භය


වර්තමාන මොරටුව

| වර්ෂය | නිවාස සංඛ්‍යාව |
|---|---|
| 1981 | 24,656 |
| 1991 | 32,143 |
| 1994 | 33,541 |
| 1999 | 37,335 |
| 2001 | 40,168 |
| 2012 | 41,633 |

**වගුව 2.1 :** *මොරටුව මහ නගර සභා සීමාව තුළ නිවාස ව්‍යාප්තිය 1981 - 2012*
**මූලාශ්‍රය :** *ජනලේඛන හා සංඛ්‍යාලේඛන වාර්තා, 1981- 2012*

2012 ජන සංගණන වාර්තාව අනුව මොරටුව මහ නගර සභා සීමාව තුළ මුළු නිවාස සංඛ්‍යාව 41,633 ක් වන අතර ස්ථිර නිවාස 37,033 ක්ද, අර්ධ ස්ථිර නිවාස 4,470 ක් හා තාවකාලික නිවාස 130ක්ද ලෙස වර්ගීකරණය කළ හැක. එම නිවාස අතරින් 69% ක් තනි නිවාසද, 18% ක් තට්ටු නිවාසද, 5% ක් මහල් නිවාසද, 5% ක් එකට එකතු කල නිවාසද 0.7% ක් ද්විත්ව නිවාසද 1% ක් පේලි නිවාස හා 1.3% ක් පැල්පත් නිවාසද වේ. (රූප සටහන් අංක 2.5)

**නිවාස වර්ගීකරණය**




**රූප සටහන 2.5 :** *මොරටුව මහ නගර සභා බල ප්‍රදේශයේ නිවාස වර්ගීකරණය*
**මූලාශ්‍රය :** *ජන හා සංඛ්‍යා ලේඛන වාර්තා, 2012*


2012 ජන සංගණන වාර්තාව පදනම් කර ගෙන ග්‍රාම නිලධාරි කොට්ඨාශ වශයෙන් නිවාස ඝනත්ව ව්‍යාප්තිය සිතියම් අංක 2.2 මගින් දක්වා ඇත. තවදුරටත් එම සංගණන දත්ත අනුව කොළඹ දිස්ත්‍රික්කයේ පිහිටි මුළු නිවාස සංඛ්‍යාවෙන් 7.27% ක් මොරටුව මහ නගර සභා බල ප්‍රදේශය තුළ  පිහිටා ඇති බව තහවුරු වේ. එසේම කොළඹ දිස්ත්‍රික්කයේ වෙනත් ප්‍රදේශ හා සංසන්දනය කිරීමේදී හෝමාගම, මහරගම, කොලොන්නාව, කැස්බෑව හා කඩුවෙල යන ප්‍රදේශවලට සාපේක්ෂව මොරටුව ප්‍රදේශයේ නිවාස ඝනත්වය වර්ග මීටරයට නිවාස 1,783 ක් වැනි ඉහල අගයක් ගන්නා බව වගු අංක 2.2 හි දත්ත පරිදි පැහැදිලි වේ.

| ප්‍රදේශය | නිවාස ඝනත්වය වර්ග මී. |
|---|---|
| කොළඹ දිස්ත්‍රික්කය | 3893 |
| හෝමාගම | 399 |
| මහරගම | 1133 |
| කොලොන්නාව | 1445 |
| කැස්බෑව | 839 |
| කඩුවෙල | 608 |
| තිඹිරිගස්යාය | 2475 |
| මොරටුව ප්‍රා.ලේ.කො | 1783 |

**වගුව 2.2 :** *නිවාස ඝනත්වය සංසන්දනය*
**මූලාශ්‍රය :** *ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, 2012*

මොරටුව බල ප්‍රදේශයේ භූමියෙහි සීමිතභාවය හේතුවෙන් අඩු ආදායම්ලාභී ජනතාව රක්ෂිත ප්‍රදේශ හා ජල මූලාශ්‍ර ගොඩ කරමින් පැල්පත් නිවාස ඉදි කිරීමේ වර්ධනයක් දක්නට ලැබෙන අතර මෙම පැල්පත් ඒකකයක් තුළ පවුල් දෙකක් හෝ වැඩි ගණනක් ජීවත් වන අවස්ථා ඉහළ මට්ටමක පවතී. මොරටුව බල ප්‍රදේශයට ප්‍රධාන ගැටළුවක් වන මෙම පැල්පත් නිවාස සඳහා විසඳුම් ලෙස ජාතික නිවාස සංවර්ධන අධිකාරිය, රතුකුරුස සංවිධානය, නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය හා විවිධ රාජ්‍ය නොවන ආයතනවල මැදිහත් වීම මත සොයිසාපුර, සයුරපුර හා සුනාමි මහල් නිවාස සංකීර්ණ ඉදී කොට ලබා දී ඇතත් 2017.12.11 වන දින පැවති පාර්ශවකරුවන්ගේ වැඩමුළුවේ දී හා ප්‍රදේශයේ ග්‍රාම සේවක නිලධාරීන් සමඟ සිදු කරන ලද සාකච්ඡාවන්හීදී රක්ෂිත ආශ්‍රිතව තවදුරටත් පැල්පත්වාසීන් 6,000 ක් පමණ ජීවත් වන බවට තොරතුරු වාර්තා වී ඇත.

2012 ජන සංගණන වාර්තාව අනුව මොරටුව බල ප්‍රදේශයේ නිවාස සංඛ්‍යාව 41,633 ක් වන අතර පවුල් සංඛ්‍යාව 42,000 ක් වේ. ඒ අනුව නිවාස ඒකක 367 ක හිඟයක් පවතින බව පැහැදිලි වන නමුත් මෙම නිවාස හිඟයට රක්ෂිත අවට පිහිටි අඩු පහසුකම් සහිත පැල්පත් නිවාස ඇතුළ ත් වී නොමැත. විවිධ පාර්ශවකරුවන්ගෙන් ලබා ගත් තොරතුරු වලට අනුව රක්ෂිත ප්‍රදේශයන්හි ජීවත් වන 6,000 ක පමණ ජනතාව සඳහා නිවාස ඒකක 1,500 ක් හා දන්දෙනියවත්ත, පිට්ටනියවත්ත, බැටරි වත්ත හා සමරකෝන් වත්ත ආදී රජයේ ඉඩම්හි ජීවත් වන අඩු ආදායම්ලාභී ජනතාව සඳහා නිවාස 1000 ක් පමණ අවශ්‍ය වන අතර ඒ අනුව මොරටුව මහ නගර සභා බල ප්‍රදේශය සඳහා දල වශයෙන් නිවාස 3000 ක පමණ අවශ්‍යතාවයක් පවතින බවට හඳුනා ගෙන ඇත.




***සිතියම 2.2 :*** *මොරටුව ප්‍රදේශයේ නිවාස ඝනත්වය - 2011* ***මූලාශ්‍රය :*** *ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, 2011*

## ජල පහසුකම්

අඹතලේ, ලබුගම හා කලටුවාව ජල පවිත්‍රාගාර මගින් පිරිපහදු කරනු ලබන ජලය මොරටුව මහ නගර සභා ප්‍රදේශය තුළ බෙදා හැරීමේ කටයුතු ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය මගින් සිදු කරනු ලබයි. ඝන මීටර 500,000 ක දෛනික ජල සැපයුම් ධාරිතාවයක් ඇති අඹතලේ ජල පවිත්‍රාගාරයෙන් මුදා හැරෙන ජලය මඟින් මොරටුව උතුරු ප්‍රදේශය එනම් අඟුලාන, සොයිසාපුර හා බොරුපන ප්‍රදේශ ආවරණය කරනු ලබන නමුත් අඹතලේ ජල සම්ප්‍රේෂණ පද්ධතිය ඉතා සංකීර්ණ බැවින් මොරටුව ප්‍රදේශයට පමණක් සැපයෙන ජල සැපයුම් ධාරිතාවය නිශ්චිතව ගණනය කිරීම අපහසු වී ඇත. දෛනිකව ඝන මීටර 60,000 ක ධාරිතාවයක් ඇති කලටුවාව ජල සැපයුම් පද්ධතිය මගින් අඹතලේ සැපයුම හරහා ආවරණය නොකරන ඉතිරි ප්‍රදේශ සඳහා ජල සැපයුම ලබා දීමට ප්‍රමාණවත් වී ඇත.

මීට අමතරව ස්වාභාවික ජල මූලාශ්‍රයක් ලෙස බොල්ගොඩ ගංගාව පවතින හෙයින් ප්‍රදේශයේ භූගත ජල මට්ටම ඉහළ අගයක් ගන්නා නමුත් කර්මාන්ත මගින් බොල්ගොඩ ගංගාවට මුදා හරින නිසි පරිදි පිරිපහදු නොකරන ලද අපජලය හේතුවෙන් භූගත ජලයද දූෂණය වී භාවිතා කිරීමට නුසුදුසු තත්ත්වයේ පවතී.

## විදුලිය පහසුකම්

මොරටුව මහ නගර සභා බල ප්‍රදේශය සඳහා ලංකා විදුලි බල මණ්ඩලය හා ලංකා පෞද්ගලික විදුලි සමාගම මගින් විදුලි බලය සැපයීම සිදු කරනු ලබන අතර, සෑම නාගරික කොට්ඨාශයක්ම කිලෝ වොට් 33 හා කිලෝ වොට් 11 විදුලි රැහැන් මගින් ආවරණය වේ. කිලෝ වොට් 33 විදුලි රැහැන් මගින් කි.මී. 60 ක පමණ දුරක් ආවරණය වන අතර, කිලෝ වොට් 11 රැහැන් මගින් කි.මී. 230 ක පමණ දුරක් ආවරණය කරනු ලබයි. තෙලවල, කටුබැද්ද හා රාවතාවත්ත යන ස්ථානවල මූලික විදුලි සැපයුම් පොළවල් පිහිටා ඇති අතර, උප පොළවල් 124 ක් පිහිටා ඇත. මොරටුව බල ප්‍රදේශය තුළ මුළු විදුලිය සැපයුමෙන් 85% ක් ගෘහස්ථ කටයුතු සඳහා ද, 9% ක් වාණිජ කටයුතු සඳහා ද, 4.5% ක් කර්මාන්ත හා 0.55% ක් ආගමික කටයුතු සඳහාද භාවිතා කරනු ලබයි. සී/ස ලංකා විදුලි පුද්ගලික සමාගම විසින් මොරටුව මහ නගර සභා ප්‍රදේශයට ලබා දී ඇති විදුලි සම්බන්ධතාවය ඇතුළ ත් සැලැස්ම ඇමුණුම් අංක 1 හි දක්වා ඇත.

## මළ හා අපජල කළමනාකරණය

මොරටුව ප්‍රදේශය තුළ ඉහළ ඝණත්වයකින් යුතුව විවිධ කර්මාන්තශාලා හා නිවාස ව්‍යාප්ත වී පැවතියද එම භාවිතයන් තුලින් දෛනිකව උත්පාදනය වන අපජලය විධිමත් ලෙස බැහැර කිරීම සඳහා ක්‍රමවේදයක් නොමැත. මළ හා අපජලය එකම නල පද්ධතියක් ඔස්සේ බැහැර කරනු ලබන අතර බොරුපන, තෙලවල හා රාවතාවත්ත ප්‍රදේශ පමණක් මෙම පහසුකම් ආවරණය වන ප්‍රදේශ ලෙස හඳුනා ගෙන ඇත. (ඇමුණුම් අංක 2).

## ඝන අපද්‍රව්‍ය කළමනාකරණය

මොරටුව මහ නගර සභා බල ප්‍රදේශය කලාප පහකට බෙදා කාබනික හා කාබනික නොවන ලෙස ඝන අපද්‍රව්‍ය වර්ගීකරණය කොට දෛනිකව මෙට්‍රික් ටොන් 70-120 අතර ප්‍රමාණයක් එකතු කිරීම සිදු කරන අතර එම ඝන අපද්‍රව්‍ය සංයුතිය ප්ලාස්ටික් 10%, ජෛවීය වියෝජනයට ලක් කල හැකි ද්‍රව්‍ය 78% සහ කඩදාසි 12% ක් ලෙස හඳුනා ගෙන ඇත.

**02 පරිච්ඡේදය
මූලික අධ්‍යයනය**

සැලසුම් සහ තත්ත්ව සන්දර්භය

වර්තමාන මොරටුව

එක්රැස් කරනු ලැබූ අපද්‍රව්‍ය මොරටුව වෙළඳ සංකීර්ණ පරිශ්‍රය පිටුපස භූමියේදී අතරමැදි පිරිපහදුවට ලක් කර කාබනික ඝන අපද්‍රව්‍ය වලින් කොටසක් (දිනකට මෙට්‍රික් ටොන් එකක් පමණ) කොම්පෝස්ට් නිපදවීමටත් ඉතිරි වන අපද්‍රව්‍ය කරදියාන අපද්‍රව්‍ය බැහැර කිරීමේ මධ්‍යස්ථානය වෙත යොමු කර ප්‍රතිචක්‍රීකරණයට හෝ නැවත භාවිතයට හෝ කොම්පෝස්ට් කිරීමට හෝ බල ශක්තිය නිපදවීමට හෝ යොදා ගනී.

මෙහිදී ඝන අපද්‍රව්‍ය වලින් මෙට්‍රික්ටොන් 30 ක් පමණ කොම්පෝස්ට් නිෂ්පාදනයට යොදා ගන්නා අතර එම ක්‍රියාවලියේදී ඝන අපද්‍රව්‍ය බරෙන් 60% ක් පමණ වාෂ්පීකරණය වී කොම්පෝස්ට් ලෙස කාබනික ද්‍රව්‍ය 10% ත් 20% ත් අතර ප්‍රමාණයක් ඉතිරි වේ. එම නිෂ්පාදිත කොම්පෝස්ට් "මිහිසරු" වෙළඳ නාමය යටතේ වෙළඳ පොල වෙත නිකුත් කරනු ලබයි.

තවදුරටත් මොරටුව මහ නගර සභා බල ප්‍රදේශය තුළ එකතු වන අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය කිරීම සඳහා වෙනත් සංවිධාන 20 ක් මගින් අපද්‍රව්‍ය වර්ග කොට ගෙන යනු ලබන අතර එම අපද්‍රව්‍ය සංයුතිය සතියකට දල වශයෙන් ප්ලාස්ටික් ටොන් 1, පොලිතීන් ටොන් 1, කැන් ටොන් 2 සහ වෙනත් ද්‍රව්‍ය ටොන් 6 ක් පමණ වේ.

## 2.2.2.2. ආර්ථික අංශය


ප්‍රදේශයේ ප්‍රධාන ආර්ථික නියාමන ලෙස වඩු කර්මාන්තය, ධීවර කර්මාන්තය හා වාණිජ කටයුතු හැඳින්විය හැකි නමුත් වර්තමානයේ සංචාරක කර්මාන්තය සඳහාද ප්‍රවණතාවයක් පවත්නා බවට හඳුනා ගෙන ඇත.

### *අ) වඩු කර්මාන්තය*

මොරටුව ප්‍රදේශයට ආවේණික වූ ආර්ථික විභවයක් ලෙස වඩු කර්මාන්තය හැඳින්විය හැකි අතර සිතියම් අංක 2.3. හි දක්වා ඇති පරිදි මොරටුමුල්ල, ඉදිබැද්ද, මෝල්පේ, විල්ලෝරවත්ත ප්‍රධාන කොට ගත් ග්‍රාම නිලධාරී වසම් 15 කට වඩා වැඩි ප්‍රමාණයක හස්ත හා යන්ත්‍රෝපකරණ භාවිතයෙන් වඩු කර්මාන්තය සිදු කරනු ලබයි. අතීතයේ බොල්ගොඩ ගඟ හරහා දැව ප්‍රවාහනය කරමින් බිහි වූ දැව භාණ්ඩ කර්මාන්තය වර්තමානය වන විට මොරටුව ප්‍රදේශයේ ප්‍රධාන හස්ත කර්මාන්තය බවට පත් වී ඇත. පාරම්පරික වඩු කාර්මික කුසලතාවකින් හෙබි පිරිසක් දැව කර්මාන්තයේ නියැලෙන හෙයින් දැව ආශ්‍රිත නිෂ්පාදන නිර්මාණය කිරීමේ හා බෙදාහැරීමේ කේන්ද්‍රස්ථානය ලෙස මොරටුව ප්‍රචලිත වීමට හේතු වී ඇත.

විශේෂයෙන්ම කොරලවැල්ල, එගොඩ උයන යන ප්‍රදේශවල සුළු පරිමාණයෙන් ගෘහාශ්‍රිත කර්මාන්තයක් ලෙස දැව කඳන් ඉරීම හා අවමංගල්‍ය භාණ්ඩ නිෂ්පාදනය යනාදිය සිදු කරන අතර, විවිධ කැටයම්, ගෘහ භාණ්ඩ හා අනෙකුත් භාණ්ඩ නිෂ්පාදනය මොරටුමුල්ල, මෝල්පේ හා ඉදිබැද්ද යන ප්‍රදේශවල පැතිරී ඇති බවත් දක්නට ලැබේ. මොරටුව වඩු කර්මාන්තය ආශ්‍රිත ඡායාරූප රූප සටහන් අංක 2.5 හි දැක්වේ.

83%ක් පමණ දෘඪ දැව යොදා ගනිමින් වඩු කර්මාන්තයේ නියැලී සිටින අතර, 17%ක් පමණ සැහැල්ලු දැව යොදා ගෙන දැව භාණ්ඩ නිෂ්පාදනය කරනු ලැබේ. 2003 වර්ෂයේදී ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ පර්යේෂණ අංශයේ අමරසේකර ටී.ඒ.ඩී.එස්. හා ජයපාල. එම්. එස්. විසින් කරන ලද A Study on the Status of Furniture Manufacturing 2003 වාර්තාව අනුව මෙම වඩු කර්මාන්තය මගින් මාසිකව දළ වශයෙන් රුපියල් මිලියන 54 ක හා වාර්ෂිකව රුපියල් මිලියන 648 ක ආදායමක් උපදවනු ලබන අතර දේශීය දළ ජාතික නිෂ්පාදනය සඳහා 0.007% ක් වැනි සුළු ප්‍රමාණයක දායකත්වයක් ලබා දේ. නවද දැව සංස්ථාවේ ලියාපදිංචි වූ වඩු කර්මාන්ත සංඛ්‍යාව 128 ක් පමණ වන නමුත් 65,000 ක පමණ පිරිසක් මෙම වඩු කර්මාන්තය ජීවිකාව කර ගෙන ඇත.




**සිතියම 2.3 :** *වඩු කර්මාන්තයේ ව්‍යාප්තිය - 2017* **මූලාශ්‍රය :** *නාගරික සංවර්ධන අධිකාරිය, 2018*



*රූප සටහන 2.6 : මොරටුව වඩු කර්මාන්තය*
*ඡායාරූප අනුග්‍රහය : ඉහළ වම් හා දකුණු කෙළවර: www.exploresrilanka.lk, පහළ වම් කෙළවර :www.greenwood.lk, පහළ දකුණු කෙළවර :www.globalpressjournal.com*

## ආ) ධීවර කර්මාන්තය

අඟුලාන සිට පානදුර තුඩුව දක්වා වූ කි.මී.10.5 ක් පමණ දිගකින් යුතු මුහුදු තීරයේ අඟුලාන, ලුනාව, මොරටුවැල්ල, කොරලවැල්ල, කටුකුරුන්ද, එගොඩ උයන හා මෝදර යන ධීවර වරායන්ද, අඟුලාන, ලුනාව, මොරටුවැල්ල, කොරලවැල්ල හා කටුකුරුන්ද යන ධීවර තොටුපලවල්ද කේන්ද්‍ර කොට ගත් ධීවර කර්මාන්තයක් දැකිය හැක. (රූප සටහන් අංක 2.7 හා 2.8). විශේෂයෙන් බොල්ගොඩ ගඟ ආශ්‍රිතව මිරිදිය ධීවර කර්මාන්තද, මුහුදු තීරය කේන්ද්‍ර කර ගත් කරදිය ධීවර කර්මාන්තයද, බොල්ගොඩ කලපු, මෝය, කඩොලාන හා වගුරු මත පදනම් වූ කලපු ධීවර කර්මාන්තයක්ද දක්නට ලැබෙන අතර මසකට මත්ස්‍ය අස්වැන්නේ ප්‍රමාණය කිලෝ ග්‍රෑම් 7,600 – 20,000 අතර ප්‍රමාණයක් වේ.



*රූප සටහන 2.7 : මෝදර ධීවර වරාය*
*මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය, 2018*



***රූප සටහන 2.8 :*** *මෝදර ධීවර වරාය ආශ්‍රිත වෙළඳසැල්*
***මූලාශ්‍රය :*** *නාගරික සංවර්ධන අධිකාරිය, 2018*

## *ඇ) වාණිජ අංශය*

මුළු භූමි ප්‍රමාණයෙන් 3% ක් පමණ වාණිජ භාවිතය සඳහා යොදා ගෙන ඇති අතර, තොග හා සිල්ලර වෙළඳාම හා සේවා අංශය පදනම් කරගත් වාණිජ භාවිතාවන් මොරටුව නගර මධ්‍යයේ සිට ගාලු පාර ඔස්සේ විහිදී ඇත. (රූප සටහන් අංක. 2.9)




***රූප සටහන 2.9 :*** *මොරටුව වාණිජ කටයුතු*
***ඡායාරූප අනුග්‍රහය :*** *https://www.facebook.com/kzonemoratuwa/,ඉහල දකුණ කෙළවර: www.travelfootprint.net පහළ වම් හා දකුණු කෙළවර මොරටුව විශ්ව විද්‍යාලය, භූදර්ශන අංශය, 2018*

## ඈ) සංචාරක කර්මාන්තය

දෙහිවල–ගල්කිස්ස හා පානදුර–කළුතර යන සංචාරක ප්‍රදේශ දෙකට මැදිව මොරටුව ප්‍රදේශය පිහිටියද දර්ශනිය මුහුදු තීරය, බොල්ගොඩ ගංඟාව හා ලුනාව කලපුව ආදි ස්වාභාවික සම්පත් මනා කළමනාකාරිත්වයකින් යුතුව සංචාරක කර්මාන්තයේ සංවර්ධන කටයුතු සඳහා යොදා නොගැනිම හේතුවෙන් සංචාරක කර්මාන්තය දිරිගැන්වීමට නොහැකි වී ඇත. එසේ වූවද බොල්ගොඩ ගඟ ආශ්‍රිතව සිදු කරන ජල ක්‍රීඩා, රුවල් ඔරු තරඟ මෙන්ම බොල්ගොඩ ගඟ, ලුනාව කලපුව හා වෙරළ තීරයට මුහුණලා ඉදිවන හෝටල් හා සහාධිපත්‍ය සංවර්ධන කටයුතු හේතුවෙන් වර්තමානයේ සංචාරක කර්මාන්තයේ යම් ප්‍රවණතාවයක් සිදුවෙමින් පවතින බව පැහැදිළි වේ. (රූප සටහන් අංක 2.10)



***රූප සටහන 2.10 :*** *මොරටුව සංචාරක කර්මාන්තය*
***ඡායාරූප අනුග්‍රහය :*** *ඉහල වම් කෙළවර:www.timeout.com, ඉහල මැද: www.travelfootprint.net , ඉහල දකුණු කෙළවර : www.escapade.lk, පහළ වම් කෙළවර: www.ranmalholidayresort.com, පහළ දකුණු කෙළවර: www.yohobed.com/*

### 2.2.2.3. සමාජයීය අංශය

මොරටුව ප්‍රදේශයේ සමාජයීය පසුබිම අධ්‍යයනය කිරීම සඳහා ජනගහනය, සෞඛ්‍යය, අධ්‍යාපන, අපරාධ හා මත්ද්‍රව්‍ය භාවිතය හා පොදු එළිමහන් විනෝද කටයුතු පහසුකම් සම්බන්ධයෙන් දීර්ඝ වශයෙන් සාකච්ඡා කරනු ලබයි.

#### *අ) ජනගහනය*


2001 හා 2012 ජන සංගණන වාර්තා අනුව මොරටුව මහ නගර සභා බල ප්‍රදේශයේ නේවාසික ජනගහනය පිලිවෙලින් 177,563 ක් හා 168,280 ක් වන අතර, ස්වාභාවික ජනගහන වර්ධන වේගය -0.49 ක් වේ. තවදුරටත් ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මගින් 2016 වර්ෂයේදී සිදු කරන ලද ජනගහන පුරෝකථනයට අනුව මොරටුව ප්‍රදේශයේ ජනගහනය දළ වශයෙන් 173,395 ක් පමණ වනු ඇතැයි වාර්තා කර ඇත.

මොරටුව මහ නගර සභා බල ප්‍රදේශයේ ජනගහනය කොළඹ දිස්ත්‍රික්කයේ සමස්ත ජනගහනයෙන් 7% ක් වන අතර කොළඹ මහ නගර සභාව හා මොරටුව මහ නගර සභාව අතර ජන ඝනත්ව අනුපාතය 1:2 ක් ලෙස හඳුනා ගත හැකි වේ. එනම් කොළඹ මහ නගර සභාවේ හා මොරටුව මහ නගර සභාවේ ජන ඝනත්ව අගයන් පිලිවෙලින් වර්ග කිලෝමීටරයට පුද්ගලයින් 3,417 ක් හා 7209 ක් වේ.

සිතියම් අංක 2.4 හා 2.5 මගින් නිරූපිත මොරටුව ප්‍රදේශයේ ජනගහන ඝනත්වය අනුව 2001 වර්ෂයේ සිට 2012 වර්ෂය වන විට එගොඩ උයන දකුණ, රාවතාවත්ත නැගෙනහිර, මොරටුමුල්ල උතුර, මොරටුමුල්ල දකුණ, මොරටුමුල්ල නැගෙනහිර හා ලක්ෂපතිය උතුර යන ග්‍රාම නිලධාරී කොට්ඨාශවල ජනගහන ඝනත්වය පහළ යාමක් දක්නට ලැබෙන අතර අඟුලාන උතුර ග්‍රාම නිලධාරී කොට්ඨාශයේ පමණක් ජනගහන ඝනත්වය ඉහල යාමක් පෙන්නුම් කෙරේ.


2012 ජන සංගණන වාර්තාව අනුව 49% ක් පුරුෂ හා 51% ක් ස්ත්‍රී වන අතර වයස් කාණ්ඩ අනුව ජනගහනය අවුරුදු 15 ට අඩු 22% ක් ද 15 – 59 අතර 65% ක්ද, 60 ට වැඩි 13% ක් ද වේ. ඒ අනුව මොරටුව ප්‍රදේශයේ ශ්‍රම බලකාය එනම් අවුරුදු 15 – 59 අතර ජනගහනය සාපේක්ෂව 65% ක් වැනි ඉහල අගයක් ගැනීම අනාගත සංවර්ධනය උදෙසා විභවතාවයක් වනු ඇත.

ජන වර්ගය අනුව ජනගහනය සලකා බැලීමේදී, වැඩිම පිරිසක් සිංහල වන අතර, ද්‍රවිඩ හා මුස්ලිම් ජනතාව සුළු පිරිසකි. එමෙන්ම ආගමික වශයෙන් සලකා බැලීමේදී, බහුතරයක් බෞද්ධයන් වන නමුත් කතෝලික ජනගහනයද සැලකිය යුතු මට්ටමක පවතී.




**සිතියම 2.4 :** *මොරටුව ජනගහන ඝනත්වය - 2001*

**මූලාශ්‍රය :** *නාගරික සංවර්ධන අධිකාරිය, 2018*




**සිතියම 2.5 :** *මොරටුව ජනගහන ඝනත්වය - 2011* **මූලාශ්‍රය :** *නාගරික සංවර්ධන අධිකාරිය, 2018*

## ආ) සෞඛ්‍යය පහසුකම්

මොරටුව මහ නගර සභා ප්‍රදේශය තුළ ස්ථාපිත ද සොයිසා දිස්ත්‍රික් රෝහල, ලුනාව ආයුර්වේද රෝහල, මධ්‍යම බෙහෙත් ශාලා, ආයුර්වේද බෙහෙත් ශාලා හා පෞද්ගලික වෛද්‍ය මධ්‍යස්ථාන මගින් ජනතාවට රිසි පරිදි බටහිර වෛද්‍ය ක්‍රමයට හෝ දේශීය වෛද්‍ය ක්‍රමයට අනුව සෞඛ්‍යය සේවා ලබා ගැනීම සඳහා අවශ්‍ය පහසුකම් ඇත.

1911 වර්ෂයේ ඉදි කරන ලද ඉතාමත් පැරණි රෝහලක් වන ද සොයිසා දිස්ත්‍රික් රෝහල ලුනාව ප්‍රදේශයේ පිහිටා ඇති අතර එය "බී" කාණ්ඩයේ දිස්ත්‍රික් රෝහලක් ලෙස වාට්ටු 3ක් සහ ගිලන් ඇඳන් 83 කින් සමන්විත වේ. දැනට වෛද්‍ය නිලධාරීන් 10 ක්, හෙද නිලධාරීන් 10 ක්, උපස්ථායකයින් 06 දෙනෙකුගෙන් සමන්විත මෙම රෝහලේ 2015 වර්ෂයේ පමණක් රෝහල් ගත වූ රෝගීන් සංඛ්‍යාව 7800 ක් පමණ වේ. දේශීය වෛද්‍ය ප්‍රතිකාර ලබා ගැනීම සඳහා මොරටුව ප්‍රදේශයේ ජනතාව මෙන්ම පිළියන්දල, පානදුර හා කළුතර යන ප්‍රදේශයන්ගෙන්ද ලුනාව ආයුර්වේද රෝහල වෙත ප්‍රතිකාර ලබා ගැනීම සඳහා රෝගීන් පැමිණෙන බවට මූලික අධ්‍යයන කටයුතු වලදී දැන ගැනීමට ලැබුණි.

මීට අමතරව මොරටුව නගරය තුළ පෞද්ගලික වෛද්‍ය මධ්‍යස්ථාන 16ක්, පෞද්ගලික බෙහෙත් ශාලා 39 ක්, මධ්‍යම බෙහෙත් ශාලා 2ක් (අඟුලාන හා කොරලවැල්ල) හා ආයුර්වේද බෙහෙත් ශාලා 16ක් ව්‍යාප්තව පැවතීම ධනාත්මක සාධකයක් ලෙස දැක්විය හැක. මොරටුව නගර සභා බල ප්‍රදේශයේ සෞඛ්‍යය පහසුකම් ව්‍යාප්තිය පිළිබඳව ඇමුණුම් අංක 3 හි දක්වා ඇත.

ලාදුරු, ඩෙංගු හා ක්ෂය රෝගය බහුලව වාර්තා වන ප්‍රදේශයක් ලෙස මොරටුව සඳහන් කල හැකි අතර, මොරටුව සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලයේ 2018 වාර්ෂික වාර්තාවට අනුව මොරටුමුල්ල හා ලුනාව ප්‍රදේශ ආශ්‍රිතව ලාදුරු රෝගීන් ජීවත් වන බව සඳහන් වේ. තවද මොරටුමුල්ල, රාවතාවත්ත හා කටුබැද්ද ප්‍රදේශ වල ඉහලම ඩෙංගු රෝගීන් සංඛ්‍යාවක්ද රාවතාවත්ත හා එගොඩ උයන ප්‍රදේශවල ඉහලම ක්ෂය රෝගීන් සංඛ්‍යාවක්ද ජීවත් වන බවට සෞඛ්‍යය වාර්තාවන්හී සඳහන් වේ.

2015 සිට 2017 වර්ෂය දක්වා ඉහත සඳහන් රෝග ව්‍යාප්තිය පිළිබඳ දත්ත පහත වගු අංක 2.3 හි දක්වා ඇත.

| රෝග වර්ගීකරණය | 2015 | 2016 | 2017 | අවධානම් ප්‍රදේශ |
|---|---|---|---|---|
| ඩෙංගු | 812 | 1,177 | 2,597 | මොරටුමුල්ල, රාවතාවත්ත, කටුබැද්ද |
| ක්ෂය රෝගය | 54 | 76 | 61 | රාවතාවත්ත, එගොඩඋයන |
| ලාදුරු | 78 | 91 | 89 | මොරටුමුල්ල / ලුනාව |

**වගුව 2.3 :** *මොරටුව ප්‍රදේශයේ රෝග ව්‍යාප්තිය පිළිබඳ දත්ත*
**මූලාශ්‍රය :** *මොරටුව සෞඛ්‍ය වෛද්‍ය නිලධාරී කාර්යාලය, 2018*

### ඇ) අධ්‍යාපන පහසුකම්

2012 ජන සංගණන වාර්තා අනුව මොරටුව මහ නගර සභා ප්‍රදේශයේ සමස්ත ජනගහනයෙන් 26% ක් පාසල් යන වයසේ ළමුන් වන අතර බස්නාහිර පළාත් අධ්‍යාපන කාර්යාලයේ වාර්ෂික වාර්තාව 2013 අනුව එම බල ප්‍රදේශයේ පිහිටි පාසල් 31හි ශිෂ්‍යයින් 21,000 ක් අධ්‍යාපනය ලබා ඇති බව සඳහන් වේ. මොරටුව මහ නගර සභා ප්‍රදේශයේ පාසල් සංයුතිය පහත වගු අංක 2.4 හි සඳහන් වේ.

| පාසල් කාණ්ඩය | පාසල් සංඛ්‍යාව |
|---|---|
| ජාතික පාසල් | 2 |
| 1 ඒබී පාසල් | 2 |
| 1 සී පාසල් | 3 |
| 2 වන ශ්‍රේණියේ පාසල් | 15 |
| 3 වන ශ්‍රේණියේ පාසල් | 9 |
| **එකතුව** | **31** |

**වගුව 2.4 :** *මොරටුව මහ නගර සභා ප්‍රදේශයේ පාසල් සංයුතිය*
**මූලාශ්‍රය :** *බස්නාහිර පළාත් අධ්‍යාපන කාර්යාලය, 2013*

පූර්ව ළමා විය සංවර්ධන මධ්‍යස්ථාන – 2016 සම්පත් පැතිකඩ වාර්තාවට අනුව මොරටුව මහ නගර සභා බල ප්‍රදේශය තුළ පෙර පාසල් 124 ක් පවතින බවට සඳහන් වන අතර මෑත කාලයේ ජාත්‍යන්තර පාසල් ස්ථාපිත වීමේ ප්‍රවණතාවක් දක්නට ලැබේ.

උසස් අධ්‍යාපන ආයතන – 1978 වර්ෂයේ ආරම්භ කර ඇති අධ්‍යාපන පීඨ හතරකින් සමන්විත මොරටුව විශ්වවිද්‍යාල වාර්ෂික වාර්තාව 2014 අනුව 2013/2014 අධ්‍යයන වර්ෂය සඳහා සිසුන් 8000 ක් ලියාපදිංචි වී ඇති අතර විශ්වවිද්‍යාල සේවක සංඛ්‍යාව 1200 ක් ලෙස සඳහන් වේ. තවද විශ්වවිද්‍යාලයේ පසුගිය දශ වර්ෂයක කාල සීමාව තුළ දී නවක සිසුන් බඳවා ගැනීමේ ප්‍රතිශතය 75% කින් ඉහල ගොස් ඇති අතර ඉදිරි කාලය තුළ දී ද සිසුන් බඳවා ගැනීමේ වර්ධනයක් අපේක්ෂා කරනු ලබයි.

මොරටුව ප්‍රදේශයේ පිහිටි වෙනත් රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතන ලෙස ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය, නවීන තාක්ෂණය පිළිබඳ ආතර් සී. ක්ලාර්ක් මධ්‍යස්ථානය, හස්ත කර්මාන්ත උසස් අධ්‍යාපන ආයතනය, බ්‍රැන්ඩෙක්ස් ඇඟලුම් තාක්ෂණික විද්‍යායතනය, ජාතික මෝස්තර මධ්‍යස්ථානය, ජර්මන් කාර්මික අභ්‍යාස ආයතනය, කර්මාන්ත ඉංජිනේරු අභ්‍යාස ආයතනය සඳහන් කල හැකිය. මොරටුව නගර සභා බල ප්‍රදේශයේ අධ්‍යාපන පහසුකම් ව්‍යාප්තිය පිළිබඳව ඇමුණුම් අංක 4 හි දක්වා ඇත.

## ඈ) අපරාධ හා මත්ද්‍රව්‍ය භාවිතය

2018 මොරටුව පොලිස් වාර්තා අනුව ලුනාව, කොරලවැල්ල, මෝදර, කටුබැද්ද, ඉඩම, ලක්ෂපතිය හා රතුකුරුස වත්ත යන ග්‍රාම නිලධාරී කොට්ඨාශ ආශ්‍රිතව මත්ද්‍රව්‍ය පැමිණිලි හා අපරාධ වැඩි වශයෙන් වාර්තා වන අතර එම සමාජයීය ගැටළුවල ව්‍යාප්තිය වගු අංක 2.5. හි දක්වා ඇත.

| වර්ෂය | වාර්තා වූ අපරාධ ගණන | අවදානම් ප්‍රදේශ | වාර්තා වූ මත්ද්‍රව්‍ය පැමිණිලි | අවදානම් ප්‍රදේශ |
|---|---|---|---|---|
| 2013 | 552 | කොරලවැල්ල<br>ලුනාව<br>ඉඩම<br>මෝදර<br>කටුබැද්ද<br>ලක්ෂපතිය | 2,030 | ලුනාව<br>රතුකුරුස වත්ත<br>කටුබැද්ද<br>කොරලවැල්ල |
| 2014 | 362 | | 1,933 | |
| 2015 | 338 | | 1,241 | |
| 2016 | 333 | | 1,191 | |
| 2017 නොවැම්බර් | 232 | | 1,110 | |


**වගුව 2.5 :** *මොරටුව ප්‍රදේශයේ වාර්තා වූ අපරාධ හා මත්ද්‍රව්‍ය පැමිණිලි 2013 – 2017*
**මූලාශ්‍රය :** *මොරටුව පොලිස් වාර්තා, 2018*

## ඉ) පොදු එළිමහන් විනෝද කටයුතු පහසුකම්

සෘජු සහ වක්‍ර විනෝද පහසුකම් ලෙස ප්‍රධාන අංශ දෙකක් යටතේ විනෝද පහසුකම් සලකා බලන අතර මොරටුව මහ නගර සභා බල ප්‍රදේශයේ සෘජු විනෝද පහසුකම් සඳහා වෙන් කර ඇති භූමි අවකාශ පහත වගු අංක 2.6 මගින් හා සිතියම් අංක 2.6 මගින් නිරූපනය කරනු ලබයි.

| උද්‍යාන වර්ගය | උද්‍යාන කේතය | ග්‍රාම නිලධාරී වසම | ප්‍රමාණය(හෙක්ටයාර) |
|---|---|---|---|
| ඉතා කුඩා උද්‍යාන (EPP) | EPP 01 | කොරළවැල්ල දකුණ | 0.11 |
| | EPP 02 | බොරුපන | 0.06 |
| | EPP 03 | උයන දකුණ | 0.08 |
| | EPP 04 | කටුබැද්ද | 0.09 |
| | EPP 05 | ලක්ෂපතිය මධ්‍යම | 0.05 |
| **පවතින ඉතා කුඩා උද්‍යාන - Existing Pocket Parks** | | | **0.39** |
| කුඩා උද්‍යාන (EMP) | EMP 01 | එගොඩඋයන දකුණ | 0.6 |
| | EMP 02 | ඉදිබැද්ද නැගෙනහිර | 0.8 |
| | EMP 03 | කඩොලාන | 0.6 |
| | EMP 04 | විල්ලොරවත්ත බටහිර | 0.6 |
| | EMP 05 | මොරටුවත්ත උතුර | 0.3 |
| | EMP 06 | කල්දෙමුල්ල | 0.2 |
| | EMP 07 | ලක්ෂපතිය මධ්‍යම | 0.3 |
| **පවතින කුඩා උද්‍යාන- Existing Mini Parks** | | | **3.4** |
| ප්‍රාදේශීය උද්‍යාන (ELP) | ELP 01 | රාවතාවත්ත නැගෙනහිර | 1.6 |
| | ELP 02 | සොයිසාපුර දකුණ | 2.4 |
| **පවතින අසල උද්‍යාන- Existing Local Parks** | | | **4.0** |
| රේඛීය උද්‍යාන (ELP) | ELiP 01 | ලුනාව කලපුව වටා ඇවිදින මංතීරු | 0.74 |
| | ELiP 02 | කටුබැද්ද ඇවිදින මංතීරු | 0.35 |
| **පවතින රේඛීය උද්‍යාන- Existing Linear Parks** | | | **1.09** |
| **එකතුව** | | | **8.88** |

**වගුව 2.6 :** මොරටුව මහ නගර සභා බල ප්‍රදේශයේ උද්‍යාන වර්ගය අනුව සංයුතිය
**මූලාශ්‍රය :** නාගරික සංවර්ධන අධිකාරිය, 2018




**සිතියම 2.6 :** *මොරටුව මහ නගර සභා බල ප්‍රදේශයේ උද්‍යාන ව්‍යාප්තිය* **මූලාශ්‍රය :** *නාගරික සංවර්ධන අධිකාරිය, 2018*

## 2.2.2.4. පාරිසරික අංශය



මෙහිදී මොරටුව ප්‍රදේශයට ආවේණික වූ පාරිසරික සම්පත් හා මුහුණපෑමට සිදු වන ස්වාභාවික ආපදා සම්බන්ධයෙන් දීර්ඝ වශයෙන් සාකච්ඡා කරනු ඇත.

### *අ) පාරිසරික සම්පත්*

පහතරට තෙත් කලාපයට අයත්  මොරටුව නගරය ප්‍රධාන වර්ෂාපතන සෘතු දෙකෙන් ම වර්ෂාව ලබන අතර  සාමාන්‍ය වාර්ෂික වර්ෂාපතනය මිලි මීටර 2000 ඉක්මවනු ලබයි.

ප්‍රධානම ජල මූලාශ්‍රය මෙන්ම මොරටුව නැගෙනහිර මායිම ලෙසද බොල්ගොඩ ගංගාව හඳුනා ගත හැකි අතර, බොල්ගොඩ ගංගාවෙහි උතුරු ගංගා ප්‍රදේශය වේරස් ගඟ ලෙස ද, මොරටුමුල්ල ආසන්න ප්‍රදේශයේ දී එය බොල්ගොඩ වැව ලෙසද දකුණු ගංගා ප්‍රදේශය පානදුර ගඟ ලෙසද හඳුන්වනු ලබයි. ඒ අනුව බොල්ගොඩ ජලාභිමුඛ ප්‍රදේශය කි.මී. 20 ක දිගකින් යුතුව විහිදී ඇති අතර බොල්ගොඩ ගංගාව ග්‍රාම නිලධාරි වසම් 21 ක් හරහා ගලා බසින අතර ප්‍රදේශයේ ඉහල ජෛව විවිධත්වයක් පවත්වා ගැනීමටත් පාරිසරික සමතුලිතතාව ආරක්ෂා කර ගැනීමටත් විශාල පිටුවහලක් වනු ඇත.



***රූප සටහන 2.11 :*** *කොළඹ දිස්ත්‍රික්කයේ හා මොරටුව මහ නගර සභා ප්‍රදේශයේ තෙත්බිම් ව්‍යාප්තිය- 2015*
***මූලාශ්‍රය :*** *නාගරික සංවර්ධන අධිකාරිය, 2018*


**02 පරිච්ඡේදය**
**මූලික අධ්‍යයනය**

සැලසුම් සහ තත්ත්ව සන්දර්භය

වර්තමාන මොරටුව

වර්ග කි.මී. 0.3 ක වපසරියකින් යුතු හා කි.මී. 6 ක දිගින් යුතු ජලාභිමුඛ ප්‍රදේශයක් සහිත ලුනාව කලපුව මොරටුව නගරයේ පළමුවැනි විශාලතම අභ්‍යන්තර තෙත්බිම ලෙස හැඳින්විය හැක. බොල්ගොඩ ගංගාව හා සම්බන්ධ වන වර්ග කි.මී. 0.2 ක වපසරියකින් යුතු හා කි.මී. 4 ක දිගින් යුතු ජලාභිමුඛ ප්‍රදේශයක් සහිත කටුබැද්ද වගුරුබිම මොරටුව ප්‍රදේශයේ දෙවන විශාලතම අභ්‍යන්තර තෙත්බිම ලෙස හඳුනා ගත හැකි ය. මොරටුව මහ නගර සභා සීමාවේ බටහිර මායිම ලෙස සලකනු ලබන වෙරළ තීරය කි.මී. 10.5 ක දිගින් යුක්ත වේ.

රූප සටහන් අංක 2.10 මගින් මොරටුව ප්‍රදේශය ආශ්‍රිතව පැතිරුණු තෙත්බිම් සැලැස්ම හා රූප සටහන් අංක 2.11 හි මගින් මොරටුව ප්‍රදේශය තුළ ජල විද්‍යාත්මක පද්ධතියෙහි පිහිටීම පෙන්වා ඇත.




***රූප සටහන 2.12 :*** *මොරටුව ජල විද්‍යාත්මක පද්ධතිය*
***මූලාශ්‍රය :*** *නාගරික සංවර්ධන අධිකාරිය, 2018*

## ආ) ස්වාභාවික ආපදා



මොරටුව මහ නගර සභා බල ප්‍රදේශයට බලපාන ආපදා තත්ත්ව ලෙස සුළි සුළං, ගංවතුර, මුහුදු ඛාදනය හා සුනාමි බලපෑම් හඳුනා ගත හැකි වේ.

i. සුළි සුළං

මොරටුව මහ නගර සභා බල ප්‍රදේශයට බලපාන ප්‍රධානතම ආපදා තත්ත්වය ලෙස සුළි සුළං දැක්විය හැකිය. 2014 වර්ෂයේ සිට 2018 වර්ෂය දක්වා සෑම වර්ෂයකම මොරටුවැල්ල බටහිර, කොරළවැල්ල බටහිර, එගොඩ උයන උතුර , එගොඩ උයන මධ්‍යම සහ දකුණ ඉඳිබැද්ද බටහිර සහ නැගෙනහිර යන ග්‍රාම නිලධාරී වසම් සුළි සුළං බලපෑමට ලක්වී ඇති අතර (වගු අංක 2.7) සුළි සුළං හේතුවෙන් බොහෝ විට නිවාස වල වහල වලට හානි සිදුවී ඇත.

| වර්ෂය | නිවාස හානි සංඛ්‍යාව |
|---|---|
| 2014 | 427 |
| 2015 | 71 |
| 2016 | 84 |
| 2017 | 2794 |
| 2018 | 161 |

**වගුව 2.7 :** සුළි සුළං හේතුවෙන් නිවාස හානි
**මූලාශ්‍රය :** මොරටුව ප්‍රදේශීය ලේකම් කාර්යාලය, 2018

ii. ගංවතුර

බොල්ගොඩ ගඟ පිටාර ගැලීම මඟින් ගඟ ඉවුරේ පිහිටි බොරුපන, තෙලවල උතුර, තෙලවල දකුණ, කටුබැද්ද, මෝල්පෙ, විල්ලෝරවත්ත නැගෙනහිර, මොරටුමුල්ල උතුර, මොරටුමුල්ල බටහිර සහ ඉඳිබැද්ද බටහිර යන ග්‍රාම නිලධාරී වසම් වල 2018 වර්ෂයේ සහ 2016 වර්ෂයේ ගංවතුර හේතුවෙන් හානියට පත් වූ නිවාස සංඛ්‍යාව පිළිවලින් 938 ක් සහ 462 ක් ලෙස වාර්තා වේ.

iii. මුහුදු ඛාදනය

2018 වර්ෂයේදී උස්වත්ත, අඟුලාන උතුර සහ අඟුලාන දකුණ යන ග්‍රාම නිලධාරී වසම් වල මුහුදු ඛාදනය හේතුවෙන් නිවාස හානි 25 ක් හානියට පත් වූ බවට වාර්තා වී ඇත.

iv. සුනාමි

2004 වර්ෂයේ ඇතිවූ සුනාමි ව්‍යසනය හේතුවෙන් අඟුලාන උතුර, අඟුලාන දකුණ, එගොඩ උයන මධ්‍යම, එගොඩ උයන උතුර, එගොඩ උයන දකුණ, කටුකුරුන්ද උතුර, කටුකුරුන්ද දකුණ, කොරළවැල්ල උතුර, කොරළවැල්ල දකුණ, කොරළවැල්ල බටහිර, මොරටුවැල්ල දකුණ, මොරටුවැල්ල බටහිර, උස්වත්ත, උයන උතුර සහ උයන දකුණ යන මුහුදුබඩ ග්‍රාම නිලධාරී වසම්හි නිවාස ඒකක 5,050 ක් පමණ පූර්ණ හා අර්ධ ලෙස හානියට පත් විය.


**02 පරිච්ඡේදය**
**මූලික අධ්‍යයනය**

සැලසුම් සහ තත්ත්ව සන්දර්භය

පූර්ව සැලසුම් ප්‍රයත්න

## 2.2.3. පූර්ව සැලසුම් ප්‍රයත්න


1998 වර්ෂයේ දී නාගරික සංවර්ධන අධිකාරිය විසින් බස්නාහිර පළාත ආවරණය වන පරිදි සකස් කරන ලද කොළඹ මහා නාගරික කලාපීය ව්‍යුහාත්මක සැලැස්ම (රූප සටහන් අංක 2.13 ) මගින් නාගරික ධුරාවලියක් හඳුන්වා දී ඇති අතර එහි සඳහන් වන පරිදි කොළඹ මහ නගර සභා ප්‍රදේශය ජාතික මධ්‍යස්ථානය ලෙසත් මොරටුව ඇතුළු දෙහිවල, කළුතර, මීගමුව හා ගම්පහ යන නගර කලාපීය මධ්‍යස්ථාන ලෙසත්, හොරණ, මතුගම, බේරුවල, බියගම හා ජා-ඇල යන නගර ප්‍රධාන නාගරික මධ්‍යස්ථාන ලෙසත් හඳුනා ගෙන ඇත.




*රූප සටහන 2.13 : කොළඹ මහානාගරික කලාපීය ව්‍යුහාත්මක සැලැස්ම - 1998*
*මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය, 2018*


2030 වර්ෂය සඳහා පිළියෙළ කරනු ලැබූ බස්නාහිර පළාත් මහ නගර සැලැස්ම (රූප සටහන් අංක 2.14) මගින් බස්නාහිර පළාත කලාප හයකට බෙදා ඇති අතර අධි ඝනත්ව කලාපයෙහි පිහිටා ඇති මොරටුව, මීගමුව සිට අලුත්ගම දක්වා දිවෙන සංචාරක කලාපයේ පිහිටි කොළඹ හර ප්‍රදේශයට ඉතා ආසන්න උප නගරයක් ලෙසද හඳුනා ගෙන ඇත.







*රූප සටහන 2.14 : බස්නාහිර පළාත් මහානගර සැලැස්ම - 2030*
*මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය, 2016*

එසේම ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව මගින් පිළියෙල කරන ලද ජාතික භෞතික ව්‍යුහාත්මක සැලැස්ම 2030 අනුව (රූප සටහන් අංක 2.15), කොළඹ අධි නාගරීකරණ කලාපය තුළට මොරටුව නගරය ඇතුළත් කර ඇති අතර, එම දෙපාර්තමේන්තුව මගින් පිළියෙල කරන ලද යෝජිත අවකාශීය ව්‍යුහාත්මක සැලැස්ම 2050 අනුව (රූප සටහන් අංක 2.16), මොරටුව නගරය ආර්ථික කලාපය තුළ පිහිටි නගරයක් ලෙසද සංවර්ධනය කිරීමට හඳුනා ගෙන ඇත.




*රූප සටහන 2.15 : ජාතික භෞතික ව්‍යුහාත්මක සැලැස්ම - 2030*
*මූලාශ්‍රය : ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව, 2016*




*රූප සටහන 2.16 : යෝජිත අවකාශීය ව්‍යුහාත්මක සැලැස්ම - 2050*
*මූලාශ්‍රය : ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුව, 2016*

## 2.3. සැලසුම් ප්‍රදේශය නිර්ණය කිරීම


මොරටුව සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීම සඳහා සැලසුම් සීමාව නිර්ණය කිරීමේදී ප්‍රදේශයේ පවතින නව සංවර්ධන ප්‍රවණතා පිළිබඳව සලකා බැලූ අතර 2.2.2 පරිච්ඡේදයේ දක්වා ඇති පරිදි ප්‍රදේශයේ ආර්ථික, සමාජයීය, පාරිසරික හා භෞතික ලක්ෂණ කෙරෙහිද අවධානය යොමු කරන ලදි.

### 2.3.1. සැලසුම් සීමාව හඳුනා ගැනීම

වර්ග කි.මී. 23.4 ක් වැනි කුඩා භූමි භාගයක පැතිරී ඇති මොරටුව මහ නගර සභා බල ප්‍රදේශය, මොරටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය හා මොරටුව ඡන්ද කොට්ඨාශය එකම භෞතික සීමාවකින් සමන්විත වීම හේතුවෙන් සැලසුම් ප්‍රදේශයේ ක්‍රියාකාරී සීමාව, පරිපාලන කොට්ඨාශය හා සැලසුම් ප්‍රදේශයද එකම සීමාවක් වීම පදනම් කර ගෙන මෙම සංවර්ධන සැලැස්ම සකස් කිරීමේදී මොරටුව මහ නගර සභා බල ප්‍රදේශය සැලසුම් ප්‍රදේශය ලෙස යොදා ගන්නා ලදි.

### 2.3.2. සැලසුම් සීමාව

උතුරින් රත්මලාන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය, නැගෙනහිරින් බොල්ගොඩ ගංගාව, දකුණින් කළුතර දිස්ත්‍රික්කයට අයත් පානදුර ප්‍රදේශය හා බොල්ගොඩ ගංගාව, බටහිරින් මුහුදු තීරය යන සීමාවන්ගෙන් හා ග්‍රාම නිලධාරී කොට්ඨාශ 42 කින් සමන්විත මොරටුව මහ නගර සභා  සැලසුම් ප්‍රදේශය පහත සිතියම් අංක 2.6 මගින් දැක්වේ.




**සැලසුම් සීමාව - 2019**
**මොරටුව මහ නගර සභා ප්‍රදේශය**

0 0.35 0.7 1.4 2.1 2.8 Kilometers

නාගරික සංවර්ධන අධිකාරිය
දෙසැම්බර් 2018

මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය | මොරටුව සංවර්ධන සැලැස්ම (2019-2030) | සැකසුම: බස්නාහිර පළාත් අංශය හා පර්යේෂණ හා සංවර්ධන ඒකකය

***සිතියම 2.7 :** මොරටුව මහ නගර සභා ප්‍රදේශයේ සැලසුම් සීමාව*

***මූලාශ්‍රය :** නාගරික සංවර්ධන අධිකාරිය, 2018*

# 03

## පරිච්ඡේදය



# සංවර්ධන සැලැස්මක අවශ්‍යතාවය

03 පරිච්ඡේදය
සංවර්ධන සැලැස්මක අවශ්‍යතාවය

හැඳින්වීම

ගැටළු හඳුනා ගැනීම

ප්‍රදේශයේ පවතින විභවතා සංවර්ධනය සඳහා දායක කර නොගැනීම

# 3.1. හැඳින්වීම

මොරටුව මහ නගර සභාව සඳහා නව සංවර්ධන සැලැස්මක් පිළියෙළ කිරීමේ අවශ්‍යතාවය හඳුනා ගැනීම මෙම පරිච්ඡේදයේ අරමුණ වේ. 2005–2020 සඳහා සකස් කරන ලද සංවර්ධන සැලැස්මේ වලංගු කාලය අවසන් වීමට ආසන්නව පැවතීම නව සංවර්ධන සැලැස්මක් පිළියෙළ කිරීමේ අවශ්‍යතාවයක් පැන නැඟීමට එක් හේතුවකි.

තවද 2005–2020 සංවර්ධන සැලැස්මේ පැවති සාර්ථක උපායමාර්ග ඉදිරියට ගෙන යන අතරම එහි පැවති දුර්වලතා මඟ හරවා ගනිමින් නව සැලසුම් ක්‍රියාමාර්ග සඳහා යොමු වීමට අදහස් කරනු ලබන අතර, ප්‍රකාශිත සංවර්ධන සැලැස්ම මගින් ආවරණය නොකරන ලද නව සංවර්ධන ප්‍රවණතා හඳුනා ගෙන එමගින් උපායශීලී ක්‍රියාමාර්ග කරා යොමු වීමටද අපේක්ෂා කරනු ලබයි.

මොරටුව ප්‍රදේශයේ පවතින ස්වාභාවික සම්පත් ආරක්ෂා කර ගැනීමටත් එම සම්පත් සංවර්ධන කටයුතු සඳහා දායක කර ගැනීමටත් ප්‍රදේශයේ ජීවත් වන ජනතාවට සුවපහසු හා ආරක්ෂාකාරී වටපිටාවක් නිර්මාණය කිරීම උදෙසාත් නව සංවර්ධන සැලැස්මක් සකස් කිරීමේ අවශ්‍යතාවයක් පවතින බව හඳුනා ගන්නා ලදී.

# 3.2. ගැටළු හඳුනා ගැනීම

පරිච්ඡේද 1.2. හි සඳහන් පාර්ශවකරුවන්ගේ අදහස් හා යෝජනා මෙන්ම ප්‍රාථමික හා ද්විතීයික දත්ත මූලාශ්‍ර තුලින් හඳුනා ගන්නා ලද ගැටළුවල තීව්‍රතාවය අනුව ප්‍රමුඛතා පෙළගැස්මක් සකස් කරන ලද අතර එහි සාරාංශය පහත වගු අංක 3.1හි දැක්වේ.

| ප්‍රමුඛතාව | හඳුනා ගත් ගැටලුව | විස්තරය |
|---|---|---|
| *01* | *ප්‍රදේශයේ පවතින විභවතා සංවර්ධනය සඳහා දායක කර නොගැනීම* | i. *දර්ශනීය මුහුදු තීරය, බොල්ගොඩ ගඟ හා ලුනාව කලපුව ආදී සම්පත් තිරසාර කළමනාකරණය නොකිරීම හා එම ජල මූලාශ්‍ර කරා ජනතාවට ප්‍රවේශ වීමේ හැකියාවක් නොමැති වීම*<br>ii. *නගර මධ්‍යයේ පවතින ඉඩම් ප්‍රශස්ත ලෙස සංවර්ධනයට යොදා නොගැනීම* |
| *02* | *අඩු ආදායම්ලාභී ජනතාව රක්ෂිත කලාප ආක්‍රමණය කිරීම හා සිදු කරනු ලබන අනවසර ඉදිකිරීම්* | i. *ජනාවාස ආශ්‍රිතව සිදු වන පාරිසරික දූෂණය*<br>ii. *සමාජයීය ගැටළු*<br>iii. *සෞඛ්‍යය ගැටළු* |

***වගුව 3.1 :*** *හඳුනා ගත් ගැටළු ප්‍රමුඛතා අනුපිළිවෙල*
***මූලාශ්‍රය :*** *නාගරික සංවර්ධන අධිකාරිය, 2018*

## 3.2.1. ප්‍රදේශයේ පවතින විභවතා සංවර්ධනය සඳහා දායක කර නොගැනීම.

### අ) දර්ශනීය මුහුදු තීරය, බොල්ගොඩ ගඟ හා ලුනාව කලපුව ආදී සම්පත් තිරසාර කළමනාකරණය නොකිරීම හා එම ජල මූලාශ්‍ර කරා ජනතාවට ප්‍රවේශ වීමේ හැකියාවක් නොමැති වීම.

නැගෙනහිරින් හා දකුණු දිශාවෙන් බොල්ගොඩ ගංගාවෙන්ද, බටහිර දිශාවෙන් දර්ශනීය මුහුදු තීරයෙන්ද වට වී ඇති හා කොරලවැල්ලේ සිට එගොඩ උයන දක්වා බොල්ගොඩ ගංගාවෙන් හා මුහුදු තීරයෙන්ද මායිම් වූ මීටර 500–800 ක් අතර පටු භූමි තීරයකින් සමන්විත මොරටුව මහ නගර සභා බල ප්‍රදේශය කොළඹ අග නගරයට ආසන්නව මෙවැනි සුවිශේෂිත පිහිටීමක් දක්නට ලැබෙන එකම නගරය ලෙස

මොරටුව හඳුන්වා දිය හැක. ලුනාව කලපුව හා අනෙකුත් තෙත්බිම් හා වගුරු බිම් ප්‍රදේශයේ ජලය රඳවා තබා ගන්නා ප්‍රධාන මූලාශ්‍රයන් වන අතර මොරටුව මහ නගර සභා ප්‍රදේශය දියසරු ප්‍රදේශයක් ලෙස හඳුන්වා දිය හැකි වේ. (රූප සටහන් අංක 3.1, 3.2 හා 3.3)



***රූප සටහන 3.1 :*** *බොල්ගොඩ ගංඟාව*
***ඡායාරූප අනුග්‍රහය ඉහල වම :*** *www.flickr.com ; ඡායාරූප ශිල්පී: නතාලි සොයිසා,*
***ඡායාරූප අනුග්‍රහය ඉහළ දකුණ :*** *www.flickr.com ; ඡායාරූප ශිල්පී : සමන් පෙරේරා ,*
***ඡායාරූප අනුග්‍රහය පහල :*** *www.flickr.com ; ඡායාරූප ශිල්පී: චන්න සේනාරත්න*




***රූප සටහන 3.2 :*** *අඟුලාන මුහුදු වෙරළ*
***ඡායාරූප අනුග්‍රහය :*** *www.flickr.com ; ඡායාරූප ශිල්පී: තිසල් කළුආරච්චි*



**රූප සටහන 3.3 :** ලුනාව කලපුව
**ඡායාරූප අනුග්‍රහය ඉහළ වම් කෙළවර :** : www.flickr.com ; ඡායාරූප ශිල්පී: මෙල්ශිරාන්, ඡායාරූප අනුග්‍රහය ඉහළ දකුණු කෙළවර: නාගරික සංවර්ධන අධිකාරිය, ඡායාරූප අනුග්‍රහය පහළ වම් කෙළවර, මැද, දකුණු කෙළවර: www.flickr.com ; ඡායාරූප ශිල්පී: නිශාන්

මොරටුව සැලසුම් ප්‍රදේශය 19% ක ස්වාභාවික ජල මූලාශ්‍රයන්ගෙන් යුක්ත වූවද, එම සම්පත් නගරයේ සංවර්ධන කටයුතු සඳහා දායක කර ගැනීමකින් තොරව හුදකලාව පැවතීම හේතුවෙන් ජනතාවට සම්පත් කරා ප්‍රවේශ වීමට නොහැකිව එහි සුන්දරත්වය අත්විඳීමට ඇති අවස්ථාවද මඟහැරී ඇති අතර ක්‍රමක්‍රමයෙන් පරිහානියට පත් වන බවද නිරීක්ෂණය කල හැකි වේ.

## ආ) නගර මධ්‍යයේ පවතින ඉඩම් ප්‍රශස්ත භාවිතයන් සඳහා යොදා නොගැනීම.

මොරටුව සැලසුම් ප්‍රදේශය තුන් පැත්තකින්ම රක්ෂිත වලින් වට වූ වර්ග කිලෝ මීටර් 23.4 ක් වැනි කුඩා භූමි ප්‍රමාණයකට සීමා වීම හේතුවෙන් පරිභෝජනය සඳහා වන ඉඩම් සීමිත වන අතර මූල්‍යමය හා සෞන්දර්යාත්මක වටිනාකමකින් යුතු නගර මධ්‍යයේ පිහිටි රජයේ ඉඩම් මනා කළමනාකාරිත්වයකින් යුතුව සංවර්ධන කටයුතු සඳහා යොදා නොගැනීම ප්‍රධාන ගැටළුවක් බවට පත්වී ඇත. උදාහරණ පහත පරිදි දැක්විය හැක.

- ගාළු පාරට මුහුණලා පිහිටි ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව සතු අක්කර 08 ක ඉඩම (රූප සටහන් අංක 3.4).
- මොරටුව පොලිස් ස්ථානය පිහිටි පුරාවිද්‍යාත්මක වටිනාකමකින් යුතු ගොඩනැගිල්ල හා ඊට අදාළ අක්කර 3.5 පමණ වපසරියකින් යුතු ඉඩම (රූප සටහන් අංක 3.5).
- බොරුපන පාර, මාලිගාව පාර හා රත්මලාන ප්‍රදේශයට යාබද මොරටුව උතුරු මායිම් ප්‍රදේශයේ පවතින කර්මාන්ත, ගුදම් හා ගබඩා සඳහා යොදා ගෙන ඇති ඉඩම්. (රූප සටහන් අංක 3.6).




***රූප සටහන 3.4 :*** *ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තමේන්තුව සතු ඉඩම*
***ඡායාරූප අනුග්‍රහය :*** *නාගරික සංවර්ධන අධිකාරිය, 2017*



***රූප සටහන 3.5 :*** *මොරටුව පොලිස් ස්ථානය පිහිටි පුරාවිද්‍යාත්මක වටිනාකමකින් යුතු ගොඩනැගිල්ල පිහිටි ඉඩම*
***ඡායාරූප අනුග්‍රහය :*** *නාගරික සංවර්ධන අධිකාරිය, 2017*




***රූප සටහන 3.6 :** මොරටුව උතුරු මායිම් ප්‍රදේශයේ පවතින කර්මාන්ත, ගුදම් හා ගබඩා*
***ඡායාරූප අනුග්‍රහය :** Google Street View*



***රූප සටහන 3.7 :** වෙරළ රක්ෂිතය හා දුම්රිය රක්ෂිතයේ පවතින අනවසර ඉදිකිරීම්*
***ඡායාරූප අනුග්‍රහය :** නාගරික සංවර්ධන අධිකාරිය, 2018*

## 3.2.2. අඩු ආදායම්ලාභී ජනතාව රජයේ ඉඩම් හා රක්ෂිත අල්ලා ගැනීම හා අනවසර ඉදිකිරීම්

මොරටුව නගරය පරිසර සංවේදී ප්‍රදේශ වැඩි ප්‍රමාණයකින් සමන්විත වීම හේතුවෙන් සංවර්ධන කටයුතු සඳහා යොදා ගත හැකි ඉඩම් ප්‍රමාණය සීමිත වේ. එකී ඉඩම් කොටස්හි ඉහල මූල්‍යමය වටිනාකමක් පැවතීම හේතුවෙන් වඩු කර්මාන්තය හා ධීවර කර්මාන්තයේ නියුතු අඩු ආදායම්ලාභී ජනතාව රක්ෂිත හා රජයේ ඉඩම් නිවාස ඉදි කර ගැනීම සඳහා යොදා ගැනීම හේතුවෙන් එම රක්ෂිත හා රජයේ ඉඩම් කොටස්හි අනවසර ඉදිකිරීම් සීග්‍ර ලෙස වැඩි වී ඇති අතර, මෙම තත්ත්වය මොරටුව ප්‍රදේශය සංවර්ධනයේ දී ප්‍රධාන ගැටළුවක් බවට පත්වී ඇත.

2017.12.11 වන දින පැවති පාර්ශවකරුවන්ගේ රැස්වීමේදී බොල්ගොඩ ගඟ, දුම්රිය හා වෙරළ රක්ෂිතයන්හි අනවසර පවුල් 1500 ක් පමණ ජීවත්වන බව ප්‍රකාශ කරන ලද අතර තවද අනවසර පවුල් 1000 ක් පමණ ජීවත්වන රජයේ ඉඩම් ලෙස දන්දෙනිය වත්ත, සමරකෝන් වත්ත, පිට්ටනිය වත්ත හා බැටරි වත්ත දැක්විය හැකිය. රූප සටහන් අංක 3.7 මගින් වෙරළ හා දුම්රිය රක්ෂිතයේ පවතින අනවසර ඉදිකිරීම් ව්‍යාප්තිය පිළිබඳව පැහැදිලි කර ඇත.

## අ) ජනාවාස ආශ්‍රිතව සිදු වන පාරිසරික දූෂණය

ඉහත ජනාවාස ආශ්‍රිතව ප්‍රමාණවත් ඉඩ පහසුකම් නොමැති වීම හේතුවෙන් විධිමත් ලෙස කැළිකසල බැහැර කිරීම හා අපජලය බැහැර කිරීම සඳහා ක්‍රමවේදයක් නොමැති අතර බොහෝ පැල්පත් නිවාස ආශ්‍රිතව උත්පාදනය වන අපද්‍රව්‍යය යාබද ජල මූලාශ්‍ර වෙත මුදා හැරීම හේතුවෙන් එම ජල මූලාශ්‍ර දූෂණයට ලක්ව ඇත. තවද ඉදිකිරීම් කටයුතු සඳහා කඩොලාන ශාඛ පද්ධතිය විනාශ කිරීම හේතුවෙන් ජෛව විවිධත්වය හායනය වීම හා කඩොලාන ශාක මගින් ස්වාභාවිකව සිදු වන ජල පිරිපහදුවට බාධා පැමිණීම ගැටළුකාරී තත්ත්වයක් ලෙස හඳුනාගෙන ඇත.

තවදුරටත් වඩු කර්මාන්තයේ අතුරුඵල ලෙස නිපදවෙන ලී කුඩු ජලාශ්‍රිත ප්‍රදේශ ගොඩ කිරීම සඳහා යොදා ගැනීම හා ලී කුඩු දහනය නිසා නිපදවෙන අධික තාප ශක්තිය හේතු කොට ගෙන පාංශු දූෂණය හා වායු දූෂණය සිදුවේ.

## ආ) සමාජයීය ගැටලු

ඉහත පරිච්ඡේද 2.2.2.3. (ඇ) හි සඳහන් වන පරිදි අඩු ආදායම්ලාභී ජනාවාස පිහිටි ප්‍රදේශ ආශ්‍රිතව අපරාධ හා මත්ද්‍රව්‍ය පිළිබඳ පැමිණිලි වැඩි වශයෙන් වාර්තා වන අතර මෙම ජනාවාස ආශ්‍රිතව ඇති භෞතික ආකෘතිය එනම් ඉතා පටු ජන ශූන්‍ය මාර්ග (දෝරු මාර්ග) ජාලයක් පැවතීම හා එම මාර්ග තවදුරටත් අවහිර කරමින් ගොඩනැගිලි ඉදිකිරීම හේතුවෙන් නිර්මාණය වී ඇති සංවෘත අවකාශය, අපරාධ හා මත් ද්‍රව්‍ය වෙළදාම සඳහා සුදුසු වටපිටාවක් තනා දීමට හේතු වී ඇත.

## ඇ) සෞඛ්‍යය ගැටලු

පැල්පත් හා මුඩුක්කු ආශ්‍රිතව ජීවත්වන ජනතාව සඳහා මූලික අවශ්‍යතා හා යටිතල පහසුකම් අවම වීම හේතුවෙන් එම ජනාවාස ආශ්‍රිතව සීඝ්‍ර ලෙස බෝවන රෝග ව්‍යාප්ත වීමේ ප්‍රවණතාවයක් දක්නට ලැබෙන අතර, ඉහත පරිච්ඡේද 2.2.2.3.( ආ) අනුව ක්ෂය රෝගය හා ලාදුරු රෝග සඳහා හඳුනා ගෙන ඇති අවදානම් ප්‍රදේශ වැඩි වශයෙන් අඩු ආදායම්ලාභී ජනාවාස පිහිටා ඇති ප්‍රදේශ ලෙසට තහවුරු වී ඇත. තවද රෝග වැළඳුනු අවස්ථාවන්හිදී නිවැරදි ප්‍රතිකාර ක්‍රම සඳහා යොමු නොවීම හා එම ජනාවාස තුළම සැඟවී ජීවත් වීම මෙම බෝවන රෝග පැතිරීයාමට හේතුවී ඇත.

## 03 පරිච්ඡේදය
## සංවර්ධන සැලැස්මක අවශ්‍යතාවය

හැඳින්වීම

ගැටළු හඳුනා ගැනීම

අඩු ආදායම්ලාභී ජනතාව රජයේ ඉඩම් හා රක්ෂිත අල්ලා ගැනීම හා අනවසර ඉදිකිරීම්

ඉහත පරිච්ඡේද 3.2.1 හි විස්තර කර ඇති පරිදි මොරටුව සැලසුම් ප්‍රදේශය සතු විභවතා මනා කළමනාකරණයකින් යුතුව සංවර්ධන කටයුතු සඳහා යොදා නොගැනීම හා පරිච්ඡේද 3.2.2 හි විස්තර කරන ලද රක්ෂිත හා රජයේ ඉඩම් අඩු ආදායම්ලාභීන් විසින් අල්ලා ගැනීම හා අනවසරයෙන් ඉදිකිරීම් සිදු කිරීම වැලැක්වීම සඳහා විසඳුම් ලබා දිය යුතු ප්‍රායෝගික තත්ත්වයක් උදා වී ඇත.

ඒ අනුව භෞතික, ආර්ථික, සමාජයීය හා පාරිසරික අංශ නඟා සිටුවීම සඳහා ඒකාබද්ධ වූ උපායශීලී සැලසුම් ක්‍රියාවලියක් අනුගමනය කරමින් මොරටුව ප්‍රදේශයට ආවේණික වූ නව සංවර්ධන ප්‍රවණතා අන්තර්ග්‍රහණය කොට දැනට ප්‍රකාශිත සංවර්ධන සැලැස්ම 2019–2030 සඳහා යාවත්කාලීන කිරීමේ අවශ්‍යතාවය හඳුනා ගන්නා ලදී.

මෙහිදී ප්‍රධාන ගැටළුව බවට පත් වී ඇති රක්ෂිත හා රජයේ ඉඩම්හි සිදු වන අනවසර ඉදිකිරීම් හා අල්ලා ගැනීම් ඉවත් කොට ප්‍රධාන විභවතාව වූ ජල තීර මහජනතාවට විවෘත කරමින් ජලාභිමුඛ සංවර්ධනයක් ඇති කිරීම සඳහා මොරටුව සංවර්ධන සැලැස්ම 2019– 2030 පිළියෙළ කරනු ලබයි.



# දෙවන කොටස

**මොරටුව මහ නගර සහා බල ප්‍රදේශයෙන් සමන්විත වන**
**මොරටුව නාගරික සංවර්ධන ප්‍රදේශය සඳහා වූ**
**සංවර්ධන සැලැස්ම අනුමත කිරීම**

මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය පාඨලී චම්පික රණවක වන මම, 1982 අංක 04 දරණ නාගරික සංවර්ධන අධිකාරි (සංශෝධිත) පනතේ 8 "ඊ" වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, 2019 මැයි 28 වන දින නාගරික සංවර්ධන අධිකාරියේ කළමණාකරන මණ්ඩලය විසින් කරන ලද නිර්දේශයන් සැලකිල්ලට ගෙන මොරටුව මහ නගර සභා බල ප්‍රදේශයෙන් සංයුක්ත වන මොරටුව නාගරික සංවර්ධන ප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලැස්ම මෙයින් අනුමත කරමි.

..................................................

**පාඨලී චම්පික රණවක**
**මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය**

**මහානගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශය,**
**17 හා 18 වන මහල,**
**"සුහුරුපාය",**
**සුභූතිපුර පාර,**
**බත්තරමුල්ල**

2019 ...ජූනි............... මස ...21... . වන දින.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2129/94 - 2019 ජූනි මස 28 වැනි සිකුරාදා - 2019.06.28

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාව, කඩුවෙල මහ නගර සභාව, මහරගම නගර සභාව, කොටිකාවත්ත - මුල්ලේරියාව ප්‍රාදේශීය සභාව බල ප්‍රදේශයන්ගෙන් සමන්විත වන අග නගර නාගරික සංවර්ධන ප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලැස්ම අනුමත කිරීම පිළිබඳ දැන්වීමයි.

1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරි පනත හා එහි සංශෝධන පනත් හි 8(අ) වගන්තිය යටතේ පැවරී ඇති බලතල අනුව ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාව, කඩුවෙල මහ නගර සභාව, මහරගම නගර සභාව, කොටිකාවත්ත - මුල්ලේරියාව ප්‍රාදේශීය සභාව බල ප්‍රදේශයන්ගෙන් සමන්විත අග නගර නාගරික සංවර්ධන බල ප්‍රදේශය සඳහා පිළියෙල කරන ලද අග නගර නාගරික සංවර්ධන සැලැස්ම මහා නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය, පාඨලී චම්පික රණවක වන මා විසින් එකී පනතේ 8(ඊ) වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල වලට අනුකූලව 2019 ජූනි මස 28 වන දින අනුමත කරන ලද බව, එකී පනතේ 8(උ) වගන්තිය ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනතාව වෙත දැනුම් දෙමි.

පාඨලී චම්පික රණවක,
මහා නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය.

2019 ජූනි මස 28 වෙනි දින,
17 හා 18 වන මහල,
''සුහුරුපාය'',
සුභූතිපුර පාර,
බත්තරමුල්ල,
මහා නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශයේ දී ය.

ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාව, කඩුවෙල මහ නගර සභාව, මහරගම නගර සභාව සහ කොටිකාවත්ත - මුල්ලේරියාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශ සඳහා වූ සංවර්ධන සැලැස්ම අනුමත කිරීම

1982 අංක 4 දරන නාගරික සංවර්ධන අධිකාරි (සංශෝධිත) පනතේ 8 ''අ'' වගන්තියේ බලතල ප්‍රකාර නාගරික සංවර්ධන අධිකාරිය විසින් සකස් කරන ලද ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාව, කඩුවෙල මහ නගර සභාව, මහරගම නගර සභාව සහ කොටිකාවත්ත - මුල්ලේරියාව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශ සඳහා සකස් කරන ලද සංවර්ධන සැලැස්ම මහා නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය ගරු පාඨලී චම්පික රණවක මැතිතුමා විසින්, එම සංශෝධිත පනතේ 8 ''ඊ'' වගන්තියෙන් එතුමන් වෙත පැවරී ඇති බලතල ප්‍රකාර 2019 ජූනි මස 28 වන දින අනුමත කරන ලද බව මහජනතාවට මෙයින් දැනුම් දෙමි.

ආචාර්ය ජගත් මුණසිංහ,
සභාපති,
නාගරික සංවර්ධන අධිකාරිය.

2019 ජූනි මස 28 දින.

07 - 4553/1


1A - PG 4553 — 177 (2019/06)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

2 A I කොටස: (I) ඡෙදය - ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අති විශෙෂ ගැසට් පත්‍රය - 2019.06.28

**කොළඹ මහ නගර සභාව, දෙහිවල - ගල්කිස්ස මහ නගර සභාව, කොළොන්නාව නගර සභාව, බොරලැස්ගමුව නගර සභාව, පැලියගොඩ නගර සභාව, වත්තල - මාබෝල නගර සභාව, වත්තල ප්‍රාදේශීය සභාව, කැළණිය ප්‍රාදේශීය සභාව බල ප්‍රදේශයන්ගෙන් සමන්විත වන කොළඹ වාණිජ නගර නාගරික සංවර්ධන ප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලැස්ම අනුමත කිරීම පිළිබඳ දැන්වීමයි.**

1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරි පනත හා එහි සංශෝධන පනත් හි 8(අ) වගන්තිය යටතේ පැවරී ඇති බලතල අනුව කොළඹ මහ නගර සභාව, දෙහිවල - ගල්කිස්ස මහ නගර සභාව, කොළොන්නාව නගර සභාව, බොරලැස්ගමුව නගර සභාව, පැලියගොඩ නගර සභාව, වත්තල - මාබෝල නගර සභාව, වත්තල ප්‍රාදේශීය සභාව, කැළණිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයන්ගෙන් සමන්විත කොළඹ වාණිජ නාගරික සංවර්ධන බල ප්‍රදේශ සඳහා පිළියෙල කරන ලද කොළඹ නාගරික සංවර්ධන සැලැස්ම මහා නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය, පාඨලී චම්පික රණවක වන මා විසින් එකී පනතේ 8(ඊ) වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල වලට අනුකූලව 2019 ජුනි මස 28 වන දින අනුමත කරන ලද බව, එකී පනතේ 8(උ) වගන්තිය ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනතාව වෙත දැනුම් දෙමි.

පාඨලී චම්පික රණවක,
මහා නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය.

2019 ජුනි මස 28 වෙනි දින,
17 හා 18 වන මහල,
''සුහුරුපාය'',
සුභූතිපුර පාර,
බත්තරමුල්ල,
මහා නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශයේ දී ය.

කොළඹ මහ නගර සභාව, දෙහිවල - ගල්කිස්ස මහ නගර සභාව, කොළොන්නාව නගර සභාව, බොරලැස්ගමුව නගර සභාව, පැලියගොඩ නගර සභාව, වත්තල - මාබෝල නගර සභාව, වත්තල ප්‍රාදේශීය සභාව සහ කැළණිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශ සඳහා වූ සංවර්ධන සැලැස්ම අනුමත කිරීම

1982 අංක 4 දරන නාගරික සංවර්ධන අධිකාරි (සංශෝධිත) පනතේ 8 ''අ'' වගන්තියේ බලතල ප්‍රකාර නාගරික සංවර්ධන අධිකාරිය විසින් සකස් කරන ලද කොළඹ මහ නගර සභාව, දෙහිවල - ගල්කිස්ස මහ නගර සභාව, කොළොන්නාව නගර සභාව, බොරලැස්ගමුව නගර සභාව, පැලියගොඩ නගර සභාව, වත්තල - මාබෝල නගර සභාව, වත්තල ප්‍රාදේශීය සභාව, කැළණිය ප්‍රාදේශීය සභා සභා බල ප්‍රදේශ සඳහා සකස් කරන ලද සංවර්ධන සැලැස්ම මහා නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය ගරු පාඨලී චම්පික රණවක මැතිතුමා විසින්, එම සංශෝධිත පනතේ 8 ''ඊ'' වගන්තියෙන් එතුමන් වෙත පැවරී ඇති බලතල ප්‍රකාර 2019 ජුනි මස 28 වන දින අනුමත කරන ලද බව මහජනතාවට මෙයින් දැනුම් දෙමි.

ආචාර්ය ජගත් මුණසිංහ,
සභාපති,
නාගරික සංවර්ධන අධිකාරිය.

2019 ජුනි මස 28 දින.

07 - 4553/2

**මොරටුව මහ නගර සභා බල ප්‍රදේශයෙන් සමන්විත වන මොරටුව නාගරික සංවර්ධන ප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලැස්ම අනුමත කිරීම පිළිබඳ දැන්වීමයි.**

1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරි පනත හා එහි සංශෝධන පනත් හි 8(අ) වගන්තිය යටතේ පැවරී ඇති බලතල අනුව මොරටුව මහ නගර සභා බල ප්‍රදේශයෙන් සමන්විත මොරටුව නාගරික සංවර්ධන බල ප්‍රදේශය සඳහා පිළියෙල කරන ලද මොරටුව නාගරික සංවර්ධන සැලැස්ම මහා නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය, පාඨලී චම්පික රණවක වන මා විසින් එකී පනතේ 8(ඊ) වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල වලට අනුකූලව 2019 ජූනි මස 28 වන දින අනුමත කරන ලද බව, එකී පනතේ 8(උ) වගන්තිය ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනතාව වෙත දැනුම් දෙමි.

පාඨලී චම්පික රණවක,
මහා නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය.

2019 ජූනි මස 28 වෙනි දින,
17 හා 18 වන මහල,
''සුහුරුපාය'',
සුභූතිපුර පාර,
බත්තරමුල්ල,
මහා නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශයේ දී ය.

මොරටුව මහ නගර සභා බල ප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලැස්ම අනුමත කිරීම

1982 අංක 4 දරන නාගරික සංවර්ධන අධිකාරි (සංශෝධිත) පනතේ 8 ''අ'' වගන්තියේ බලතල ප්‍රකාර නාගරික සංවර්ධන අධිකාරිය විසින් සකස් කරන ලද මොරටුව මහ නගර සභා බල ප්‍රදේශය සඳහා සකස් කරන ලද සංවර්ධන සැලැස්ම මහා නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය ගරු පාඨලී චම්පික රණවක මැතිතුමා විසින්, එම සංශෝධිත පනතේ 8 ''ඊ'' වගන්තියෙන් එතුමන් වෙත පැවරී ඇති බලතල ප්‍රකාර 2019 ජූනි මස 28 වන දින අනුමත කරන ලද බව මහජනතාවට මෙයින් දැනුම් දෙමි.

ආචාර්ය ජගත් මුණසිංහ,
සභාපති,
නාගරික සංවර්ධන අධිකාරිය.

2019 ජූනි මස 28 දින.

07 - 4553/3

---

**කළුතර නගර සභාව, කළුතර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයන්ගෙන් සමන්විත වන කළුතර නාගරික සංවර්ධන ප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලැස්ම අනුමත කිරීම පිළිබඳ දැන්වීමයි.**

1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරි පනත හා එහි සංශෝධන පනත් හි 8(අ) වගන්තිය යටතේ පැවරී ඇති බලතල අනුව කළුතර නගර සභාව, කළුතර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයන්ගෙන් සමන්විත කළුතර නාගරික සංවර්ධන බල ප්‍රදේශය සඳහා පිළියෙල කරන ලද කළුතර නාගරික සංවර්ධන සැලැස්ම මහා නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය, පාඨලී චම්පික රණවක වන මා විසින් එකී පනතේ 8(ඊ) වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල වලට අනුකූලව 2019 ජූනි මස 28 වන දින අනුමත කරන ලද බව, එකී පනතේ 8(උ) වගන්තිය ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනතාව වෙත දැනුම් දෙමි.

පාඨලී චම්පික රණවක,
මහා නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය.

2019 ජූනි මස 28 වෙනි දින,
17 හා 18 වන මහල,
''සුහුරුපාය'',
සුභූතිපුර පාර,
බත්තරමුල්ල,
මහා නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශයේ දී ය.

කළුතර නගර සභාව සහ කළුතර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශ සඳහා වූ සංවර්ධන සැලැස්ම අනුමත කිරීම

1982 අංක 4 දරන නාගරික සංවර්ධන අධිකාරි (සංශෝධිත) පනතේ 8 ''අ'' වගන්තියේ බලතල ප්‍රකාර නාගරික සංවර්ධන අධිකාරිය විසින් සකස් කරන ලද කළුතර නගර සභාව සහ කළුතර ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා සකස් කරන ලද සංවර්ධන සැලැස්ම මහා නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය ගරු පාඨලී චම්පික රණවක මැතිතුමා විසින්, එම සංශෝධිත පනතේ 8 ''ඊ'' වගන්තියෙන් එතුමන් වෙත පැවරී ඇති බලතල ප්‍රකාර 2019 ජූනි මස 28 වන දින අනුමත කරන ලද බව මහජනතාවට මෙයින් දැනුම් දෙමි.

ආචාර්ය ජගත් මුණසිංහ,
සභාපති,
නාගරික සංවර්ධන අධිකාරිය.

2019 ජූනි මස 28 දින.

07 - 4553/4

---

**බේරුවල නගර සභාව, බේරුවල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයන්ගෙන් සමන්විත වන බේරුවල නාගරික සංවර්ධන ප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලැස්ම අනුමත කිරීම පිළිබඳ දැන්වීමයි.**

1978 අංක 41 දරන නාගරික සංවර්ධන අධිකාරි පනත හා එහි සංශෝධන පනත් හි 8(අ) වගන්තිය යටතේ පැවරී ඇති බලතල අනුව බේරුවල නගර සභාව, බේරුවල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයන්ගෙන් සමන්විත බේරුවල නාගරික සංවර්ධන බල ප්‍රදේශය සඳහා පිළියෙල කරන ලද බේරුවල නාගරික සංවර්ධන සැලැස්ම මහා නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය, පාඨලී චම්පික රණවක වන මා විසින් එකී පනතේ 8(ඊ) වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල වලට අනුකූලව 2019 ජූනි මස 28 වන දින අනුමත කරන ලද බව, එකී පනතේ 8(උ) වගන්තිය ප්‍රකාර, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනතාව වෙත දැනුම් දෙමි.

පාඨලී චම්පික රණවක,
මහා නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය.

2019 ජූනි මස 28 වෙනි දින,
17 හා 18 වන මහල,
''සුහුරුපාය'',
සුභූතිපුර පාර,
බත්තරමුල්ල,
මහා නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍යාංශයේ දී ය.

බේරුවල නගර සභා සහ බේරුවල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලැස්ම අනුමත කිරීම

1982 අංක 4 දරන නාගරික සංවර්ධන අධිකාරි (සංශෝධිත) පනතේ 8 ''අ'' වගන්තියේ බලතල ප්‍රකාර නාගරික සංවර්ධන අධිකාරිය විසින් සකස් කරන ලද බේරුවල නගර සභා සහ බේරුවල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා සකස් කරන ලද සංවර්ධන සැලැස්ම මහ නගර හා බස්නාහිර සංවර්ධන අමාත්‍ය ගරු පාඨලී චම්පික රණවක මැතිතුමා විසින්, එම සංශෝධිත පනතේ 8 ''ඊ'' වගන්තියෙන් එතුමන් වෙත පැවරී ඇති බලතල ප්‍රකාර 2019 ජූනි මස 28 වන දින අනුමත කරන ලද බව මහජනතාවට මෙයින් දැනුම් දෙමි.

ආචාර්ය ජගත් මුණසිංහ,
සභාපති,
නාගරික සංවර්ධන අධිකාරිය.


2019 ජූනි මස 28 දින.

07 - 4553/5

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

# 04
## පරිච්ඡේදය



# සංවර්ධන සැලසුම් රාමුව

## 4.1. සංවර්ධන සැලැස්මේ දැක්ම



*"බටහිර ඉවුරේ දියසරු උද්‍යානය"*

# 4.2. දැක්මෙහි ප්‍රකාශනය

මොරටුව නගරය 2030 වන විට සැලසුම් සහගත නගරයක් ලෙසින් සංවර්ධනය කිරීමේ අරමුණට ළඟා වීමට අවශ්‍ය දැක්ම සකස් කිරීමේදී නගරයේ ස්ථානීය පිහිටීම, සංවර්ධන ප්‍රවණතා, පවතින සම්පත් ආදී සියලු අංශ පිළිබඳව සලකා බලන ලදී. මෙහිදී ප්‍රධාන වශයෙන් මොරටුව නගරයේ දැක්ම සකස් කිරීම සඳහා පහත රූප සටහන් අංක 4.1 මඟින් දැක්වෙන විභවතා ඔස්සේ කරුණු පෙළගස්වන ලදී.




*රූප සටහන 4.1 : දැක්ම ලඟා කර ගැනීමේ විභවතා*

## *“බටහිර ඉවුර”*

දකුණු දෙස සිට කොළඹ දිස්ත්‍රික්කයට ප්‍රවිෂ්ට වන දකුණු ද්වාරය මොරටුව මහ නගර සභා බල ප්‍රදේශය වන අතර කොළඹ දිස්ත්‍රික්කයේ දකුණුපස බටහිර මායිමද මොරටුව නගරය වන බැවින් “බටහිර ඉවුර” යන නාමය යොදන ලදී.

## *“දියසරු”*

මොරටුව නගරය නැගෙනහිරින් හා දකුණින් බොල්ගොඩ ගංගාවෙන්ද, බටහිරින් මුහුදෙන්ද ලෙස තුන් පැත්තකින් ජලයෙන් මායිම් වූ හෙක්ටයාර 30ක වපසරියකින් යුත් ලුනාව කලපුව හා ඒ ආශ්‍රිතව පැතිරුණු ඇල මාර්ග ජාලයක් සහිත අභ්‍යන්තර ජල මූලාශ්‍රයන්ගෙන් සමන්විත වීම මොරටුව ප්‍රදේශයේ විශේෂ ලක්ෂණයකි.  තවද ජලය රදවා තබා ගැනීම සඳහා හෙක්ටයාර 20 ක තෙත්බිම් හා වගුරුබිම්ද දක්නට ලැබෙන අතර සමස්තයක් ලෙස ගත් කල මොරටුව මහ නගර සභා ප්‍රදේශයේ මුළු භූමි ප්‍රමාණයෙන් 19 % ක් ජලාශ්‍රිත ස්වාභාවික සම්පත් වලින් හා ජල මතුපිටකින් සමන්විත වන බැවින් ජලයෙන් ස්වයංපෝෂිත යන අර්ථයෙන් “දියසරු” යන නාමය භාවිතා කිරීම උචිත වේ .

## *“උද්‍යානය”*

මොරටුව සංවර්ධන සැලැස්ම තුළින් ශාක හා සත්ත්ව විශේෂ ජීවත් වන වගුරුබිම් හා තෙත්බිම් ඇතුළු හරිත වැස්ම ආරක්ෂා කරමින් ජල රක්ෂිත මහජන ශුභ සිද්ධිය සඳහා පරිහරණය කිරීමට හැකි වන අයුරින් තෙත්බිම් උද්‍යාන ලෙස සංවර්ධනය කිරීමට යෝජිත බැවින් එය අර්ථ ගැන්වීම සඳහා “උද්‍යානය” යන නාමය භාවිතා කරන ලදී.

## 4.3. සංවර්ධන සැලැස්මේ අරමුණු

මොරටුව සංවර්ධන සැලැස්මේ දැක්ම වෙත ළඟා වීම සඳහා ප්‍රධාන අරමුණු 03ක් ගොඩ නඟා ඇත.

අරමුණ 01 — ජලයෙන් පෝෂිත නගරයක්

අරමුණ 02 — සංචාරක ආකර්ෂණය සහිත නගරයක්

අරමුණ 03 — නගරයේ අවශ්‍යතා සඳහා ප්‍රමාණවත් යටිතල පහසුකම්

## 4.4 සංවර්ධන සැලැස්මේ පරමාර්ථ

අරමුණ 01 — ජලයෙන් පෝෂිත නගරයක්

පරමාර්ථ

1. 2030 වර්ෂය වන විට ප්‍රදේශයේ පවතින ජල මූලාශ්‍ර (බොල්ගොඩ ගඟ, ලුනාව කලපුව හා වෙරළ), තෙත්බිම් හා වගුරු බිම් 100% ක් සංරක්ෂණය කිරීම.
2. 2025 වර්ෂය වන විට ලුනාව කලපුව පරිසර ආරක්ෂණ කලාපයක් ලෙස ප්‍රකාශයට පත් කිරීම.

අරමුණ 02

## සංචාරක ආකර්ෂණය සහිත නගරයක්

පරමාර්ථ

1. 2025 වර්ෂය වන විට සංචාරක ආකර්ෂණය සඳහා බොල්ගොඩ ගඟ, ලුනාව කලපුව හා වෙරළ ආශ්‍රිතව හෙක්ටයාර් 160 ක ක්‍රියාකාරී හා ක්‍රියාකාරී නොවන විවෘත භූමි ඇති කිරීම.
2. 2030 වර්ෂය වන විට සංචාරක කර්මාන්තය ආශ්‍රිත ආයෝජන ප්‍රවර්ධනය සඳහා කි.මී 35ක දිගකින් යුතු ජලාභිමුඛ ප්‍රදේශ විවෘත කර සංවර්ධනය කිරීම.

අරමුණ 03

## නගරයේ අවශ්‍යතා සඳහා ප්‍රමාණවත් යටිතල පහසුකම්

පරමාර්ථ

1. 2030 වර්ෂය වන විට ඒකාබද්ධ මාර්ග පද්ධතියක් ඇති කිරීම සඳහා කිලෝ මීටර 40 ක දිගින් යුත් මාර්ග සංවර්ධනය කිරීම.
2. 2030 වසර වන විට රක්ෂිත හා රජයේ ඉඩම් කොටස්හි පදිංචි පවුල් 2500 ක් සඳහා විකල්ප නිවාස ලබා දීම.
3. පාරම්පරික වඩු කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම සඳහා රෙගුලාසි ලිහිල් කිරීම හා දැව ආශ්‍රිත නිෂ්පාදන ප්‍රවර්ධන කලාපයක් ස්ථාපිත කිරීම.

# 05

## පරිච්ඡේදය



# SWOT විශ්ලේෂණය

# 5.1. සාරාංශගත SWOT විශ්ලේෂණය

2030 වර්ෂය වන විට මොරටුව නගරය සැලසුම් සහගත නගරයක් කිරීමේ දැක්ම වෙත ළඟා වීමට හැකිවන අයුරින් භෞතික, ආර්ථික, සමාජයීය හා පාරිසරික වශයෙන් පවතින ප්‍රබලතා, දුබලතා, අවස්ථා හා තර්ජන හඳුනා ගැනීම සඳහා SWOT විශ්ලේෂණය සිදුකළ අතර, එමඟින් සංවර්ධන අරමුණු ලඟා කර ගැනීමට අපේක්ෂා කෙරේ. ඒ අනුව එක් එක් අරමුණට අදාලව සිදු කරන ලද සාරාංශගත SWOT විශ්ලේෂණය හා සවිස්තරාත්මක SWOT විශ්ලේෂණය පිළිවෙලින් පරිච්ඡේද 5.1 හා 5.2. මඟින් දැක්වේ.

## 5.1.1. "ජලයෙන් පෝෂිත නගරයක්" යන අරමුණ සඳහා වන සාරාංශගත SWOT විශ්ලේෂණය

**S**

- *වර්ග කිලෝමීටර් 23.4 ක් වන මොරටුව මහ නගර සභා සමස්ත භූමි ප්‍රමාණයෙන් 19% ක් ජලාශ්‍රිත ස්වභාවික සම්පත් වීම.*
- *ශ්‍රී ලංකාවේ විශාලතම ස්වභාවික මිරිදිය තෙත්බිම යැයි සලකනු ලබන බොල්ගොඩ ගංගාධාරයෙන් සමන්විත වීම.*
- *ඉහල ජෛව විවිධත්වයකින් අනූන ජලජ පරිසර පද්ධතියකින් යුතු තෙත්බිම් පිහිටා තිබීම.*
- *බොල්ගොඩ, ලුනාව කලපුව හා වෙරළාශ්‍රිතව කඩොලාන ශාක වර්ධනය වීමට උචිත පාරිසරික තත්ත්වයක් පැවතීම.*

**W**

- *ජලාශ්‍රිත පාරිසරික සංවේදී ප්‍රදේශ වල සිදු කරනු ලබන ගොඩ කිරීම් හා අනවසර ඉදිකිරීම්.*
- *කර්මාන්ත මඟින් නිපදවෙන අපද්‍රව්‍ය යාබද ජල මූලාශ්‍ර වෙත බැහැර කිරීම.*
- *ලුනාව කලපුව පරිසර ආරක්ෂණ කලාපයක් ලෙස ප්‍රකාශයට පත් කර නොතිබීම.*
- *බොල්ගොඩ, ලුනාව කලපුව හා වෙරළාශ්‍රිතව කඩොලාන ශාක වඳ වී යාමේ තත්ත්වයක් පැවතීම.*

**O**

- *1980 අංක 47 දරණ ජාතික පාරිසරික පනත යටතේ බොල්ගොඩ ආරක්ෂණ කලාපයක් ලෙසට ප්‍රකාශයට පත්කර තිබීම.*

**T**

- *ගෝලීය උෂ්ණත්වය ඉහල යාම හේතුවෙන් සිදු වන සාගර ජල මට්ටම ඉහල යාම .*

## 5.1.2. “සංචාරක ආකර්ෂණය සහිත නගරයක්” යන අරමුණ සඳහා වන සාරාංශගත SWOT විශ්ලේෂණය

**S**

- *මොරටුව මහ නගර සභා ප්‍රදේශය ශ්‍රී ලංකාවේ පිහිටි විශාලතම සංචාරක ආකර්ෂණයෙන් යුතු මහ කොළඹ සංචාරක පුරවරයට අයත් හා සංචාරක ආකර්ෂණය සහිත ප්‍රදේශ දෙකකට එනම්; උතුරින් දෙහිවල- ගල්කිස්ස මහ නගර සභා ප්‍රදේශයටත් දකුණින් පානදුර නගරයටත් මැදිව පිහිටා තිබීම.*
- *මොරටුව නගරය තුන් පසෙකින් ස්වභාවික ජල මූලාශ්‍රයන්ගෙන් මායිම්ව උප නාගරික ලක්ෂණ වලින් හෙබි වාණිජ න්‍යෂ්ටියක්  ලෙස  වර්ධනය වීම.*
- *මොරටුව නගරයේ පාරම්පරිකව පවතින දැව කර්මාන්තය .*

**W**

- *මොරටුව නගරය ස්වභාවික ජල මූලාශ්‍රයන්ගෙන් සමන්විත වුවද, එම ජල මූලාශ්‍ර කරා ජනයාට ප්‍රවේශ වීමේදී භෞතිකව පවත්නා බාධා හා ජල මූලාශ්‍ර දූෂණය වීමෙන් ඒවායේ ආකර්ෂණීයභාවය හායනය වීම හේතුවෙන් නගරය තුළ සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය සඳහා එම සම්පත් උපයෝගී කර ගැනීමට නොහැකි වීම.*

**O**

- *2016 වසරේ සකස් කරන ලද බස්නාහිර කලාපීය මහ නගර සැලැස්ම යටතේ මොරටුව නගරය සංචාරක කලාපයේ පිහිටි නගරයක් ලෙස සංවර්ධනය කිරීමට හඳුනා ගෙන තිබීම.*

**T**

## 5.1.3.,"නගරයේ අවශ්‍යතා සඳහා ප්‍රමාණවත් යටිතල පහසුකම්" යන අරමුණ සඳහා වන සාරාංශගත SWOT විශ්ලේෂණය

**S**

- *මොරටුව නගරයට මැදින් ගමන් කරන ගාළු පාර කොළඹ නගරයට ඇතුල්වන කොරිඩෝ හතෙන් එකක් වීම හා මොරටුව නගරය තුල ගාලු පාර කේන්ද්‍ර කර ගත් මනාව විහිදුණු මාර්ග පද්ධතියක් පැවතීම.*
- *මොරටුව ප්‍රධාන දුම්රිය පොළ කේන්ද්‍ර කොට ගත් අභ්‍යන්තර දුම්රිය ස්ථාන හතරකින් සමන්විත වීම.*

**W**

- *මොරටුව නගරයේ නේවාසික ජනගහනය සඳහා ප්‍රමාණවත් විවෘත අවකාශ නොමැති වීම.*
- *මොරටුව නගරය සඳහා පොදු රථ වාහන නැවතුම් ස්ථාන නොමැති වීම.*
- *අඩු පහසුකම් සහිත නිවාස හා නිවාස හිඟයක් පැවතීම.*

**O**

- *යෝජිත බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථාන ව්‍යාපෘතිය හා මුහුදුබඩ මාර්ගය මොරටුව දක්වා දීර්ඝ කිරීම.*
- *මහනගර ප්‍රවාහන සැලැස්ම යටතේ යෝජිත සැහැල්ලු දුම්රිය මාර්ග ව්‍යාපෘතිය*
- *දන්දෙනියවත්ත, සමරකෝන්වත්ත, පිටිටනියවත්ත හා බැටරිවත්ත සඳහා යෝජිත නිවාස සංවර්ධන ව්‍යාපෘති*

**T**

- *ගෝලීය උෂ්ණත්වය ඉහල යාම හේතුවෙන් සිදු වන සාගර ජල මට්ටම ඉහල යාම .*

# 5.2. විස්තරාත්මක SWOT විශ්ලේෂණය

## 5.2.1. අරමුණ 01

*ජලයෙන් පෝෂිත නගරයක්*

### 5.2.1.1. ප්‍රබලතා | අරමුණ 01

#### අ. වර්ග කිලෝමීටර් 23.4 ක් වන මොරටුව මහ නගර සභා සමස්ත භූමි ප්‍රමාණයෙන් 19% ක් ජලාශ්‍රිත ස්වභාවික සම්පත් වීම.

මුළු භූමි පරිභෝජනයෙන් 19% ක් ස්වභාවික ජල හා ජල මූලාශ්‍රයන්ගෙන් සමන්විත මොරටුව නගරය පහත වගු අංක 5.1 හි සඳහන් පරිදි කලපු 1.6% ක් ද තෙත්බිම් හා වගුරුබිම් 1.4 % ක් හා ගංගා 15.5% කින් සමන්විත වේ.


| ස්වභාවික සම්පත් කාණ්ඩය | මුළු බිම් ප්‍රමාණයෙන් ප්‍රතිශතය |
|---|---|
| කලපු | 1.60% |
| තෙත්බිම් හා වගුරු බිම් | 1.90% |
| ගංගා | 15.50% |
| මුළු | 19% |

**වගුව 5.1 :** මොරටුව ස්වභාවික සම්පත් ව්‍යාප්තිය
**මූලාශ්‍රය :** නාගරික සංවර්ධන අධිකාරිය, 2018

#### ආ. ශ්‍රී ලංකාවේ විශාලතම ස්වභාවික මිරිදිය තෙත්බිම යැයි සලකනු ලබන බොල්ගොඩ ගංගාධාරයෙන් සමන්විත වීම.

ශ්‍රී ලංකාවේ විශාලතම අභ්‍යන්තර මිරිදිය තෙත්බිම ලෙස සලකනු ලබන බොල්ගොඩ තෙත්බිම, වේරස් ගඟ, බොල්ගොඩ ගඟ, පානදුර ගඟ හා බොල්ගොඩ වැවෙන් සමන්විත වන අතර බොල්ගොඩ වැව, උතුරු බොල්ගොඩ වැව හා දකුණු බොල්ගොඩ වැව ලෙස වර්ග කි.මී 400 ක වපසරියකින් යුතු විශාල ජල රැඳවුම් ප්‍රදේශ දෙකකින් සමන්විත වේ. තවදුරටත් බොල්ගොඩ ගංගාධාරය, දියවන්නාව හා තලංගම නාගරික තෙත්බිම් සමඟ සම්බන්ධ වන අතර බොල්ගොඩ පෝෂක ප්‍රදේශය රූප සටහන් අංක 5.1 මඟින් නිරූපනය කරනු ලබයි.

බොල්ගොඩ ස්වභාවික තෙත්බිම් පද්ධතිය මඟින් පරිසර සමතුලිතතාව ඇති කිරීම සඳහා දායක වන ජෛවීය සේවාවන් අතර; ජල අවශ්‍යතාවය සපුරාලීම, පරිසරය සිසිල් කිරීම, ගංවතුර හා නියඟය පාලනය කිරීම, ජෛව විවිධත්වය සුරැකීම, මිරිදිය ධීවර කර්මාන්තය ප්‍රවර්ධනය, දූෂක සහ අවසාදිත ද්‍රව්‍ය පෙරනයක් ලෙස ක්‍රියා කිරීම, භූගත ජලධරය ඉහළ නැංවීම සහ ස්වභාවික ජල පිරිපහදුව යනාදිය වැදගත් වේ. (Sri Lanka Water Partnership (SLWP), 2016)




**රූප සටහන 5.1 :** බොල්ගොඩ පෝෂක ප්‍රදේශය
**මූලාශ්‍රය :** *Japan International Cooperation Agency, 2003*

රූප සටහන් අංක 5.1 හි දක්වා ඇති පරිදි වර්ග කි.මී. 394 ක වපසරියකින් යුතු බොල්ගොඩ පෝෂක ප්‍රදේශයේ උතුරු පෝෂක ප්‍රදේශය වේරස් ගඟ පෝෂක ප්‍රදේශය ලෙස හඳුන්වනු ලබන අතර මෙම වේරස් ගඟ පෝෂක ප්‍රදේශය වර්ග කි.මී. 55.5 ක වපසරියකින් යුතු සහ නුගේගොඩ– රත්නපිටිය, බොල්ගොඩ ඇළ, බොරලැස්ගමුව උතුර, බොරලැස්ගමුව දකුණ, මහ ඇළ, නම්බෝවිල හා රත්මලාන–මොරටුව යන උප පෝෂක ප්‍රදේශ හතකින් සමන්විත වේ. ඒ අනුව ව.කි.මී. 8.1 ක වපසරියකින් යුතු රත්මලාන– මොරටුව උප පෝෂක ප්‍රදේශය මොරටුව මහ නගර සභා බල ප්‍රදේශය තුළ පිහිටා ඇත.

## ඇ. ඉහල ජෛව විවිධත්වයකින් අනූන ජලජ පරිසර පද්ධතියකින් යුතු තෙත්බිම් පිහිටා තිබීම.

ලුනාව කලපුව හා බොල්ගොඩ ගංගාව ආශ්‍රිතව ඉහල ජෛව විවිධත්වයකින් යුතු සත්ත්ව හා ශාක විශේෂ සනාත්වයක් දක්නට ලැබෙන අතර විශේෂයෙන්ම ලුනාව කලපුව ආශ්‍රිතව සංක්‍රමණික හා සංක්‍රමණික නොවන කුරුළු විශේෂ 75ක් පමණ ජීවත් වන බව සඳහන් වේ. (තුෂාර, 2009) පහත වගු අංක 5.2 හි සඳහන් වන පරිදි බොල්ගොඩ හා ලුනාව තෙත්බිම් පරිසර පද්ධතීන් ආශ්‍රිතව වෙසෙන ඉහල ශාක හා සත්ත්ව ගහන හේතුවෙන් ස්වභාව සෞන්දර්යයෙන් අනූන හා ජෛව විවිධත්වයෙන් පොහොසත් පරිසරයක් මොරටුව ප්‍රදේශය තුළ නිර්මාණය වී ඇති බව ගම්‍ය වේ.

| බොල්ගොඩ ගඟ ආශ්‍රිතව දක්නට ලැබෙන සත්ත්ව හා ශාක විශේෂ | |
|---|---|
| ශාක විශේෂ | නෙළුම්, කෙකටිය, ජපන්ජබර, ලිලී මල්, දිය බෙරලිය, තුල්හිරිය, අත්ත, බොකුටු, බිම්තම්බරු උණ ශාක විශේෂ, පුවක්, ලුනුවිල, මාර, සැල්වීනියා, හබරල විශේෂ, කඩොලාන විශේෂ, කුඹුක්, කිරල හා වෙනත්; |
| කුරුළු විශේෂ | පිළිහුඩුවා, මයිනා, කොක්කු විශේෂ, හංස විශේෂ, උකුසු විශේෂ, තාරා විශේෂ, කපුටන් වවුලන් විශේෂ<br>විද්‍යාත්මක නාම; Anserini, Tyrannidae, Gruidae, Hirundinidae, Numenius, Phalacrocoracidae, Gallinula chloropus, Lonchura atricapilla, |
| වෙනත් ජලජ සත්ත්ව විශේෂ | මාළු විශේෂ Esomus thermoicos, Channa orientalis, Clarias brachysoma, Aplocheilus dayi<br>උරග විශේෂ Otocryptis weigmanni, Cylindrophis maculatus, Lycodon osmanhilli, Oligodon sublineatus, Xenocrophis asperrimus<br>ක්ෂීරපායි විශේෂ Trachypithecus vetulus<br>උභය ජීවී විශේෂ Bufo atukoralei, Rana gracilis, Polypedatus cruciger<br>දුර්ලභ විශේෂ Loris tardigradus, Pelecanus philippensis, Prionailurus viverrinus, Lutra lutra and Crocodylus palustris |

**වගුව 5.2 :** බොල්ගොඩ ගඟ ආශ්‍රිතව දක්නට ලැබෙන සත්ත්ව හා ශාක විශේෂ
**මූලාශ්‍රය :** නාගරික සංවර්ධන අධිකාරිය, 2018

## ඈ. බොල්ගොඩ, ලුනාව කලපුව හා වෙරළාශ්‍රිතව කඩොලාන ශාක වර්ධනය වීමට උචිත පාරිසරික තත්ත්වයක් පැවතීම.

"Mangrove" යන්න ස්පාඤ්ඤය හා පෘතුගීසි භාෂාවන්හි ආභාෂය ලත් ඉංග්‍රීසි වචනයක් වන අතර සිංහල බසින් එය "කඩොලාන" හෝ "කඩොල් වගුරු" ලෙස ව්‍යවහාර කරනු ලබන ශාකමය භූදර්ශනයකි. කඩොලාන ශාක ප්‍රජාව සමුද්‍රාසන්න ගංගා මෝය වල හෝ වෙරළ තීර දිගේ ව්‍යාප්ත වන ගස් හෝ පඳුරු ශාක වන අතර පුළුල් ලවණතා අන්තරයන්ට, උෂ්ණත්ව පරාසයන්ට හා ආර්ද්‍රතා පරාසයන්ට අනුව අනුවර්තනය වීමේ හැකියාව ඇති ශාක විශේෂ ලෙස සලකනු ලබයි.

## 05 පරිච්ඡේදය
## SWOT විශ්ලේෂණය

### විස්තරාත්මක SWOT විශ්ලේෂණය

ශ්‍රී ලංකාවේ කඩොලාන ව්‍යාප්තව පවතින බටහිර වෙරළාශ්‍රිත ප්‍රදේශ අධ්‍යයනයේදී බොල්ගොඩ වැව, ලුනාව කලපුව හා මිගමුව කලපුව පමණක් හඳුනා ගත හැකි අතර, පහත වගු අංක 5.3 හි දැක්වෙන කඩොලාන ශාක විශේෂ 20 වර්ධනය වීම සඳහා උචිත පරිසර තත්ත්වයන් මොරටුව මහ නගර සභා බල ප්‍රදේශය තුළ පිහිටි බොල්ගොඩ වැව හා ලුනාව කලපුව ආශ්‍රිතව පවතින බව හඳුනා ගෙන ඇත. (වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව, 2017)

| කුලය | විද්‍යාත්මක නාමය | සිංහල ව්‍යවහාර නාමය |
|---|---|---|
| *Pteridaceae* | *Acrostichum speciosum* | වැරැල්ල |
| *Myrsinaceae Primulaceae* | *Aegiceras corniculatum* | හීන් ගස් |
| *Acanthaceae* | *Avicennia alba* | මඩ ගස් |
| *Acanthaceae* | *Avicennia marina* | මන්ඩා, මඩ ගස් |
| *Acanthaceae* | *Avicennia* | මන්ඩා |
| *Rhizophoraceae* | *Bruguiera gymnorrhiza* | සිරි කන්ඩ |
| *Rhizophoraceae* | *Bruguiera sexangula* | මල් කඩොල් |
| *Malpighiales* | *Ceriops tagal* | රතු ගස්, පුන් කඩ |
| *Euphorbiaceae* | *Excoecaria agallocha* | තෙල කීරිය, තෙල |
| *Sterculaceae* | *Heritiera littoralis* | ඇටුන |
| *Combretaceae* | *Lumnitzera littorea* | බෙරිය |
| *Combretaceae* | *Lumnitzera racemosa* | බෙරිය |
| *Rubiaceae* | *Morinda citrifolia* | අඟු |
| *Arecaceae* | *Nypa fruticans* |ගින්පොල් |
| *Pandanaceae* | *Pandanus tectorius* | මුදු කෙයියා |
| *Rhizophoraceae* | *Rhizophora apiculata* | කඩොල් |
| *Rhizophoraceae* | *Rhizophora mucronat* | මහා කඩොල් |
| *Lythraceae* | *Sonneratia alba* | කිරල |
| *Lythraceae* | *Sonneratia caseolaris* | කිරිල්ල, හොඳ කිරල |
| *Meliaceae* | *Xylocarpus granatum* | මුට්ටි කඩොල් |

**වගුව 5.3 :** *බොල්ගොඩ වැව හා ලුනාව කලපුව ආශ්‍රිතව වර්ධනය විය හැකි කඩොලාන ශාක විශේෂ*
**මූලාශ්‍රය :** *වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව, 2017*

## 5.2.1.2. දුර්වලතා | අරමුණ 01

### අ. ජලාශ්‍රිත පාරිසරික සංවේදී ප්‍රදේශ වල සිදු කරනු ලබන ගොඩ කිරීම් හා අනවසර ඉදිකිරීම්

ජල පද්ධතිය, ශාක වැස්ම හා සමෝච්ඡ රේඛා ව්‍යාප්තිය පිළිබඳව අධ්‍යයනය කර මොරටුව සැලසුම් ප්‍රදේශයට අදාලව පාරිසරික සංවේදිතා විශ්ලේෂණය සිදු කරනු ලැබූ අතර එම සංවේදිතා විශ්ලේෂණය සිදු කරනු ලැබූ ආකාරය ඇමුණුම් අංක 5 හි ද පරිසර සංවේදිතා විශ්ලේෂණය සිතියම් අංක 5.1හි ද දක්වා ඇත.

පරිසර සංවේදිතා විශ්ලේෂණ සිතියම අනුව ලා කොළ පැහැයෙන් දිස්වෙන අති සංවේදී පාරිසරික තත්ත්ව සහිත ජලාශ්‍රිත හා ජලාභිමුඛ ප්‍රදේශ ලෙස හඳුනාගෙන ඇති බොල්ගොඩ රක්ෂිතය, ලුනාව කලපු ප්‍රදේශය හා වෙරළ රක්ෂිතය අනවසර ඉදි කිරීම් හා ගොඩකිරීම් බහුල ප්‍රදේශ ලෙසට තහවුරු වී ඇත.

මධ්‍යම පරිසර අධිකාරිය හා විවෘත විශ්වවිද්‍යාලය, සිවිල් ඉංජිනේරු පීඨය විසින් සිදු කරනු ලැබූ Investigation of illegal encroachment and land filling in Bolgoda Environment Potection area, Colombo පර්යේෂණ වාර්තාවට අනුව බොල්ගොඩ රක්ෂිත ප්‍රදේශය තුළ 2013 වර්ෂයේදී අනවසර භූමි ගොඩකිරීම් හා අනවසර අල්ලා ගැනීම් පිළිවෙලින් වර්ග කි.මී. 0.0756 හා වර්ග කි.මී. 0.0077 ලෙස සඳහන් වේ. තවදුරටත් බණ්ඩාරගම හා කළුතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ වලට සාපේක්ෂව මොරටුව, රත්මලාන, පානදුර හා කැස්බෑව යන ප්‍රදේශ වල රක්ෂිත ආක්‍රමණයේ බලපෑම ඉහළ බව සඳහන් වේ. (කුමුදිනී එන්.එම්.යු. අතපත්තු බී.සී.එල්, 2013)

නාගරික සංවර්ධන අධිකාරිය විසින් ප්‍රදේශ කිහිපයකට අදාලව ගූගල් සිතියම් ආශ්‍රයෙන් සිදු කරනු ලැබූ අධ්‍යයනයන් මඟින් පසුගිය වසර 10ක කාල සීමාව තුළ අනවසර ගොඩකිරීම් හා ඉදිකිරීම් වල වර්ධනයක් ඇති බව පහත රූප සටහන් අංක. 5.2, 5.3 හා 5.4 මඟින් පැහැදිලි වේ.




2004 වර්ෂය



2015 වර්ෂය

**රූප සටහන 5.2 :** *මදුරු දූව දූපත ආශ්‍රිතව අනවසර ගොඩකිරීම්*
**මූලාශ්‍රය :** *ගූගල් සිතියම් ආශ්‍රයෙන් නාගරික සංවර්ධන අධිකාරිය, 2018*




***සිතියම 5.1 :*** *මොරටුව පරිසර සංවේදිතා විශ්ලේෂණය - 2018* ***මූලාශ්‍රය :*** *නාගරික සංවර්ධන අධිකාරිය, 2018*



2004 වර්ෂය 2015 වර්ෂය

***රූප සටහන 5.3 :*** *කටුබැද්ද තෙත් බිම් ආශ්‍රිතව අනවසර ගොඩකිරීම්*
***මූලාශ්‍රය :*** *ගූගල් සිතියම් ආශ්‍රයෙන් නාගරික සංවර්ධන අධිකාරිය, 2018*




2004 වර්ෂය 2015 වර්ෂය


***රූප සටහන 5.4 :*** *දුම්රිය රක්ෂිතය හා වෙරළ රක්ෂිතය ආශ්‍රිතව කොරලවැල්ල ප්‍රදේශයේ අනවසර ඉදිකිරීම්*
***මූලාශ්‍රය :*** *ගූගල් සිතියම් ආශ්‍රයෙන් නාගරික සංවර්ධන අධිකාරිය, 2018*

## ආ. කර්මාන්ත මඟින් නිපදවෙන අපද්‍රව්‍යය යාබද ජල මූලාශ්‍ර වෙත බැහැර කිරීම.

2016 වර්ෂය වන විට මොරටුව මහ නගර සභා සීමාව තුළ පිහිටි මධ්‍යම පරිසර අධිකාරිය මඟින් නිර්දේශිත කර්මාන්ත අතරින් අධි දූෂක ඒ කාණ්ඩයේ කර්මාන්ත 122ක්ද, මධ්‍යම දූෂක බී කාණ්ඩයේ කර්මාන්ත 70ක්ද, දූෂක නොවන කාණ්ඩයේ කර්මාන්ත 305ක් සහ ආයෝජන හා ප්‍රවර්ධන මණ්ඩලයට අයත් කර්මාන්ත 14 ක් ලෙස කර්මාන්ත 511 ක් ලියාපදිංචි කර ඇති අතර පහත රූප සටහන් අංක 5.5 මඟින් එලෙස ලියාපදිංචි කර ඇති කර්මාන්තයන්හි අවකාශීය ව්‍යාප්තිය දැක්වේ.

කර්මාන්ත මඟින් සිදු කරන නිෂ්පාදන ක්‍රියාවලියේදී උත්පාදනය වන අපජලය පිරිපහදු කිරීමෙන් අනතුරුව යාබද ස්වභාවික ජල මූලාශ්‍රයන්ට සෘජුවම හෝ පොදු අපජල ප්‍රවාහන පද්ධතීන් මාර්ගයෙන් ජලමූලාශ්‍ර වෙතට බැහැර කිරීම සිදු කරනු ලබන අතර කර්මාන්ත මඟින් බැහැර කරනු ලබන අපජලය, 2008 අංක 01 දරන ජාතික පාරිසරික (ආරක්ෂණ සහ තත්ත්ව) නියෝග ලෙස සඳහන් කර ඇති සහ අංක 1534/18 සහ 2008.02.01 දරන ගැසට් නිවේදනය මඟින් ප්‍රකාශයට පත් කර ඇති "අපජලය බාහිර පරිසරයට මුදා හැරීමේ දී අදාල වන ප්‍රමිති සහ උපමාන" වලට අනුව එම අපජලයේ තනුකතාව අදාළ ජල මූලාශ්‍රයේ පරිමාව මෙන් අට ගුණයක අගයක් විය යුතුය.




**රූප සටහන 5.5 :** *ඒ, බී හා සී කාණ්ඩයන්ට අයත් කර්මාන්තයන්හි අවකාශීය ව්‍යාප්තිය*
**මූලාශ්‍රය :** *මධ්‍යම පරිසර අධිකාරිය, 2016*

ආචාර්ය සේපාල සමරසේකර මහතා විසින් ප්‍රකාශයට පත් කරන ලද Socio Ecological Review of Bolgoda Lake in Sri Lanka, 2017 අනුව බොල්ගොඩ ගංගාවේ ජල සාම්පල පරීක්ෂා කිරීම තුළින් එළඹෙන ලද නිරීක්ෂණ පහත වගු අංක 5.4. හි ද ඊට අදාල නිගමන ඇමුණුම් අංක 6 හි ද දැක්වේ.

| | උෂ්ණත්වය | pH අගය | රසායනික ඔක්සිජන් ඉල්ලුම | ජෛවීය ඔක්සිජන් ඉල්ලුම | සමස්ත අවලම්භිත ද්‍රව්‍යය | සමස්ත ද්‍රවිත ඝන ද්‍රව්‍යය | සමස්ත නයිට්‍රජන් අගය | ද්‍රවිත ඔක්සිජන් | සන්නායකතාව |
|---|---|---|---|---|---|---|---|---|---|
| ඒකකය | සෙල්සියස් | | ලීටරයට මිලිග්‍රෑම් | | | | | | මිලිවෝල්ට් |
| සම්මත අගය | | 6.0-8.5 | 250 | 3-5 | 50 | 25-250 | | 3 | |
| කොස්පලන ඉවුර, | 29.9 | 7.5 | 200 | 7 | 10 | 228 | හ.නො. | 7.9 | 20 |
| කොරල වැල්ල ඉවුර | 29.8 | 8 | 600 | 22 | 555 | 9028 | 5.6 | 5.3 | 20 |
| කොරල වැල්ල මධ්‍යය | 29.7 | 8 | 600 | 21 | 553 | 12484 | 5.6 | 6.6 | 30 |
| පහල ඉඳිබැද්ද ඉවුර | 31.4 | 7.9 | 200 | 8 | 47 | 4404 | හ.නො. | 6.7 | 20 |
| කඩොලාන මධ්‍යය | 29.9 | 8.3 | 400 | 12 | 217 | 4848 | 2.8 | 9.2 | 30 |
| කඩොලාන ඉවුර | 31.3 | 7.8 | 100 | 14 | 310 | 5024 | හ.නො. | 4.3 | 20 |
| විල්ලොර වත්ත මධ්‍යය | 30 | 8.3 | 200 | 4 | 47 | 980 | හ.නො. | 9.5 | 10 |

- *නිරීක්ෂිත අගය එහි සම්මත අගයෙන් අපගමනය වූ අවස්ථාවලදී එය කහ පැහැයෙන් දක්වා ඇත.*

**වගුව 5.4 :** *බොල්ගොඩ ගංගාවේ ජල සාම්පල නිරීක්ෂණ වාර්තාව*
**මූලාශ්‍රය :** *ආචාර්ය සමරසේකර එස්, 2017*

### *ඇ. ලුනාව කලපුව පරිසර ආරක්ෂණ කලාපයක් ලෙස ප්‍රකාශයට පත් කර නොතිබීම.*

සවිස්තරාත්මක SWOT විශ්ලේෂණයෙහි පරිච්ඡේද 5.2.1.1; ප්‍රබලතා යටතේ ලුනාව කලපු ප්‍රදේශයේ ඉහල සත්ත්ව හා ශාක විශේෂ සනත්වයක් හා විවිධත්වයක් ඇති බවට හඳුනා ගෙන ඇති අතර තවදුරටත් ජල විද්‍යාත්මක වශයෙන් වැදගත් ජලජ හා ගොඩබිම් ආශ්‍රිත පරිසර පද්ධතීන් ඇති බවට තහවුරු වී ඇත. ඒ අනුව ලුනාව කලපු ප්‍රදේශය ජෛව විවිධත්වය අනුව වැදගත් ස්ථානයක් ලෙස සලකනු ලබන නමුත් එම ප්‍රදේශය පරිසර ආරක්ෂණ කලාපයක් ලෙස ප්‍රකාශයට පත් කර නොතිබීම දුර්වලතාවයක් ලෙසට හඳුනා ගන්නා ලදි.

### *ඈ. බොල්ගොඩ, ලුනාව කලපුව හා වෙරළාශ්‍රිතව කඩොලාන ශාක වඳ වී යාමේ තත්ත්වයක් පැවතීම.*

පරිච්ඡේදය 5.2.1.1.(ඈ) යටතේ සඳහන් කර ඇති පරිදි කඩොලාන ශාක වර්ධනය සඳහා ඉතා උචිත පාරිසරික තත්ත්වයන් බොල්ගොඩ වැව, ලුනාව කලපුව හා වෙරළාශ්‍රිතව පවතින බවට හඳුනාගනු ලැබුවද වර්තමානය වන විට විවිධ මානව ක්‍රියාකාරකම් හා අවිධිමත් කළමනාකරණය හේතුවෙන් එම ප්‍රදේශයන්හි පවත්නා ඉතා වටිනා හා ඉහල ජෛව විවිධත්වයකින් යුතු කඩොලාන ශාක ක්‍රමයෙන් හායනය වෙමින් පවතින බවට හඳුනා ගන්නා ලදි.

මොරටුව තෙත්බිම් ආශ්‍රිත කඩොලාන ශාක හායනය වීමට හේතු හා එමඟින් ඇති වන බලපෑම්;

i. බොල්ගොඩ ගංගාවේ ඉස්සන් ගොවිපළ පාලනය- ඉස්සන් කොටු වලින් මුදා හැරෙන දිලිර සහිත ජලය, ආහාර අවශේෂ, ඉස්සන්ගේ මළ අපද්‍රව්‍ය, කාබනික හා කාබනික නොවන කෘමිනාශක යනාදිය ඉහල ප්‍රමාණ වලින් බැහැර කිරීම හේතුවෙන් සෘතුමය වර්ෂාපතන වලදී ඒවා ජලාශය පුරා ව්‍යාප්ත වීමෙන් දේශීය ශාක හා සතුන් හායනය වීම.

ii. කර්මාන්තශාලා වලින් පිට කරන විෂ අපද්‍රව්‍ය, ඝන අපද්‍රව්‍යය හා දැව කර්මාන්තයෙන් ඉවතලන ලී කුඩු ජලාශ වලට එක් කිරීම- මෙලෙස බැහැර කරන අපද්‍රව්‍යය කඩොලාන ශාක අතර අවසාදනය වීම හේතුවෙන් වායුධර මුල් අවහිරවීම නිසා කඩොලාන ශාක වල මනා වර්ධනයට බාධා පැමිණේ. තවද මෙමඟින් ක්ෂුද්‍ර ශාක හා සතුන්ටද ජීවත්වීමට නුසුදුසු පාරිසරික තත්ත්ව නිර්මාණය වන අතර වක්‍රාකාරව මිනිසාගේ සෞඛ්‍යයටද හානිදායක බලපෑම් ඇති කරනු ලබයි. (උදාහරණ ලෙස රෝගකාරක බීජ පැතිරීම හේතුවෙන් උණ සන්නිපාතය බහුල වීම ) තවදුරටත් ජීවීන්ගේ ප්‍රජනන ක්‍රියාවලිය අඩාල වීමෙන් ප්‍රදේශයේ ජෛව විවිධත්වය හා ජීවීන්ගේ පැවැත්ම සීමා වී ඇත.


iii. ජලාශ්‍රිත ප්‍රදේශ ගොඩ කිරීම හා වාණිජ කටයුතු සඳහා කඩොලාන ශාක කපා ඉවත් කිරීම- මෙහිදී කෙටි කාල සීමාවකදී විශාල ප්‍රමාණයෙන් ශාක ඉවත් කරන බැවින් හා ගොඩ කරන ලද ප්‍රදේශ වල සිදු කරන අවිධිමත් ඉදිකිරීම් හේතුවෙන්, කඩොලාන ශාක ස්වාභාවික පුනර්ජනනය වීමට නොහැකි වීම. ස්වාභාවික

## 5.2.1.3. අවස්ථා | අරමුණ 01

### අ. *1980 අංක 47 දරණ ජාතික පාරිසරික පනත යටතේ බොල්ගොඩ ආරක්ෂණ කලාපයක් ලෙසට ප්‍රකාශයට පත්කර තිබීම.*

1988 අංක 56 සහ 2000 අංක 53 දරණ පනත් වලින් සංශෝධිත 1980 අංක 47 දරණ ජාතික පාරිසරික පනතේ අංක 24 ඇ සහ ඈ වගන්ති ප්‍රකාරව බොල්ගොඩ පරිසර ආරක්ෂණ කලාපය ප්‍රකාශයට පත් කර තිබීම ජලයෙන් පෝෂිත නගරයක් යන අරමුණ කරා ලඟා වීමේදී වැදගත් අවස්ථාවක් වනු ඇත. ඒ අනුව මධ්‍යම පරිසර අධිකාරිය විසින් මොරටුව නැගෙනහිර සහ දකුණු මායිම වන බොල්ගොඩ ගඟ සඳහා මීටර 60 ක රක්ෂිත සීමාවක් පවත්වා ගෙන යනු ලබයි.

රූප සටහන් අංක 5.6 හි නිරූපනය කර ඇති පරිදි බොල්ගොඩ ගංගාව කොළඹ හා කළුතර දිස්ත්‍රික්කයන්හි ග්‍රාම නිලධාරි වසම් 84 ක් ආවරණය වන පරිදි ගලා බසින අතර එයින් ග්‍රාම නිලධාරි වසම් 21ක් මොරටුව මහ නගර සභා සීමාවට අයත් වේ. තවදුරටත් එම රූප සටහනේ මධ්‍යම පරිසර අධිකාරිය මඟින් බල පවත්වනු ලබන මීටර 60 බොල්ගොඩ ගංගා රක්ෂිතයද එහි සලකුණු කොට ඇත.




*රූප සටහන 5.6 : බොල්ගොඩ පරිසර ආරක්ෂණ කලාපය | **මූලාශ්‍රය :** මධ්‍යම පරිසර අධිකාරිය, 2017*

## 5.2.1.4. තර්ජන | අරමුණ 01

### අ. *ගෝලීය උෂ්ණත්වය ඉහල යාම හේතුවෙන් සිදු වන සාගර ජල මට්ටම ඉහල යාම.*

එක්සත් ජාතීන්ගේ පාරිසරික ව්‍යාපෘතිය, ලෝක කාලගුණ විද්‍යා සංවිධානය හා විද්‍යාත්මක සංගම් පිළිබඳ වූ අන්තර්ජාතික මණ්ඩලය යන ආයතන ඒකාබද්ධව 2007 වර්ෂයේදී ගෝලීය කාලගුණික වෙනස් වීම් පිළිබඳව දැක්වෙන "Intergovernmental Panel on Climate Change (IPCC)" වාර්තාව ප්‍රකාශයට පත් කොට ඇත. ගෝලීය උෂ්ණත්වය ඉහල යාම හේතුකොට ගෙන ශ්‍රී ලංකාවේ සාගර ජල මට්ටම ඉහල යාම පුරෝකථනය කිරීම සඳහා ඉහත වාර්තාවේ සඳහන් කර ඇති දත්ත ආශ්‍රයෙන් 2012 වර්ෂයේදී ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ අධීක්ෂණය යටතේ, වෙරළ සංරක්ෂණ හා වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් වෙරළාශ්‍රිත ප්‍රදේශ ජලයෙන් යටවීමේ ප්‍රවණතා පුරෝකථනය කරන ලද අතර එහිදී අවුරුදු 25, 50, 75, 100 ලෙස කාල පරාස හතරක් යටතේ අධ්‍යයනය සිදු කර ඇත. ඒ ආශ්‍රයෙන් මොරටුව ප්‍රදේශය සඳහා "සාගර ජල මට්ටම ඉහළ යාම– 66 පත්‍රය හා 73 පත්‍රය" ලෙස ප්‍රකාශයට පත් කොට ඇති සිතියම් ද්විත්වය ඇමුණුම් අංක 7 හි දක්වා ඇත.

එම සිතියම් අධ්‍යයනය තුළින් එළඹිය හැකි නිගමන;

i. වසර 25 ක කාල පරාසයක් තුළදී සාගර ජල මට්ටම ඉහල යාම හේතුවෙන් මොරටුව වෙරළ රක්ෂිත ප්‍රදේශය ජලයෙන් යට වීමේ හැකියාවක් පවතී.

ii. ක්‍රමයෙන් වසර 100ක් ගත වන විට ලුනාව කලපුව හා බොල්ගොඩ ගංගාව ආශ්‍රිත ප්‍රදේශත් රට අභ්‍යන්තර ප්‍රදේශත් ජලයෙන් යට වීමේ හැකියාවක් ඇති බව හඳුනා ගෙන ඇත.

iii. කොරලවැල්ලේ සිට එගොඩ උයන දක්වා වූ පටු බිම් තීරය සාගර ජල මට්ටම ඉහල යාමේ අධි අවදානම් කලාපයක් ලෙස හඳුනාගෙන ඇත.

## 5.2.2. අරමුණ 02

*ගමනාගමනය පාදක කරගත් ජනාවාස ඉලක්ක කරගනිමින් කාර්යක්‍ෂම හා ඵලදායී නගරයක් බිහිකිරීම.*


### 5.2.2.1. ප්‍රබලතා | අරමුණ 02

අ. *මොරටුව මහ නගර සභා ප්‍රදේශය ශ්‍රී ලංකාවේ සිව්වන විශාලතම සංචාරක ආකර්ෂණයෙන් යුතු මහ කොළඹ සංචාරක පුරවරයට අයත් හා සංචාරක ආකර්ෂණය සහිත ප්‍රදේශ දෙකකට එනම්; උතුරින් දෙහිවල- ගල්කිස්ස මහ නගර සභා ප්‍රදේශයටත් දකුණින් පානදුර නගරයටත් මැදිව පිහිටා තිබීම.*

විවෘත ආර්ථිකය හඳුන්වාදීමත් සමග ශ්‍රී ලංකාව සම්ප්‍රදායානුකූල නොවන ආර්ථික විභවයන් වෙත අවධානය යොමු කරනු ලැබූ අතර එහිදී අපනයන අංශය කරා යොමුව සංචාරක කර්මාන්තය, රෙදිපිළි කර්මාන්තය හා පිළියෙළ කරනු ලැබූ කෘෂිකාර්මික නිෂ්පාදන යනාදී භාණ්ඩ හා සේවා වෙත නැඹුරු විය. ඒ අනුව මොරටුව සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීමේදී ප්‍රදේශයේ ඇති විභවතා උපයෝගී කර ගනිමින් ශ්‍රී ලංකාවේ දළ ජාතික ආදායමට සැලකිය යුතු දායකත්වයක් ලබා දීමට හැකි වන අංශ වෙත අවධානය යොමු කරනු ලැබූ අතර එහිදී සංචාරක කර්මාන්තය දිරි ගැන්වීමට ඇති ප්‍රබලතා හඳුනා ගනු ලැබීය.

මොරටුව මහ නගර සභා ප්‍රදේශයේ සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය සඳහා වන ප්‍රධානතම ශක්තිය ලෙස එහි පිහිටීම දැක්විය හැක. එනම් මොරටුව නගරය ශ්‍රී ලංකාවේ සිව්වන විශාලතම සංචාරක ආකර්ෂණයෙන් යුතු මහ කොළඹ සංචාරක පුරවරයට අයත් හා සංචාරක ආකර්ෂණය සහිත ප්‍රදේශ දෙකකට එනම්; උතුරින් දෙහිවල– ගල්කිස්ස මහ නගර සභා ප්‍රදේශයටත් දකුණින් පානදුර නගරයටත් මැදිව පිහිටා තිබීම දැක්විය හැකි වේ. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ වාර්ෂික වාර්තාව 2017 අනුව ශ්‍රී ලංකාව සංචාරක කලාප හතකට එනම්; කොළඹ නගරය (කොළඹ 1–14), මහ කොළඹ කලාපය, දකුණු වෙරළබඩ ප්‍රදේශය, නැගෙනහිර වෙරළබඩ ප්‍රදේශය, මධ්‍යම කඳුකරය, පුරාණ නගර හා උතුරු ප්‍රදේශය වශයෙන් බෙදා දක්වා ඇති අතර මොරටුව නගරය මහ කොළඹ (මොරටුව සිට කොළඹ දක්වා හා මීගමුව සිට කොළඹ දක්වා වන ප්‍රදේශය) සංචාරක කලාපයට අයත් වේ.  ( රූප සටහන් අංක 5.7)

ඉහත සංචාරක කලාපයන්හි පවතින නවාතැන් පහසුකම් සලකා බැලීමේදී මහ කොළඹ ප්‍රදේශය 13.74%ක ධාරිතාවයකින් හෙබි වන අතර කොළඹ නාගරික ප්‍රදේශයේ එනම් කොළඹ නගරය (1–14) 22.62%ක ධාරිතාවයකින් යුක්ත වේ. ඒ අනුව කොළඹ ඇතුළු අනෙකුත් ආසන්න ප්‍රදේශ වල සමස්ත ධාරිතාවය 36.36%ක් වේ. තවදුරටත් ශ්‍රී ලංකාවට පැමිණෙන සංචාරකයින් නවාතැන් ගන්නා අනුපාත සංසන්දනයේදී මහ කොළඹ කලාපයේ සංචාරකයින් නවාතැන් ගන්නා ප්‍රමාණය 73.14%  ක් වන අතර සංචාරකයින් සඳහා නවාතැන් පහසුකම් සැපයීම හා නවාතැන් ගන්නා ප්‍රමාණය අනුව මහ කොළඹ සංචාරක කලාපය සිව් වන ස්ථානය ගන්නා බව වගු අංක. 5.5 අනුව තහවුරු වේ.  (ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය, 2017)




***රූප සටහන 5.7 :*** *ශ්‍රී ලංකාවේ සංචාරක කලාප*
***මූලාශ්‍රය :*** *ශ්‍රී ලංකා ජාතික සිතියම්, 2007*

| සංචාරක පුරවරය | සංචාරක නවාතැන් පහසුකම් ධාරිතාවය | නවාතැන් ගන්නා ප්‍රමාණය |
|---|---|---|
| කොළඹ නගරය (කොළඹ 1-14) | 22.62% | 75.31% |
| මහ කොළඹ කලාපය | 13.74% | 73.14% |
| දකුණු වෙරළබඩ ප්‍රදේශය | 35.23% | 72.38% |
| නැගෙනහිර වෙරළබඩ ප්‍රදේශය | 4.82% | 72.95% |
| මධ්‍යම කඳුකරය | 5.78% | 73.55% |
| පුරාණ නගර | 17.11% | 73.85% |
| උතුරු ප්‍රදේශය | 0.70% | 70.98% |

*වගුව 5.5 : සංචාරක පුරවරයන්හි සංචාරක නවාතැන් පහසුකම් ධාරිතාවය හා නවාතැන් ගන්නා ප්‍රමාණය*
*මූලාශ්‍රය : ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය, 2017*

මොරටුව මහ නගර සභා උතුරු මායිම වන දෙහිවල-ගල්කිස්ස මහ නගර සභා ප්‍රදේශය හා දක්ෂිණ මායිම වන පානදුර නගරය වර්තමානයේද සංචාරක ආකර්ෂණය නොමදව ලැබෙන ප්‍රදේශ වේ. එලෙස එම ප්‍රදේශ සඳහා සංචාරක ආකර්ෂණය ඇතිවීමට හේතුන් ලෙස සිසුයෙන් ව්‍යාප්ත වන නවීන කඩසාප්පු, රෙදිපිළි ප්‍රදර්ශනාගාර, තරු පන්තියේ හෝටල් හා විවිධ සභාධිපත්‍ය ගොඩනැගිලි යනාදිය දැක්විය හැකි අතර දෙහිවල සත්වෝද්‍යානය හේතුවෙන්ද වාර්ෂිකව 1,400,000 පමණ සංචාරකයින් ප්‍රමාණයක් දෙහිවල-ගල්කිස්ස ප්‍රදේශය වෙත ඇදී එයි. (ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය, 2017). තවද දර්ශනීය මුහුදු තීරයත් ඒ ආශ්‍රිතව ව්‍යාප්ත වන හෝටල් කර්මාන්තයත් නිසා මෙම ප්‍රදේශ ඉතා ජනප්‍රිය සංචාරක ගමනාන්ත බවට පත්ව ඇත.

වර්තමානයේ මොරටුව නගරයට පවතින සංචාරක ආකර්ෂණය ඉතා අල්ප වුවද, ඉහත විස්තර කර ඇති පරිදි දෙහිවල-ගල්කිස්ස හා පානදුර නගර සඳහා ඇති සංචාරක ආකර්ෂණය උපයෝගී කොට ගෙන මොරටුව නගරයද සංචාරක තෝතැන්නක් බවට පත් කිරීමේ හැකියාව පවතින බව පෙනී යයි.

## ආ. මොරටුව නගරය තුන් පසෙකින් ස්වභාවික ජල මූලාශ්‍රයන්ගෙන් මායිම්ව උප නාගරික ලක්ෂණ වලින් හෙබි වාණිජ න්‍යෂ්ටියක් ලෙස වර්ධනය වීම.

### මොරටුව නගරය තුන් පසෙකින් ස්වභාවික ජල මූලාශ්‍රයන්ගෙන් මායිම් වීම.

මොරටුව නගරයේ පරිපාලන මායිම වන මහ නගර සභා සීමා මායිම ස්වාභාවිකම තුන් පසෙකින් ජලයෙන් මායිම්ව පවතී. එනම් මොරටුව නගරය බටහිර දෙසින් වෙරළබඩ තැනිතලාවේ ඉන්දියන් සාගරයට යාව සුන්දර බිම් තීරයකට හිමිකම් කියනු ලබන අතර නැගෙනහිරින් හා දකුණෙන් බොල්ගොඩ නදියෙන්ද මායිම්ව ඇත.

මොරටුව මහ නගර සභා පරිපාලන සීමාවේ පවතින එකම ගොඩබිම් මායිම ලෙස උතුරින් දෙහිවල-ගල්කිස්ස මහ නගර සභා බල ප්‍රදේශයේ සීමා මායිම හඳුනා ගත හැකි වේ. මේ අනුව මොරටුව මහ නගර සභා ප්‍රදේශයේ සමස්ත සීමා මායිම් දිගෙන් කි.මී. 40 ක් පමණ ජලාභිමුඛ ප්‍රදේශ වන හෙයින් සංචාරක අංශය ප්‍රවර්ධනයේදී ජලාභිමුඛ සංවර්ධනය දිරි ගැන්වීමට හැකි වන අයුරින් ඒ සඳහා ඉතා උචිත පාරිසරික තත්ත්වයන් ස්වාභාවිකම මොරටුව නගරයට උරුම වී ඇත.

### උප නාගරික ලක්ෂණ වලින් හෙබි වාණිජ න්‍යෂ්ටියක් ලෙස වර්ධනය වීම

19 වන ශත වර්ෂය ආරම්භයේ සිට ශ්‍රී ලංකාව වැනි දකුණු ආසියාතික තෙවැනි ලෝකයේ රටවල ආර්ථික කටයුතු වල කේන්ද්‍රස්ථානය ලෙස ප්‍රථමතා නගර බිහි වූ බවට හඳුනා ගත හැකි වේ. මෙලෙස ප්‍රථමතා නගර බිහිවීම සඳහා ප්‍රදේශයේ මාර්ග රටාව හා බැඳුනු භෞතික සැකැස්ම ඍජු ලෙස බලපා ඇති අතර සමාජයීය හා පාරිසරික ලක්ෂණද රට හේතු වී ඇත. එලෙස ශ්‍රී ලංකාවේ නිර්මාණය වූ ප්‍රථමතා නගරයක් ලෙස කොළඹ නගරය හැඳින්විය හැක. (රිමර්,1998). මෙවැනි පසුබිමක් තුළ ක්‍රමයෙන් කොළඹ හර ප්‍රදේශය සීඝ්‍රයෙන් ජනාකීර්ණ වීමත් සමඟ ඇතිවූ පාරිසරික හා සමාජයීය ගැටළු පදිංචියට නුසුදුසු පරිසරයක් නිර්මාණය කිරීම හේතුවෙන් ජන සංක්‍රමණය වීම ආරම්භ විය. එහි ප්‍රතිඵලයක් ලෙස කොළඹ හර ප්‍රදේශය ආසන්නව දෙහිවල-ගල්කිස්ස, මොරටුව, පානදුර මහරගම වැනි උප නාගරික කේන්ද්‍ර ශ්‍රේණියක් නිර්මාණය වීම ආරම්භ විය.

තවද මධ්‍යම ව්‍යාපාර ප්‍රදේශය ජනාකීර්ණ වීමත් සමඟ එහි ඉඩකඩ ප්‍රමාණවත් නොවීම හා සේවා අවශ්‍යතා වැඩිවීම හේතුවෙන් උප නාගරික කේන්ද්‍ර බිහි වී ඇති අතර එම උප නාගරික ප්‍රදේශ කරා ව්‍යාප්ත වන කාර්යයන් ලෙස වෙළඳසැල්, සාප්පු සංකීර්ණ, සිනමාහල්, ගෘහ භාණ්ඩ වෙළඳසැල්, නිවාඩු නිකේතන හා සංචාරක සේවා යනාදිය දැක්විය හැක. (කෝට්ටේගොඩ එස්.බී.බී, 2015)

යම් නගරයක සංචාරක කටයුතු ප්‍රවර්ධනය කිරීම සඳහා බලපාන එක් සංරචකයක් ලෙස නාගරීකරණ තීව්‍රතාව හැඳින්විය හැකි වේ. මොරටුව නගරය කොළඹ හර ප්‍රදේශයට ආසන්නව පිහිටි වාණිජ කටයුතු ස්ථාපිත වූ උප නගරයක් වන බැවින් සංචාරක ආකර්ෂණය ලබා ගැනීම සඳහා අවශ්‍ය පහසුකම් වර්ධනය කිරීමට ඉතා සුදුසු ප්‍රදේශයක් ලෙස හැඳින්විය හැක.

ඉහත කරුණු සලකා බැලීමේදී මොරටුව නගරය සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම සඳහා උචිත පාරිසරික, ආර්ථික හා වාණිජ පසුබිමකින් යුතු ප්‍රදේශයක් ලෙස හැඳින්විය හැකිය.

### ඇ. මොරටුව නගරයේ පාරම්පරිකව පවතින දැව කර්මාන්තය

මොරටුව නගරයේ අනන්‍යතාවය ලෙස පාරම්පරික ලී බඩු කර්මාන්තය හැඳින්විය හැකි අතර වර්තමානයේදීද නගරවාසී ජනතාවගේ ප්‍රධානතම ජීවනෝපාය වන්නේ වඩු කර්මාන්තයයි. ප්‍රධාන වශයෙන් මොරටුමුල්ල, ඉඳිබැද්ද, කඩලාන, විල්ලෝරවත්ත හා කොරළවැල්ල යන ප්‍රදේශ කේන්ද්‍ර කරගනිමින් ක්‍රියාත්මක වන වර්තමාන දැව භාණ්ඩ නිෂ්පාදනය විශාල වශයෙන් යන්ත්‍රානුසාරයෙන් නවීන තාක්ෂණය භාවිතා කරමින්, විශාල නිෂ්පාදන ධාරිතාවයකින් යුතුව පවත්වා ගෙන යනු ලබයි. (මොරටුව මහ නගර සභාව, 2017).

83% ක් දෘඩ දැව හා 17% ක් සැහැල්ලු දැව යොදා ගනිමින් ලී බඩු නිෂ්පාදනය කරනු ලබන අතර මාසිකව ලී භාණ්ඩ ඒකක 64,000 ක් පමණ නිෂ්පාදනය කරනු ලබන අතර මාසිකව රුපියල් මිලියන 54ක පමණ අදායමක් ලබන බව සඳහන් වේ. (අමරසේකර ටී.ඒ.ඩී.එස්. හා ජයපාල. එම්. එස්) ඒ අනුව ශ්‍රී ලංකාවේ ප්‍රධානතම දැව නිෂ්පාදනය සිදු කරන නගරය මොරටුව වන හෙයින් නගරයේ සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය කිරීම සඳහා යොදා ගත හැකි එක් මෙවලමක් ලෙස දැව කර්මාන්තය හැඳින්විය හැකි වේ.

## 5.2.2.2. දුර්වලතා | අරමුණ 02

*අ. මොරටුව නගරය ස්වභාවික ජල මූලාශ්‍රයන්ගෙන් සමන්විත වුවද, එම ජල මූලාශ්‍ර කරා ජනයාට ප්‍රවේශ වීමේදී භෞතිකව පවත්නා බාධා හා ජල මූලාශ්‍ර දූෂණය වීමෙන් ඒවායේ ආකර්ෂණීයභාවය හායනය වීම හේතුවෙන් නගරය තුළ සංචාරක කර්මාන්තය ප්‍රවර්ධනය සඳහා එම සම්පත් උපයෝගී කර ගැනීමට නොහැකි වීම.*

මොරටුව නගරය ඉහල ජෛව විවිධත්වයකින් යුතු ජල මූලාශ්‍රයන්ගෙන් සමන්විත වුවද එම ජල මූලාශ්‍ර ඉතා සීඝ්‍රයෙන් දූෂණය වෙමින් පවතින හෙයින් ඒවායේ ජෛව විවිධත්වය හා සුන්දරත්වය ක්‍රමයෙන් හායනය වෙමින් පවතී. මොරටුව නගරයේ වැඩිම දිගකින් යුතු බොල්ගොඩ ජලාභිමුඛ ප්‍රදේශය වෙත විවිධ හේතූන් මත ජනතාවට ප්‍රවේශ වීමට නොහැකි තත්ත්වයකට පත්ව ඇති අතර, ඊට හේතු ලෙස මොරටුමුල්ල, ඉදිබැද්ද ප්‍රදේශවලදී වඩු කර්මාන්තය ගංගා ඉවුර දක්වාම ව්‍යාප්ත වීම, ජලාභිමුඛ ප්‍රදේශයේ අනවසරයෙන් ඉදි කොට ඇති පැල්පත් නිවාස හා බොල්ගොඩ ගංගාව කරා ප්‍රවේශ වීම සඳහා ප්‍රමාණවත් පුළුල් මාර්ග නොමැති වීම යනාදිය දැක්විය හැක.

තවදුරටත් මොරටුව නගරය දර්ශනීය වෙරළ තීරයකට උරුමකම් කියනු ලැබුවද දුම්රිය මාර්ගය හා වෙරළ රක්ෂිත සීමාව අනවසර පැල්පත් හා මුඩුක්කු නිවාස වලින් සමන්විත වීම හේතුවෙන් ජනතාවට ආරක්ෂිතව හා පහසුවෙන්  වෙරළ තීරයට ප්‍රවේශ වී එහි සුන්දරත්වය අත්විඳීමට නොහැකි වී ඇත.

නාගරික සංවර්ධන අධිකාරියේ මැදිහත් වීමෙන් ඉදි කරනු ලැබූ මොරටුව-ලුනාව ශරීර සුවතා මංතිරුව ව්‍යාපෘතිය යටතේ ඇවිදින මංතීරු ඉදිකර දීමට අමතරව කලපුවේ ජලය පවිත්‍රතා කටයුතු සිදු කරනු ලැබුවද කලපුව හා සම්බන්ධ වන ඇළ මාර්ග වෙතට අපද්‍රව්‍ය හා අපජලය බැහැර කිරීම වැළැක්වීම සඳහා නිසි ක්‍රියාමාර්ග ගෙන නොතිබීම හේතුවෙන් වර්තමානය වන විට ලුනාව කලපුවේ ජලය නැවතත් ක්‍රමයෙන්  දූෂණය වෙමින් පවතින බව නිරීක්ෂණය වී ඇත.

## 5.2.2.3. අවස්ථා | අරමුණ 02

*අ. 2016 වසරේ සකස් කරන ලද බස්නාහිර කලාපීය මහ නගර සැලැස්ම යටතේ මොරටුව නගරය සංචාරක කලාපයේ පිහිටි නගරයක් ලෙස සංවර්ධනය කිරීමට හඳුනා ගෙන තිබීම.*

2016 වර්ෂයේදී පිළියෙළ කරනු ලැබූ බස්නාහිර කලාපීය මහ නගර සැලැස්ම (රූප සටහන් අංක 2.14) මඟින් බස්නාහිර පළාත කලාප හයකට බෙදා දක්වා ඇති අතර මොරටුව අධි ඝනත්ව කලාපයට අයත් මීගමුව සිට අලුත්ගම දක්වා දිවෙන සංචාරක කලාපයේ පිහිටි කොළඹ හර ප්‍රදේශයට ඉතා ආසන්න උප නගරයක් ලෙස හඳුනා ගෙන ඇත.

## 5.2.3. අරමුණ 03


*නගරයේ අවශ්‍යතා සඳහා ප්‍රමාණවත් යටිතල පහසුකම්*

### 5.2.3.1. ප්‍රබලතා | අරමුණ 03

අ. *මොරටුව නගරයට මැදින් ගමන් කරන ගාළු පාර කොළඹ නගරයට ඇතුල් වන කොරිඩෝ හතෙන් එකක් වීම හා මොරටුව නගරය තුළ ගාලු පාර කේන්ද්‍ර කර ගත් මනාව විහිදුණු මාර්ග පද්ධතියක් පැවතීම.*


කි.මී.9ක දිගින් යුත් ගාලු කොරිඩෝව මොරටුව නගරය මැදින් දිවෙන අතර, රූප සටහන් අංක 5.8 හි දැක්වෙන පරිදි කොම්ට්‍රාන්ස් අධ්‍යයන වාර්තාවේ දත්ත වලට අනුව එය කොළඹ නගරයට පිවිසෙන ප්‍රධාන කොරිඩෝ හත අතරින් තෙවන ක්‍රියාකාරී කොරිඩෝව ලෙස හැදින්විය හැක. එහි සඳහන් පරිදි 2013 වර්ෂයේදී දෛනිකව මගීන් 298,000 ක් ගාලු කොරිඩෝව හරහා සංසරණය වී ඇති අතර එය 2035 වන විට දෛනිකව 447,500 ක් දක්වා වර්ධනය වේ යැයි අපේක්ෂා කෙරේ.

මොරටුව මහ නගර සභා ප්‍රදේශය සඳහා සිදු කරනු ලැබූ අවකාශීය සංකලන විශ්ලේෂණයට (සිතියම් අංක 5.2) අනුව, සැලසුම් ප්‍රදේශයෙහි බොහෝ ප්‍රදේශ ඉහල හා මධ්‍යම අගයන්ගෙන් යුතුව අවකාශීය සංකලනය වී ඇති බව නිරීක්ෂණය වන බැවින් සැලසුම් ප්‍රදේශ-යෙහි මනාව විහිදුනු මාර්ග පද්ධතියක් ඇති බවට නිගමනය කල හැක. එහි ප්‍රතිඵලයක් ලෙස විවිධ භූමි පරිභෝ-ජනයන් හා විවිධ ක්‍රියාකාරකම් මොරටුව ප්‍රදේශය පුරා පහසුවෙන් ව්‍යාප්ත කිරීමේ හැකියාවක් පවතින බවට තහවුරු වේ.




Source: CoMTrans Study Team

*රූප සටහන 5.8 : කොළඹ නගරයට පිවිසෙන ප්‍රධාන කොරිඩෝ*
*මූලාශ්‍රය : කොම්ට්‍රාන්ස් අධ්‍යයන වාර්තාව, 2014*





***සිතියම 5.2 :*** *අවකාශීය සංකලන විශ්ලේෂණය- 2018*

***මූලාශ්‍රය :*** *නාගරික සංවර්ධන අධිකාරිය, 2018*

### ආ. මොරටුව ප්‍රධාන දුම්රිය පොළ කේන්ද්‍ර කොට ගත් අභ්‍යන්තර දුම්රිය ස්ථාන හතරකින් සමන්විත වීම.

මොරටුව නගරයේ දුම්රිය මාර්ග පද්ධතිය මොරටුව ප්‍රධාන දුම්රිය ස්ථානය කේන්ද්‍ර කොට ගෙන පහත රූප සටහන් අංක 5.9 පරිදි අඟුලාන, කොරලවැල්ල, ලුනාව, එගොඩ උයන යන අභ්‍යන්තර දුම්රිය ස්ථාන හතරකින් යුක්තව සකස් කොට ඇත.




***රූප සටහන 5.9 :*** *මොරටුව දුම්රිය ස්ථාන*
***මූලාශ්‍රය :*** *ගූගල් සිතියම් හා නාගරික සංවර්ධන අධිකාරිය, 2018*

මොරටුව නගරයේ දුම්රිය මාර්ග පද්ධතිය මොරටුව ප්‍රධාන දුම්රිය ස්ථානය කේන්ද්‍ර කොට ගෙන පහත රූප සටහන් අංක 5.9 පරිදි අඟුලාන, කොරලවැල්ල, ලුනාව, එගොඩ උයන යන අභ්‍යන්තර දුම්රිය ස්ථාන හතරකින් යුක්තව සකස් කොට ඇත.

## 5.2.3.2. දුර්වලතා | අරමුණ 03

### අ. මොරටුව නගරයේ නේවාසික ජනගහනය සඳහා ප්‍රමාණවත් විවෘත අවකාශ නොමැති වීම.

ජන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලැබූ 2012 ජන සංගණන දත්ත අනුව මොරටුව මහ නගර සභා ප්‍රදේශයේ 167,000ක පමණ ජනගහනයක් ජීවත් වන බව සඳහන් වේ. ශ්‍රී ලංකාවේ පොදු විවෘත අවකාශ සඳහා වන සම්මතය අනුව පුද්ගලයින් 1000 කට අවම වශයෙන් හෙක්ටයාර 1.4 ක පොදු එළිමහන් ප්‍රදේශයක් වෙන් කල යුතු වේ. ඒ අනුව මොරටුව සැලසුම් ප්‍රදේශය සඳහා අවම වශයෙන් හෙක්ටයාර 230ක පොදු එළිමහන් ප්‍රදේශයක් වෙන් කල යුතු වුවත් වර්තමානයේ මොරටුව මහ නගර සභා බල ප්‍රදේශය තුළ හෙක්ටයාර 9ක පමණ පොදු එළිමහන් ප්‍රදේශයක් පවතින හෙයින් එය වර්තමාන නේවාසික ජනගහනස සඳහා කිසිසේත්ම ප්‍රමාණවත් නොවන බවට හඳුනාගෙන ඇත.

### ආ. මොරටුව නගරය සඳහා පොදු රථ වාහන නැවතුම් ස්ථාන නොමැති වීම.

ඇමුණුම 33 හි දැක්වෙන පරිදි ප්‍රදේශයේ ස්වභාවික ජල ගැලීමට අනුව, එක් එක් ඇළ මාර්ගයන් දිගින් මී. 500 කට වඩා වැඩි ප්‍රමාණයක් අවහිර වී තිබේ. එම ඇළ මාර්ග හා අවහිර වී ඇති ප්‍රමාණයන් වගුව 5.7 හි දැක්වෙන අතර ඊට අදාල ඡායාරූප රූප සටහන 5.19 හි දැක්වේ. මෙම තත්ත්වය ක්ෂණික ගංවතුර වැනි පාරිසරික ගැටලු ඇති වීමට හේතු වී ඇත.

### ඇ. අඩු පහසුකම් සහිත නිවාස හා නිවාස හිඟයක් පැවතීම.


2012 ජනසංගණන වාර්තාවේ දත්ත විශ්ලේෂණය තුළින් දල වශයෙන් නිවාස 375ක පමණ හිඟයක් පවතින බවට හඳුනාගෙන ඇති අතර දන්දෙනියවත්ත, බැටරිවත්ත, පිට්ටනියවත්ත හා සමරකෝන්වත්ත ආදි රජයේ ඉඩම් හා වෙරළ, දුම්රිය හා ජල රක්ෂිත ප්‍රදේශයන්හි පදිංචි අඩු පහසුකම් සහිත 2500 ක් පමණ පවුල් සඳහා පහසුකම් සහිත නිවාස නොමැතිවීම දුර්වලතාවයක් ලෙසට හඳුනාගන්නා ලදි.

## 5.2.3.3. අවස්ථා | අරමුණ 03

### අ. යෝජිත බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථාන ව්‍යාපෘතිය හා මුහුදුබඩ මාර්ගය මොරටුව දක්වා දීර්ඝ කිරීම

#### යෝජිත බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානය

කොළඹ නගරයට ඇතුළු වන දක්ෂිණ ද්වාරය ලෙස සලකන මොරටුව නගරය බටහිර වෙරළ තීරයේ පිහිටා ඇති ප්‍රධානතම නගරයක් ලෙසට හැඳින්විය හැකි අතර කොළඹට සමගාමීව පානදුර, පිළියන්දල හා මහරගම නගර සමඟද අන්තර් සබඳතා පවත්වන න්‍යෂ්ටික ප්‍රදේශයක් ලෙසටද මොරටුව හඳුන්වාදිය හැක. මොරටුව විශ්වවිද්‍යාලය, ජර්මන් ටෙක් ආයතනය, වෙනත් අධ්‍යාපනික හා තාක්ෂණික ආයතන, කර්මාන්ත ප්‍රදේශය සහ පුද්ගලික ආයතන රාශියක් මෙම ප්‍රදේශයේ ඒකරාශී වීම හේතුවෙන් දෛනිකව ඉහළ මගී ගලනයක් සිදු වන අතර ක්‍රමවත් හා කාර්යක්ෂම පොදු ප්‍රවාහන සේවයක අවශ්‍යතාවය පැන නැගී ඇත.




*රූප සටහන 5.10 : යෝජිත මොරටුව බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථාන ව්‍යාපෘති සැලැස්ම*
*මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය, 2017*

මොරටුව ප්‍රධාන දුම්රිය ස්ථානය හා ප්‍රධාන බස් නැවතුම්පොළ භූමිය ආශ්‍රිත අක්කර 8 ක පමණ වපසරියක් ඇති දුම්රිය දෙපාර්තමේන්තුව සතු භූමියේ (රූප සටහන 5.10 ) ඒකාබද්ධ බස් හා දුම්රිය පර්යන්තය, මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතිය හා සැහැල්ලු දුම්රිය පද්ධතිය සමග රථ වාහන නැවතුම් පහසුකම් සහිතව මොරටුව බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානය සංවර්ධනයට යෝජිතය.

### යෝජිත මුහුදුබඩ මාර්ගය මොරටුව දක්වා දීර්ඝ කිරීම

යෝජිත මුහුදුබඩ මාර්ගය සංවර්ධන ව්‍යාපෘතිය මඟින් මොරටුව නගරය සඳහාද අවධානය යොමු කර තිබීම විශේෂ අවස්ථාවකි. කොළඹ සිට දිවෙන යෝජිත මුහුදුබඩ මාර්ගය වීරපුරන්අප්පු රජ මාවත ඔස්සේ මොරටුව නගර මධ්‍යයට සම්බන්ධ කර ඉදි කිරීමට මාර්ග සංවර්ධන අධිකාරිය මඟින් යෝජනා වී ඇත.

### ආ. *මහානගර ප්‍රවාහන සැලැස්ම යටතේ යෝජිත සැහැල්ලු දුම්රිය මාර්ග ව්‍යාපෘතිය*

මහානගර ප්‍රවාහන සැලැස්ම මඟින් යෝජිත සැහැල්ලු දුම්රිය මාර්ග ව්‍යාපෘතිය, කොළ, රතු, නිල් මාර්ග ලෙස පැකේජ තුනක් යටතේ සිදු කිරීමට යෝජනා වී ඇති අතර එහි තෙවන පැකේජය ලෙස හරිත (කොළ) මාර්ගය කැළණිය, දෙමටගොඩ, බොරැල්ල, නාරාහේන්පිට, නුගේගොඩ, පිළියන්දල හරහා මොරටුව වෙත කි.මි. 28.3 ක දිගකින් යුතුව සැහැල්ලු දුම්රිය මාර්ගය ඉදි කිරීමට යෝජනා කර ඇත. එම සැහැල්ලු දුම්රිය මාර්ගයේ ගමනාන්තය මොරටුව බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානය වන අතර අතරමැදි නැවතුම් ස්ථාන වශයෙන් මොරටුව විශ්වවිද්‍යාලය, කටුබැද්ද හා රාවතාවත්ත යෝජනා කර ඇත.

### ඇ. *දන්දෙනියවත්ත, සමරකෝන්වත්ත, පිට්ටනියවත්ත හා බැටරිවත්ත සඳහා යෝජිත නිවාස සංවර්ධන ව්‍යාපෘති*

දන්දෙනියවත්ත, සමරකෝන්වත්ත, පිට්ටනියවත්ත හා බැටරිවත්ත සහ අඩු පහසුකම් සහිත නිවාස වල පදිංචිකරුවන්ගේ ජීවන තත්ත්වය නඟා සිටුවීම සඳහා නාගරික සංවර්ධන අධිකාරිය විසින් මහල් නිවාස සංකීර්ණ ඉදිකිරීමට යෝජනා කොට ඇත. නාගරික පුනර්ජීවන ව්‍යාපෘතියක් ලෙස ක්‍රියාත්මක කිරීමට යෝජිත මෙම නිවාස යෝජනා ක්‍රමයේදී ඉඩමෙන් කොටසක් අඩු පහසුකම් සහිත පවුල් වෙනුවෙන් මහල් නිවාස ඉදිකිරීමටත් ඉතිරි භූමිය මිශ්‍ර සංවර්ධන කටයුතු සඳහා මුදා හැරීමටත් සැලසුම් කරමින් පවතී.

## 5.3.3.4. තර්ජන | අරමුණ 03

### අ. *සිවිල් ගුවන් සේවා අධිකාරිය මඟින් බල පැවැත්වෙන උස සීමාව.*

මොරටුව මහ නගර සභා ප්‍රදේශය රත්මලාන ගුවන් ධාවන පථ සීමාවට ආසන්නව පිහිටීම හේතුවෙන් ගොඩනැගිලි ඉදි කිරීමේදී සිවිල් ගුවන් සේවා අධිකාරිය මඟින් පනවන ලද උස සීමාවන්ට අනුගතව සියලුම සංවර්ධන කටයුතු සිදු කල යුතු වේ.

# 06

## පරිච්ඡේදය



# සංවර්ධන සැලැස්ම

# 6.1. සංකල්පිත සැලැස්ම

සංවර්ධන සැලැස්ම තුළින් හඳුනා ගත් අරමුණු හා පරමාර්ථ මුදුන් පමුණුවා ගැනීම තුළින් සංවර්ධන දැක්ම ලඟාකර ගැනීම සඳහා 2030 වසර වන විට මොරටුව මහ නගර සභා බල ප්‍රදේශයේ අපේක්ෂිත සංවර්ධනය සිදු විය යුතු අකාරය සංකල්පිත සැලැස්ම තුළින් සරලව විග්‍රහ කරනු ලබයි. මෙහිදී ප්‍රධාන වශයෙන් ප්‍රදේශයේ පවතින සංවර්ධන ප්‍රවණතා, ස්වභාවික සම්පත්, සංචාරක ආකර්ෂණය හා ස්ථානීය පිහිටීම යන කරුණු පිළිබඳව විශේෂ අවධානය යොමු කරන ලදී.

සංවර්ධන ප්‍රවණතාවයේ බලපෑම පිළිබඳව අධ්‍යයනය කිරීමේදී අනාගත සංවර්ධනයන් පිළිබඳව විශේෂ අවධානය යොමු කරන ලද අතර, එනම් යෝජිත බහුවිධ ප්‍රවාහන සැලැස්ම ප්‍රමුඛ කොට ගෙන නගර මධ්‍යය ප්‍රදේශය පළමු පෙළ මංසන්ධිය ලෙසද කටුබැද්ද, බොරුපන හා රාවතාවත්ත දෙවන පෙළ මංසන්ධි ලෙසද සංවර්ධනය කිරීමට හඳුනා ගෙන ඇත. තවදුරටත් තෙවන පෙළ මංසන්ධි ලෙස අඟුලාන හා මොරටුව අලුත් පාලම මංසන්ධි හඳුනා ගනු ලැබූ අතර නේවාසික මංසන්ධි කිහිපයක්ද සංවර්ධන ප්‍රවණතා අනුව සංවර්ධනය කිරීමට යෝජිතය.

සංකල්පිත සැලැස්ම මඟින් මොරටුව නගරයට විශේෂිත වූ පාරිසරික පද්ධතීන් ලෙස හඳුනා ගත් තුන් පසෙකින් ජලයෙන් වට වී තිබීම, එනම් නැගෙනහිරින් හා දකුණින් බොල්ගොඩ ගංගාවෙන්ද, බටහිරින් මුහුදු තීරයෙන්ද මායිම් වීම අභ්‍යන්තර ජල මූලාශ්‍රයන් ලෙස හෙක්ටයාර 30 ක වපසරියකින් යුත් ලුනාව කලපුව, වේරස් ගඟ හා ලුනාව ආශ්‍රිතව පැතිරුණු ඇළ මාර්ග ජාලය, ජලය රදවා තබා ගන්නා  ස්ථාන ලෙස හෙක්ටයාර 20 ක තෙත්බිම් හා වගුරුබිම් ආදි ප්‍රදේශය පුරා පැතිරී ඇති ජල සම්පත ප්‍රමුඛ පාරිසරික සම්පත් නිසි කළමනාකරණය තුළින් දියසරු උද්‍යානයක් ලෙස මහජනතාවගේ සුව පහසුව සඳහා විවෘත කරමින්, එම අත්දැකීම් අන් අයට අත්විදිය හැකි පරිදි සංචාරක කර්මාන්තය දියුණු කිරීමට බලාපොරොත්තු වේ.

ජල මූලාශ්‍රයන් මහජනතාව සඳහා විවෘත කරමින් විනෝදාස්වාදජනක කටයුතු සඳහා යොදා ගැනීම, පදික  මංතීරු, වෙරළ භූදර්ශනය හා අලංකරණය, වගුරුබිම් ආශ්‍රිත තෙත්බිම් නිසි කළමනාකරණය තුළින් සංවර්ධන සැලැස්මේ අරමුණු හා දැක්ම ලඟාකර ගැනීමයි. එමෙන්ම ගාලු පාර ප්‍රධාන කොට ගත් ප්‍රවේශ මාර්ගයන් දියුණු කිරීම, එනම් නගරයට ලගා වීමට ඇති හැකියාව වැඩි කිරීම සඳහා මනාව විහිදුනු මාර්ග ජාලයක් ඉදි කිරීමටත් මෙමඟින් යෝජිතය.

මෙම සියළු කාරණා සැලකිල්ලට ගෙන මොරටුව නගරයේ පවතින පාරිසරික සම්පත් උපරිම අයුරින් සංරක්ෂණය කරමින් සංචාරක කර්මාන්තය හරහා නවෝද්පාදයක් ලබා දෙමින් මොරටුව නගරය සෑම අංශයකින්ම ස්වයංපෝෂිත නගරයක් බවට පත් කිරීමට පහත රූප සටහන් අංක 6.1 මඟින් දැක්වෙන මෙම සංකල්පිත සැලැස්ම මඟින් බලාපොරොත්තු වේ.

සංකල්පිත සැලැස්ම




***රූප සටහන 6.1 :*** *සංකල්පිත සැලැස්ම*
***මූලාශ්‍රය :*** *නාගරික සංවර්ධන අධිකාරිය, 2018*

# 6.2. යෝජිත භූමි පරිහරණ සැලැස්ම

මොරටුව පුරවරය ආර්ථික වශයෙන් සවිමත් නාගරික කේන්ද්‍රයක් ලෙස සංවර්ධනය කිරීම හා නගරයෙහි ස්වභාවික ජල මූලාශ්‍ර සංවර්ධන මෙවලමක් ලෙස යොදා ගනිමින් ජනයාට ජීවත් වීම සඳහා වඩා සුවපහසු වටපිටාවක් නිර්මාණය කිරීම යන අභිප්‍රායන් පෙරදැරිව මොරටුව මහ නගර සභා ප්‍රදේශය සඳහා මොරටුව සංවර්ධන සැලැස්ම 2019 –2030 ඉදිරිපත් කරනු ලැබේ.

මොරටුව නගරයේ ආර්ථික නියාමන හඳුනා ගෙන, ඒවා වඩා විධිමත් හා තිරසාර ලෙස සංවර්ධනය සඳහා උපයෝගී කර ගත හැකි වන අයුරින් මංසන්ධි ධූරාවලියක් පිළියෙළ කරනු ලැබිය. ඒ අනුව මොරටුව නගරයේ පළමු පෙළ මංසන්ධිය වශයෙන් මොටුව නගර මධ්‍ය මංසන්ධිය දැක්විය හැකි අතර දෙවන පෙළ මංසන්ධි ලෙස බොරුපන මංසන්ධිය, කටුබැද්ද හා රාවතාවත්ත මංසන්ධි හැඳින්විය හැකි වේ. තෙවන පෙළ මංසන්ධි ලෙස මොරටුව අලුත් පාලම මංසන්ධිය හා අඟුලාන මංසන්ධිය දැක්විය හැකි අතර මොරටුව නගරය තුළ විසිරී පවතින නේවාසික මංසන්ධි කිහිපයක්ම හඳුනා ගත හැකි වේ.

### අපේක්ෂිත නාගරික ආකෘතිය

මොරටුව මහ නගර සභා ප්‍රදේශය සඳහා පිළියෙළ කරනු ලබන සංවර්ධන සැලැස්ම 2019–2030 තුළින් ස්වාභාවික ජල මූලාශ්‍ර ආශ්‍රිතව ජලාභිමුඛ සංවර්ධනය සමග බැඳුණු නාගරික ආකෘතියක් ඇති කිරීමට අපේක්ෂා කරනු ලබයි. එහිදී ජලාභිමුඛ ප්‍රදේශ ආශ්‍රිතව විවිධ ගොඩනැගිලි ඝනත්ව පවත්වා ගෙන යාමට අපේක්ෂිත අතර රට සමගාමීව සියලු ජලාභිමුඛ ප්‍රදේශයන්හි ඉහල හරිත ඝනත්වයක් සුරැකෙන පරිදි සංවර්ධන කටයුතු දිරි ගන්වනු ලබයි.


මොරටුව බටහිර වෙරළ මායිමේ සිට නැගෙනහිර බොල්ගොඩ ගංගා මායිම දක්වා සියලු ජලාභිමුඛ ප්‍රදේශ අන්තර්ගත වන පරිදි නිර්මාණය කරනු ලැබූ නගර හරස් ඛණ්ඩ රූප සටහන් අංක 6.2.හි නිරූපනය කර ඇති අයුරින් ජලාභිමුඛ ප්‍රදේශ වල ගොඩනැගිලි ඝනත්ව විචලනය වනු ඇත. ඒ අනුව වෙරළ ජලාභිමුඛ ප්‍රදේශය මොරටුව නගරය තුළට සුළංධාරා ඇතුළු වන බටහිර මායිම වන බැවින් එම ප්‍රදේශයේ ගොඩනැගිලි ඝනත්වය පහළ අගයකිනුත් හරිත ඝනත්වය ඉහල අගයකිනුත් පවත්වා ගෙන යාමට අපේක්ෂා කරනු ලබයි.

වෙරළ තීරයේ සිට නැගෙනහිර දෙසට වන්නට පවතින ලුනාව කලපු ප්‍රදේශය නේවාසික භාවිතය සඳහා ඉතා උචිත ස්වභාවික ආපදා වලින් තොර හා ප්‍රමාණවත් යටිතල පහසුකම් වලින් සමන්විත වන අතරම සෞම්‍ය පාරිසරික තත්ත්ව සහිත ප්‍රදේශයක් ලෙසට පරිවර්තනය කර ගැනීමටද හැකි හෙයින් අධි ඝනත්ව නේවාසික ප්‍රදේශයක් ලෙස සංවර්ධනය කරනු ඇත. ලුනාව කලපු ප්‍රදේශයේ සිට ක්‍රමයෙන් නගර මධ්‍යය දෙසට වන්නට ගාලු පාර කේන්ද්‍ර කර ගනිමින් වාණිජ හා මූල්‍ය අංශය සඳහා අධි ඝනත්වයකින් යුතුව සංවර්ධනයක් ඇති කිරීමට අදහස් කරන අතර මොරටුව මහ නගර සභා ප්‍රදේශයේ ප්‍රවාහන පහසුකම් හා බැඳුණු නාගරික සංවර්ධනයක් ඇති කරනු ලබන ප්‍රධානතම ප්‍රදේශය ලෙසටද හඳුන්වා දිය හැක. තවද කටුබැද්ද තෙත්බිම ආශ්‍රිත ප්‍රදේශය මධ්‍ය ඝනත්ව මිශ්‍ර සංවර්ධන ප්‍රදේශයක් ලෙස සංවර්ධනයට අදහස් කර ඇත. බොල්ගොඩ ගංගා ප්‍රදේශය ස්වභාවික ආපදා වලට නිරන්තර ලක් වන ප්‍රදේශයක් බැවින් ගොඩනැගිලි ඝනත්වය සාපේක්ෂව පහළ  අගයකින් පවත්වා ගෙන යනු ඇත. (රූප සටහන් අංක 6.2)


එහෙත් සියලු ජලාභිමුඛ ප්‍රදේශ වල ජලයට ඉතා ආසන්න ප්‍රදේශය පනවන ලද උස සීමාවන්ට යටත්ව සිදු කරනු ලබන සහාධිපත්‍ය ඉදිකිරීම් සඳහා ප්‍රවර්ධනය කරනු ලබන අතර සියලු ඉදි කිරීම් ජලාභිමුඛ ප්‍රදේශයට මුහුණලා සිදු කිරීමට යෝජිත වේ. තවදුරටත් ජලාභිමුඛ ප්‍රදේශ වල සංචාරක කටයුතු ප්‍රවර්ධනය සඳහා සංවර්ධන සැලැස්ම තුළින්  විවෘත උද්‍යාන, සංචාරක හෝටල් හා ජලාශ්‍රිත ක්‍රියාකාරකම් හඳුන්වා දෙනු ඇත.

මොරටුව මහ නගර සභා ප්‍රදේශය සඳහා අපේක්ෂිත නාගරික ආකෘතිය කරා ලඟා වීමට හැකි වන අයුරින් මොරටුව සංවර්ධන සැලැස්ම 2019–2030 සඳහා භාවිතා කලාප 6 ක් හා ව්‍යාපෘති යෝජනා ඉදිරිපත් කරනු ලැබූ අතර එය සිතියම් අංක 6.1 යෝජිත භූමි පරිහරණ සැලැස්මේ දක්වා ඇත.






***රූප සටහන 6.2 :*** *අපේක්ෂිත නාගරික ආකෘතියෙහි හරස් ඛණ්ඩ*
***මූලාශ්‍රය :*** *නාගරික සංවර්ධන අධිකාරිය, 2018*




**යෝජිත භූමි පරිහරණ සැලැස්ම- 2030**
**මොරටුව මහ නගර සභා ප්‍රදේශය**

0 0.35 0.7 1.4 2.1 2.8 Kilometers

**නාගරික සංවර්ධන අධිකාරිය**
දෙසැම්බර් 2018

මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය
මොරටුව සංවර්ධන සැලැස්ම (2019-2030)
සැකසුම: බස්නාහිර පළාත් අංශය හා පර්යේෂණ හා සංවර්ධන ඒකකය

***සිතියම 6.1 :*** *යෝජිත භූමි පරිහරණ සැලැස්ම - 2030* ***මූලාශ්‍රය :*** *නාගරික සංවර්ධන අධිකාරිය, 2018*

# 6.3. අපරව්‍යුහ පහසුකම් සංවර්ධනය කිරීමේ උපායමාර්ගික සැලැස්ම

## 6.3.1. සේවා කළමනාකරණ සැලැස්ම


මොරටුව සැලසුම් බල ප්‍රදේශය තුළ දැනට පවතින සෞඛ්‍යය, අධ්‍යාපන සහ අනෙකුත් පොදු පහසුකම් එනම් ක්‍රීඩා පිට්ටනි, වෙළඳ සංකීර්ණ, පොලීසි, තැපැල් කාර්යාල හා බැංකු පහසුකම් පිළිබඳව අවධානය යොමු කරමින් එකී පහසුකම්වල ප්‍රමාණාත්මකභාවය ඇගයීම තුළින් 2030 වසරේදී මොරටුව මහ නගර සභා බල ප්‍රදේශය සඳහා පුරෝකථනය කරන ලද ජනගහනය වෙනුවෙන් අවශ්‍ය සේවා හා පහසුකම් සලසාලීම සේවා කළමනාකරණ සැලැස්මේ අරමුණ වේ. සිතියම් අංක 6.2 මඟින් මොරටුව බල ප්‍රදේශයේ සමස්ත සේවා කළමනාකරණය පිළිබඳව පැහැදිලි කරනු ලබයි.

### 6.3.1.1. සෞඛ්‍යය පහසුකම්

ද සොයිසා රෝහල, දිස්ත්‍රික් රෝහලක් වන බැවින් එහි සේවා වපසරිය කිලෝ මීටර 5 ක අරයකින් යුතු ප්‍රදේශයක් ආවරණය කරනු ඇතැයි උපකල්පනය කරන ලදී. ඒ අනුව මොරටුව මහ නගර ප්‍රදේශයේ දකුණු මායිමේ පිහිටි කටුකුරුන්ද දකුණ, එගොඩ උයන උතුර, එගොඩ උයන දකුණ හා එගොඩ උයන මධ්‍යම යන ග්‍රාම නිලධාරී වසම් හැර අනෙකුත් ප්‍රදේශ ද සොයිසා දිස්ත්‍රික් රෝහල් සේවා වපසරිය මඟින් ආවරණය වන අතර එම සේවා වපසරිය මඟින් ආවරණය නොවූ ඉහත සදහන් ග්‍රාම නිලධාරී වසම් සඳහා අවශ්‍ය කෙරෙන සෞඛ්‍යය පහසුකම් යාබදව පිහිටි පානදුර මූලික රෝහල් සේවා වපසරිය මඟින් ආවරණය වනු ඇත.(සිතියම් අංක 6.3)


පරිච්ඡේද 2.2.2.3.(ඉ) හි සදහන් වූ පරිදි ලුනාව ආයුර්වේද රෝහල අතිරික්ත සේවා පහසුකම් වලින් සමන්විත බැවින් එහි සේවා වපසරිය කි.මී. 7 ක් ලෙස උපකල්පනය කරන ලද අතර ඒ අනුව මොරටුව මහ නගර සභා බල ප්‍රදේශය ආවරණය වන පරිදි සේවා සැපයීමේ හැකියාවක් ලුනාව ආයුර්වේද රෝහල සතුව ඇත.

ද සොයිසා දිස්ත්‍රික් රෝහල වැඩි දියුණු කිරීම: “බී” කාණ්ඩයේ දිස්ත්‍රික් රෝහලක් ලෙස සේවා සපයන ද සොයිසා රෝහල ”ඒ” කාණ්ඩයේ රෝහලක් ලෙස ඇඳන් 200 කින් හා ප්‍රමාණවත් කාර්යය මණ්ඩලයකින් සමන්විත නවීන තාක්ෂණික උපාංගයන්ගෙන් යුක්ත කාර්යක්ෂම සේවාවක් සැපයීමට හැකි රෝහලක් ලෙස වැඩිදියුණු කිරීමට යෝජනා කරනු ලබයි.




*සිතියම 6.2 : අපරවයුහ පහසුකම් ව්‍යාප්තිය - 2018*

*මුලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය, 2018*




**සෞඛ්‍යය පහසුකම් ව්‍යාප්තිය හා ආවරණ ප්‍රදේශය - 2018**
**මොරටුව මහ නගර සභා ප්‍රදේශය**

0 0.35 0.7 1.4 2.1 2.8 Kilometers

නාගරික සංවර්ධන අධිකාරිය
දෙසැම්බර් 2018

මුලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය | මොරටුව සංවර්ධන සැලැස්ම (2019-2030) | සැකසුම: බස්නාහිර පළාත් අංශය හා පර්යේෂණ හා සංවර්ධන ඒකකය

***සිතියම 6.3 :*** *සෞඛ්‍යය පහසුකම් ආවරණ ව්‍යාප්තිය - 2018* ***මුලාශ්‍රය :*** *නාගරික සංවර්ධන අධිකාරිය, 2018*

### 6.3.1.2. අධ්‍යාපන පහසුකම්

මොරටුව නගරය තුළ පිහිටි අධ්‍යාපන ආයතන වර්ගීකරණය අනුව ප්‍රාථමික පාසල්, මධ්‍ය මහා විද්‍යාල, මහා විද්‍යාල හා උසස් අධ්‍යාපන ආයතනයන්හි සේවා වපසරිය පිලිවෙලින් කිලෝමීටර 1.5, 3 හා 5 ක අරයකින් යුතු ප්‍රදේශයක් ආවරණය කරනු ඇතැයි උපකල්පනය කරන ලදී. ඒ අනුව මොරටුව මහ නගර සභා සැලසුම් ප්‍රදේශය තුළ පිහිටි පාසල් හා අධ්‍යාපන ආයතන මඟින් සේවා ආවරණ කලාප සිතියම් අංක 6.4 මඟින් නිරූපණය කරනු ලබන අතර එකී විශ්ලේෂණය පරිදි මොරටුව සැලසුම් බල ප්‍රදේශය සඳහා 2030 වසර වන විට පුරෝකථනය කරන ලද ජනගහනය සඳහා මොරටුව නගරය තුළ ප්‍රමාණවත් අධ්‍යාපන පහසුකම් සැපයීමේ හැකියාවක් ඇති බවට නිගමනය කල හැකිය.

### 6.3.1.3. නාගරික ජනාවාස සංවර්ධන සැලැස්ම

#### *සැලසුම් පරමාර්ථ*

මොරටුව සංවර්ධන සැලැස්ම තුළින් 2030 වර්ෂය සඳහා පුරෝකථනය කරන ලද නේවාසික ජනගහනය සඳහා ප්‍රමාණවත් යටිතල පහසුකම් වලින් යුක්ත හා ජීවත් වීමට උචිත පාරිසරික තත්ත්ව හා අවකාශය සහිත නිවාස ඒකක සපයා දීම නාගරික ජනාවාස සංවර්ධන සැලැස්මේ පරමාර්ථය ලෙස දැක්විය හැක.

#### *සැලසුම් විෂය පථය*

මොරටුව සංවර්ධන සැලැස්ම (2019 – 2030 ) 12 වසරක කාල පරිච්ඡේදය සඳහා පිළියෙල කරනු ලැබුවද, ඒ යටතේ වූ නාගරික ජනාවාස සංවර්ධන සැලැස්මේ අපේක්ෂිත ප්‍රතිලාභ ලබා ගැනීම සඳහා 2019 – 2040 දක්වා වූ කාල පරිච්ඡේදය අවශ්‍ය වනු ඇත.

නාගරික ජනාවාස සංවර්ධන සැලැස්ම තුළින් මොරටුව සැලසුම් ප්‍රදේශය තුළ නිවාස ඒකක ඝනත්වය නියාමනය සැලසුම් කරනු ලබන අතර ප්‍රදේශයේ ජල රැදවුම් ප්‍රදේශ ආශ්‍රිත පහත් බිම්, පාරිසරික සංවේදී ප්‍රදේශ හා රක්ෂිත ආශ්‍රිතවද ගොඩනැගිලි ඝනත්වය පාලනය කරනු ලබයි.

තවදුරටත් මොරටුව මහ නගර සභා ප්‍රදේශයේ හඳුනා ගනු ලැබූ අඩු පහසුකම් සහිත නිවාස 2500 ක් සඳහා ප්‍රමාණවත් පහසුකම් හා අවකාශ සහිත නිවාස ව්‍යාපෘති යෝජනා කිරීම මෙහිදී සිදු කෙරේ. (සමස්ත නාගරික ජනාවාස සංවර්ධන සැලැස්ම සිතියම් අංක 6.5 මඟින් දැක්වේ) .
(මොරටුව නාගරික ජනාවාස සංවර්ධන සැලැස්ම කේතය– SP)

#### *සැලසුම් උපායමාර්ග*

***අ. මොරටුව සංවර්ධන සැලැස්ම මඟින් අපේක්ෂිත භෞතික ආකෘතිය ලඟා කර ගැනීමට හැකි වන අයුරින් ගොඩනැගිලි ඝනත්වය පදනම් කරගනිමින් කලාපීකරණය සිදු කිරීම හා රෙගුලාසි හඳුන්වා දීම.***

මොරටුව මහ නගර සභා ප්‍රදේශය සඳහා යෝජිත කලාපීකරණ සැලැස්මෙහි සඳහන් සංවර්ධන කලාප 06 අතුරින් නේවාසික භාවිතය ප්‍රවර්ධනය සඳහා කලාප 04 ක් හඳුනා ගෙන ඇත. එහිදී මොරටුව මහ නගර සභා ප්‍රදේශයේ ප්‍රධානතම නේවාසික කලාපය ලෙස ලුනාව කලපුව ආශ්‍රිත ප්‍රදේශය හඳුනා ගනු ලැබූ අතර, එම ප්‍රදේශයේ ඉහල ගොඩනැගිලි ඝනත්වයකින් හා ඉහළ හරිත ඝනත්වයකින් යුතුව සංවර්ධන කටයුතු දිරි ගන්වනු ලබයි. බොල්ගොඩ ගංගාව හා මායිම්ව පවතින ප්‍රදේශය තුළ සභාධිපත්‍ය නේවාසික කටයුතු ප්‍රවර්ධනය කරනු ලබන අතර මෙම සංවර්ධන සැලැස්ම මඟින් බොරුපන, තෙලවල, මාලිගාව පාර යනාදී ප්‍රදේශයේ පිහිටි අධි හා මධ්‍ය දූෂක කර්මාන්ත ව්‍යාප්තිය සීමා කරනු ලබන හෙයින් එම

ප්‍රදේශයද අනාගතයේදී නේවාසික භාවිතාවන් සඳහා යොදා ගැනීමට අදහස් කරනු ලබයි. තවද කොරළවැල්ලේ සිට එගොඩ උයන දක්වා ප්‍රදේශයේ අඩු සනත්වයකින් යුතු නේවාසික භාවිතා දිරි ගන්වනු ලබයි.

ගාලු පාර කේන්ද්‍ර කරගත් මොරටුව නගර මධ්‍ය ප්‍රදේශය නේවාසික භාවිතය සඳහා දිරි නොගන්වන අතර එම ප්‍රදේශය වානිජ කලාපයක් ලෙස සංවර්ධනය කිරීමට අදහස් කරනු ලබයි. තවද ලී කර්මාන්තය සිදු කරනු ලබන ප්‍රදේශයන්හි ලී කුඩු හේතුවෙන් ඇති වන ස්වසන අපහසුතා හා යන්ත්‍රෝපකරණ මඟින් නිකුත් වන අධික ශබ්දය, තාපය හා කම්පන හේතුවෙන් එම ප්‍රදේශ නේවාසික භාවිතය සඳහා උචිත නොවන බවට  හඳුනා ගෙන ඇති බැවින් එම ප්‍රදේශයන්හිද නේවාසික භාවිතය දිරි ගන්වනු නොලැබේ.

### ආ. නිවාස සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා රජය සතු ඉඩම් යොදා ගැනීම. SP01- තේක්ක වත්ත, මෝල වත්ත හා මහවත්ත නිවාස සංවර්ධන ව්‍යාපෘති (සිතියම් අංක 6.5)


ප්‍රාදේශීය ලේකම් භාරයේ පවතින තේක්ක වත්ත, මෝල වත්ත හා මහවත්ත නැමැති රජය සතු ඉඩම් නිවාස සංවර්ධන ව්‍යාපෘති දියත් කිරීම සඳහා යොදා ගැනීමට අදහස් කරන අතර, දැනට වෙරළ තීරයේ පදිංචිව සිටින ජනතාව එම නිවාස සංකීර්ණ වෙත පුනස්ථාපනය කිරීමට යෝජනා කරනු ලබයි.

### ඇ. අඩු පහසුකම් සහිත නිවාස වල ජනතාවගේ ආර්ථික හා සමාජයීය කටයුතු වලට බාධා නොවන පරිදි එම ජනතාව පුනස්ථාපනය කිරීම. SP02- බැටරි වත්ත හා දන්දෙනිය වත්ත නිවාස සංවර්ධන ව්‍යාපෘතිය (සිතියම් අංක 6.5)

දන්දෙනියවත්ත ඉඩමේ නිවාස ඒකක 900 ක්ද  හා බැටරි වත්ත ඉඩමේ නිවාස ඒකක 700 ක්ද ලෙස නාගරික සංවර්ධන අධිකාරිය යටතේ නාගරික පුනර්ජීවන ව්‍යාපෘතියක් ලෙස මහල් නිවාස ඉදි කිරීමට අදහස් කරනු ලබන අතර එකී නිවාස එම රජයේ ඉඩම් කොටස්හි පවුල් සඳහා ලබා දීමට යෝජිතය. තව ද ඉතිරි වන බිම් කොටස් මිශ්‍ර සංවර්ධන කටයුතු සඳහා යෙදවීමට අපේක්ෂිතය.

### ඈ. ඌන භාවිතයෙන් යුතු නිවාස සංවර්ධන ව්‍යාපෘති පුනර්ජීවන නිවාස ව්‍යාපෘති සඳහා යොදා ගැනීම SP03- සොයිසාපුර හා සුනාමි නිවාස සංකීර්ණ ව්‍යාපෘතිය (සිතියම් අංක 6.5)

මොරටුව මහ නගර සභා බල ප්‍රදේශයේ අඩු පහසුකම් සහිත ජනතාව සඳහා විවිධ රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන වල මැදිහත් වීමෙන් නිවාස සංකීර්ණයන්හි නිවාස ලබා දී ඇති අතර, වර්තමානය වන විට එම නිවාස සංකීර්ණ ඌන භාවිතයෙන් යුතු බවට හදුනාගෙන ඇති බැවින් එම ඉඩම් සංවර්ධන කටයුතු සඳහා යොදා ගත හැකි  වනු ඇත. ඒ අනුව එලෙස ප්‍රතිසංවර්ධනයට උචිත බවට හඳුනා ගනු ලැබූ සොයිසාපුර මහල් නිවාස සංකීර්ණය හා සුනාමි නිවාස සංකීර්ණය පිහිටි ඉඩම් කොටස් පුනර්ජීවන නිවාස ව්‍යාපෘතියක් සඳහා යොදා ගැනීම තුළින් නව නිවාස වැඩි ප්‍රමාණයක් ඉදි කිරීමට හැකි වනු ඇත.





**අධ්‍යාපන පහසුකම් ව්‍යාප්තිය හා ආවරණ ප්‍රදේශය - 2018**
**මොරටුව මහ නගර සභා ප්‍රදේශය**

0 0.35 0.7 1.4 2.1 2.8 Kilometers

නාගරික සංවර්ධන අධිකාරිය
දෙසැම්බර් 2018

මුලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය | මොරටුව සංවර්ධන සැලැස්ම (2019-2030) | සැකසුම: බස්නාහිර පළාත් අංශය හා පර්යේෂණ හා සංවර්ධන ඒකකය

***සිතියම 6.4 :*** *අධ්‍යාපන පහසුකම් ව්‍යාප්තිය-2018* ***මූලාශ්‍රය :*** *නාගරික සංවර්ධන අධිකාරිය, 2018*




**සිතියම 6.5 :** *නාගරික ජනාවාස සංවර්ධන සැලැස්ම-2030* **මූලාශ්‍රය :** *නාගරික සංවර්ධන අධිකාරිය, 2018*

### 6.3.1.4. පොදු පහසුකම්

මොරටුව මහ නගර සභා බල ප්‍රදේශය තුළ පිහිටි පොදු හා පෞද්ගලික පොදු වෙළඳ සංකීර්ණ, මූල්‍ය ආයතන හා තැපැල් කාර්යාල යනාදියේ ව්‍යාප්තිය හා එම පහසුකම් ප්‍රමාණාත්මකභාවය සලකා බැලීම සඳහා ඒවායේ සේවා වපසරිය සම්බන්ධයෙන් පහත උපකල්පනයන්ට එළඹෙන ලදී. ඒ අනුව මූල්‍ය කටයුතු සඳහා කිලෝ මීටර 1.5 ක්ද පොදු වෙළඳ සංකීර්ණය සඳහා කිලෝ මීටර 3ක්ද, පෞද්ගලික වෙළඳ සංකීර්ණ සඳහා කිලෝ මීටර 1ක්ද, උප ප්‍රධාන තැපැල් කාර්යාල සඳහා කි.මී 5ක් හා උප තැපැල් කාර්යාල සඳහා කි .මී 1ක්ද වේ. පොදු පහසුකම් ආවරණය වන සේවා වපසරිය පහත සිතියම් අංක 6.6 මඟින් නිරූපණය කරනු ලබන අතර උපකල්පිත සේවා ඒකී පරිහරණය අනුව මොරටුව බල ප්‍රදේශය ආවරණය වන පරිදි අවශ්‍ය පොදු පහසුකම් ප්‍රමාණවත් පරිදි ව්‍යාප්ත වී ඇති බව නිගමනය කල හැකිය.

## 6.3.2. මාර්ග සහ ප්‍රවාහන සැලැස්ම

පසුගිය දශකයක කාලය තුළදී මොරටුව නගරය ඇතුළු අනෙකුත් උප-නාගරික කේන්ද්‍ර වෙත ජනගහනය සංක්‍රමණය වීම හා සේවා ලබා ගැනීමට පැමිණෙන මගී ජනගහනය හේතුවෙන් ප්‍රවාහන ඉල්ලුමෙහි ඉහල යාමක් පෙන්නුම් කෙරෙන අතර එමඟින් නගරය තුළ සංසරණය වන සමස්ත ජනගහනය පොදු හා පෞද්ගලික මාධ්‍යය භාවිතා කිරීමට පෙලඹී ඇත. මෙහිදී පොදු ප්‍රවාහන මාධ්‍යයන්ට වඩා පෞද්ගලික ප්‍රවාහන මාධ්‍යය භාවිතා කිරීමට පෙලඹීමෙන් නගරය තුළ සංසරණය වන වාහන ධාරිතාව ඉහල යාම හා කාර්යයබහුල වේලාවන්හීදී නගරය තුළ සිදු වන ගමනාගමනය ඉහල යාම හේතුවෙන් පවත්නා මාර්ගයන් හි සේවා මට්ටම අතික්‍රමණය කරමින් වාහන තදබද තත්වයක් පවතින බවට නිරීක්ෂණය වී ඇත.


### 6.3.2.1. සැලසුම් පරමාර්ථ

මොරටුව මහ නගර සභා ප්‍රදේශයේ පොදු ප්‍රවාහන සේවය විධිමත් කරමින් ජනතාව ඒ කරා යොමු කිරීම තුළින් ප්‍රවාහන තදබදය අවම කරලීම හා ජලාභිමුඛ සංවර්ධනය ඇති කිරීම හැකි වන පරිදි ප්‍රවේශකත්ව පහසුකම් සපයා දීම මෙම මාර්ග හා ප්‍රවාහන සැලැස්මේ පරමාර්ථ ලෙස දැක්විය හැකි වේ.

### 6.3.2.2. සැලසුම් විෂය පථය

මොරටුව මහ නගර සභා බල ප්‍රදේශයේ මාර්ග හා ප්‍රවාහන සැලැස්ම පිළියෙළ කිරීමේදී සංවර්ධන සැලැස්ම මඟින් පුරෝකථනය කරනු ලැබූ ජනගහනයට සමගාමීව ගමන්වාර සනත්වය ප්‍රවාහන අරමුණ හා ප්‍රවාහන මාධ්‍ය අනුව විචල්‍ය වීම අධ්‍යයනය තුළින් 2019–2030 සැලසුම් කාල පරිච්ඡේදය දක්වා ප්‍රදේශයේ ප්‍රවාහන අවශ්‍යතා සපුරාලීමට හැකි වන අයුරින් සැලසුම්කරණය කරනු ලැබීය. එහිදී ප්‍රදේශයේ මහාමාර්ග පද්ධතියේ සැකැස්ම අනුව එනම්; පළාත්බඳ සබඳතා සඳහා ඉවහල් වන මාර්ග, අන්තර් ගමනාගමනය සඳහා ඉවහල් වන මාර්ග හා මාර්ගයේ වර්තමාන භෞතික පළල යන සාධක මත මාර්ගයන්හි ප්‍රමුඛතා කාණ්ඩ වෙන් වශයෙන් හඳුනා ගනු ලැබීය.

නගරාන්තර ගමනාගමනය සඳහා පොදු ප්‍රවාහන මාධ්‍යය භාවිතය මෙන්ම විකල්ප පොදු ප්‍රවාහන මාධ්‍යය ප්‍රවර්ධනය සඳහා ශක්‍යතා අධ්‍යයන සිදු කරනු ලැබූ අතර සැලසුම් ප්‍රදේශය තුළ කෙටි දුර සංචාර සඳහා ඇවිදීම හා පාපැදි භාවිතයට අවශ්‍ය පහසුකම් සපයා දීම කෙරෙහිද අවධානය යොමු කරනු ලැබීය. තවදුරටත් මාර්ග හා ප්‍රවාහන සැලැස්ම තුළින් සංවර්ධන විභවතා පවතින ජලාභිමුඛ ප්‍රදේශ වෙත ප්‍රවේශකත්වය ඉහළ නැංවීම සඳහා උපායමාර්ග හඳුන්වා දීමද සිදු කරනු ලබයි.




**පොදු පහසුකම් ව්‍යාප්තිය හා ආවරණ ප්‍රදේශය - 2018**
**මොරටුව මහ නගර සභා ප්‍රදේශය**

0 0.35 0.7 1.4 2.1 2.8 Kilometers

නාගරික සංවර්ධන අධිකාරිය
දෙසැම්බර් 2018

මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය | මොරටුව සංවර්ධන සැලැස්ම (2019-2030) | සැකසුම: බස්නාහිර පළාත් අංශය හා පර්යේෂණ හා සංවර්ධන ඒකකය

***සිතියම 6.6 :*** *පොදු අවශ්‍යතා ව්‍යාප්තිය-2018*

***මූලාශ්‍රය :*** *නාගරික සංවර්ධන අධිකාරිය, 2018*

## 6.3.2.3. ප්‍රවාහන පසුබිම අධ්‍යයනය

තෙවන උපාය මාර්ගය ලෙස පොදු ප්‍රවාහන සේවය දිරිමත් කිරීම යටතේ යෝජිත දුම්රිය නවීකරණයන් හා සැහැල්ලු දුම්රිය සේවාවන් අන්තර්ගත කරගැනීමට යෝජනා කර ඇත. ඒ අනුව යෝජිත දුම්රිය නවීකරණය යටතේ පානදුර සිට වේයන්ගොඩ දක්වා ප්‍රධාන දුම්රිය මාර්ගයේ විද්‍යුත් නවීකරණය පාදක කොටගෙන සැලසුම් කලාපයට අයත් වනවාසල හා හුණුපිටිය දුම්රිය ස්ථානයන් නවීකරණය කෙරෙන අතර ගමනාගමනය පාදක කොට ගත් කුඩා නගර ලෙස අවශ්‍ය පහසුකම් සැපයේ. එසේම 2020 වසර සඳහා යෝජිත නව දුම්රිය නවීකරණ සැලැස්ම යටතේ කැලණිය සිට කොස්ගම දක්වා බියගම දොම්පෙ හරහා යෝජිත දුම්රිය මාර්ගය සම්බන්ධ කර ගනිමින් නුන්ගමුගොඩ නව දුම්රිය ස්ථානයක් ස්ථාපිත කිරීමට යෝජනා කෙරේ.

මොරටුව මහ නගර සභා ප්‍රදේශයේ මහාමාර්ග හා දුම්රිය මාර්ග ජාලය සම්බන්ධයෙන් පරිච්ඡේද 2.2.2.1.(ඇ) හි සවිස්තරාත්මකව විග්‍රහ කර ඇත. මොරටුව සංවර්ධන සැලැස්ම 2019–2030 හි මහාමාර්ග හා ප්‍රවාහන සැලැස්ම සකස් කිරීම සඳහා 2030 වසර වන විට ජනගහනය පුරෝකථනය කරන ලද අතර අපේක්ෂිත ජනගහනයට සමගාමීව ගමන් වාර ඝනත්ව ගණනය කරන ලදි.

ජනගහනය පුරෝකථනය– 2001 හා 2012 ජන සංගණන වාර්තාව අනුව 2030 වසර වන විට මොරටුව මහ නගර සභා සැලසුම් ප්‍රදේශය සඳහා පුරෝකථනය කරන ලද 150000 ක නේවාසික ජනගහනය හා 87000 ක මඟී ජනගහනය අනුව මොරටුව මහ නගර සභා සැලසුම් ප්‍රදේශය තුළ නේවාසික ජනගහනය හා පිටතින් පැමිණෙන ජනගහනය අතර 2:1ක අනුපාතයක් පවතී. තවද –0.49%ක ස්වාභාවික වාර්ෂික ජනගහන වර්ධන වේගය 1% කින් ඉහල නැංවීමට අපේක්ෂා කරන අතර ඒ අනුව ජනගහන වර්ධන වේගය 0.5%ක අගයක් ගනී.


ගමන් වාර ඝනත්ව පුරෝකථනය– යම් පුද්ගලයකු විසින් යම් කිසි නිශ්චිත කාර්යයක් අරමුණු කොට ගෙන ගමනාරම්භක ස්ථානයේ සිට ගමනාන්තය දක්වා සිදු කරනු ලබන චලනයක් ගමන් වාරයක් ලෙස සලකනු ලබන අතර සමස්ත ගමන් වාර එකතුව හා අදාළ ප්‍රදේශයේ වපසරිය අතර අනුපාතය ගමන් වාර ඝනත්වය ලෙස සැලකේ. කොම්ට්‍රාන්ස් අධ්‍යයන කණ්ඩායම විසින් ඉදිරිපත් කරනු ලැබූ Urban Transport Systems Development Project for Colombo Metropolitan Region and Suburbs වාර්තාවෙහි දැක්වෙන දත්ත හා නිගමන අනුව මොරටුව මහ නගර සභා සීමාව තුළ ප්‍රවාහන අරමුණ හා ප්‍රවාහන මාධ්‍යය අනුව ගමන් වාර ඝනත්වය හා එහි ව්‍යාප්තිය  අධ්‍යයනය කරනු ලැබිය.

ප්‍රවාහන අරමුණ අනුව ගමන් වාර සංයුතිය පහත රූප සටහන් අංක 6.3 පරිදි වර්ග කල හැකි අතර ගමන් වාර ප්‍රමුඛතාවය පිළිවලින් නිවෙස් කරා, රැකි–රක්ෂා, පුද්ගලික හේතූන් හා අධ්‍යාපනය සඳහා වේ. 2030 වර්ෂය වන විට පුරෝකථනය කරන ලද ජනගහනය අනුව දුම්රිය, බස්රථ හා පුද්ගලික ප්‍රවාහන මාධ්‍යයක් මඟින් උත්පාදිත ගමන්වාර ඝනත්ව පිළිබඳ අධ්‍යයනය කරන ලද අතර සමස්ත ගමන්වාර ඝනත්වය පහත සිතියම් අංකː 6.7 මඟින් පැහැදිලි කරනු ලබයි.

දුම්රිය ගමන්වාර ඝනත්වය පිළිබඳ සලකා බැලිමේදී මොරටුව, අඟුලාන, ලුනාව දුම්රිය නැවතුම් ස්ථාන ආශ්‍රිතව වඩා විහිදුණු සංචාර ඝනත්වයක් හඳුනා ගත හැකි නමුත් කොරලවැල්ලේ සිට එගොඩ උයන අතර කෙටි දුර සංචාරය සඳහා දුම්රිය භාවිතා කිරීමේ නැඹුරුතාවක් ඇති බව හඳුනා ගත හැක. (ඇමුණුම් අංක. 5) බස් රථ මඟින් උත්පාදිත ගමන්වාර ඝනත්ව අධ්‍යයනයේදී හෙක්ටයාරයට අවම වශයෙන් සංචාර 20 කට වඩා වැඩි අගයක් ගනු ලබන බව පැහැදිලි වේ.  (ඇමුණුම් අංක. 6)

පුද්ගලික මෝටර් රථ සඳහා වැඩි නැඹුරුතාවක් පෙන්නුම් කෙරෙන ප්‍රදේශ ලෙස අඟුලාන උතුර, බොරුපන, මොරටුව නගර මධ්‍යය හා එගොඩ උයන යනාදී ප්‍රදේශ හැඳින්විය හැකි අතර එම ප්‍රදේශ වල ඉහළ සංචාර ඝනත්වයක්ද දැකිය හැකි වේ. (ඇමුණුම 7)

**ප්‍රවාහන අරමුණු අනුව සංයුතිය**





***රූප සටහන 6.3 :*** *ප්‍රවාහන අරමුණු අනුව සංයුතිය*
***මූලාශ්‍රය :*** *Urban Transport Systems Development Project for Colombo Metropolitan Region and Suburbs වාර්තාව, 2017*


## 6.3.2.4. මාර්ග හා ප්‍රවාහන සැලැස්ම සඳහා වන උපායමාර්ග

මොරටුව මහ නගර සභා බල ප්‍රදේශය සඳහා වූ මාර්ග හා ප්‍රවාහන සැලැස්ම සඳහා උපායමාර්ග 3ක් පහත දක්වා ඇති පරිදි හඳුනා ගෙන ඇති අතර ඒ සඳහා පිළියෙල කර ගනු ලැබූ සමස්ත මාර්ග සංවර්ධන සැලැස්ම සිතියම් අංක 6.8 මඟින් දක්වා ඇත.

අ. අමොරටුව නගරය හා යාබද නාගරික කේන්ද්‍ර අතර සබඳතාව තර කිරීම සඳහා ප්‍රදේශයේ මාර්ග පද්ධතිය හා පොදු ප්‍රවාහන ජාලය වැඩිදියුණු කිරීම.
ආ. ඒකාබද්ධ ප්‍රවාහන පද්ධතියක් ඇති කිරීම තුළින් සම්පිණ්ඩිත නාගරික ආකෘතියක් බිහි කිරීම.
ඇ. ජලාභිමුඛ ප්‍රදේශ මහජනයාට විවෘත කොට සංවර්ධන කටයුතු දිරිගැන්වීම.




***සිතියම 6.7 :*** *මොරටුව මහ නගර සභා බල ප්‍රදේශය තුළ උත්පාදිත සමස්ත ගමන්වාර ඝනත්වය* ***මූලාශ්‍රය :*** *නාගරික සංවර්ධන අධිකාරිය, 2018*




**සිතියම 6.8 :** *මොරටුව ප්‍රවාහන සැලැස්ම - 2030*

**මූලාශ්‍රය :** *නාගරික සංවර්ධන අධිකාරිය, 2018*

### *අ) මොරටුව නගරය හා යාබද නාගරික කේන්ද්‍ර අතර සබඳතාව තර කිරීම සඳහා ප්‍රදේශයේ මාර්ග පද්ධතිය හා පොදු ප්‍රවාහන ජාලය වැඩිදියුණු කිරීම.*

කොළඹ හර ප්‍රදේශයේ සිදු වන වේගවත් නාගරීකරණයත් සමඟ, කොළඹට ආසන්නයේ ප්‍රධාන නාගරික කේන්ද්‍ර කරා ප්‍රධාන මාර්ග ඔස්සේ නාගරීකරණය සම්ප්‍රේෂණය වීමෙන් ඊට ආසන්නව උපනගර ශ්‍රේණියක් නිර්මාණය වී ඇති අතර කොළඹ හර ප්‍රදේශය හා සම්බන්ධ වන ගාලු කොරිඩෝව ප්‍රධාන කොට ගනිමින් කොල්ලුපිටිය, වැල්ලවත්ත, දෙහිවල, රත්මලාන හා මොරටුව යන උප නාගරික කේන්ද්‍ර ශ්‍රේණියක් බිහි වී ඇත.

මොරටුවට යාබදව පිහිටි ස්වාධීන නාගරික කේන්ද්‍ර ලෙස උතුරින් දෙහිවල, නැගෙනහිරින් පිළියන්දල හා මහරගම, දකුණින් පානදුර හැඳින්විය හැක. බොරලැස්ගමුව, රත්මලාන, කැස්බෑව හා කහතුඩුව යන ප්‍රදේශ අනාගතයේ දී නාගරික මධ්‍යස්ථාන ලෙස සංවර්ධනය වීම තුළින් මොරටුව නගරය සමඟ සබඳතා වර්ධනය වනු ඇතැයි අපේක්ෂා කෙරේ. (රූප සටහන් අංක 6.4)




*__රූප සටහන 6.4 :__ මොරටුව හා නාගරික කේන්ද්‍ර අතර කලාපීය සබඳතා | __මූලාශ්‍රය :__ නාගරික සංවර්ධන අධිකාරිය, 2018*

පහත විස්තර කොට ඇති විකල්ප පොදු ප්‍රවාහන මාධ්‍ය හඳුන්වා දීම හා මාර්ග සංවර්ධනය තුළින් ඉහත දක්වන ලද නාගරික කේන්ද්‍ර හා මොරටුව මහ නගර සභා ප්‍රදේශය අතර කලාපීය සම්බන්ධතාව ඉහල නැංවීමට අපේක්ෂා කෙරේ.

(මොරටුව ප්‍රවාහන සැලැස්ම කේතය- TP)

## i. සැහැල්ලු දුම්රිය සේවය (LRT)

බස්නාහිර කලාපීය මහානගර ප්‍රවාහන සැලැස්ම මඟින් යෝජිත සැහැල්ලු දුම්රිය මාර්ගය කැළණියෙන් ආරම්භ වී දෙමටගොඩ, බොරැල්ල, නාරාහේන්පිට, නුගේගොඩ හරහා මොරටුව බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානය ගමනාන්තය වේ.

පවතින මහාමාර්ගයට ඉහළින් ඉදි වන දුම්රිය මාර්ගය ඔස්සේ ධාවනයට හඳුන්වා දෙන සැහැල්ලු දුම්රිය සේවාව, සීමිත නැවතුම් ස්ථාන ගණනාවකින් සමන්විත වන අතර මහජනයාට වඩා කාර්යක්ෂම හා සුවපහසු පොදු ප්‍රවාහන සේවාවක් ලබා දීමේ හැකියාව ඇත.


TP01- පිළියන්දල, කටුබැද්ද හරහා මොරටුව නගර මධ්‍යය දක්වා සැහැල්ලු දුම්රිය සේවය

රූප සටහන් අංක 6.5 හි දක්වා ඇති පරිදි ඉදි කිරීමට යෝජිත සැහැල්ලු සේවය කිලෝමීටර 5ක දිගකින් යුතු අතර මොරටුව ප්‍රදේශයට අයත් නැවතුම් ස්ථාන වශයෙන් මොරටුව විශ්වවිද්‍යාලය, කටුබැද්ද, රාවතාවත්ත හා මොරටුව බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානය හඳුනා ගනු ලැබිය.

## ii. දුම්රිය මාර්ග සංවර්ධනය

TP02- වෙරළබඩ දුම්රිය මාර්ගය නවීකරණය

දුම්රිය සේවාව වඩා කාර්යක්ෂම කිරීම සඳහා නව සංඥා පද්ධතියක් ඇතුළුව දුම්රිය පද්ධතිය විද්‍යුතනය කොට වෙරළබඩ දුම්රිය මාර්ගය නවීකරණය හා අඟුලාන, ලුනාව, කොරළවැල්ල හා එගොඩ උයන දුම්රිය ස්ථාන නවීකරණය කිරීම.




*රූප සටහන 6.5 : P1 - ගාලු පාර මාර්ග හරස් ඛණ්ඩය*
*මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය, 2018*


### iii. මහාමාර්ග සංවර්ධනය

TP03– ගාලු පාර සංවර්ධන ව්‍යාපෘතිය.

මොරටුව නව ගාලු පාර හා පරණ ගාලු පාර සම්බන්ධ වන ස්ථානයේ සිට මොරටුව යෝජිත බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානය දක්වා කි.මී. 1ක දිගින් යුතු මාර්ගය මංතීරු 6 ක් සහිතව සංවර්ධනය කිරීම (හරස් ඛණ්ඩය රූප සටහන් අංක 6.5 මඟින් නිරූපනය කරයි).

TP04– බොරුපන මාර්ගය සංවර්ධන ව්‍යාපෘතිය


කොම්ට්‍රාන්ස් වාර්තාවට අනුව මංතීරු 6ක් සහිතව සංවර්ධනය කිරීමට හඳුනා ගෙන ඇති මධ්‍ය වටරවුම් පාර මහරගම, බත්තරමුල්ල, කැළණිය, වත්තල හා මොරටුව යන නාගරික කේන්ද්‍ර එකිනෙකට සම්බන්ධ කෙරෙන මාර්ගය සංවර්ධනය කිරීමට හැකි වන පරිදි බොරුපන මංසන්ධියේ සිට ගංගාරාම මාර්ගය දක්වා මීටර 200ක දිගින් යුතු  බොරුපන පාර මංතීරු 6 ක් සහිතව සංවර්ධනය කිරීම. (හරස් ඛණ්ඩය රූප සටහන් අංක 6.6 මඟින් නිරූපනය කරයි).




***රූප සටහන 6.6 :*** *P1 - බොරුපන පාර මාර්ග හරස් ඛණ්ඩය*
***මූලාශ්‍රය :*** *නාගරික සංවර්ධන අධිකාරිය, 2018*

TP05 කොළඹ ක්‍රමය පාර හෙවත් මුහුදුබඩ මාර්ගය දීර්ඝ කිරීම


බස්නාහිර පළාත් මහානගර සැලැස්ම මඟින් යෝජිත කොළඹ ක්‍රමය පාර දෙහිවල සිට වීරපුරන් අප්පු මාර්ගය ඔස්සේ යෝජිත මොරටුව බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානය දක්වා දීර්ඝ කිරීම. (හරස් ඛණ්ඩය රූප සටහන් අංක 6.7 මඟින් නිරූපනය කරයි).




***රූප සටහන 6.7 :*** *P2- යෝජිත මුහුදුබඩ මාර්ග හරස් බණ්ඩය*
***මූලාශ්‍රය :*** *නාගරික සංවර්ධන අධිකාරිය, 2018*


TP06 බණ්ඩාරනායක මාවත සංවර්ධන ව්‍යාපෘතිය

ක්‍රොම්ට්‍රාන්ස් වාර්තාව අනුව මොරටුව නගරය බණ්ඩාරනායක මාවත ඔස්සේ පිළියන්දල, පන්නිපිටිය, මාලබේ, බොල්ලෙගල, සපුගස්කන්ද, හුණුපිටිය සහ හැඳල හා සම්බන්ධ වන පරිදි නැගෙනහිර වටරවුම් මාර්ගය සංවර්ධනයට යෝජිත අතර ඒ අනුව කටුබැද්ද මංසන්ධියේ සිට කොස්පලාන පාලම දක්වා කි.මී. 2ක දිගින් යුතු බණ්ඩාරනායක මාවත මංතීරු 4 ක් සහිතව සංවර්ධනය කිරීම. (හරස් බණ්ඩය රූප සටහන් අංක 6.8 මඟින් නිරූපනය කරයි)




***රූප සටහන 6.8 :*** *P2- බණ්ඩාරනායක මාවත මාර්ග හරස් බණ්ඩය*
***මූලාශ්‍රය :*** *නාගරික සංවර්ධන අධිකාරිය, 2018*

ක්‍රොම්ට්‍රාන්ස් වාර්තාව අනුව හඳුනා ගෙන ඇති නැගෙනහිර වටරවුම් මාර්ගයට රාවතාවත්ත මංසන්ධිය සම්බන්ධ වන පරිදි රාවතාවත්ත මංසන්ධියේ සිට කටුබැද්ද කොස්පලාන පාලම දක්වා කි.මී. 3ක දිගින් යුතු ද සොයිසා මාර්ගය මංතීරු 4කින් යුතුව සංවර්ධනය කිරීම. (හරස් බණ්ඩය රූප සටහන් අංක 6.9 මඟින් නිරූපනය කරයි)




***රූප සටහන 6.9 :** P2 - ද සොයිසා මාර්ග හරස් ඛණ්ඩය*
***මූලාශ්‍රය :** නාගරික සංවර්ධන අධිකාරිය, 2018*

### *ආ) ඒකාබද්ධ ප්‍රවාහන පද්ධතියක් ඇති කිරීම තුළින් සම්පිණ්ඩිත නාගරික ආකෘතියක් බිහි කිරීම.*


නගර නිර්මාණකරණයේ සංකල්පයක් වන සම්පිණ්ඩිත නගර නොහොත් කෙටි දුර නගර, කාර්යක්ෂම හා ඒකාබද්ධ ප්‍රවාහන සේවාවකින් යුතු නාගරික ආකෘතියක් සහිත නගර ලෙස සැලකේ. මේ අනුව මොරටුව නගරය තුළද මෙවැනි සම්පිණ්ඩිත නාගරික ආකෘතියක් ඇති කිරීම සඳහා පහත යෝජනා ඉදිරිපත් කරනු ලබයි.

TP08– යෝජිත බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානය

දැනටමත් මොරටුව දුම්රිය ස්ථානය හා බස් නැවතුම්පොල පිහිටි දුම්රිය දෙපාර්තමේන්තුව සතු අක්කර 10ක් පමණ වූ භූමි භාගය දුම්රිය, සැහැල්ලු දුම්රිය හා බස් රථ ප්‍රවාහන මාධ්‍යයන්ගෙන් ඒකාබද්ධ වූ බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානය ඉදිකිරීමට යෝජිත අතර එය බස් හා දුම්රිය පර්යන්තය, සැහැල්ලු දුම්රිය නැවතුම් ස්ථානය සහ රථ වාහන නැවතුම් අංගනය ආදී පහසුකම් වලින් සමන්විත මිශ්‍ර සංවර්ධන කාර්යය සඳහා යෙදවීමට කටයුතු කරනු ලබයි.


TP09– පදික හා පාපැදි මංතීරු ජාලය

සම්පිණ්ඩිත නාගරික ආකෘතියක් සහිත නගර වල පුද්ගලික මෝටර් රථ භාවිතයට සාපේක්ෂව ඇවිදීම හා පාපැදි භාවිතය ප්‍රවර්ධනය කරන අතර එමඟින් නගරයේ සමස්ත ශක්ති පරිභෝජනය හා පරිසර දූෂණය අවම කිරීම අරමුණු කෙරේ. ඒ අනුව මොරටුව මහ නගර සභා ප්‍රදේශය ආවරණය වන පරිදි මාර්ග දෙපස දිවෙන පාපැදි හා පදික මංතීරු ජාලයක් හඳුන්වා දෙන අතර එය සිතියම් අංක 6.10 මඟින් දක්වා ඇත.




**සිතියම 6.9 :** *මොරටුව නගරය සඳහා පදික හා පාපැදි මංතීරු ජාලය - 2030*

**මූලාශ්‍රය :** *නාගරික සංවර්ධන අධිකාරිය, 2018*





***රූප සටහන 6.10 :*** *P2 මාර්ග හරස් ඛණ්ඩය*
***මූලාශ්‍රය :*** *නාගරික සංවර්ධන අධිකාරිය, 2018*

TP10– දුම්රියපොළ ප්‍රවේශ මාර්ග සංවර්ධනය

මොරටුව දුම්රිය ස්ථානය ඇතුළු අභ්‍යන්තර දුම්රිය ස්ථාන ගාලු පාර හා සම්බන්ධ වන සිතියම් අංක. 6.6 හි පෙන්වා ඇති පහත සඳහන් ප්‍රධාන ප්‍රවේශ මාර්ග පදික හා පාපැදි මංතීරු සහිතව මංතීරු 2 කින් යුතුව සංවර්ධනය කිරීම. එම මාර්ගයන්හි හරස් ඛණ්ඩය රූප සටහන් අංක. 6.11 මඟින් නිරූපණය කරනු ලබයි.

- කොරලවැල්ල දුම්රියපොළ ප්‍රවේශ මාර්ගය – මීටර 400
- එගොඩ උයන දුම්රියපොළ ප්‍රවේශ මාර්ගය– මීටර 400
- අගුලාන දුම්රියපොළ ප්‍රවේශ මාර්ගය– කිලෝ මීටර 2
- ලුනාව දුම්රියපොළ ප්‍රවේශ මාර්ගය– කිලෝ මීටර 2
- මොරටුව දුම්රියපොළ ප්‍රවේශ මාර්ගය– මීටර 200




***රූප සටහන 6.11 :*** *P3 මාර්ග හරස් ඛණ්ඩය*
***මූලාශ්‍රය :*** *නාගරික සංවර්ධන අධිකාරිය, 2018*

### *ඇ) ජලාභිමුඛ ප්‍රදේශ මහජනයාට විවෘත කොට සංවර්ධන කටයුතු දිරිගැන්වීම.*


බොල්ගොඩ ගංගාශ්‍රිත ප්‍රදේශයේ සිදු වන අනවසර ගොඩකිරීම් වළකාලමින් ජල සම්පත් සංරක්ෂණය සඳහා වන එක් උපායමාර්ගයක් ලෙස ජලාභිමුඛ ප්‍රදේශ මහජනයාට විවෘත කර ජලාභිමුඛ සංවර්ධන කටයුතු දිරි ගැන්වීම මෙහිදී අදහස් කරනු ලබයි.

TP11 යෝජිත බොල්ගොඩ සිරි මාර්ගය

දිගොරැල්ල නව පාලමේ සිට බොල්ගොඩ ගංගා මායිම ඔස්සේ බොරුපන පාර දක්වා අඩි 20ක පළලකින් යුතු නව මාර්ගයක් ඉදි කිරීම. (සිතියම් අංක 6.8.)

TP12– දෘශ්‍ය ප්‍රවේශන කොරිඩෝ

බොල්ගොඩ ගංගාව හා මොරටුව වෙරළ තීරය එක එල්ලේ දර්ශනය වන පරිදි කොරළවැල්ලේ සිට එගොඩ උයන අතර පිහිටි ගුණවර්ධනාරාම මාර්ගය, සමාජවාදී නිවහන් පෙදෙස, ටී.එල්.සී පීරිස් මාවත හා මහවත්ත මාවත මංතීරු 2ක් සහිතව පුළුල් කිරීම. (සිතියම් අංක 6.8), (හරස් ඛණ්ඩය රූප සටහන් අංක 6.12මඟින් නිරූපනය කරයි).




***රූප සටහන 6.12 :** දෘශ්‍ය ප්‍රවේශන කොරිඩෝ හරස් ඛණ්ඩය*
***මූලාශ්‍රය :** නාගරික සංවර්ධන අධිකාරිය, 2018*

## 6.3.2.5. මාර්ග කාණ්ඩ ගත කිරීම

මොරටුව සංවර්ධන සැලැස්ම 2019–2030 තුළින් සංවර්ධනයට යෝජිත මාර්ග ප්‍රමුඛතාව අනුව කාණ්ඩගත කරන ලද අතර පළමු ප්‍රමුඛ මාර්ග P1 ලෙසද, දෙවන ප්‍රමුඛ මාර්ග P2 ලෙසද, තෙවන ප්‍රමුඛ මාර්ග P3 මාර්ග ලෙසද, සිව්වන ප්‍රමුඛ මාර්ග P4 මාර්ග ලෙසද දක්වා ඇත.

### i. සැලසුම් කාලය තුළ සංවර්ධනයට යෝජිත මාර්ග

| මොරටුව සංවර්ධන සැලැස්ම 2019-2030 තුළින් සංවර්ධනයට යෝජිත මාර්ග | | | | | |
|---|---|---|---|---|---|
| මාර්ග ප්‍රමුඛතාව | මාර්ග ලක්ෂණ | හඳුනා ගන්නා ලද මාර්ග | මංතීරු ගණන | සේවා මංතීරු | යෝජිත මාර්ග පළල-මීටර |
| පළමු ප්‍රමුඛ මාර්ග P1 මාර්ග | නගරයට පිටත වෙනත් ප්‍රධාන නාගරික කේන්ද්‍ර කිහිපයක් සමග සම්බන්ධ වන, භෞතික පළල අඩි 20 හෝ ඊට වැඩි මාර්ග | TP3 ගාලු පාර- මොරටුව නව ගාලු පාර හා පරණ ගාලු පාර සම්බන්ධ වන ස්ථානයේ සිට මොරටුව බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානය | 6 | අදාළ වේ. | 36.6 |
| | | TP4 බොරුපන පාර- බොරුපන මංසන්ධියේ සිට ගංගාරාම මාර්ගය දක්වා | 6 | අදාළ වේ. | 31.7 |
| දෙවන ප්‍රමුඛ මාර්ග P2 මාර්ග | නගරයට පිටත වෙනත් නාගරික කේන්ද්‍ර සමග සම්බන්ධ වන,මාර්ගයේ භෞතික පළල අඩි 20 හෝ ඊට වැඩි මාර්ග | TP6 බණ්ඩාරනායක මාවත- කටුබැද්ද මංසන්ධියේ සිට කොස්පලාන පාලම දක්වා | 4 | අදාළ වේ. | 27.2 |
| | | TP5 යෝජිත මුහුදුබඩ මාර්ගය දෙහිවල සිට වීරපුරන් අප්පු මාර්ගය ඔස්සේ යෝජිත මොරටුව බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානය දක්වා | 4 | අදාළ වේ. | 24.7 |
| | | TP7 ද සොයිසා මාර්ගය රාවතාවත්ත මංසන්ධියේ සිට කටුබැද්ද කොස්පලාන පාලම දක්වා | 4 | අදාළ වේ. | 24.7 |
| තෙවන ප්‍රමුඛ මාර්ග P3 මාර්ග | මාර්ගයේ භෞතික පළල අඩි 20 හෝ ඊට වැඩි මාර්ග | TP11 යෝජිත බොල්ගොඩ සිරි මාර්ගය දිගොරැල්ල නව පාලමේ සිට බොල්ගොඩ ගංගා මායිම ඔස්සේ බොරුපන පාර දක්වා | 2 | අදාළ වේ. | 17.1 |
| | මාර්ගයේ භෞතික පළල අඩි 20 ට වඩා අඩු මාර්ග | TP10 මොරටුව දුම්රියපොළ ප්‍රවේශ මාර්ගය ගාලු පාරේ සිට මොරටුව දුම්රිය ස්ථානය දක්වා | 2 | අදාළ වේ. | 17.1 |
| | | TP10 කොරලවැල්ල දුම්රියපොළ ප්‍රවේශ මාර්ගය ගාලු පාරේ සිට කොරලවැල්ල දුම්රිය ස්ථානය දක්වා | 2 | අදාළ වේ. | 17.1 |
| | | TP10 එගොඩ උයන දුම්රියපොළ ප්‍රවේශ මාර්ගය ගාලු පාරේ සිට එගොඩ උයන දුම්රිය ස්ථානය දක්වා | 2 | අදාළ වේ. | 17.1 |
| | | TP10 අඟුලාන දුම්රියපොළ ප්‍රවේශ මාර්ගය ගාලු පාරේ සිට අඟුලාන දුම්රිය ස්ථානය දක්වා | 2 | අදාළ වේ. | 17.1 |
| | | TP10 ලුනාව දුම්රියපොළ ප්‍රවේශ මාර්ගය ගාලු පාරේ සිට ලුනාව දුම්රිය ස්ථානය දක්වා | 2 | අදාළ වේ. | 17.1 |
| | | TP12 ගුණවර්ධනාරාම මාර්ගය නව ගාලු පාරේ සිට බොල්ගොඩ යෝජිත පාපැදි හා පදික මංතීරු දක්වා | 2 | අදාළ වේ. | 12.2 |
| | | TP12 සමාජවාදී නිවහන් පෙදෙස නව ගාලු පාරේ සිට බොල්ගොඩ යෝජිත පාපැදි හා පදික මංතීරු දක්වා | 2 | අදාළ වේ. | 12.2 |
| | | TP12 ටී.එල්.සී පීරිස් මාවත නව ගාලු පාරේ සිට බොල්ගොඩ යෝජිත පාපැදි හා පදික මංතීරු දක්වා | 2 | අදාළ වේ. | 12.2 |
| | | TP12 මහවත්ත මාවත නව ගාලු පාරේ සිට බොල්ගොඩ යෝජිත පාපැදි හා පදික මංතීරු දක්වා | 2 | අදාළ වේ. | 12.2 |

**වගුව 6.1 :** මොරටුව සංවර්ධන සැලැස්ම 2019- 2030 තුළින් සංවර්ධනයට යෝජිත මාර්ග ප්‍රමුඛතාව
**මූලාශ්‍රය :** නාගරික සංවර්ධන අධිකාරිය, 2018

P1, P2 හා P3 ලෙස සංවර්ධනයට හඳුනා ගත් මාර්ග හා එහි යෝජිත මාර්ග පළල ඉහත වගු අංක 6.1 හි සවිස්තරාත්මකව දක්වා ඇත.

- මොරටුව සංවර්ධන සැලැස්ම 2019-2030 තුළින් සංවර්ධනයට යෝජිත ඉහත සඳහන් මාර්ග සඳහා බලපැවැත්වෙන රෙගුලාසි වෙළුම II පරිච්ඡේද 1හි සඳහන් වේ.

### ii. සැලසුම් කාලය තුළ සංවර්ධනයට හඳුනා නොගත් මාර්ග

මොරටුව සංවර්ධන සැලැස්ම මඟින් ඉදිරි අවුරුදු 12 ක කාල සීමාව තුළදී සංවර්ධනය කිරීම සඳහා හඳුනා නොගත් මාර්ග සිව්වන ප්‍රමුඛ මාර්ග P4 මාර්ග ලැයිස්තුව වෙළුම II හි ඇමුණුම 4 හි දක්වා ඇත. ඒ අනුව එම මාර්ග සඳහා බලපැවැත්වෙන රෙගුලාසි වෙළුම II පරිච්ඡේද 1 හි සඳහන් වේ.

## 6.3.3. ජල සැපයුම් සැලැස්ම

2019-2030 කාල පරිච්ඡේදය සඳහා පිළියෙළ කරන ලද මොරටුව සංවර්ධන සැලැස්මේ අරමුණු කරා ළඟා වීමේදී, ජනතාව වෙත ප්‍රමාණවත් හා අඛණ්ඩ ජල සැපයුමක් දෛනිකව ලබා දීම අත්‍යාවශ්‍ය වන අතර 2030 වසර සඳහා පුරෝකථනය කරන ලද ජල ඉල්ලුම සපුරාලීම සඳහා වර්තමානයේ පවත්නා ක්‍රමවේද හා යෝජිත ව්‍යපෘති හදුනා ගැනීම මෙම ජල සැපයුම් සැලසුම මඟින් අපේක්ෂා කරනු ලබයි.


### අ. 2030 වන විට අපේක්ෂිත ජල ඉල්ලුම

මොරටුව මහ නගර සභා ප්‍රදේශය සඳහා 151,000ක නේවාසික ජනගහනයක්ද 87,000ක මගී ජනගහනයක්ද පුරෝකථනය කරන ලද අතර සිතියම් අංක 6.10 හි දක්වා ඇති පරිදි සංවර්ධන කලාපයට අදාලව ජල ඉල්ලුම ගණනය කරනු ලදී. එහිදී නේවාසික ඒක පුද්ගල දෛනික ජල අවශ්‍යතාව ලීටර 130 ක් වශයෙන්ද සලකනු ලැබූ අතර නගරයට පිටතින් පැමිණෙන පුද්ගලයකුගේ දෛනික ජල අවශ්‍යතාව ලීටර 50 ක් වශයෙන්ද සලකනු ලැබිය.

ඒ අනුව 2030 වර්ෂය වන විට මොරටුව මහ නගර සභා සීමාව තුළ දෛනික ජල ඉල්ලුම ඝන මීටර 25,500 වන අතර ගෘහස්ත ජල ඉල්ලුම දෛනිකව ඝන මීටර 19,600ක්ද, ගෘහස්ත නොවන කටයුතු සඳහා ජල ඉල්ලුම දෛනිකව ඝන මීටර 5,900ක්ද වේ. එක් එක් සංවර්ධන කලාපයට අදාල ජල ඉල්ලුම හා සමස්ත ජල ඉල්ලුම පහත 6.2 වගුවෙහි දැක්වේ.

| සංවර්ධන කලාපය | ගෘහස්ත ජල ඉල්ලුම (දිනකට ඝන මීටර) | ගෘහස්ත නොවන ජල ඉල්ලුම (දිනකට ඝන මීටර) | සමස්ත ජල ඉල්ලුම (දිනකට ඝන මීටර) |
|---|---|---|---|
| අධි ඝනත්ව මිශ්‍ර සංවර්ධන කලාපය | 2833 | 1695 | 4528 |
| අධි ඝනත්ව හරිත නේවාසික කලාපය | 5296 | 1017 | 6313 |
| අඩු ඝනත්ව මිශ්‍ර සංවර්ධන කලාපය | 1089 | 396 | 1485 |
| අඩු ඝනත්ව නේවාසික කලාපය | 4749 | 283 | 5031 |
| දැව ආශ්‍රිත නිෂ්පාදන ප්‍රවර්ධන කලාපය | 2535 | 1130 | 3665 |
| බොල්ගොඩ ජලාභිමුඛ සංවර්ධන කලාපය | 3071 | 1130 | 4201 |
| සමස්ත ජල ඉල්ලුම (දිනකට ඝන මීටර) | 19573 | 5650 | 25223 |

**වගුව 6.2 :** පුරෝකථනය කරන ලද ජල ඉල්ලුම - 2030
**මූලාශ්‍රය :** නාගරික සංවර්ධන අධිකාරිය, 2018




***සිතියම 6.10 :*** *මොරටුව මහ නගර සභා ප්‍රදේශයේ සමස්ත ජල ඉල්ලුම - 2030* ***මූලාශ්‍රය :*** *නාගරික සංවර්ධන අධිකාරිය, 2018*

ඝන මීටර 500,000 හා 60,000ක ධාරිතාවයකින් යුතු අඹතලේ හා කලටුවාව ජල පවිත්‍රාගාර මඟින් දෛනික අඛණ්ඩ හා ප්‍රමාණවත් ජල සැපයුමක් ලබා දෙමින් මොරටුව මහ නගර සභා ප්‍රදේශය ආවරණය කරනු ලබයි. එසේ වුවද මෙම ජල පවිත්‍රාගාර මඟින් මොරටුව ප්‍රදේශයට අමතරව වෙනත් ප්‍රදේශ සඳහාද ජලය සපයනු ලබන බැවින් ජල සැපයුම විධිමත් කරමින්, අනාගත සංවර්ධන විභවතා පවතින ප්‍රදේශ සඳහා වන ජල ඉල්ලුම සපුරාලීමට ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය මඟින් කරන ලද යෝජනා කිහිපයක් පහතින් දක්වා ඇත.


i. කලටුවාව ජල පිරිපහදු මධ්‍යස්ථානයේ වර්තමාන දෛනික සැපයුම් ධාරිතාව වන ඝන මීටර 60,000 ඝන මීටර 140,000 ක් දක්වා වැඩි දියුණු කිරීම.

ii. කලටුවාව ජල පිරිපහදු මධ්‍යස්ථානයේ භූගත ජල ටැංකි පද්ධතියේ වර්තමාන ධාරිතාව වන ඝන මීටර 4,600 අමතර ඝන මීටර 20,000කින් ඉහල නැංවීම


iii. එම භූගත ටැංකි පද්ධතියේ සිට කෙසෙල්වත්ත දක්වා කි.මී.3ක පමණ දිගකින් යුතු සම්ප්‍රේෂණ නළ ඉදි කිරීම.

## 6.3.4. විදුලි සැපයුම් සැලැස්ම

මොරටුව සංවර්ධන සැලැස්ම පිළියෙළ කිරීමේදී එම බල ප්‍රදේශය සඳහා ප්‍රමාණවත් පරිදි යටිතල පහසුකම් ලබා දීම එක් අරමුණක් වන බැවින් එම ප්‍රදේශය සඳහා ප්‍රමාණවත් පරිදි විදුලි පහසුකම් ලබා දීම කළමනාකරණය කිරීම සඳහා විදුලි සැපයුම් සැලැස්ම පිළියෙළ කරන ලදී. 2017 වසරේ බලශක්ති පරිභෝජනය හා දැනට පවත්නා විදුලි සම්බන්ධතා පිලිබඳ තොරතුරු පහත රූප සටහන් අංක 6.13 හා 6.14 මඟින් නිරූපණය කරනු ලබයි.




*රූප සටහන 6.13 : බලශක්ති පරිභෝජනය - 2017*
*මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය, 2018*




*රූප සටහන 6.14 : විදුලි සම්බන්ධතා ඒකක-2017*
*මූලාශ්‍රය : නාගරික සංවර්ධන අධිකාරිය, 2018*

ඉහත ප්‍රස්තාර ගත දත්ත අනුව ඉහළ බලශක්ති පරිභෝජනයක් එනම් 44%ක් නේවාසික පරිභෝජනය සඳහා වන අතර අනෙකුත් කාර්යය සඳහා බලශක්ති පරිභෝජනය අවරෝහණ පිලිවෙලින් කර්මාන්ත, වාණිජ හා වෙනත් භාවිත සඳහා යොදා ගෙන ඇති බව පැහැදිලි වේ. තවද 2017 වන විට ලබා දී ඇති විදුලි සම්බන්ධතා ඒකක අවරෝහණ පිලිවෙලින් නේවාසික, වාණිජ, කර්මාන්ත හා වෙනත් භාවිතා ලෙස දැක්විය හැකි අතර කර්මාන්ත සඳහා ලබාදී ඇති විදුලි සබඳතා ඒකක ගණන වාණිජ ඒකක ගණනට වඩා අඩු අගයක් ගනු ලැබුවද කර්මාන්ත සඳහා වන බලශක්ති පරිභෝජනය ඉහල අගයක් පෙන්නුම් කරනු ලබයි.

ලංකා විදුලිබල මණ්ඩලය හා සී/ස ලංකා විදුලි පුද්ගලික සමාගම මඟින් මොරටුව බල ප්‍රදේශයේ සෑම නාගරික කොට්ටාශයක්ම ආවරණය වන පරිදි විදුලි සැපයුම් රැහැන් මඟින් ආවරණය වී ඇති අතර 2030 වර්ෂය සඳහා පුරෝකථන ජනගහනයට සරිලන බලශක්ති ඉල්ලුම සපුරාලීමේ හැකියාවක් පවතින බවට තහවුරු වී ඇත.

මොරටුව සංවර්ධන සැලැස්ම 2019–2030 මඟින් අධි හා මධ්‍ය දූෂක කර්මාන්ත ව්‍යාප්ත වීම සීමා කිරීම හේතුවෙන් ඉහත විස්තර කර ඇති පරිදි කර්මාන්ත කටයුතු සඳහා අනෙකුත් භාවිතයන්ට සාපේක්ෂව ඉහල බලශක්ති සැපයුමක් අඛණ්ඩව අවශ්‍ය කෙරෙන නමුත් ප්‍රදේශයේ කර්මාන්ත ප්‍රමාණය අඩු වූ වී 2030 වන විට කර්මාන්ත සඳහා වන බලශක්ති ඉල්ලුමද සාපේක්ෂ වශයෙන් පහල යනු ඇතැයි අපේක්ෂා කරන අතර සමස්ත බලශක්ති ඉල්ලුමද පහල යනු ඇත

ඉහත කී තත්ත්ව මත මොරටුව සැලසුම් ප්‍රදේශය තුළ 2030 වර්ෂය වන විට විදුලිබල ඌනතාවයක් සිදු නොවනු ඇතැයි අපේක්ෂා කෙරේ.

## 6.3.5. මළ හා අපජල කළමනාකරණ සැලැස්ම

මොරටුව ප්‍රදේශ තුළ ඉහල සනත්වයකින් යුතුව විවිධ කර්මාන්තශාලා හා නිවාස ව්‍යාප්තව ඇති බැවින් එම භාවිතයන් තුළින් දෛනිකව උත්පාදනය වන අපජලය විධිමත් ලෙස බැහැර කිරීමේ ක්‍රමවේදයක් නොමැති වීම දුර්වලතාවයක් ලෙස හඳුනා ගන්නා ලදී.

### *අ. 2030 වන විට අපේක්ෂිත අපජල උත්පාදනය*

2030 වසර වන විට පුරෝකථනය කරන ලද ජනගහනය වෙනුවෙන් අපජල උත්පාදනය ගණනය කිරීම සඳහා දෛනිකව ඒක පුද්ගල නේවාසික අපජල උත්පාදනය ඝන මීටර 130ක් ලෙස උපකල්පනය කරන ලදී. ඒ අනුව පහත වගු අංක 6.3 හි සඳහන් වන පරිදි 2030 වන විට මොරටුව මහ නගර සභා බල ප්‍රදේශය තුළ දෛනිකව ඝන මීටර 30112 ක ගෘහස්ත අපජල උත්පාදනයක්ද, දෛනිකව ඝන මීටර 8879 ක ගෘහස්ත නොවන අපජල උත්පාදනයක්ද, සිදු වනු ඇතැයි පුරෝකථනය කරන ලදී. ඉහල අපජල උත්පාදනයක් අධි සනත්ව මිශ්‍ර සංවර්ධන කලාපය හා අධි සනත්ව හරිත නේවාසික කලාපය මඟින් සිදු වන බව පහත සිතියම් අංක 6.11 මඟින් පැහැදිලි වේ.

| සංවර්ධන කලාපය | ගෘහස්ත අපජලය උත්පාදනය (දිනකට ඝන මීටර) | ගෘහස්ත නොවන අපජලය උත්පාදනය (දිනකට ඝන මීටර) | සමස්ත අපජලය උත්පාදනය (දිනකට ඝන මීටර) |
|---|---|---|---|
| අධි සනත්ව මිශ්‍ර සංවර්ධන කලාපය | 4,358 | 2,664 | 7,022 |
| අධි සනත්ව හරිත නේවාසික කලාපය | 8,148 | 1,598 | 9,747 |
| අඩු සනත්ව මිශ්‍ර සංවර්ධන කලාපය | 1,676 | 622 | 2,297 |
| අඩු සනත්ව නේවාසික කලාපය | 7,306 | 444 | 7,750 |
| දැව ආශ්‍රිත නිෂ්පාදන ප්‍රවර්ධන කලාපය | 3,899 | 1,776 | 5,675 |
| බොල්ගොඩ ජලාභිමුඛ සංවර්ධන කලාපය | 4,724 | 1,776 | 6,500 |
| සමස්ත අප ජල උත්පාදනය (දිනකට ඝන මීටර) | 30,112 | 8,879 | 38,990 |

***වගුව 6.3 :*** *අපේක්ෂිත අපජල උත්පාදනය - 2030*
***මූලාශ්‍රය :*** *නාගරික සංවර්ධන අධිකාරිය, 2018*

### ආ. වර්තමාන අපජල පිරිපහදු ව්‍යාපෘති

ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය විසින් රත්මලාන හා මොරටුව ප්‍රදේශ ආවරණය වන පරිදි අපජලය බැහැර කිරීමේ පද්ධතිය ස්ථාපිත කිරීමේ ව්‍යාපෘතිය මඟින් මොරටුව සැලසුම් සීමාවෙහි ග්‍රාම නිලධාරී කොට්ඨාශ 23 ක අපජලය පිරිපහදු කොට මුදා හැරීම සඳහා අපජලය පොම්ප කිරීමේ මධ්‍යස්ථාන 5ක් ස්ථාපිත කිරීමට යෝජනා කර ඇත. එකී ග්‍රාම නිලධාරී වසම් ලෙස මොරටුමුල්ල උතුර, රාවතාවත්ත දකුණ, රාවතාවත්ත බටහිර, රාවතාවත්ත නැගෙනහිර, උයන දකුණ, උයන උතුර, මෝල්පේ, කඩුවාමුල්ල, ලක්ෂපතිය මධ්‍යම, ලක්ෂපතිය දකුණ, ලක්ෂපතිය උතුර, අඟුලාන උතුර, අඟුලාන දකුණ, මොරටුවැල්ල උතුර, ඉඩම, සොයිසාපුර දකුණ, සොයිසාපුර උතුර, දහම්පුර, නෙලවල දකුණ, නෙලවල උතුර, කල්දෙමුල්ල, බොරුපන හා කටුබැද්ද දැක්විය හැක.

අදියර දෙකක් යටතේ සිදු කිරීමට සැලසුම් කර ඇති ව්‍යාපෘතියෙහි පළමු අදියර මේ වන විටත් නිම කොට ඇති අතර එමඟින් දෛනිකව රත්මලාන හා මොරටුව ප්‍රදේශ වල අපජලය ඝන මීටර 7,000 ක ප්‍රමාණයක් එක්රැස් කොට පිරිපහදු කරනු ලබන නමුත් අදියර 1හි සමස්ත දෛනික ධාරිතාව ඝන මීටර 17,000 ක් වන බව සඳහන් වේ. මේ අනුව තවදුරටත් අදියර 1 හි අපජලය එක්රැස් කිරීම සඳහා ඝන මීටර 10,000 ක ධාරිතාවයකින් සමන්විත වන බව හඳුනා ගන්නා ලදී.

## ඇ. අපජල කළමනාකරණය සඳහා වන නිර්දේශ


මොරටුව මහ නගර සභා සීමාවෙන් දෛනිකව අපජලය ඝන මීටර 39,000 ක් පමණ උත්පාදනය වන බැවින් ඉහත හඳුනා ගන්නා ලද අපජල කළමනාකරණ ව්‍යාපෘතිය මඟින් ආවරණය නොවන මොරටුව දකුණු කොටසට අයත් ග්‍රාම නිලධාරී කොට්ඨාස 19 සඳහාද අපජල කළමනාකරණ ව්‍යාපෘතියක අවශ්‍යතාව පවතී. විශේෂයෙන්ම කොරලවැල්ලේ සිට එගොඩ උයන දක්වා බිම් තීරයෙහි ජන හා ගොඩනැගිලි ඝනත්ව අධික වන හෙයින් විධිමත් අපජල කළමනාකරණ පද්ධතියක අවශ්‍යතාවයක් පැන නැගී ඇත. ඒ සඳහා වන නිර්දේශ කිහිපයක් පහතින් දක්වා ඇත.

i. මොරටුව නගර සභා සීමාව තුළ උත්පාදනය වන අපජලය, අපජලය එක්රැස් කිරීමේ නල පද්ධතියක් හරහා හා මධ්‍යම පිරිපහදු පවිත්‍රාගාරයකට යොමු කොට පිරිපහදු කොට ජල මූලාශ්‍ර වෙත මුදාහැරීම.

ii. ඉහත යෝජිත අපජලය පිරිපහදු ව්‍යාපෘතිය මඟින් ආවරණය නොවන ප්‍රදේශ වලද උත්පාදිත අපජලය පිරිපහදු කිරීමට හැකි වන පරිදි යෝජිත අපවහන පිරිපහදු පද්ධතියේ ධාරිතාව ඉහල නැංවීම.

iii. ඉහත ව්‍යාපෘතිය මඟින් ආවරණය නොවන ප්‍රදේශයන්හි අපජලය එක්රැස් කිරීමේ අපවහන නල පද්ධතියක් ස්ථාපනය.

iv. එම ප්‍රදේශ වල හඳුනා ගත් ස්ථානයන්හි පොම්ප කිරීමේ මධ්‍යස්ථාන පිහිටුවීම.




**අපජල උත්පාදනය- 2030**
**මොරටුව මහ නගර සභා ප්‍රදේශය**

0 0.35 0.7 1.4 2.1 2.8 Kilometers

**නාගරික සංවර්ධන අධිකාරිය**
දෙසැම්බර් 2018

මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය | මොරටුව සංවර්ධන සැලැස්ම (2019-2030) | සැකසුම: බස්නාහිර පළාත් අංශය හා පර්යේෂණ හා සංවර්ධන ඒකකය

***සිතියම 6.11 :*** *මොරටුව මහ නගර සභා ප්‍රදේශයේ ජලාපවහන හා මලාපවහන උත්පාදනය-2030* ***මූලාශ්‍රය :*** *නාගරික සංවර්ධන අධිකාරිය, 2018*

## 6.3.6. ඝන අපද්‍රව්‍ය කළමනාකරණ සැලැස්ම

නාගරික ප්‍රදේශයන්හි සිදු කරනු ලබන වේගවත් සංවර්ධන කටයුතු හේතුවෙන් විශාල ප්‍රමාණයන්ගෙන් උත්පාදනය වන ඝන අපද්‍රව්‍ය ස්වභාවික ජෛවීය වියෝජන ක්‍රියාවලිය මඟින් වියෝජනය වීමට ගතවන කාලයට වඩා වැඩි වේගයකින් උත්පාදනය වන හෙයින් නිසි ලෙස අපද්‍රව්‍ය වර්ග කොට එකතු කිරීම, අපද්‍රව්‍ය ප්‍රවාහනය, අතරමැදි පිරිපහදුව හා ක්‍රමවත් බැහැර කිරීම ලෙස විධිමත් කළමනාකරණ ක්‍රමවේදයක් පවත්වා ගැනීම අත්‍යවශ්‍ය වේ. එසේ සිදු නොවුනහොත් බොහෝ ප්‍රදේශ වල දක්නට ලැබෙන පරිදි නගරයේ මාර්ග දෙපස හා පොදු ස්ථාන මෙන්ම පහත් බිම් හා ජල මූලාශ්‍ර වැනි සංවේදී පාරිසරික ප්‍රදේශ වෙත මෙම අපද්‍රව්‍ය බැහැර කිරීම සිදු කරනු ලබයි. මෙම අවිධිමත් බැහැර කිරීම් නිසා ඇතිවිය හැකි භූගත ජල දූෂණය, බැර ලෝහ ආදිය මඟින් සිදුවන පාංශු දූෂණය හා මීතේන්, හයිඩ්‍රජන්, සල්ෆයිඩ් ආදී වායු මඟින් සිදුවන වායු දූෂණය හේතුවෙන් අධි සාන්ද්‍රනයෙන් යුතුව විෂ මූලද්‍රව්‍ය පරිසර පද්ධති තුළ සංසරණය වීම හේතුවෙන් නගරයේ ජීවත්වන ජනතාවට බොහෝ සෙයින් සෞඛ්‍යය හා සමාජීය ගැටළු වලට මුහුණපෑමට සිදු වී ඇත.


### අ. 2030 වන විට අපේක්ෂිත ඝන අපද්‍රව්‍ය උත්පාදනය

මොරටුව මහ නගර සභා ප්‍රදේශයක් වන බැවින් එක පුද්ගලයකුගේ පරිභෝජන අවශ්‍යතාව හා ඝන අපද්‍රව්‍ය උත්පාදනය සැලකිල්ලට ගනිමින් නේවාසික ඒකපුද්ගල දෛනික ඝන අපද්‍රව්‍ය උත්පාදනය කිලෝග්‍රෑම් 0.75 ක් ලෙසද පිටතින් පැමිණෙන පුද්ගලයෙකුගේ දෛනික ඝන අපද්‍රව්‍ය උත්පාදනය කිලෝග්‍රෑම් 0.25 ක් ලෙසද සලකන ලදී. ඒ අනුව සංවර්ධන කලාපයන්ට අදාලව ඝන අපද්‍රව්‍ය උත්පාදනය වගු අංක 6.4හි හා සිතියම් අංක 6.12 හි දක්වා ඇත.

| සංවර්ධන කලාපය | ගෘහස්ත ඝන අපද්‍රව්‍ය උත්පාදනය (දිනකට මෙට්‍රික්ටොන්) | ගෘහස්ත නොවන ඝන අපද්‍රව්‍ය උත්පාදනය (දිනකට මෙට්‍රික්ටොන්) | සමස්ත ඝන අපද්‍රව්‍ය උත්පාදනය (දිනකට මෙට්‍රික්ටොන්) |
|---|---|---|---|
| අධි ඝනත්ව මිශ්‍ර සංවර්ධන කලාපය. | 16 | 6 | 22 |
| අධි ඝනත්ව හරිත නේවාසික කලාපය. | 6 | 1 | 8 |
| අඩු ඝනත්ව මිශ්‍ර සංවර්ධන කලාපය. | 31 | 4 | 34 |
| අඩු ඝනත්ව නේවාසික කලාපය. | 27 | 1 | 28 |
| දැව ආශ්‍රිත නිෂ්පාදන ප්‍රවර්ධන කලාපය. | 15 | 4 | 19 |
| බොල්ගොඩ ජලාභිමුඛ සංවර්ධන කලාපය. | 18 | 4 | 22 |
| සමස්ත ඝන උත්පාදනය(දිනකට මෙට්‍රික්ටොන්) | 113 | 20 | 133 |

**වගුව 6.4 :** *අපේක්ෂිත ඝන අපද්‍රව්‍ය උත්පාදනය - 2030*
**මූලාශ්‍රය :** *නාගරික සංවර්ධන අධිකාරිය, 2018*

ඉහත වගු අංක 6.4 හි දක්වා ඇති පරිදි මොරටුව මහ නගර සභා සීමාව තුළ දෛනිකව ඝන අපද්‍රව්‍ය මෙට්‍රික්ටොන් 135 ක් පමණ උත්පාදනය වුවද, පරිච්ඡේද 2.2.2.1.ඇ) අනුව ඝන අපද්‍රව්‍ය එක්රැස් කිරීම සඳහා මහ නගර සභාවේ පවතින වර්තමාන ධාරිතාවය අනුව දෛනිකව එකතු කරනු ලබන ඝන අපද්‍රව්‍ය ප්‍රමාණය මෙට්‍රික්ටොන් 70–120 ක් පමණ වන බැවින් මෙට්‍රික් ටොන් 14–64ක පමණ ඝන අපද්‍රව්‍ය ප්‍රමාණයක අතිරික්තයක් පවතී යැයි හඳුනා ගන්නා ලදී.




**සිතියම 6.12 :** *මොරටුව මහ නගර සභා ප්‍රදේශයේ ඝන අපද්‍රව්‍ය උත්පාදනය - 2030* **මූලාශ්‍රය :** *නාගරික සංවර්ධන අධිකාරිය, 2018*

### ආ) ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා නිර්දේශ

2019 වසරේදී අවසන් කිරීමට නියමිත මෙට්‍රික් ටොන් 500ක ධාරිතාවයකින් යුතු කරදියාන කසළ මඟින් විදුලිය සහ පොහොර නිෂ්පාදනය කිරීමේ ව්‍යාපෘතිය සක්‍රීය වූ පසු මෙට්‍රික් ටොන් 14-64 ක් පමණ වන අතිරික්ත ඝන අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා, හැකියාව ලැබෙන අතර ජීව-වායු නිෂ්පාදනයටත්, විදුලිය නිෂ්පාදනයටත්, දියර සහ කාබනික පොහොර නිෂ්පාදනයටත් හැකියාව ලැබෙනු ඇත.

# 6.4. ආර්ථික සංවර්ධන උපායමාර්ගික සැලැස්ම

## 6.4.1. පරමාර්ථ


මොරටුව සැලසුම් ප්‍රදේශයේ පවතින සම්පත් තිරසාර අයුරින් උපයෝගී කර ගනිමින් හා යටිතල පහසුකම් වැඩි දියුණු කරමින්, වාණිජ හා මූල්‍ය අංශය, සංචාරක කර්මාන්තය හා දැව කර්මාන්තය යන ආර්ථික නියාමන ඒකාබද්ධ කරමින් ආර්ථික සංවර්ධනය කරා ලඟා වීම ආර්ථික සංවර්ධන උපායමාර්ගික සැලැස්මෙහි පරමාර්ථය ලෙස දැක්විය හැක.

## 6.4.2. විෂය පථය

මොරටුව ප්‍රදේශයේ ආර්ථික අංශය වැඩි දියුණු කිරීමේ පරමාර්ථය පෙරදැරිව පිළියෙළ කරනු ලබන ආර්ථික සංවර්ධන සැලැස්මේ කාලය 2019-2030 වර්ෂය දක්වා සීමා වනු ඇත. මෙම ආර්ථික සංවර්ධන උපායමාර්ගික සැලැස්ම දැව කර්මාන්තය, වාණිජ හා මූල්‍ය අංශය හා සංචාරක කර්මාන්තය යන අංශ සංවර්ධනය කිරීමට අදාලව විග්‍රහ කරනු ලබන අතර මොරටුව ප්‍රදේශයේ සිදු කරනු ලබන කරදිය,මිරිදිය හා කිවුල්දිය ධීවර කර්මාන්තය මඟින් ලබන වාර්ෂික මත්ස්‍ය නිෂ්පාදනය ප්‍රදේශයේ ගෘහස්ථ පරිභෝජනය සඳහා පමණක් ප්‍රමාණවත් වන හෙයින් මෙම සැලැස්ම මඟින් ධීවර කර්මාන්තය පිළිබඳව විශේෂ අවධානය යොමු නොකරන ලදී.

මොරටුව මහා නගර සභා ප්‍රදේශය සඳහා යෝජිත සමස්ත ආර්ථික සංවර්ධන උපායමාර්ගික සැලැස්ම සිතියම් අංක 6.13 මඟින් දක්වා ඇත.

(මොරටුව ආර්ථික සංවර්ධන උපායමාර්ගික සැලැස්ම කේතය- EcP)




**සිතියම 6.13 :** *ආර්ථික සංවර්ධන උපායමාර්ගික සැලැස්ම - 2030* **මූලාශ්‍රය :** *නාගරික සංවර්ධන අධිකාරිය, 2018*

## 6.4.3. ආර්ථික සංවර්ධන උපායමාර්ග හා ව්‍යාපෘති

### *අ. මොරටුව මහ නගර සභා බල ප්‍රදේශයේ ආර්ථිකයට විවිධ අංශ මඟින් කරනු ලබන දායකත්වය හා වත්මන් භූමි පරිහරණ රටාව අනුව සංවර්ධන කලාප හඳුනා ගැනීම.*

දැව කර්මාන්තය බහුලව ව්‍යාප්තව ඇති ප්‍රදේශ දැව ආශ්‍රිත නිෂ්පාදන කලාපය ලෙසටත්, ගාලු පාර හා නගර මධ්‍යය ප්‍රදේශය වාණිජ හා මූල්‍ය කටයුතු සංවර්ධනය සඳහා අධි ඝනත්ව මිශ්‍ර සංවර්ධන කලාපය ලෙසටත්, ජලාභිමුඛ ප්‍රදේශ සංචාරක කටයුතු ප්‍රවර්ධනය සඳහා යොදා ගැනීමටත් කලාප කරනු ලැබූ අතර එම සංවර්ධන කලාප ආශ්‍රිතව ප්‍රවේශකත්ව පහසුකම් වැඩි දියුණු කිරීම සඳහා පරිච්ඡේද 6.3.2. මාර්ග හා ප්‍රවාහන සැලැස්මෙහි දක්වා ඇති මාර්ග සංවර්ධන උපායමාර්ග යෝජනා කරනු ලැබිය.

1. දැව ආශ්‍රිත නිෂ්පාදන කලාපය සංවර්ධනය සඳහා ප්‍රවේශ පහසුකම් ලබා දීම.
2. දැව ආශ්‍රිත නිෂ්පාදන කලාපය වෙත ප්‍රවේශ වන ප්‍රධාන මාර්ග පුළුල් කිරීම

    i. TP03 ගාලු පාර සංවර්ධන ව්‍යාපෘතිය
    ii. TP06 කටුබැද්ද මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය
    iii. දැව ආශ්‍රිත නිෂ්පාදන කලාපය හරහා වැටී ඇති ප්‍රධාන මාර්ගය වන ද සොයිසා මාර්ගය සංවර්ධනය සඳහා වන TP07 ද සොයිසා මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය.

අධි ඝනත්ව මිශ්‍ර සංවර්ධන කලාපය සංවර්ධනය සඳහා ප්‍රවේශ පහසුකම් ලබා දීම.

ගාලු පාර ආශ්‍රිත රේඛීය සංවර්ධනයත් සමග සංකේන්ද්‍රණය වන විවිධ වාණිජ හා මූල්‍ය භූමි පරිහරණ ක්‍රියාකාරකම් වැඩි දියුණු කිරීම සඳහා විකල්ප ප්‍රවාහන මාධ්‍යය ලෙස TP01– සැහැල්ලු දුම්රිය පද්ධතිය ස්ථාපිත කරනු ලබන අතරම නගර මධ්‍යය ප්‍රදේශය තුළ TP08– බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානය ඉදි කරනු ඇත.

බොල්ගොඩ ජලාභිමුඛ සංවර්ධන කලාපය සංවර්ධනය සඳහා ප්‍රවේශ පහසුකම් ලබා දීම.

බොල්ගොඩ ගංගාභිමුඛ ප්‍රදේශය සංවර්ධනය සඳහා යෝජිත TP11 බොල්ගොඩසිරි මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය මඟින් එම ප්‍රදේශය හෝටල් කර්මාන්තය සහ සහාධිපත්‍ය ඉදි කිරීම් ආශ්‍රිත ආයෝජන අවස්ථා සඳහා විවෘත වනු ඇත.

### *ආ. මොරටුව නගර මධ්‍යය ප්‍රදේශය පළමු පෙළ මංසන්ධි ප්‍රදේශයක් ලෙස සංවර්ධනය කිරීම.*

මොරටුව නගරයේ ආර්ථික සංවර්ධනය උදෙසා ප්‍රමාණවත් පහසුකම් සැපයීම සඳහා වාණිජ අංශය දායක කර ගැනීම තුළින් ප්‍රදේශයේ ආර්ථික මට්ටම ඉහළ නැංවීමට අපේක්ෂා කරනු ලබයි. එහිදී මොරටුව සංවර්ධන සැලැස්ම 2019 – 2030 මඟින් මොරටුව මහ නගර සභා සීමාව සඳහා පුරෝකථනය කරනු ලැබූ 150,000ක පමණ වන නේවාසික ජනගහනය හා 87,000ක පමණ වන මගී ජනගහනය සඳහා අවශ්‍ය වාණිජ පහසුකම් ලබාදීමට හැකි වනු පිණිස උත්ප්‍රේරණ ව්‍යාපෘති කිහිපයක් දියත් කිරීමට යෝජනා කරනු ලබන අතර එම ව්‍යාපෘති රූප සටහන් අංක 6.15 මඟින් පෙන්නුම් කරනු ලබයි.

    i. EcP01– පොදු වෙළඳ සංකීර්ණ සංවර්ධන ව්‍යාපෘතිය
    ii. EcP02– වීර පුරන්අප්පු උද්‍යාන මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතිය
    iii. EcP03– බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානය හා සබැඳි මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතිය
    iv. EcP04– එළිමහන් රංග ශාලාව හා මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතිය
    v. EcP05– නව කාර්යාල සංකීර්ණ ව්‍යාපෘතිය




***රූප සටහන 6.15 :*** *මොරටුව නගර මධ්‍යය පළමු පෙළ මංසන්ධි ප්‍රදේශය සංවර්ධන ව්‍යාපෘති*
***මූලාශ්‍රය :*** *නාගරික සංවර්ධන අධිකාරිය, 2018*



### i. EcP01- පොදු වෙළඳ සංකීර්ණ සංවර්ධන ව්‍යාපෘතිය

මොරටුව මහ නගර සභාව සතු මොරටුව හා කටුබැද්ද පොදු වෙළඳ සංකීර්ණ ගොඩනැගිලි ඌන භාවිතය හා අන්තරාදායක තත්ත්වය හේතු කොට ගෙන තවදුරටත් භාවිතය සඳහා උචිත නොවන බවට පෙනෙන බැවින් නව වෙළඳ සංකීර්ණයන් ඉදි කර වාණිජ කටයුතු සඳහා අවශ්‍ය අවකාශ සපයා දෙමින් හා නිසි නඩත්තුවකින් යුතුව පවත්වා ගෙන යාමට යෝජනා කෙරේ.

#### කටුබැද්ද පොදු වෙළඳ සංකීර්ණ ව්‍යාපෘතිය

දල වශයෙන් ප්‍රමාණයෙන් පර්චස් 32 ක් ආවරණය වන පරිදි ගාළු පාරට මුහුණලා කටුබැද්ද හංදියේ පිහිටා ඇති කටුබැද්ද පොදු වෙළඳ සංකීර්ණය වර්තමානය වන විට භාවිතා කිරීමට අපහසු මට්ටමේ පවතී. මෙම දෙමහල් ගොඩනැගිල්ලේ කඩ කාමර 42 ක් වැනි ප්‍රමාණයක් පැවතියද මේ වන විට ක්‍රියාකාරී මට්ටමේ පවතිනුයේ කඩ කාමර 25ක් පමණ වේ. වැසිකිළි පද්ධතිය භාවිතා කිරීමට නොහැකි වී තිබීම, ජලය හා විදුලිය වැනි පොදු පහසුකම් බිඳ වැටීම හා වාහන නැවතුම් පහසුකම් නොමැති වීම යනාදී කරුණු හේතු කොට ගෙන මෙම ගොඩනැගිල්ල භාවිතා කිරීමට අපහසු වී ඇති අතර වර්තමානයේ පවතින අබලන් වූ දෙමහල් ගොඩනැගිල්ල ඉවත් කර දැනට පවතින කඩ කාමර 42 ට අමතරව කඩ කාමර මෙන්ම රථවාහන ගාල් කිරීමට හැකි වන අයුරින් රථවාහන නැවතුම් අංගනයක් සමග මිශ්‍ර සංවර්ධන ගොඩනැගිල්ලක් ලෙස ව්‍යාපෘතිය සිදු කිරීමට යෝජිතය.

මොරටුව පොදු වෙළඳ සංකීර්ණය ව්‍යාපෘතිය

කළුතර සිට කොළඹ දෙසට ගමන් කිරීමේදී නව ගාළු පාරට මුහුණලා වම් පසින් පිහිටා ඇති මොරටුව පොදු වෙළඳ සංකීර්ණය මොරටුව නගරයට ඇතුල් වීමේදී පවතින ප්‍රධාන මංසලකුණකි. මෙම වෙළඳ සංකීර්ණය මොරටුව මහ නගර සභාව සතු පර්චස් 72 ක වැනි ප්‍රමාණයක පැතිරී පවතින කඩ කාමර 37 කින් යුත් තෙමහල් ගොඩනැගිල්ලකි. මේ වන විට මෙම පොදු වෙළඳපොල අබලන් තත්ත්වයේ පවතින අතර ඉදිරි අනාගත සංවර්ධන කටයුතු සමග ඒකාබද්ධ වූ මිශ්‍ර සංවර්ධනයක් සහිත සුපිරි වෙළඳ සංකීර්ණ ගොඩනැගිල්ලක් මෙම ස්ථානයේ ස්ථාපිත කිරීමට යෝජිතය.

## ii. EcP02 - වීරපුරන් අප්පු උද්‍යාන මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතිය

නව ගාළු පාරට මුහුණලා, මොරටුව පොදු වෙළඳපොල ඉදිරිපිට පිහිටා ඇති මොරටුව මහ නගර සභාව සතු වීරපුරන් අප්පු උද්‍යානය දල වශයෙන් පර්චස් 115 ක වපසරියකින් යුක්ත වේ. නගර මධ්‍යයේ පිහිටා ඇති මෙම උද්‍යානය වර්තමානය වනවිට විවිධ උත්සව අවස්ථා සඳහා යොදා ගනු ලැබුවද, ප්‍රශස්ත ලෙස නිසි භාවිතයකට යොදා නොගනී. එමෙන්ම මොරටුව නගරයේ රථ වාහන නැවතුම් ස්ථාන නොමැති වීමද ගැටළුවක් වී ඇති අතර ඒ සඳහාද විසඳුමක් ලෙස වීරපුරන් අප්පු උද්‍යානය ජනතාවට ප්‍රවේශ වීමට සිත් දෙන අයුරින් භූගත රථවාහන අංගනයකින් සමන්විත නාගරික උද්‍යානයක් ලෙස සංවර්ධනය කිරීමට යෝජනා කරනු ලබයි. තවද යෝජිත මොරටුව සුපිරි වෙළඳ සංකීර්ණ ගොඩනැගිල්ල හා වීරපුරන් අප්පු උද්‍යානය නව ගාලු පාර දෙපස පවතින භූමි වන හෙයින් මෙම යෝජිත භූගත රථවාහන අංගනය හා මොරටුව සුපිරි වෙළඳ සංකීර්ණ ගොඩනැගිල්ල භූගත උමං මාර්ගයකින් සම්බන්ධ කරනු ලබයි.

## iii. EcP03- බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානය හා සබැඳි මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතිය

මොරටුව නගර මධ්‍යයේ පවතින ශ්‍රී ලංකා දුම්රිය දෙපාර්තුමේන්තුව සතු අක්කර 8 ක පමණ වපසරියකින් යුත් දුම්රිය ස්ථානය හා බස් නැවතුම් පොළ පිහිටි ඉඩම බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානයක් ලෙස සංවර්ධනය කිරීමට යෝජිතය. යෝජිත බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථාන භූමියේ එනම්; මොරටුව දුම්රිය නැවතුම් පොළ, මොරටුව බස් නැවතුම් පොළ හා දුම්රිය නිල නිවාස යන භූමි භාග වල තැනින් තැන අවිධිමත් ලෙස පැතිර ඇති ගොඩනැගිලි ඉවත් කරමින් නැවත සංවර්ධනයක් ලෙස මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතිය යෝජිත වේ. එහිදී මෙම ව්‍යාපෘතිය යෝජිත බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථාන පරිශ්‍රයට අමතරව පූර්ණ පහසුකම් සහිත දුම්රිය නිල නිවාස, රථවාහන නැවතුම් අංගන හා වෙළඳ කුටි යනාදියෙන් සමන්විත වනු ඇත.

## iv. EcP04- එළිමහන් රංග ශාලාව හා මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතිය

මොරටුව පොලිස් ස්ථානය පිහිටි ඉඩම, මොරටුව නගර මධ්‍යයේ පවතින එකම ඓතිහාසික වටිනාකමකින් යුතු ගොඩනැගිල්ල පවතින ඉඩම ලෙස සඳහන් කල හැක. තවද මෙම ඉඩම, මොරටුව නගර මධ්‍යය ප්‍රදේශයට බොල්ගොඩ ගංගාව සෘජුව දර්ශනය වන භූමි බාගය ලෙසටද හඳුන්වා දිය හැකි අතර එය ආසන්න වශයෙන් අක්කර 3 ක පමණ වපසරියකින් යුක්ත වේ. මෙම පොලිස් ස්ථානය පිහිටි ඉඩම් ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තුමේන්තුව සතු දේපොලක් වන අතර වර්තමානය වන විට පොලිස් ස්ථානය හා පොලිස් නිල නිවාස පවත්වාගෙන යනු ලබයි. මෙම ඉඩමෙහි ස්ථානීය පිහිටීම සැලකිල්ලට ගනිමින් පුරාවිද්‍යාත්මක වටිනාකමකින් යුත් ගොඩනැගිල්ල ආරක්ෂා කර ගනිමින් බොල්ගොඩ ගඟේ අසිරිය විඳ ගනිමින් සෞන්දර්යාත්මක අත්දැකීමක් ලබා ගැනීමට හැකි වන අයුරින් එළිමහන් රංග ශාලාවකින් යුක්ත පොදු විනෝදාස්වාද ප්‍රදේශයක් ලෙස සංවර්ධනයට යෝජිත වේ. තවද පොලිස් ස්ථාන ගොඩනැගිල්ල පුනර්ජනනය කරමින් මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතියක් ලෙස සංවර්ධනය කිරීමට බලාපොරොත්තු වේ.

v. EcP05- නව කාර්යාල සංකීර්ණ ව්‍යාපෘතිය



මොරටුව නගරයේ රජයේ හා රජයේ නොවන ආයතන තැනින් තැන විසිරී පවතින අතර මහජනතාවට සුවිශේෂී සේවා සපයන රජයේ හා රජයේ නොවන ආයතන එකම ස්ථානයකට විතැන් කර, මොරටුව මහ නගර සභා පරිශ්‍රයට යාබදව මොරටුව නව කාර්යයාල සංකීර්ණය ඉදි කිරීමට යෝජනා කරනු ලබයි. මේ සඳහා මොරටුව නගර සභාව සතු මොරටුව මහ නගර සභා ගොඩනැගිල්ලට යාබදව පවතින ඉඩම් ඒ සඳහා යොදා ගැනීමට යෝජිත අතර එහිදී යෝජිත එළිමහන් රංග ශාලාව හා මිශ්‍ර සංවර්ධන ව්‍යාපෘතිය හේතුවෙන් ඉවත් කිරීමට සිදු වන මොරටුව පොලිස් ස්ථානයද මෙම භූමි බාගයේම ස්ථාපනය කිරීමට යෝජනා කරනු ලබයි.


# 6.5. තිරසර පරිසර උපායමාර්ගික සැලැස්ම

මොරටුව මහ නගර සභා සැලසුම් ප්‍රදේශය තුළ තිරසාර පාරිසරික සංවර්ධනයක් සිදු කිරීම මඟින් යෝජිත දැක්ම සාක්ෂාත් කරගැනීමට හැකි වන අයුරින් "ජලයෙන් පෝෂණය වන නගරයක්" යන අරමුණ ඉදිරිපත් කරනු ලැබිය. එම අරමුණ කරා ළඟා වීම සඳහා "2025 වර්ෂය වන විට ප්‍රදේශයේ පවතින ජල මූලාශ්‍ර (බොල්ගොඩ ගඟ, ලුනාව කලපුව හා වෙරළ) ඇතුළුව තෙත්බිම් හා වගුරුබිම් 100% සංරක්ෂණය කිරීමට කටයුතු කිරීම" යන පරමාර්ථය හා "2025 වර්ෂය වන විට ලුනාව කලපුව පරිසර ආරක්ෂණ කලාපයක් ලෙස ප්‍රකාශයට පත් කිරීම" යන පරමාර්ථය උපයෝගී කර ගනු ලබයි. මේ අනුව තිරසාර පාරිසරික උපායමාර්ගික සැලැස්ම ප්‍රධාන අනු කොටස් හතරකින් සමන්විත වේ.

- පාරිසරික සංරක්ෂණ සැලැස්ම
- භූදර්ශන කළමනාකරණ සැලැස්ම
- පොදු එළිමහන් හා විනෝද කටයුතු පිළිබඳ අවකාශීය සැලැස්ම
- ආපදා කළමනාකරණ සැලැස්ම

මේ අනුව මොරටුව මහ නගර සභා ප්‍රදේශයේ තිරසාර පාරිසරික සංවර්ධනයක් සිදු කිරීම සඳහා හඳුනා ගනු ලැබූ උත්ප්‍රේරක ව්‍යාපෘති ඇතුළත් සමස්ත පාරිසරික සැලැස්ම සිතියම් අංක 6.14 මඟින් දක්වා ඇත.

(තිරසාර පරිසර උපාය මාර්ගික සැලැස්ම සඳහා වන කේතය- En)




***සිතියම 6.14 :*** *මොරටුව තිරසාර පාරිසරික උපායමාර්ගික සැලසුම 2019 - 2030*

***මූලාශ්‍රය :*** *නාගරික සංවර්ධන අධිකාරිය, 2018*

## 6.5.1. පාරිසරික සංරක්ෂණ සැලැස්ම

### 6.5.1.1. සැලසුම් පරමාර්ථ

සංවේදිතා විශ්ලේෂණය තුළින් හඳුනා ගනු ලැබූ පාරිසරික සංවේදී ප්‍රදේශයන්හි ක්‍රමවත් භූමි පරිහරණයක් ඇති කරමින් එම ප්‍රදේශ සංරක්ෂණය කර ගැනීම පාරිසරික සංරක්ෂණ සැලැස්මෙහි පරමාර්ථය ලෙස දැක්විය හැක.

### 6.5.1.2. සැලසුම් විෂය පථය

සැලසුම් ප්‍රදේශය තුළ පවතින ප්‍රධාන ජල මූලාශ්‍රද එම ජල මූලාශ්‍ර වෙතට සම්බන්ධ අනෙකුත් ජල මාර්ග හා සියලුම ජලාභිමුඛ ප්‍රදේශ සංරක්ෂණය කරනු ලබන අතර සුවිශේෂී පාරිසරික තත්ත්ව සහිත ප්‍රදේශ හඳුනා ගනු ලැබිය. පාරිසරික සංරක්ෂණ සැලැස්ම ඉතා කෙටි කලක් තුළ ක්‍රියාත්මක කිරීම ආරම්භ කරනු ලබන අතර එහි වලංගුතාව දිගු කාලීන වනු ඇත.

### 6.5.1.3. සැලසුම් උපායමාර්ග

*අ) පාරිසරික වශයෙන් සුවිශේෂී හා සංරක්ෂණය කිරීමේ දැඩි අවශ්‍යතාවයක් ඇති ප්‍රදේශ හඳුනා ගැනීම හා එම ප්‍රදේශ පාරිසරික ආරක්ෂක ප්‍රදේශ ලෙස ප්‍රකාශ කිරීම සඳහා නිර්දේශ කිරීම.*

i. නිර්දේශිත ලුනාව කලපු ආරක්ෂක ප්‍රදේශය.

පරිච්ඡේද 5.2.1.1; ප්‍රබලතා යටතේ ලුනාව කලපු ප්‍රදේශයේ ඉහල සත්ත්ව හා ශාක විශේෂ ඝනත්වයක් හා විවිධත්වයක් ඇති බවට හඳුනා ගෙන ඇති අතර තවදුරටත් ජල විද්‍යාත්මක වශයෙන් වැදගත් ජලජ හා ගොඩබිම් ආශ්‍රිත පරිසර පද්ධතීන් ඇති බවට තහවුරු වී ඇත. 2000 අංක 53 හා 1986 අංක 56 දරණ පනත් වලින් සංශෝධිත 1980 අංක 47 දරණ ජාතික පාරිසරික පනතේ 24 (ඇ) සහ 24 (ඈ) යන වගන්ති ප්‍රකාරව පාරිසරික වශයෙන් සුවිශේෂී හෝ තර්ජනයට ලක් වී ඇති හෝ සංරක්ෂණය කිරීමේ දැඩි අවශ්‍යතාවයක් ඇති ප්‍රදේශ ගැසට් නිවේදනයක පල කරන නියමයක් මඟින් පරිසර විෂයභාර අමාත්‍යවරයාට පාරිසරික ආරක්ෂක ප්‍රදේශ වශයෙන් ප්‍රකාශයට පත්කල හැකිය. ඒ අනුව මධ්‍යම පරිසර අධිකාරිය විසින් පරිසර ආරක්ෂණ ප්‍රදේශයක් ලෙස යම් ප්‍රදේශයක් ප්‍රකාශයට පත් කිරීමේදී "සුදුසු ප්‍රදේශ/ ස්ථාන" ලෙස සඳහන් කරනු ලබන ප්‍ර කරුණු අතරින් ලුනාව කලපු ප්‍රදේශය පහත කරුණු අනුව යෝග්‍ය වන බවට හඳුනා ගනු ලැබිය.

- පාරිසරික ආරක්ෂක ප්‍රදේශ ප්‍රකාශයට පත් කිරීම සඳහා සුදුසු ප්‍රදේශ/ස්ථාන
- අනන්‍ය ගති ලක්ෂණ වලින් යුතු පාරිසරික පද්ධති. *උදා: ජෛව විවිධත්වය අතින් අනූන වන තර්ජනයට ලක් වී ඇති හෝ ඒක දේශික සත්ත්ව / ශාක ප්‍රජාවන්ගෙන් යුතු වූ ප්‍රදේශ*
- ජල විද්‍යාත්මක වශයෙන් සුවිශේෂී ප්‍රදේශ
  *උදා: තෙත් බිම්, ජල පෝෂක ප්‍රදේශ, වැදගත් ජල මාර්ග, ජලාශ*
- විවිධ ආයතන මඟින් සකස් කරන ලද මහා සැලසුම් යටතේ සංරක්ෂණය කළ යුතු බවට හඳුනා ගන්නා ලද ප්‍රදේශ / විද්‍යාත්මක ගවේශණ හෝ වෙනත් සැලසුම් මඟින් සංරක්ෂණය කළ යුතු බවට නිර්දේශිත ප්‍රදේශ.
- විද්‍යාත්මක වශයෙන් වැදගත් ප්‍රදේශ / භූමි භාග.
- විද්‍යාත්මක ගවේශණ වලින් නිර්දේශිත හෝ වෙනත් සැලසුම් වලට අනුව සංරක්ෂණය කළ යුතු බවට හඳුනාගත් ප්‍රදේශ.
- පාරිසරික වශයෙන් වැදගත් ලෙස වෙනත් අණපනත් යටතේ ප්‍රකාශයට පත් කරන ලද ප්‍රදේශ වල ස්වාරක්ෂක කලාප.

## *ආ) ජලාභිමුඛ ප්‍රදේශ සංරක්ෂණය කිරීම සඳහා රක්ෂිත කලාප හඳුනා ගැනීම.*

### i. බොල්ගොඩ ගංගා රක්ෂිතය

බොල්ගොඩ ගංගා ඉවුරෙහි සිට අඩි 40 ක පළලකින් යුතු රක්ෂිතයක් පවත්වා ගත යුතු අතර මෙම රක්ෂිතය වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ නිර්දේශයන්ට හා ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාවේ නිර්දේශයන්ට යටත් විය යුතුය.

### ii. ලුනාව කලපු රක්ෂිතය

ලුනාව කලපු ඉවුරෙහි සිට මීටර 8ක පළලකින් යුතු රක්ෂිතය පවත්වා ගත යුතු අතර, මෙම රක්ෂිතය ශ්‍රී ලංකා ඉඩම් ගොඩ කිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාවේ නිර්දේශයන්ට යටත් විය යුතුය. ඉහත සඳහන් කලපුව හා සම්බන්ධව පවතින අනෙකුත් සියලුම කුඩා ඇලවල් සඳහා එම ඇළ මාර්ග වල පවතින පළලෙහි භාගයක් වන ප්‍රමාණයකින් යුත් රක්ෂිතයක් ඇළ ඉවුරේ සිට පැවැත්විය යුතුය.

### iii. වෙරළ රක්ෂිතය

වෙරළ රක්ෂිතය වඩදිය රේඛාවේ සිට මීටර 45 ක් විය යුතුය.

### iv. ඇළ මාර්ග රක්ෂිත.

| *ඇළ මාර්ගයේ නම* | *ජල මාර්ගය ඉවුරේ සිට පැවතිය යුතු රක්ෂිතය මීටර වලින්* |
|---|---|
| *ලුනාව ඇළ* | *මීටර 6* |
| *එළු ඇළ* | *මීටර 6* |
| *හෙමින් ගිය ඇළ* | *මීටර 6* |
| *බඹටුව ඇළ* | *මීටර 6* |

**වගුව 6.5 :** *ඇළ මාර්ග රක්ෂිතය*
**මූලාශ්‍රය :** *නාගරික සංවර්ධන අධිකාරිය, 2018*

## 6.5.2. භූදර්ශන කළමනාකරණ සැලැස්ම (LSP)

### 6.5.2.1. සැලසුම් පරමාර්ථ

සැලසුම් ප්‍රදේශයේ පවතින සෞන්දර්යයාත්මක වටිනාකමකින් යුක්ත හා වර්තමානයේ ප්‍රවේශ-කත්වයෙන් ඌන ප්‍රදේශ මහජනයාට අත්විඳිය හැකි ප්‍රදේශ ලෙස සංවර්ධනය කිරීමටත්, සැලසුම් ප්‍රදේශය තුළ සුළං සංසරණය විධිමත් කිරීම සහ ඉහත සංරක්ෂණ සැලැස්ම මඟින් සංරක්ෂණය කරනු ලබන ප්‍රදේශ තිරසාර භාවිතය සඳහා ඉදිරිපත් කිරීම භූදර්ශන කළමනාකරණ සැලැස්මෙහි පරමාර්ථ ලෙස දැක්විය හැක.

### 6.5.2.2. සැලසුම් විෂය පථය


භූදර්ශන කළමනාකරණ සැලැස්ම 2019-2030 සැලසුම් කාල පරිච්ඡේදය තුළ ක්‍රියාත්මක කිරීමට යෝජිත අතර සැලැස්ම මඟින් සියලුම ජලාභිමුඛ ප්‍රදේශ සඳහා භූදර්ශන ව්‍යාපෘති හඳුනා ගනු ලැබිය.

### 6.5.2.3. සැලසුම් උපායමාර්ග

*අ. සැලසුම් ප්‍රදේශය තුළ සුළං සංසරණය ක්‍රමවත් පරිදි සිදු වීම සඳහා ජල මූලාශ්‍ර එකිනෙක සම්බන්ධ කරමින් වායු සංසරණ කොරිඩෝ නිර්මාණය කර ගැනීම.*

#### En1 - මාර්ග දෙපස හරිත මංතීරු ව්‍යාපෘති

ඇමුණුම 8 හි දක්වා ඇති පරිදි මොරටුව ප්‍රදේශය සඳහා සිදු කරනු ලැබූ සුළං සංසරණ විශ්ලේෂණයට අනුව ප්‍රදේශයේ ජල මූලාශ්‍ර එකිනෙක සම්බන්ධ වන පරිදි ප්‍රදේශය පුරා ක්‍රමවත් වායු සංසරණය ක්‍රියාවලියක් ඇති කිරීම සඳහා උපයෝගී කර ගත හැකි මාර්ග හඳුනා ගනු ලැබූ අතර එම මාර්ග දෙපස පහත සිතියම් අංක 6.15 හි සඳහන් ලෙස රුක් රෝපණය කරමින් හරිත මංතීරු පිහිටුවනු ඇත.




**මාර්ගය දෙපස රුක් රෝපණ ව්‍යාපෘතිය-2030**
**මොරටුව මහනගර සභා ප්‍රදේශය**

0 0.325 0.65 1.3 1.95 2.6 Kilometers

නාගරික සංවර්ධන අධිකාරිය
දෙසැම්බර් 2018

මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය | මොරටුව සංවර්ධන සැලැස්ම (2019-2030) | සැකසුම: බස්නාහිර පළාත් අංශය හා පර්යේෂණ හා සංවර්ධන ඒකකය

**සිතියම 6.15 :** *මාර්ග දෙපස රුක් රෝපණය කරනු ලබන මාර්ග*

**මූලාශ්‍රය :** *නාගරික සංවර්ධන අධිකාරිය, 2018*

## ආ. ජලාභිමුඛ ප්‍රදේශ සඳහා භූදර්ශන ක්‍රමවේද හඳුන්වා දීම.



### En2 - බොල්ගොඩ ජලාභිමුඛ භූදර්ශන ව්‍යාපෘතිය

බොල්ගොඩ ජලාභිමුඛ භූදර්ශන ව්‍යාපෘතිය ජල මුලාශ්‍රය භූදර්ශනය, ජලයට ඉතා ආසන්න ප්‍රදේශය භූදර්ශනය හා මිනිස් ක්‍රියාකාරකම් සහිත ප්‍රදේශය භූදර්ශනය ලෙස ප්‍රධාන කොටස් ත්‍රිත්වයකින් යුක්ත වේ.

ජල මුලාශ්‍රය භූදර්ශනය: කඩොලාන ශාක ඇතුළු වෙනත් ජලජ ශාක ප්‍රතිෂ්ඨාපනය කොට ජලාශ්‍රිත ජීවීන් සඳහා උචිත පරිසර පද්ධති නිර්මාණය කර දීම.

ජලයට ඉතා ආසන්න ප්‍රදේශය භූදර්ශනය: බොල්ගොඩ භූදර්ශන ව්‍යාපෘතියේ ප්‍රධාන උපායමාර්ගික අංගය ලෙස, ප්‍රදේශයේ ගංවතුර තත්ත්ව මැඩපැවැත්වීමට හා ගංගාව දර්ශනය වීමට හැකි වන ලෙස ජලයට ආසන්න ප්‍රදේශය "පිය ගැට පෙළ උද්‍යානයක් " ලෙස සංවර්ධනය සඳහා ගංගා ඉවුරු ප්‍රදේශය උචිත කැපුම් හා පිරවුම් සිදු කොට පිය ගැට පෙළ වේදිකාවක අයුරින් නිර්මාණය කරනු ලබයි. තවදුරටත් බොල්ගොඩ ගංගා මට්ටමින් ඉහලට ඔසවා ඉදි කරනු ලබන යෝජිත පාපැදි, පදික මංතීරු සහ නැරඹුම් කුටි මඟින් ජනතාවට කිසිදු දෘශ්‍ය බාධාවකින් තොරව ගංගාවේ සුන්දරත්වය අත්විඳීමටද හැකියාව ලැබෙනු ඇත.

මිනිස් ක්‍රියාකාරකම් සහිත ප්‍රදේශ භූදර්ශනය: ජල මුලාශ්‍රයේ සිට ගොඩබිම දෙසට වන්නට පවතින ප්‍රදේශය තුළ විනෝදාස්වාද කටයුතු ප්‍රවර්ධනය සඳහා කඩ සාප්පු, ළමා උද්‍යාන, විවේක ගත හැකි කුඩා ගෘහ ඒකක, සංස්කෘතික මධ්‍යස්ථාන සහ අධ්‍යාපනික කුටි ආදිය අනුමත භාවිතාවන් ලෙස හඳුනා ගනු ලැබූ අතර මොරටුමුල්ල ආශ්‍රිත උතුරු  බොල්ගොඩ වැව ප්‍රදේශය ජල ක්‍රීඩා ඇතුළු විවිධ ජල ක්‍රියාකාරකම් සඳහා උචිත භෞතික තත්ත්වයන්ගෙන් සමන්විත බව හඳුනා ගනු ලැබිය.

### En3 වෙරළ භූදර්ශන ව්‍යාපෘතිය

i. වෙරළබඩ දුම්රිය මාර්ගය දෙපස ආරක්ෂිත වැටි ස්ථාපනය හා වෙරළ ඛාදනය වැළැක්වීමේ ක්‍රම භාවිතා කිරීම.
ii. අධික සුළං හා සුළි සුළං තත්ත්ව මැඩපැවැත්වීමට හැකි වන අයුරින් හා ලවණ පරිසරයට උචිත ශාක රෝපණය කොට වෙරළ තීරය හරිත මංතීරුවක් ලෙස සංවර්ධනය.
iii. ප්‍රධාන ප්‍රවේශ මාර්ගයේ සිට දුම්රිය මාර්ගය හරහා වෙරළ තීරය වෙත ජනතාවට ආරක්ෂිතව ප්‍රවේශ වීමට හැකි වන පරිදි පදික ගුවන් පාලම් ස්ථාපනය කිරීම.

### En4 ලුනාව භූදර්ශන ව්‍යාපෘතිය

i. ලුනාව කලපුව ආශ්‍රිතව ජෛව විවිධත්වය ඉහල නැංවීමට සහ කලපුවේ ජලය ස්වාභාවික පිරිපහදුව සඳහා කඩොලාන ශාක ප්‍රතිෂ්ඨාපනය කිරීම.
ii. ලුනාව කලපුව ආශ්‍රිත කර්කශ ස්වභාවය මග හරවා ස්වභාව සෞන්දර්ය ඉහල නැංවීම සඳහා, පාපැදි හා පදික මංතීරු දෙපස රුක් රෝපණය කිරීම.

## 6.5.3. පොදු එළිමහන් හා විනෝද කටයුතු පිළිබඳ අවකාශීය සැලැස්ම (PORS)

### 6.5.3.1. සැලසුම් පරමාර්ථ

මොරටුව මහ නගර සභා බල ප්‍රදේශය සඳහා 2030 වර්ෂය වන විට පුරෝකථනය කරන ලද 151000ක ජනගහනය සඳහා ප්‍රමාණවත් පොදු එළිමහන් විනෝදාස්වාද ප්‍රදේශ වෙන් කර දීම පොදු එළිමහන් හා විනෝද කටයුතු පිළිබඳ අවකාශීය සැලැස්මෙහි පරමාර්ථය ලෙස දැක්විය හැකි වේ.

### 6.5.3.2 සැලසුම් විෂය පථය

1983 අප්‍රේල් මස නාගරික සංවර්ධන අධිකාරිය මඟින් පවත්වන ලද "Spatial and Design Standards for Urban Development" වැඩමුළුවේ එකඟත්වයට අනුව පොදු එළිමහන් විනෝදාස්වාද ප්‍රදේශ සඳහා සම්මතය ලෙස පුද්ගලයින් 1000ක් සඳහා අවම වශයෙන් හෙක්ටයාර 1.4 ක (අක්කර 3.5 ක) ප්‍රදේශයක් වෙන් කල යුතු නමුත් නගරයෙහි අනාගත වර්ධනය සමඟ බැඳුණු ස්වභාවික හා සාමාජීයීය වටපිටාවේ ස්ථානීය වෙනස්කම් හේතුකොට ගෙන, ඉහත සම්මතය සංශෝධනයට ඉඩ ලබා දී ඇත. වර්තමාන ඉඩම් පරිහරණ රටාව අනුව මොරටුව මහ නගර සභා සීමාව තුළ විනෝදාස්වාද කටයුතු සඳහා වෙන් කර ඇති හෙක්ටයාර 9 ක භූමි ප්‍රමාණය ප්‍රදේශයේ ජනගහනය සඳහා ප්‍රමාණවත් නොවන අතර මොරටුව මහ නගර සභා බල ප්‍රදේශය වර්ග කිලෝමීටර 23.4ක සීමිත භූමි ප්‍රමාණයකින් යුතු බැවින් ඉහත සම්මතය සංශෝධනය කරමින් පුද්ගලයින් 1000කට හෙක්ටයාර 1.0 ලෙස සලකා 2030 වර්ෂය වන විට හෙක්ටයාර 150ක පොදු එළිමහන් විනෝදාස්වාද ප්‍රදේශ ස්ථාපිත කරනු ඇත.

### 6.5.3.3. සැලසුම් උපායමාර්ග


#### *අ. පොදු එළිමහන් විනෝදාස්වාද ප්‍රදේශ පිහිටුවීම සඳහා ප්‍රමාණවත් ඉඩ පහසුකම් නොමැති ප්‍රදේශ වල රේඛීය උද්‍යාන සංවර්ධනය*

#### En5 දෘශ්‍ය ප්‍රවේශන කොරිඩෝ

කොරලවැල්ලේ සිට එගොඩ උයන දක්වා නැගෙනහිරින් බොල්ගොඩ ගංඟාවෙන් හා බටහිරින් මුහුදෙන් මායිම්ව පවතින මීටර 500– 800 ක පමණ පටු භූමි පිහිටුම ශ්‍රී ලංකාවේ දැකිය හැකි ස්ථානය ලෙස මොරටුව හැඳින්විය හැක. ඒ අනුව ඇමුණුම් අංක 9හි දක්වා ඇති පරිදි සිදු කරන ලද දෘශ්‍යතා විශ්ලේෂණය මඟින්, බොල්ගොඩ ගංඟාව හා වෙරළ තීරය රේඛීයව දර්ශනය වන මාර්ග, දෘශ්‍ය ප්‍රවේශන කොරිඩෝ (සිතියම් අංක 6.16) ලෙස සංවර්ධනය කිරීමට යෝජිත වේ. වගු අංක 6.6 හි සඳහන් පරිදි දෘශ්‍ය ප්‍රවේශන කොරිඩෝ ලෙස හඳුනා ගනු ලැබූ මාර්ග අඩි 40 ක පළලකින් හා දෙපස රුක් රෝපිත හරිත මංතීරු, පදික මංතීරු, පාපැදි මංතීරු හා විවේකීව ගත කළ හැකි ස්ථාන වලින් යුක්තව රේඛීය උද්‍යාන වශයෙන් සංවර්ධනය කරනු ලබයි.

| *දෘශ්‍ය ප්‍රවේශන කොරිඩෝව* | *කොරිඩෝවෙහි දිග* |
|---|---|
| *ගුණවර්ධනාරාම පාර* | *770m* |
| *සමාජවාදී නිවහන් පෙදෙස* | *520m* |
| *ටී.එල්.සී. පීරිස් මාවත* | *450m* |
| *මහවත්ත පාර* | *400m* |

***වගුව 6.6 :*** *යෝජිත දෘශ්‍ය ප්‍රවේශන කොරිඩෝ*
***මූලාශ්‍රය :*** *නාගරික සංවර්ධන අධිකාරිය, 2018*




**දෘශ්‍ය ප්‍රවේශන කොරිඩෝ-2030**
**මොරටුව මහනගර සහ ප්‍රදේශය**

0 0.175 0.35 0.7 1.05 1.4 Kilometers

නාගරික සංවර්ධන අධිකාරිය
දෙසැම්බර් 2018

මූලාශ්‍රය: නාගරික සංවර්ධන අධිකාරිය | මොරටුව සංවර්ධන සැලැස්ම (2019-2030) | සැකසුම: බස්නාහිර පළාත් අංශය හා පර්යේෂණ හා සංවර්ධන ඒකකය

***සිතියම 6.16 :*** *යෝජිත දෘශ්‍ය ප්‍රවේශ කොරිඩෝ*

***මූලාශ්‍රය :*** *නාගරික සංවර්ධන අධිකාරිය, 2018*

### *ආ. වර්තමානයේ ඌන භාවිතයෙන් යුතු භූමි පොදු උද්‍යාන ලෙස සංවර්ධනය කිරීම.*

#### En6 කටුබැද්ද තෙත්බිම් උද්‍යානය

වී වගා කටයුතු සඳහා භාවිතා කර වර්තමානය වන විට අතහැර දමා පුරන්ව පවතින වර්ග කි.මී 0.19 වපසරියකින් යුතු කටුබැද්ද වගුරුබිම, පදික මංතීරු, පාපැදි මංතීරු, නැරඹුම් කුටි, විවේකිව අසුන්ගත හැකි ස්ථාන, කුඩා පර්යේෂණ ප්‍රදර්ශන කුටි සහ කඩොලාන ප්‍රතිසංස්ථාපනය ව්‍යාපෘතිය ඇතුලත්ව තෙත්බිම් උද්‍යානයක් ලෙස (රූප සටහන් අංක 6.16) සංවර්ධනයට යෝජනා කෙරේ.




***රූප සටහන 6.16 :*** *තෙත්බිම් උද්‍යාන*

#### En7 මදුරු දූව විවෘත උද්‍යානය

මොරටුමුල්ල ප්‍රදේශයේ බොල්ගොඩ ගංඟාවේ ගොඩබිමට ඉතා ආසන්නයේ පවතින හෙක්ටයාර 3ක පමණ වපසරියකින් යුතු “මදුරු දූව” දූපත ප්‍රදේශයේ විනෝදාස්වාද කටයුතු ප්‍රවර්ධනය සඳහා ඉතා වැදගත් විභවතාවක් ලෙස හඳුනා ගත හැකි හෙයින් ඉහත En2 බොල්ගොඩ ජලාභිමුඛ භූදර්ශන ව්‍යාපෘතිය උත්ප්‍රේරණය කිරීමට හැකි වන අයුරින් මදුරු දූව දූපත විවෘත උද්‍යානයක් ලෙස සංවර්ධනයට යෝජිත වේ. තවද බොල්ගොඩ ගංගාව දර්ශනය වන පරිදි ගොඩ බිම් ප්‍රදේශ හා දූපත සම්බන්ධ වන පරිදි මගී පාලම් (bridge views) ස්ථාපනය කිරීමටද යෝජනා කරනු ලබයි.

## 6.5.4. ආපදා කළමනාකරණ සැලැස්ම

### අ. *ජල ගැලීම් මැඩපැවැත්වීමේ ක්‍රියාමාර්ග*

- බොල්ගොඩ ගංගාව ආශ්‍රිත ජල ගැලීම් විපත් අවම කර ගැනීම සඳහා En2 යටතේ යෝජිත "පිය ගැට පෙළ උද්‍යාන" සංවර්ධනය හැකි වනු ඇත.
- මොරටුව සැලසුම් ප්‍රදේශයේ ප්‍රධානතම හා ඉහලම වපසරියකින් යුතු අභ්‍යන්තර තෙත්බිම වන කටුබැද්ද වගුරුබිම, ඉහල වැසි ජල ප්‍රමාණයක් රඳවා තබා ගැනීමට හැකි නමුත් වර්තමානයේදී අනවසර ගොඩ කිරීම් හේතුවෙන් වගුරුබිමෙහි ජලය රඳවා තබා ගැනීමේ ධාරිතාව ක්‍රමයෙන් අඩු වන බැවින්, අධික වැසි තත්ත්වයන්හිදී ජල ගැලීම් වලට මුහුණපෑමට සිදු වේ. එහෙයින් ඉහත ජල රැඳවුම් ප්‍රදේශය සංරක්ෂණය සඳහා En6 කටුබැද්ද තෙත්බිම් උද්‍යාන ව්‍යාපෘතිය මඟින් හැකියාව ලැබෙනු ඇත.

### ආ. *සුළි-සුළං*

මොරටුව නගරය සුළි-සුළං තත්ත්ව මඟින් බලපෑමට ලක්වන අතර, ඒ අතරිනුත් කොරළවැල්ලේ සිට එගොඩ උයන දක්වා මුහුදෙන් හා ගොඩබිමෙන් මායිම්ව පවතින පටු භූමි තීරය එහි ස්වාභාවික භෞතික පිහිටීම හේතුවෙන් නිරන්තර ආපදාවට ලක් වේ. එහෙයින් මෙම ප්‍රදේශයේ සුළි-සුළං මඟින් ඇති වන හානිදායක තත්ත්ව මග හරවා ගැනීම සඳහා En3 ව්‍යාපෘතිය යටතේ යෝජිත වෙරළ තීරයේ ශාක ප්‍රතිෂ්ඨාපන ව්‍යාපෘතිය මගින් හැකියාව ලැබෙනු ඇත.

### ඇ. *සුනාමි බලපෑම*

#### මැඩපැවැත්වීමේ ක්‍රියාමාර්ග

මොරටුව සැලසුම් ප්‍රදේශයේ බටහිර මායිම කි.මී 10.5 ක දිගින් යුතු වෙරළ තීරයකින් යුක්ත බැවින් සුනාමි අනතුරු ඇඟවීම් පද්ධතියක් ස්ථාපනය කිරීමට යෝජනා කෙරේ. එමඟින් සුනාමි අවදානම් අවස්ථා වලදී කල් ඇතිව දැනුවත් වී අවදානම් සහිත ප්‍රදේශ වලින් ඉවත් වීමෙන් පුද්ගල ජීවිත හා දේපළ හානි වීම අවම කර ගැනීම අපේක්ෂා කෙරේ.

# 6.6. ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ උපායමාර්ග සැලැස්ම


## 6.6.1 හැඳින්වීම

2030 වර්ෂය සඳහා සැකසෙන මොරටුව මහ නගර සභා බල ප්‍රදේශය සඳහා වූ සංවර්ධන සැලැස්මේ වැදගත් කොටසක් ලෙස ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ උපායමාර්ග සැලැස්ම හඳුන්වා දිය හැක. ප්‍රදේශයේ සංවර්ධනය සඳහා අත්‍යාවශ්‍ය ව්‍යාපෘති පිළිබඳව හඳුනා ගැනීමෙන් අනතුරුව එකී ව්‍යාපෘති හරහා ප්‍රදේශයේ දැනට පැන නැගී ඇති ගැටළු හා ඉදිරියේදී පැන නැඟිය හැකි ගැටළු සඳහා විසඳුම් ලබා දීමට බලාපොරොත්තු වේ. මෙම ව්‍යාපෘතීන් අදියර කිහිපයක් යටතේ ක්‍රියාත්මක කිරීමට හා කඩිනමින් විසඳුම් ලබා දිය යුතු ගැටළු සඳහා ප්‍රමුඛතාව පදනම් කර ගෙන ව්‍යාපෘති සිදු කිරීමට අදහස් කරනු ලබයි. මෙහිදී මහා භාණ්ඩාගාරයේ, නාගරික සංවර්ධන අධිකාරියේ හා පෞද්ගලික අංශයේ මූල්‍යමය ප්‍රතිපාදන යොදා ගෙන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත අතර මොරටුව සංවර්ධන සැලැස්ම තුළින් මූලිකවම ව්‍යාපෘති 22 ක් හඳුනා ගෙන ඇති අතර එම ව්‍යාපෘති ක්‍රියාත්මක කරන ආකාරය පිළිබඳ විස්තර පහත පරිදි දැක්විය හැක.


*__වගුව 6.7 :__ සැහැල්ලු දුම්රිය මාර්ග ව්‍යාපෘතිය*
*__මූලාශ්‍රය :__ නාගරික සංවර්ධන අධිකාරිය, 2018*

01

<table>
<tr><th colspan="6">ව්‍යාපෘතිය හඳුනා ගැනීම</th></tr>
<tr><td>ව්‍යාපෘති මාතෘකාව</td><td colspan="5">TP01 - සැහැල්ලු දුම්රිය මාර්ග ව්‍යාපෘතිය</td></tr>
<tr><td>ව්‍යාපෘතිය</td><td colspan="5">සැහැල්ලු දුම්රිය මාර්ග</td></tr>
<tr><td>ව්‍යාපෘති යෝජනාව</td><td colspan="5">බස්නාහිර කලාපීය මහා නගර ප්‍රවාහන සැලැස්ම මගින් යෝජිත සැහැල්ලු දුම්රිය මාර්ගය කැළණියෙන් ආරම්භ වී දෙමටගොඩ, බොරැල්ල, නාරාහේන්පිට, නුගේගොඩ හරහා මොරටුව බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානය ගමනාන්තය වන පරිදි පවතින මහා මාර්ගයට ඉහළින් ඉදි කිරීමට යෝජිත දුම්රිය මාර්ගය ඔස්සේ ධාවනයට හඳුන්වා දෙන සැහැල්ලු දුම්රිය සේවාව, සීමිත නැවතුම් ස්ථාන ගණනාවකින් සමන්විත වනු ඇත. නැවතුම් ස්ථාන වශයෙන් මොරටුව විශ්වවිද්‍යාලය, කටුබැද්ද මංසන්ධිය, රාවතාවත්ත මංසන්ධිය හා මොරටුව බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානය හඳුනා ගනු ලැබිය.</td></tr>
<tr><td rowspan="4">පිහිටීම</td><td>පළාත</td><td>බස්නාහිර</td><td rowspan="4">සීමාවන්</td><td>උතුර</td><td rowspan="4">කටුබැද්ද පාලමේ සිට 255 ගල්කිස්ස කොට්ටාව මාර්ගය ඔස්සේ කටුබැද්ද මංසන්ධිය හරහා ගාලු පාර ඔස්සේ මොරටුව බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානය</td></tr>
<tr><td>දිස්ත්‍රික්කය</td><td>කොළඹ</td><td>නැගෙනහිර</td></tr>
<tr><td>ප්‍රාදේශීය සීමාව</td><td>මොරටුව මහ නගර සභා බල ප්‍රදේශය</td><td>දකුණ</td></tr>
<tr><td>පරිපාලන ඒකකය</td><td>මහ නගර සභා</td><td>බටහිර</td></tr>
<tr><td>ප්‍රවේශය</td><td colspan="5">පිලියන්දල සිට 255 මාර්ගය ඔස්සේ මොරටුව නගරය වෙත.</td></tr>
</table>




පිහිටීම දක්වන සිතියම




භූමි පරිහරණ සැලැස්ම

| ව්‍යාපෘතිය සාධාරණීකරණය කිරීම | | | | | |
|---|---|---|---|---|---|
| **ව්‍යාපෘති ප්‍රභේද** | සංරක්ෂණය | | **ව්‍යාපෘති ස්වභාවය** | නව | √ |
| | භූදර්ශන | | | විස්තීරණය කළ යුතු | |
| | උරුමයන් | | | භූමිය සංවර්ධනය කිරීම පමණක් | |
| | ප්‍රතිස්ථාපන | | **ව්‍යාපෘතියේ ඉලක්ක** | ආර්ථික | |
| | නිවාස | | | සමාජීය | √ |
| | මාර්ග සංවර්ධන | √ | | පාරිසරික | |
| | වෙනත් | | | භෞතික | √ |


| ව්‍යාපෘතිය සාධාරණීකරණය කිරීම | |
|---|---|
| **ව්‍යාපෘති ඉලක්ක** | i. මොරටුව නගරය හා වෙනත් ප්‍රධාන නාගරික කේන්ද්‍ර අතර පළාත්බඳ සබඳතාව වැඩි දියුණු කිරීම හා ගමනාගමන කාලය අඩු කරලීම.<br>ii. මගීන් විකල්ප ප්‍රවාහන මාධ්‍ය වෙත නැඹුරු කිරීම.<br>iii. ප්‍රධාන මාර්ගයන්හි වාහන තදබදය අවම කිරීම.<br>iv. පොදු ප්‍රවාහන මාධ්‍යයන්හි ගුනාත්මකතාව හා කාර්යක්ෂමතාව ඉහල නැංවීම. |
| **ව්‍යාපෘතියේ පදනම** | ඉහල යන ගමනාගමන ඉල්ලුම මත ප්‍රධාන මාර්ගයන්හි සේවා මට්ටම් අතික්‍රමණය කරමින් වාහන තදබද තත්ත්වයන් ඇති වන හෙයින් නගරයට ඇතුළු වන හා පිටවන රථවාහන ප්‍රමාණය අවම කිරීම සඳහා මහජනතාව පොදු ප්‍රවාහන මාධ්‍ය කරා යොමු කල යුතු වේ. ඒ සඳහා පොදු ප්‍රවාහන මාධ්‍ය ඉතා කාර්යක්ෂම හා සුවපහසු ලෙස පවත්වා ගත යුතු වන හෙයින් විකල්ප පොදු ප්‍රවාහන මාධ්‍ය ලෙස සැහැල්ලු දුම්රිය සේවා හඳුන්වා දීම කෙරෙහි අවධානය යොමු කරනු ලැබිය. |

| ව්‍යාපෘතියේ දේපළ පිළිබඳ විස්තරය | | | | | |
|---|---|---|---|---|---|
| **ඉඩමේ වර්තමාන අයිතිය** | නා.සං.අධි. | | **මිනින්දෝරු සැලසුම** | අංකය | – |
| | රජයේ | √ | | දිනය | – |
| | වෙනත් | | | ඉඩමේ ප්‍රමාණය | – |


| ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම | | | | | |
|---|---|---|---|---|---|
| ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදය | **ක්‍රියාත්මක කළ යුතු ආයතනය** | නාගරික සංවර්ධන අධිකාරිය | **කලාපය** | අධි ඝනත්ව මිශ්‍ර සංවර්ධන කලාපය සහ අඩු ඝනත්ව මිශ්‍ර සංවර්ධන කලාපය | |
| | | මොරටුව මහ නගර සභාව | **කලාපීකරණ අනුකූලතාවය** | ඔව් | √ |
| | | මාර්ග සංවර්ධන අධිකාරිය | | නැත | |
| | **අරමුදල් සපයා ගැනීමේ ක්‍රමවේදය** | භාණ්ඩාගාර අරමුදල් | **අනුමැතිය ලබා ගත යුතු ආයතන** | • නාගරික සංවර්ධන අධිකාරිය<br>• මොරටුව මහ නගර සභාව | |

**වගුව 6.8 :** *වෙරළබඩ දුම්රිය මාර්ගය නවීකරණය*
**මූලාශ්‍රය :** *නාගරික සංවර්ධන අධිකාරිය, 2018*

| ව්‍යාපෘතිය හඳුනා ගැනීම | | | | | |
|---|---|---|---|---|---|
| ව්‍යාපෘති මාතෘකාව | TP02 - වෙරළබඩ දුම්රිය මාර්ගය නවීකරණය | | | | |
| ව්‍යාපෘතිය | වෙරළබඩ දුම්රිය මාර්ගය නවීකරණය | | | | |
| ව්‍යාපෘති යෝජනාව | දුම්රිය සේවාව වඩා කාර්යක්ෂම කිරීම සඳහා නව සංඥා පද්ධතියක් ඇතුළුව දුම්රිය පද්ධතිය විද්‍යුතනය කොට වෙරළබඩ දුම්රිය මාර්ගය නවීකරණය හා අඟුලාන, ලුනාව, කොරළවැල්ල හා එගොඩ උයන දුම්රිය ස්ථාන නවීකරණය කිරීම. | | | | |
| පිහිටීම | **පළාත** | බස්නාහිර | සීමාවන් | **උතුර** | දෙහිවල-ගල්කිස්ස මහ නගර සභාව |
| | **දිස්ත්‍රික්කය** | කොළඹ | | **නැගෙනහිර** | – |
| | **ප්‍රාදේශීය සීමාව** | මොරටුව මහ නගර සභා බල ප්‍රදේශය | | **දකුණ** | මොරටුව මහ නගර සභාව |
| | **පරිපාලන ඒකකය** | මහ නගර සභා | | **බටහිර** | – |
| ප්‍රවේශය | කොටුව ප්‍රධාන දුම්රිය ස්ථානයේ සිට මොරටුව ප්‍රධාන දුම්රිය ස්ථානය දක්වා දිවෙන වෙරළබඩ දුම්රිය මාර්ගය. | | | | |




පිහිටීම දක්වන සිතියම




භූමි පරිහරණ සැලැස්ම

| ව්‍යාපෘතිය සාධාරණීකරණය කිරීම | | | | | |
|---|---|---|---|---|---|
| **ව්‍යාපෘති ප්‍රභේද** | සංරක්ෂණය | | **ව්‍යාපෘති ස්වභාවය** | නව | |
| | හුදර්ශන | | | විස්තීරණය කළ යුතු | √ |
| | උරුමයන් | | | භූමිය සංවර්ධනය කිරීම පමණක් | |
| | ප්‍රතිස්ථාපන | | **ව්‍යාපෘතියේ ඉලක්ක** | ආර්ථික | √ |
| | නිවාස | | | සමාජීය | √ |
| | මාර්ග සංවර්ධන | √ | | පාරිසරික | |
| | වෙනත් | | | භෞතික | √ |

| ව්‍යාපෘතිය සාධාරණීකරණය කිරීම | |
|---|---|
| **ව්‍යාපෘති ඉලක්ක** | i. වෙරළබඩ දුම්රිය මාර්ගය හා වෙනත් දුම්රිය මාර්ග අතර සබඳතාව ඉහල නැංවීම.<br>ii. මහාමාර්ගයන්හි රථවාහන තදබදය අවම කිරීම.<br>iii. මගී ප්‍රවාහන හා භාණ්ඩ ප්‍රවාහන ධාරිතාවය ඉහල නැංවීම.<br>iv. දුම්රිය ගමනාගමනය සඳහා ගත වන කාලය අවම කිරීම. |
| **ව්‍යාපෘතියේ පදනම** | ඉහල යන ගමනාගමන ඉල්ලුම මත ප්‍රධාන මාර්ගයන්හි සේවා මට්ටම් අතික්‍රමණය කරමින් වාහන තදබද තත්ත්වයන් ඇති වන හෙයින් නගරයට ඇතුළු වන හා පිටවන රථවාහන ප්‍රමාණය අවම කිරීම සඳහා මහජනතාව පොදු ප්‍රවාහන මාධ්‍යය කරා යොමු කල යුතු වේ. ඒ සඳහා පොදු ප්‍රවාහන මාධ්‍යය ඉතා කාර්යක්ෂම හා සුවපහසු ලෙස පවත්වා ගත යුතු වන හෙයින් විකල්ප පොදු ප්‍රවාහන මාධ්‍ය ලෙස සැහැල්ලු දුම්රිය සේවා හඳුන්වා දීම කෙරෙහි අවදානය යොමු කරනු ලැබිය. |


| ව්‍යාපෘතියේ දේපළ පිළිබඳ විස්තරය | | | | | |
|---|---|---|---|---|---|
| **ඉඩමේ වර්තමාන අයිතිය** | නා.සං.අධි. | | **මිනින්දෝරු සැලසුම** | අංකය | – |
| | රජයේ | √ | | දිනය | – |
| | වෙනත් | | | ඉඩමේ ප්‍රමාණය | – |

| ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම | | | | | |
|---|---|---|---|---|---|
| ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදය | **ක්‍රියාත්මක කළ යුතු ආයතනය** | නාගරික සංවර්ධන අධිකාරිය | **කලාපය** | අධි ඝනත්ව මිශ්‍ර සංවර්ධන කලාපය සහ අධි ඝනත්ව හරිත නේවාසික කලාපය | |
| | | මොරටුව මහ නගර සභාව | **කලාපීකරණ අනුකූලභාවය** | ඔව් | √ |
| | | මාර්ග සංවර්ධන අධිකාරිය | | නැත | |
| | **අරමුදල් සපයා ගැනීමේ ක්‍රමවේදය** | භාණ්ඩාගාර අරමුදල් | **අනුමැතිය ලබා ගත යුතු ආයතන** | • නාගරික සංවර්ධන අධිකාරිය<br>• මොරටුව මහ නගර සභාව<br>• වෙරල සංරක්ෂණ දෙපාර්තමේන්තුව | |


**වගුව 6.9 :** *ගාලු පාර සංවර්ධන ව්‍යාපෘතිය.*
**මූලාශ්‍රය :** *නාගරික සංවර්ධන අධිකාරිය, 2018*

03

<table>
<tr><td colspan="6">ව්‍යාපෘතිය හඳුනා ගැනීම</td></tr>
<tr><td>ව්‍යාපෘති මාතෘකාව</td><td colspan="5">TP03 - ගාලු පාර සංවර්ධන ව්‍යාපෘතිය.</td></tr>
<tr><td>ව්‍යාපෘතිය</td><td colspan="5">ගාලු පාර සංවර්ධන ව්‍යාපෘතිය</td></tr>
<tr><td>ව්‍යාපෘති යෝජනාව</td><td colspan="5">මොරටුව නව ගාලු පාර හා පරණ ගාලු පාර සම්බන්ධ වන ස්ථානයේ සිට මොරටුව යෝජිත බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානය දක්වා කි.මී. 1ක දිගින් යුතු මාර්ගය මංතීරු 6 ක් සහිතව සංවර්ධනය කිරීම</td></tr>
<tr><td rowspan="4">පිහිටීම</td><td>පළාත</td><td>බස්නාහිර</td><td rowspan="4">සීමාවන්</td><td>උතුර</td><td rowspan="4">මොරටුව නව ගාලු පාර හා පරණ ගාලු පාර සම්බන්ධ වන ස්ථානයේ සිට මොරටුව යෝජිත බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානය දක්වා</td></tr>
<tr><td>දිස්ත්‍රික්කය</td><td>කොළඹ</td><td>නැගෙනහිර</td></tr>
<tr><td>ප්‍රාදේශීය සීමාව</td><td>මොරටුව මහ නගර සභා බල ප්‍රදේශය</td><td>දකුණ</td></tr>
<tr><td>පරිපාලන ඒකකය</td><td>මහ නගර සභා</td><td>බටහිර</td></tr>
<tr><td>ප්‍රවේශය</td><td colspan="5">ගාලු පාර</td></tr>
</table>



**පිහිටීම දක්වන සිතියම**




**භූමි පරිහරණ සැලැස්ම**

| ව්‍යාපෘතිය සාධාරණීකරණය කිරීම | | | | | |
|---|---|---|---|---|---|
| **ව්‍යාපෘති ප්‍රභේද** | සංරක්ෂණය | | **ව්‍යාපෘති ස්වභාවය** | නව | |
| | භූදර්ශන | | | විස්තීරණය කළ යුතු | √ |
| | උරුමයන් | | | භූමිය සංවර්ධනය කිරීම පමණක් | |
| | ප්‍රතිස්ථාපන | | **ව්‍යාපෘතියේ ඉලක්ක** | ආර්ථික | √ |
| | නිවාස | | | සමාජීය | √ |
| | මාර්ග සංවර්ධන | √ | | පාරිසරික | |
| | වෙනත් | | | භෞතික | √ |

| ව්‍යාපෘතිය සාධාරණීකරණය කිරීම | |
|---|---|
| **ව්‍යාපෘති ඉලක්ක** | i. පවතින මාර්ගයේ ප්‍රවේශකත්ව හා චලනතාව(mobility) ඉහළ නැංවීම.<br>ii. මාර්ගයේ ධාරිතාව ඉහළ නැංවීම.<br>iii. නාගරික කේන්ද්‍ර අතර රථවාහන ගමනාගමන වේගය පැයට කිලෝමීටර 60ක අගයකින් යුතුව පවත්වා ගැනීම. |
| **ව්‍යාපෘතියේ පදනම** | – |


| ව්‍යාපෘතියේ දේපළ පිළිබඳ විස්තරය | | | | | |
|---|---|---|---|---|---|
| **ඉඩමේ වර්තමාන අයිතිය** | නා.සං.අධි. | | **මිනින්දෝරු සැලසුම** | අංකය | – |
| | රජයේ | √ | | දිනය | – |
| | වෙනත් | | | ඉඩමේ ප්‍රමාණය | – |

| ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම | | | | | |
|---|---|---|---|---|---|
| **ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදය** | **ක්‍රියාත්මක කළ යුතු ආයතනය** | නාගරික සංවර්ධන අධිකාරිය | **කලාපය** | අධි ඝනත්ව මිශ්‍ර සංවර්ධන කලාපය | |
| | | මොරටුව මහ නගර සභාව | **කලාපීකරණ අනුකූලභාවය** | ඔව් | √ |
| | | මාර්ග සංවර්ධන අධිකාරිය | | නැත | |
| | **අරමුදල් සපයා ගැනීමේ ක්‍රමවේදය** | භාණ්ඩාගාර අරමුදල් | **අනුමැතිය ලබා ගත යුතු ආයතන** | • නාගරික සංවර්ධන අධිකාරිය<br>• මොරටුව මහ නගර සභාව | |


**වගුව 6.10 :** බොරුපන මාර්ගය සංවර්ධන ව්‍යාපෘතිය
**මූලාශ්‍රය :** නාගරික සංවර්ධන අධිකාරිය, 2018

04

| ව්‍යාපෘතිය හඳුනා ගැනීම | | | | | |
|---|---|---|---|---|---|
| ව්‍යාපෘති මාතෘකාව | TP04 - බොරුපන මාර්ගය සංවර්ධන ව්‍යාපෘතිය | | | | |
| ව්‍යාපෘතිය | බොරුපන මාර්ගය පුළුල් කිරීම | | | | |
| ව්‍යාපෘති යෝජනාව | බොරුපන මංසන්ධියේ සිට ගංගාරාම මාර්ගය දක්වා මීටර 200ක දිගින් යුතු බොරුපන පාර මංතීරු 6 ක් සහිතව සංවර්ධනය කිරීම. | | | | |
| පිහිටීම | පළාත | බස්නාහිර | සීමාවන් | උතුර | බොරුපන මංසන්ධියේ සිට ගංගාරාම මාර්ගය දක්වා |
| | දිස්ත්‍රික්කය | කොළඹ | | නැගෙනහිර | |
| | ප්‍රාදේශීය සීමාව | මොරටුව මහ නගර සභා බල ප්‍රදේශය | | දකුණ | |
| | පරිපාලන ඒකකය | මහ නගර සභා | | බටහිර | |
| ප්‍රවේශය | ගාලු පාර හා ගංගාරාම මාර්ගය | | | | |



පිහිටීම දක්වන සිතියම




භූමි පරිහරණ සැලැස්ම

| ව්‍යාපෘතිය සාධාරණීකරණය කිරීම | | | | | |
|---|---|---|---|---|---|
| **ව්‍යාපෘති ප්‍රභේද** | සංරක්ෂණය | | **ව්‍යාපෘති ස්වභාවය** | නව | |
| | භූදර්ශන | | | විස්තීරණය කළ යුතු | √ |
| | උරුමයන් | | | භූමිය සංවර්ධනය කිරීම පමණක් | |
| | ප්‍රතිස්ථාපන | | **ව්‍යාපෘතියේ ඉලක්ක** | ආර්ථික | |
| | නිවාස | | | සමාජීය | |
| | මාර්ග සංවර්ධන | √ | | පාරිසරික | |
| | වෙනත් | | | භෞතික | √ |


| ව්‍යාපෘතිය සාධාරණීකරණය කිරීම | |
|---|---|
| **ව්‍යාපෘති ඉලක්ක** | i. පවතින මාර්ගයේ ප්‍රවේශකත්ව හා චලනතාව(mobility) ඉහළ නැංවීම.<br>ii. මාර්ගයේ ධාරිතාව ඉහළ නැංවීම.<br>iii. නාගරික කේන්ද්‍ර අතර රථවාහන ගමනාගමන වේගය පැයට කිලෝමීටර 60ක අගයකින් යුතුව පවත්වා ගැනීම. |
| **ව්‍යාපෘතියේ පදනම** | කොට්ටාන්ස් මාර්තාවට අනුව මහරගම, බත්තරමුල්ල, කැළණිය, වත්තල හා මොරටුව යන නාගරික කේන්ද්‍ර එකිනෙකට සම්බන්ධ වන පරිදි සංවර්ධනය සඳහා මධ්‍ය වටරවුම් පාර සංවර්ධනය කිරීමට හැකි වන පරිදි බොරුපන පාර මංතීරු 6 ක් සහිතව සංවර්ධනය සඳහා යෝජනා කරනු ලබයි. |

| ව්‍යාපෘතියේ දේපළ පිළිබඳ විස්තරය | | | | | |
|---|---|---|---|---|---|
| **ඉඩමේ වර්තමාන අයිතිය** | නා.සං.අධි. | | **මිනින්දෝරු සැලසුම** | අංකය | – |
| | රජයේ | √ | | දිනය | – |
| | වෙනත් | | | ඉඩමේ ප්‍රමාණය | – |


| ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම | | | | | |
|---|---|---|---|---|---|
| ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදය | **ක්‍රියාත්මක කළ යුතු ආයතනය** | නාගරික සංවර්ධන අධිකාරිය | **කලාපය** | අඩු ඝනත්ව මිශ්‍ර සංවර්ධන කලාපය | |
| | | මොරටුව මහ නගර සභාව | **කලාපීකරණ අනුකූලභාවය** | ඔව් | √ |
| | | මාර්ග සංවර්ධන අධිකාරිය | | නැත | |
| | **අරමුදල් සපයා ගැනීමේ ක්‍රමවේදය** | භාණ්ඩාගාර අරමුදල් | **අනුමැතිය ලබා ගත යුතු ආයතන** | • නාගරික සංවර්ධන අධිකාරිය<br>• මොරටුව මහ නගර සභාව | |

**වගුව 6.11 :** කටුබැද්ද මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය
**මූලාශ්‍රය :** නාගරික සංවර්ධන අධිකාරිය, 2018

| ව්‍යාපෘතිය හඳුනා ගැනීම | | | | | |
|---|---|---|---|---|---|
| ව්‍යාපෘති මාතෘකාව | TP06 - කටුබැද්ද මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය | | | | |
| ව්‍යාපෘතිය | කටුබැද්ද මාර්ගය පුළුල් කිරීම | | | | |
| ව්‍යාපෘති යෝජනාව | කටුබැද්ද මංසන්ධියේ සිට කොස්පලාන පාලම දක්වා කි.මී. 2ක දිගින් යුතු කටුබැද්ද මාර්ගය මංතීරු 4 ක් සහිතව සංවර්ධනය කිරීම. | | | | |
| පිහිටීම | පළාත | බස්නාහිර | සීමාවන් | උතුර | කටුබැද්ද මංසන්ධියේ සිට කොස්පලාන පාලම දක්වා |
| | දිස්ත්‍රික්කය | කොළඹ | | නැගෙනහිර | |
| | ප්‍රාදේශීය සීමාව | මොරටුව මහ නගර සභා බල ප්‍රදේශය | | දකුණ | |
| | පරිපාලන ඒකකය | මහ නගර සභා | | බටහිර | |
| ප්‍රවේශය | ගාලු පාර හා කොස්පලාන පාලම | | | | |



පිහිටීම දක්වන සිතියම




භූමි පරිහරණ සැලැස්ම

| ව්‍යාපෘතිය සාධාරණීකරණය කිරීම | | | | | |
|---|---|---|---|---|---|
| **ව්‍යාපෘති ප්‍රභේද** | සංරක්ෂණය | | **ව්‍යාපෘති ස්වභාවය** | නව | |
| | භූදර්ශන | | | විස්තීරණය කළ යුතු | √ |
| | උරුමයන් | | | භූමිය සංවර්ධනය කිරීම පමණක් | |
| | ප්‍රතිස්ථාපන | | **ව්‍යාපෘතියේ ඉලක්ක** | ආර්ථික | |
| | නිවාස | | | සමාජීය | |
| | මාර්ග සංවර්ධන | √ | | පාරිසරික | |
| | වෙනත් | | | භෞතික | √ |

| ව්‍යාපෘතිය සාධාරණීකරණය කිරීම | |
|---|---|
| **ව්‍යාපෘති ඉලක්ක** | i. පවතින මාර්ගයේ ප්‍රවේශකත්ව හා චලනතාව(mobility) ඉහල නැංවීම.<br>ii. මාර්ගයේ ධාරිතාව ඉහල නැංවීම.<br>iii. නාගරික කේන්ද්‍ර අතර රථවාහන ගමනාගමන වේගය පැයට කිලෝමීටර 60ක අගයකින් යුතුව පවත්වා ගැනීම. |
| **ව්‍යාපෘතියේ පදනම** | කොමිට්‍රාන්ස් වාර්තාවට අනුව මොරටුව, පිළියන්දල, පන්නිපිටිය, මාලඹේ, බොල්ලෙගල, සපුගස්කන්ද, හුණුපිටිය සහ හැඳල යන නාගරික කේන්ද්‍ර එකිනෙකට සම්බන්ධ වන පරිදි සංවර්ධනය සඳහා නැගෙනහිර වටරවුම් පාර සංවර්ධනය කිරීමට හැකි වන පරිදි කටුබැද්ද පාර මංතීරු 4 ක් සහිතව සංවර්ධනය සඳහා යෝජනා කරනු ලබයි. |

| ව්‍යාපෘතියේ දේපළ පිළිබඳ විස්තරය | | | | | |
|---|---|---|---|---|---|
| **ඉඩමේ වර්තමාන අයිතිය** | නා.සං.අධි. | | **මිනින්දෝරු සැලසුම** | අංකය | – |
| | රජයේ | √ | | දිනය | – |
| | වෙනත් | | | ඉඩමේ ප්‍රමාණය | – |


| ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම | | | | | |
|---|---|---|---|---|---|
| ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදය | **ක්‍රියාත්මක කළ යුතු ආයතනය** | නාගරික සංවර්ධන අධිකාරිය | **කලාපය** | අඩු ඝනත්ව මිශ්‍ර සංවර්ධන කලාපය | |
| | | මොරටුව මහ නගර සභාව | **කලාපීකරණ අනුකූලභාවය** | ඔව් | √ |
| | | මාර්ග සංවර්ධන අධිකාරිය | | නැත | |
| | **අරමුදල් සපයා ගැනීමේ ක්‍රමවේදය** | භාණ්ඩාගාර අරමුදල් | **අනුමැතිය ලබා ගත යුතු ආයතන** | • නාගරික සංවර්ධන අධිකාරිය<br>• මොරටුව මහ නගර සභාව | |

**වගුව 6.12 :** ද සොයිසා මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය
**මූලාශ්‍රය :** නාගරික සංවර්ධන අධිකාරිය, 2018

<table>
<tr><th colspan="6">ව්‍යාපෘතිය හඳුනා ගැනීම</th></tr>
<tr><td>ව්‍යාපෘති මාතෘකාව</td><td colspan="5">TP07 - ද සොයිසා මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය</td></tr>
<tr><td>ව්‍යාපෘතිය</td><td colspan="5">ද සොයිසා මාර්ගය පුළුල් කිරීම</td></tr>
<tr><td>ව්‍යාපෘති යෝජනාව</td><td colspan="5">රාවතාවත්ත මංසන්ධියේ සිට කටුබැද්ද කොස්පලාන පාලම දක්වා කි.මී. 3ක දිගින් යුතු ද සොයිසා මාර්ගය මංතීරු 4කින් යුතුව සංවර්ධනය කිරීම.</td></tr>
<tr><td rowspan="4">පිහිටීම</td><td>පළාත</td><td>බස්නාහිර</td><td rowspan="4">සීමාවන්</td><td>උතුර</td><td rowspan="4">රාවතාවත්ත මංසන්ධියේ සිට කොස්පලාන පාලම දක්වා</td></tr>
<tr><td>දිස්ත්‍රික්කය</td><td>කොළඹ</td><td>නැගෙනහිර</td></tr>
<tr><td>ප්‍රාදේශීය සීමාව</td><td>මොරටුව මහ නගර සභා බල ප්‍රදේශය</td><td>දකුණ</td></tr>
<tr><td>පරිපාලන ඒකකය</td><td>මහ නගර සභා</td><td>බටහිර</td></tr>
<tr><td>ප්‍රවේශය</td><td colspan="5">ගාලු පාර හා කොස්පලාන පාලම</td></tr>
</table>



පිහිටීම දක්වන සිතියම




භූමි පරිහරණ සැලැස්ම

| ව්‍යාපෘතිය සාධාරණීකරණය කිරීම | | | | | |
|---|---|---|---|---|---|
| **ව්‍යාපෘති ප්‍රභේද** | සංරක්ෂණය | | **ව්‍යාපෘති ස්වභාවය** | නව | |
| | භූදර්ශන | | | විස්තීරණය කළ යුතු | √ |
| | උරුමයන් | | | භූමිය සංවර්ධනය කිරීම පමණක් | |
| | ප්‍රතිස්ථාපන | | **ව්‍යාපෘතියේ ඉලක්ක** | ආර්ථික | |
| | නිවාස | | | සමාජීය | |
| | මාර්ග සංවර්ධන | √ | | පාරිසරික | |
| | වෙනත් | | | භෞතික | √ |

| ව්‍යාපෘතිය සාධාරණීකරණය කිරීම | |
|---|---|
| **ව්‍යාපෘති ඉලක්ක** | i. රථවාහන ගාල් කිරීම සඳහා අවකාශ ඇති කිරීම.<br>ii. පවතින මාර්ගයේ ප්‍රවේශකත්ව හා චලනතාව(mobility) ඉහල නැංවීම.<br>iii. මාර්ගයේ ධාරිතාව ඉහල නැංවීම. |
| **ව්‍යාපෘතියේ පදනම** | දැව කර්මාන්තය ව්‍යාප්තව ඇති ප්‍රදේශය වෙත අමුද්‍රව්‍ය හා නිමකළ භාණ්ඩ ප්‍රවාහනය සඳහා සහ භාණ්ඩ මිලදී ගැනීම සඳහා ඇතුළුවන රථවාහන හේතුවෙන්, ද සොයිසා මාර්ගයෙහි වර්තමාන ධාරිතාව ප්‍රමාණවත් නොවන හෙයින් සහ යෝජිත නැගෙනහිර වටරවුම් මාර්ගයට රාවතාවත්ත මංසන්ධිය සම්බන්ධ කිරීමට  හැකි වන පරිදි මාර්ගය දෙපස රථවාහන ගාල් කිරීමටද හැකි පරිදි ද සොයිසා මාර්ගය පුළුල් කිරීමට යෝජනා කරනු ලබයි. |

| ව්‍යාපෘතියේ දේපළ පිළිබඳ විස්තරය | | | | | |
|---|---|---|---|---|---|
| **ඉඩමේ වර්තමාන අයිතිය** | නා.සං.අධි. | | **මිනින්දෝරු සැලසුම** | අංකය | – |
| | රජයේ | √ | | දිනය | – |
| | වෙනත් | | | ඉඩමේ ප්‍රමාණය | – |

| ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම | | | | | |
|---|---|---|---|---|---|
| ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදය | **ක්‍රියාත්මක කළ යුතු ආයතනය** | නාගරික සංවර්ධන අධිකාරිය | **කලාපය** | දැව ආශ්‍රිත නිෂ්පාදන ප්‍රවර්ධන කලාපය | |
| | | මොරටුව මහ නගර සභාව | **කලාපීකරණ අනුකූලභාවය** | ඔව් | √ |
| | | මාර්ග සංවර්ධන අධිකාරිය | | නැත | |
| | **අරමුදල් සපයා ගැනීමේ ක්‍රමවේදය** | භාණ්ඩාගාර අරමුදල් | **අනුමැතිය ලබා ගත යුතු ආයතන** | • නාගරික සංවර්ධන අධිකාරිය<br>• මොරටුව මහ නගර සභාව | |


**සිතියම 6.13 :** *යෝජිත බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානය*
**මූලාශ්‍රය :** *නාගරික සංවර්ධන අධිකාරිය, 2018*



<table>
<tr><td colspan="6">ව්‍යාපෘතිය හඳුනා ගැනීම</td></tr>
<tr><td>ව්‍යාපෘති මාතෘකාව</td><td colspan="5">TP08 - යෝජිත බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානය</td></tr>
<tr><td>ව්‍යාපෘතිය</td><td colspan="5">බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානය</td></tr>
<tr><td>ව්‍යාපෘති යෝජනාව</td><td colspan="5">මොරටුව දුම්රිය ස්ථානය හා බස් නැවතුම් පොල පිහිටි දුම්රිය දෙපාර්තමේන්තුව සතු අක්කර 10ක් පමණ වූ භූමි භාගය දුම්රිය, සැහැල්ලු දුම්රිය හා බස් රථ ප්‍රවාහන මාධ්‍යයන්ගෙන් ඒකාබද්ධ වූ බහුවිධ ප්‍රවාහන මධ්‍යස්ථානය ඉදිකිරීමට යෝජිත අතර එය බස් හා දුම්රිය පර්යන්තය, සැහැල්ලු දුම්රිය නැවතුම් ස්ථානය සහ රථ වාහන නැවතුම් අංගනය ආදී පහසුකම් වලින් සමන්විත මිශ්‍ර සංවර්ධන කාර්යය සඳහා යෙදවීමට කටයුතු කරනු ලබයි.</td></tr>
<tr><td rowspan="4">පිහිටීම</td><td>පළාත</td><td>බස්නාහිර</td><td rowspan="4">සීමාවන්</td><td>උතුර</td><td rowspan="4">–</td></tr>
<tr><td>දිස්ත්‍රික්කය</td><td>කොළඹ</td><td>නැගෙනහිර</td></tr>
<tr><td>ප්‍රාදේශීය සීමාව</td><td>මොරටුව මහ නගර සභා බල ප්‍රදේශය</td><td>දකුණ</td></tr>
<tr><td>පරිපාලන ඒකකය</td><td>මහ නගර සභා</td><td>බටහිර</td></tr>
<tr><td>ප්‍රවේශය</td><td colspan="5">ගාලු පාර හා කොස්පලාන පාලම</td></tr>
</table>



පිහිටීම දක්වන සිතියම




භූමි පරිහරණ සැලැස්ම

| ව්‍යාපෘතිය සාධාරණීකරණය කිරීම | | | | | |
|---|---|---|---|---|---|
| **ව්‍යාපෘති ප්‍රභේද** | සංරක්ෂණය | | **ව්‍යාපෘති ස්වභාවය** | නව | |
| | භූදර්ශන | | | විස්තීරණය කළ යුතු | √ |
| | උරුමයන් | | | භූමිය සංවර්ධනය කිරීම පමණක් | |
| | ප්‍රතිස්ථාපන | | **ව්‍යාපෘතියේ ඉලක්ක** | ආර්ථික | √ |
| | නිවාස | | | සමාජීය | |
| | මාර්ග සංවර්ධන | √ | | පාරිසරික | |
| | වෙනත් | | | භෞතික | √ |

| ව්‍යාපෘතිය සාධාරණීකරණය කිරීම | |
|---|---|
| **ව්‍යාපෘති ඉලක්ක** | i. විවිධ ප්‍රවාහන මාධ්‍ය ඒකාබද්ධ කිරීම සහ සබඳතාව වැඩිදියුණු කිරීම.<br>ii. මගී ප්‍රවාහනයේ ගුණාත්මකභාව ඉහල නැංවීම හා මගී සුවමාරු පහසුකම් වැඩි දියුණු කිරීම.<br>iii. නගරය තුළ ව්‍යාපාර අවස්ථා, වාණිජ හා මුල්‍ය කටයුතු මෙන්ම සංචාරක අංශය වැඩි දියුණු කිරීම. |
| **ව්‍යාපෘතියේ පදනම** | – |


| ව්‍යාපෘතියේ දේපළ පිළිබඳ විස්තරය | | | | | |
|---|---|---|---|---|---|
| **ඉඩමේ වර්තමාන අයිතිය** | නා.සං.අධි. | | **මිනින්දෝරු සැලසුම** | අංකය | – |
| | රජයේ | √ | | දිනය | – |
| | වෙනත් | | | ඉඩමේ ප්‍රමාණය | – |

| ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම | | | | | |
|---|---|---|---|---|---|
| ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදය | **ක්‍රියාත්මක කළ යුතු ආයතනය** | නාගරික සංවර්ධන අධිකාරිය | **කලාපය** | අඩු ඝනත්ව මිශ්‍ර සංවර්ධන කලාපය | |
| | | මොරටුව මහ නගර සභාව | **කලාපීකරණ අනුකූලභාවය** | ඔව් | √ |
| | | මාර්ග සංවර්ධන අධිකාරිය | | නැත | |
| | **අරමුදල් සපයා ගැනීමේ ක්‍රමවේදය** | භාණ්ඩාගාර අරමුදල් | **අනුමැතිය ලබා ගත යුතු ආයතන** | • නාගරික සංවර්ධන අධිකාරිය<br>• මොරටුව මහ නගර සභාව | |


**වගුව 6.14 :** *බොල්ගොඩ සිරි මාර්ගය*
**මූලාශ්‍රය :** *නාගරික සංවර්ධන අධිකාරිය, 2018*



<table>
<tr><th colspan="6">ව්‍යාපෘතිය හඳුනා ගැනීම</th></tr>
<tr><td>ව්‍යාපෘති මාතෘකාව</td><td colspan="5">TP11 - බොල්ගොඩ සිරි මාර්ගය</td></tr>
<tr><td>ව්‍යාපෘතිය</td><td colspan="5">බොල්ගොඩ ගඟ රක්ෂිතයෙන් දිවෙන මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය</td></tr>
<tr><td>ව්‍යාපෘති යෝජනාව</td><td colspan="5">දිගොරැල්ල නව පාලමේ සිට බොල්ගොඩ ගංගා මායිම් රක්ෂිතය ඔස්සේ බොරුපන පාර දක්වා අඩි 20ක පළලකින් හා මංතීරු 2කින් යුතු නව මාර්ගය ඉදි කිරීම සහ මාර්ගය දෙපස හරිත මංතීරු ඇති කිරීම.</td></tr>
<tr><td rowspan="4">පිහිටීම</td><td>පළාත</td><td>බස්නාහිර</td><td rowspan="4">සීමාවන්</td><td>උතුර</td><td rowspan="4">බොල්ගොඩ ගඟ රක්ෂිතය</td></tr>
<tr><td>දිස්ත්‍රික්කය</td><td>කොළඹ</td><td>නැගෙනහිර</td></tr>
<tr><td>ප්‍රාදේශීය සීමාව</td><td>මොරටුව මහ නගර සභා බල ප්‍රදේශය</td><td>දකුණ</td></tr>
<tr><td>පරිපාලන ඒකකය</td><td>මහ නගර සභා</td><td>බටහිර</td></tr>
<tr><td>ප්‍රවේශය</td><td colspan="5">දිගොරැල්ල පාලම, බොරුපන පාර, කටුබැද්ද පාර</td></tr>
</table>




පිහිටීම දක්වන සිතියම




භූමි පරිභරණ සැලැස්ම

| ව්‍යාපෘතිය සාධාරණීකරණය කිරීම | | | | | |
|---|---|---|---|---|---|
| **ව්‍යාපෘති ප්‍රභේද** | සංරක්ෂණය | √ | **ව්‍යාපෘති ස්වභාවය** | නව | √ |
| | භූදර්ශන | √ | | විස්තීරණය කළ යුතු | |
| | උරුමයන් | | | භූමිය සංවර්ධනය කිරීම පමණක් | |
| | ප්‍රතිස්ථාපන | | **ව්‍යාපෘතියේ ඉලක්ක** | ආර්ථික | √ |
| | නිවාස | | | සමාජීය | |
| | මාර්ග සංවර්ධන | √ | | පාරිසරික | √ |
| | වෙනත් | | | භෞතික | √ |

| ව්‍යාපෘතිය සාධාරණීකරණය කිරීම | |
|---|---|
| **ව්‍යාපෘති ඉලක්ක** | i. බොල්ගොඩ ජලාභිමුඛ ප්‍රදේශය මහජනයාට විවෘත කිරීම.<br>ii. බොල්ගොඩ ගංගාවේ ජලය දූෂණය වීම වළක්වාලීම .<br>iii. අනවසර ගොඩකිරීම්, අල්ලාගැනීම් හා ඉදිකිරීම් නවතාලීම.<br>iv. මොරටුව මහ නගර සභා උතුරු බොරුපන සීමාවේ සිට දිගොරැල්ල නව පාලම දක්වා යෝජිත මාර්ගය මඟින් මනා සම්බන්ධතාවයක් ලබා දීම. |
| **ව්‍යාපෘතියේ පදනම** | වර්තමානයේ බොල්ගොඩ ගංගා ඉවුර දක්වාම ගොඩනැගිලි ඉදි කිරීම් සිදු කරනු ලබන අතරම ගංගාවට ඝන හා ද්‍රව අපද්‍රව්‍ය මෙන්ම අපජලය බැහැර කිරීමද සිදු කරනු ලබයි. බොල්ගොඩ පරිසර ආරක්ෂණ කලාපයක් ලෙස හඳුනා ගෙන ඇති බැවින් මීටර 60ක රක්ෂිත ප්‍රදේශයක් බල පැවත්වුවද එය ක්‍රියාත්මක කිරීම ප්‍රයෝගිකව අපහසු බව හඳුනා ගත් හෙයින් රක්ෂිත මායිම ඔස්සේ මාර්ගයක් ඉදි කිරීම තුළින් භෞතිකව රක්ෂිත කලාපය සලකුණු කිරීමට අදහස් කරනු ලබයි. එමඟින් පාරිසරික, සමාජයීය හා භෞතික වශයෙන් ඇතිවන ගැටළු අවම කර ගැනීමට අපේක්ෂා කෙරේ. |


| ව්‍යාපෘතියේ දේපළ පිළිබඳ විස්තරය | | | | | |
|---|---|---|---|---|---|
| **ඉඩමේ වර්තමාන අයිතිය** | නා.සං.අධි. | | **මිනින්දෝරු සැලසුම** | අංකය | – |
| | රජයේ | √ | | දිනය | – |
| | වෙනත් | | | ඉඩමේ ප්‍රමාණය | – |

| ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම | | | | | |
|---|---|---|---|---|---|
| ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ ක්‍රමවේදය | **ක්‍රියාත්මක කළ යුතු ආයතනය** | නාගරික සංවර්ධන අධිකාරිය | **කලාපය** | බොල්ගොඩ ජලාභිමුඛ සංවර්ධන කලාපය | |
| | | මොරටුව මහ නගර සභාව | **කලාපීකරණ අනුකූලභාවය** | ඔව් | √ |
| | | මාර්ග සංවර්ධන අධිකාරිය | | නැත | |
| | **අරමුදල් සපයා ගැනීමේ ක්‍රමවේදය** | භාණ්ඩාගාර අරමුදල් | **අනුමැතිය ලබා ගත යුතු ආයතන** | • මධ්‍යම පරිසර අධිකාරිය<br>• නාගරික සංවර්ධන අධිකාරිය<br>• මොරටුව මහ නගර සභාව | |


**වගුව 6.15 :** මාර්ග දෙපස හරිත මංතීරු ව්‍යාපෘති
**මූලාශ්‍රය :** නාගරික සංවර්ධන අධිකාරිය, 2018



| ව්‍යාපෘතිය හඳුනා ගැනීම | | | | | |
|---|---|---|---|---|---|
| ව්‍යාපෘති මාතෘකාව | En1 - මාර්ග දෙපස හරිත මංතීරු ව්‍යාපෘති | | | | |
| ව්‍යාපෘතිය | රුක් රෝපණය කිරීම | | | | |
| ව්‍යාපෘති යෝජනාව | ජල මූලාශ්‍ර එකිනෙක සම්බන්ධ වන පරිදි ප්‍රදේශය පුරා ක්‍රමවත් වායු සංසරණය ක්‍රියාවලියක් ඇති කිරීම සඳහා උපයෝගී කර ගත හැකි මාර්ග දෙපස රුක් රෝපණය කරමින් හරිත මංතීරු පිහිටුවනු ඇත. | | | | |
| පිහිටීම | පළාත | බස්නාහිර | සීමාවන් | උතුර | – |
| | දිස්ත්‍රික්කය | කොළඹ | | නැගෙනහිර | |
| | ප්‍රාදේශීය සීමාව | මොරටුව මහ නගර සභා බල ප්‍රදේශය | | දකුණ | |
| | පරිපාලන ඒකකය | මහ නගර සභා | | බටහිර | |
| ප්‍රවේශය | හඳුනා ගනු ලැබූ මාර්ග | | | | |




පිහිටීම දක්වන සිතියම




භූමි පරිභරණ සැලැස්ම

| ව්‍යාපෘතිය සාධාරණීකරණය කිරීම | | | | | |
|---|---|---|---|---|---|
| **ව්‍යාපෘති ප්‍රභේද** | සංරක්ෂණය | | **ව්‍යාපෘති ස්වභාවය** | නව | |
| | භූදර්ශන | √ | | විස්තීරණය කළ යුතු | √ |
| | උරුමයන් | | | භූමිය සංවර්ධනය කිරීම පමණක් | |
| | ප්‍රතිස්ථාපන | | **ව්‍යාපෘතියේ ඉලක්ක** | ආර්ථික | |
| | නිවාස | | | සමාජීය | |
| | මාර්ග සංවර්ධන | | | පාරිසරික | √ |
| | වෙනත් | | | භෞතික | √ |

| ව්‍යාපෘතිය සාධාරණීකරණය කිරීම | |
|---|---|
| **ව්‍යාපෘති ඉලක්ක** | i. ප්‍රදේශයේ ක්‍රමවත් වායු සංසරණය ක්‍රියාවලියක් ඇති කිරීම<br>ii. ප්‍රදේශයේ ජල මුලාශ්‍ර එකිනෙක සම්බන්ධ කිරීම |
| **ව්‍යාපෘතියේ පදනම** | මොරටුව සැලසුම් සීමාවෙහි ගොඩනැගිලි හා ඉදිකිරීම් හේතුවෙන් ඇතිවන නාගරික තාපය ඉහළ යාම අවම කරමින් ප්‍රදේශයෙහි සෞම්‍ය පරිසරයක් ඇති කිරීම තුලින් ජිවත් වීමට යෝග්‍ය පරිසරයක් ගොඩනැගීම. |

| ව්‍යාපෘතියේ දේපළ පිළිබඳ විස්තරය | | | | | |
|---|---|---|---|---|---|
| **ඉඩමේ වර්තමාන අයිතිය** | නා.සං.අධි. | | **මිනින්දෝරු සැලසුම** | අංකය | – |
| | රජයේ | √ | | දිනය | – |
| | වෙනත් | | | ඉඩමේ ප්‍රමාණය | – |

| ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම | | | | | |
|---|---|---|---|---|---|
